අලගියවන්නමුකවෙටිතුමන් විසින්
විරචිත

# දහම්සොඬකව.

ආචාර්‍ය්‍ය පණ්ඩිත වැලිවිටියේ
සොරත ස්වාමිපාදයන්වහන්සේ
විසින් ලියනලද

## පරිකථා

සහිතයි.

විද්‍යෝදය පරිවෙණාධිපති
කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන
ප්‍රධානනායක මාහිමියන්වහන්සේ විසින්
පිළිගන්නා ලදි.

වී. ඩබ්ලිව්. සමරනායක මහතා විසින්
දෙවෙනිවරට
කොළඹ–හුණුපිටියේ
ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවන ලදි.

ශ්‍රී බු: ව: 2478
ක්‍රි: ව: 1934

28
500

# ප්‍රස්තාවනා.

ග්‍රන්ථයක් පිළිවබඳ ව පරිකථාකරණාවසරයෙහි සංඥා, නිමිත්ත, කර්තෘ, ප්‍රමාණ, ප්‍රයොජන යන අර්ථපඤ්චකය ද විභජනය කට යුතු ය යනු පෙරදුරන්ගේ නියමය හෙයින් මේ ග්‍රන්ථය පිළිබඳ ව කරණු ලබන පරිකථාවගේ ප්‍රමුඛයෙහි යථොක්ත අර්ථපඤ්චකය හා තදනුකූල වූ වෙනත් කරුණුත් සැකෙවින් දක්වම්හ. ඔවුනතුරෙන්—

I. "සංඥා" නම් විශෙෂසංඥා සාමාන්‍යසංඥා යයි දෙවැදෑරුම් වූ නාමයයි. මේ ග්‍රන්ථයට වනාහි විශෙෂසංඥාවක් ඇති බවෙක් නො පෙණේ. සාමාන්‍යසංඥා වශයෙන් '**දහම්සොඬකාව**' යනු ද, '**දහම්සොඬදූකාව**' යනු ද ප්‍රසිද්ධ ය. එයින් වැඩිදෙනා අතර ප්‍රසිද්ධ හෙයින් පළමුවැන්න අප විසින් ද මෙහි යොදනලදී. **දහම්සොඬවත** බුද්ධභාෂිතයක් නොවන හෙයින් ද **ජාතකපාළියෙහි** නො ආබැවින් ද ඊට ජාතකනාමය නො යෙදේ යයි සමහරු සිතති. එහෙත් බුද්ධභාෂිත නුවූ, මහරහතුන් විසින් දෙසනලද මහාබොධිසත්වචරිතයන්ට **ජාතක**නාමය පුරාතනයන් ව්‍යවහාර කළබව **ජාතකමාලා**දියෙහි **ව්‍යාඝ්‍රීජාතකාදි**යෙන් පෙණේ. **මහාවංශයෙහි** 97 වන පරිච්ඡෙදයෙහි **ශ්‍රීපරාක්‍රමනරෙන්ද්‍රසිංහරාජයන්** විසින් කළ පින්කම් වැණුමෙහි **දහම්සොඬවත ද** ජාතකසඞ්ඛ්‍යාවෙහි ලා ගිණූහ. මෙසේ සර්වඥභාෂිත නුවූවත් බොධිසත්වචරිතයන්ට '**ජාතක**' නාමය යෙදුනු හෙයින් '**දහම්සොඬදූකාව**' යන්න සාවද්‍ය නො වේ. '**දහම්සොඬකාව**' යන්න ද "**සොණනන්දජාතකාව්‍ය**' යනාදි නාමයන් වැනි හෙයින් නිරවද්‍ය ය. 'දහම්සොඬහු නිසා කළ කාව' යනු අර්ථයි.

II. අභ්‍යන්තර බාහ්‍යවශයෙන් දෙවදෑරුම් වූ නිමිත්තයන් අතුරෙන් **සමරදිවාකරමුකවෙටි** මන්ත්‍රිවරයාගේ ආරාධනය මේ ග්‍රන්ථකරණයෙහි බාහ්‍යනිමිත්ත වි ය. ධර්මශාස්ත්‍ර උද්ග්‍රහණ ධාරණයෙහි අලස වූ සුකුමාර මතීන් විෂයයෙහි පැවැති කරුණාව අභ්‍යන්තර නිමිත්ත ය.

III. මේ ග්‍රන්ථයෙහි කර්තෘ **අලගියවන්නමුකවෙටිතුමා ය.** ඒ බව මේ ග්‍රන්ථයාගේ අවසානයෙහි පෙණෙන කවිවලින් හැඟේ. මෙතුමන්ගේ ග්‍රාමය **සීනාකෝරළයේ** ගහබඩපත්

තුව බද **හිස්සැල්ල** ය. එතුමාගේ පිතෘ වූ **ධර්මධ්වජ** පඬිවරයන් විසින් මේ ග්‍රන්ථය කරණලදැයි ඇතැම්හු කියත්. ඒ භවතුන්ගේ එකී මතයට පිහිට ව තිබෙන්නේ එලෙස පවත්නා ජනප්‍රවාදයක් හා ඇතැම් පුස්කොළ පිටපත්හි කර්තෘනාමසන්දර්ශන පද්‍යයන් ගිලිහී තිබීමත් මෙහි හා **කුසජාතක**කාව්‍යයෙහි සමානපද්‍යයන් දක්නට ලැබීමත් යන මේ කරුණු යි.

මේ එකක් වත් ඒ මතය ස්ථිර කර ලීමෙහි පොහොසත් නො වේ. මෙබදු ජනප්‍රවාද සත්‍ය වන්නේ ඉතාමත් කලාතුරෙකිනි. **අමාවතුර** නම් වූ **බුත්සරණ ගුරුළුගෝමිහුගේ** බුහුනතිකෙනෙකුන් විසින් කරණලදැයි ජනප්‍රවාදයෙක් පැවැත්තේ ය. කරුණු පරීක්ෂා කළ කල්හි එ ම කථාව අතිශයඅසත්‍යයක් බව හෙළි වී ය. එසේ ම **දහම්සොඬදාකව** පිළිබඳ ව පවත්නා ජනප්‍රවාදය ද හැදහිය නො හැක්කකි. **දහම්දද**, **දහම්සොඬ** යන නම් දෙකෙහි ඇති සමානත්වය මේ ජනප්‍රවාදය ඉපදීමට හෙතු වී යයි සැලකිය හැක.

කර්තෘනාමසන්දර්ශනපද්‍යයන් සමහර පොත්වල නො පෙණීම මේ පොත **ධර්මධ්වජ** පඬිවරයාගේ යයි නිශ්චය කිරීමට සාධකයෙක් නො වේ. එක පිටපතෙක වත් ඒ පද්‍ය තිබේ නම්, ඒ ම මෙය අලගියවන්නතුමාගේ කෘතියක් බවට බලවත් සාධකයෙකි. යට කී **අමාවතුර** ග්‍රන්ථයාගේ ද කර්තෘනාමය පිටපත් කීපයෙක මිස බොහෝ පිටපත්වල නො පෙණේ. එහෙත් එය **විද්‍යාචක්‍රවර්තීන්ගේ** කෘතියක් නොවන බවට ඇතැම් පිටපත්හි ලැබෙන ඒ කර්තෘනාමාදර්ශනය සාධකයෙක් නො වී ය. එසේ ම මෙහි ද සමහර පිටපත්හි කර්තෘනාමසූචකපද්‍යයන් ගිලිහී තිබීම මෙය **අලගියවන්න**තුමාගේ කෘතියක් නො වේ යයි කීමට සාධකයක් කර ගැණුම අතිශයඅයුක්ත ය. ග්‍රන්ථාන්තයෙහි පැණෙන කර්තෘනාම ගොත්‍රාත්මකපද්‍ය දෙක මෑත දී අන්‍යයෙකු විසින් එකතු කරණ ලදැයි සිතීම ද යුක්තියුක්ත නො වේ. අන්‍යයෙකුගේ කෘතියක් තදන්‍යයෙකුට හිමි කර දීම ඉන් බොහෝ මෑත සිටියෙකුට මඳ වූ ද ප්‍රයොජනයක් ගෙණ දෙන්නක් නො වේ. අප්‍රයොජන කාර්‍ය්‍යයෙක්හි මන්දයෙක් ද ප්‍රවෘත්ත නො වේ.

මෙහි හා **කුසදා**හි සමානපද්‍යයන් දක්නා ලැබීම කෘතිද්වයය එකකර්තෘක යයි කීමට බාධාවකැයි සලකන්නෝ 'අන්‍යකෘතීන් ගෙන් පද්‍යපාදාදිය ගැණුම තත්කර්තෘවරයන්ට කරණු ලබන

මහත් ගෞරවයෙකැයි ද, පුරාතනමහාකවීහු ද ඒ සිරිත අනුගමනය කළාහු යයි ද, ස්වකීය කෘතියකින් පද්‍යාදිය ගෙණ තමන්ගේ ම අන්‍යකෘතියෙක්හි යෙදීම මහත් නිඳුවෙකැ'යි ද කියති. අන්‍ය කෘතියකින් පද්‍යාදිය පැහැර ගැණුම නිඳුවක් මිස ස්වකීයකෘතියකින් ගෙණ අතික් ස්වකීයකෘතියක යෙදුම නිඳුවක් නො වේ. තමන්ගේ දූය තමන් කැමැති සේ කිරීම වරදෙකැයි සැලකීම කවර නීතියකට එකඟ වේ ද? මහාකවි**කාලිදාසයන්** වැනියෝ පවා තමන්ගේ පූර්වකෘතීන්ගෙන් ශ්ලෝකපාදාදිය ගෙණ ස්වකීය නව්‍යකෘතීන්හි යෙදූහ. එහෙයින් **කුසදාහි** හා **දහම්සොඬකාවෙහි** සමානපද්‍ය දැක්ම **දහම්සොඬකාව** **අලගියවන්න මුකවෙටි** තුමාගේ නො වේ යයි කීමට සාධකයෙක් නො වේ. මෙලෙසින් **ධර්මධ්වජ** තුමාගේ පක්ෂය ගන්නන් ප්‍රස්තුතාර්ථසමර්ථනයෙහි ස්වල්ප වූ ද ශක්තියක් නැති අතිශය දුර්වලතර්කයන්හි එල්බ සිටින බව පෙණේ.

**අලගියවන්නමුකවෙටි**තුමන් ගැඹුරු සකුමගද කවිනළු සිඳු කිමිදිබව ඔවුන් විසින් කළ **සැවුල්අස්නෙහි** කියනලදී. හේ සංස්කෘතකාව්‍යග්‍රන්ථයන්හි පරිචිතිය ඇත්තෙක් වී නම්, සංස්කෘතපද්‍යයන්ගේ අර්ථයන් ගෙණ ස්වකීයකෘතීන් හොබවා ගණු නියත ය. **අලගියවන්න**තුමාගේ කෘතිහු පුරාතන සිංහල මහාකවීන් විසින් කරණලද කාව්‍යයන්ගෙන් ගෙණ යෙදූ දෑයින් ම පොහොසත් වූහ. **දහම්සොඬකාවෙහි** ද ඒ ඒ තන්හි ඒබව දක්වා ඇත. මොවුන් විසින් වැඩියක් ආශ්‍රය කරණලද්දේ **කව්සිළුමිණ, කාව්‍යශෙඛර, මයූරසන්දෙශ** යන පොත් යයි හැඟේ. **දහම්සොඬකාවෙහි** මෙන් ම **සැවුල්අස්නෙහි** ද **කව්සිළුමිණෙන්** ගත් අර්ථයන් හා වචන ද බොහෝ ය. මොවුන් විසින් කළ **'සුභාෂිත'** නම් නීතිග්‍රන්ථයෙහි පමණක් සංස්කෘතපද්‍යයන්ගේ පරිවර්තනයෝ දක්නා ලැබෙත්.

**පරංගිහටන** නම්. තවත් කුඩා කව්පොතක් ද මොවුන් විසින් රචනා කරණලදැයි කියතත් එය මොවුන්ගේ කෘතියක් බවට ජනප්‍රවාදය ම මිස අතික් එක ද සාක්ෂ්‍යයෙක් නැත්තේ ය. එය වනාහි **දෙවෙනිරාජසිංහ** රජහුගේ වික්‍රමාතිශයය වර්ණනා කරණු සඳහා එරජු හා **පරංගින්** ද අතර වූ යුද්ධයක් කථාශරීරය වශයෙන් ගෙණ නිපදවන ලද්දකි. **දෙවෙනිරාජසිංහ** රජුගේ කාලයෙහි අලගියවන්න මුකවෙටිතුමන් පරංගින්ගේ යටතට

පැමිණ **'දොන් ජෙරෝනිමෝ අලගියවන්න** නාමයෙන් ප්‍රසිද්ධ ව උසස් තිලයක් දරමින් පරංගින්ට අයත් ව තුබූ ප්‍රදේශයන්හි ජන ලේඛනයක් (තෝම්බුවක්) සම්පාදනය කළ බව ප්‍රසිද්ධ ය.‡

**දහම්සොඬකාව** පළමුවරට ශුද්ධ කොට ව්‍යාඛ්‍යානයක් ලියූ **ජඹුරැළියේ පඤ්ඤානන්ද** ස්ථවිරපාදයන්වහන්සේ **අලගියවන්න** තුමන් **දෙවෙනි රාජසිංහ** රජහුගේ කාලයෙහි සිටිබව කියති. එසේ කීමට හෙතුව වූයේ මේ පරංගිහටන ම විය හැකි ය. **දහම් සොඬකාව** අලගියවන්නතුමන්ගේ අන්තිම කෘතිය යයි ද උන් වහන්සේගේ මතයකි. මෙහි අටළොස් වන කව ඊට සාධක කොට දක්වති. නමුත් අප අදහස් ඊට වෙනස් වේ. **සැවුල් අස්නෙහි** 66 වන—

"තර සිවුපා ගුණදම බැඳෙමින් සිටි න"

යනාදි කව කරන්නට ඇත්තේ **දහම්සොඬ** කාවෙහි පෙණෙන--

"සිවුපා පදූනි දි ඩ"

යනාදි කව බලා ගෙණ ම ය. මෙයින් **දහම්සොඬකාව** සැවුල්අස් නට ද පුරාතන බව කිය හැකි ය. **දහම්සොඬකාව** හා **සැවුල්අස් නත්** කරණ ලද්දේ බුද්ධවර්ෂ 2421 පමණේ දී සිංහාසනා රූඪ ව එකොලොස් අවුරුද්දක් පමණ **සීතාවක** වෙසෙමින් රාජ්‍යානුශා සනා කළ **පළමුවන රාජසිංහ**රජුගේ කාලයේ දී ය. **කුශජාතක කාව්‍යය** වනාහි බුද්ධ වර්ෂ 2154 වන වර්ෂයේ දී නිමවී ය.

පළමුවන **රාජසිංහ** රජතුමා වනාහි පොත්පත් ගිනිලැවීම් ආදියෙන් ශාස්ත්‍රාගමවර්ධනයට බෙහෙවින් අකුල් හෙළූ රජෙකි. ඔහුගේ කාලයෙහි ශාස්ත්‍රාගම බොහෝ සෙයින් පිරිහී තුබුනු බව නිසැක ය. එබඳු කාලයෙක්හි පවා මෙබඳු ග්‍රන්ථයන් නිපදවා ලූ **අලගියවන්නමුඛවෙටිතුමන්** කෙරෙහි හැම සිංහලයන් ම කෘතඥ විය යුතු ය.

IV. ප්‍රමාණය වශයෙන් මේ ග්‍රන්ථය පද්‍ය එක්සිය තෙසැටෙකින් පරිමිත ය.

V. කාව්‍යග්‍රන්ථයෙකින් ලැබිය හැකි ප්‍රයොජන බොහෝ ය. මන්දබුද්ධීන්ට ද කාව්‍යග්‍රන්ථනිෂෙවණයෙන් ධර්මාර්ථකාමමොක්ෂයන් ලැබෙන බව **ශ්‍රී විශ්වනාථ කවිරාජයෝ** කිහ.

---

‡ මේ කාලෙහි සඳහන් සමරදිවාකර වැන්දුත් ද පරංගි පක්ෂයට බැඳී දොන් ජෙරෝනිමෝ නාමින් ප්‍රසිද්ධ ව සිටිබව ඇතැම්හු කියත්.

හුදු ව්‍යාකරණාදි ශාස්ත්‍ර හා ආගම ධර්මත් ඉගෙණීමෙහි මැලි වූ සුකුමාරමතීන්ට එකී ශාස්ත්‍රාදිය කාව්‍යග්‍රන්ථයෙක්හි ඇතුළත් කොට උගන්වන්නට වන්කල ඉතා පහසු වේ. එහෙයින් කාව්‍ය ග්‍රන්ථ මධුශර්කරායුක්ත තික්තඖෂධ වැන්නැයි මහාකවි **අශ්වඝෝෂාචාර්යයන්** විසින් කියනලදී. ආචාර්ය **භාමහයෝ** ද, "සත්පත් කාව්‍යග්‍රන්ථ සේවනය කිරීම ධර්ම අර්ථකාම මෝක්ෂ යන්හි හා සිවුසැටකලාවන්හිත් විචක්ෂණභාවය හා කීර්තියත් ප්‍රීතියත් කෙරේ"යයි කීහ. මෙයින් කාව්‍යග්‍රන්ථයකින් ලැබිය හැකි ප්‍රයෝජන පැහැදිලි වේ. **දහම්ගොණ්ඩාව** වනාහි උසස් කාව්‍යග්‍රන්ථයෙකැයි නො කිය හැකිය. එහෙත් මෙබඳු පොත් පළමු කොට නිසෙවනය කිරීමෙන් උසස් කාව්‍යග්‍රන්ථයන් අසුරු කිරීමට මග පැදෙන්නේ ය. මේ කාව්‍යයෙන් ප්‍රකාශ වනුයේ බෝධිසත්ත්ව චරිතයකි. එය ඉගෙණීමෙන් ලැබෙන ප්‍රයෝජන මේ පොතෙහි අටළොස් (18) වැනි පද්‍යයෙන් ප්‍රකාශ වේ.

VI. මෙහි කාව්‍යශරීරය වනාහි අපගේ බුදුරජාණන්වහන්සේගේ පූර්වචරිතයෙකි. "එක්කාලෙක්හි අප බෝසත්තෙමේ රජකුලෙහි ඉපිද දඹදිව අගරජ වීය. එතුමා ධර්මශ්‍රවණය නැති වීමෙන් කලකිරී දහම් සොයනුවස් වල් වැද තැවෙමින් සිටියේ ඒ බව දැන රකුස් වෙස් ගෙණ පැමිණි **ශක්‍රයා** "අනිච්චාවත සඞ්ඛාරා" යනාදි ගාථාව කියමින් සිටිය දී පළමු ගිවිසුම ලෙස ඔහුගේ මුඛයට ගිරිමුදුනෙක සිට පැන්නේය. එයින් තුටුවූ **ශක්‍ර** තෙමේ එරජ තුමන් දෙව්ලොවට වඩාගෙණ ගොස් සුරසිරි පෙන්වා අවවාද කොට මිනිස් ලොවට ඇර ලී ය." යනු එහි සංක්ෂේපයයි.

VII. මේ කාව්‍යග්‍රන්ථය මින් අවුරුදු කීපයකට ඉහත දී ඉතා දුර්ලභ ව පැවැත්තේ ය. ඒ කාලයෙහි **ජඹුරැළියේ ප්‍රඥානන්දාභිධාන** ස්වාමිපාදයන් වහන්සේ පිටපත් කීපයක් සපයා ගෙණ මහත් පරිශ්‍රමයෙන් මූලග්‍රන්ථය ශුද්ධ කොට පදගතාර්ථව්‍යාඛ්‍යානයක් ද නිපදවා ලූහ. මුල දී පොත කෙබඳු තත්ත්වයක පැවැත්තේ දැයි නොදන්නන්ට උන්වහන්සේගේ කෘතියෙහි ප්‍රශංසාර්හත්වය නො වැටහේ. ඉතා දුර්ලභ ව පැවැති පොතක් බොහෝදුර ශුද්ධියට පමුණුවා සුලභ කර ලූ උන්වහන්සේ සාධූන්ගේ ගෞරවයට භාජන වෙති.

ඉතාමහත් නුවූ ද ඉතා කුඩා නුවූ ද මේ පොත කියවීමෙන් ප්‍රසන්න වූ කීප දෙනෙක් ම මේ පොතට විස්තරාර්ථවර්ණනාවක් නිපදවාලුව මැනැවැයි අපට ආරාධනය කළහ. වෙසෙසින්

**වී. ඩබ්ලිව්. සමරනායක** මහතා මේ කෘතියෙහි වැඩියක් ම අප උත්සාහවත් කෙළේ ය. එහෙයින් මේ කෘතියෙහි ආසක්ත ව පළමු කොට මූල ග්‍රන්ථය ශුද්ධ කර ගතුම්හ.

අපගේ පාඨයෙහි පළමුවෙන් මුද්‍රිත ග්‍රන්ථයට වඩා විසදෘශ ස්ථාන දක්නා ලැබේ. එහෙත් ප්‍රථම පුස්තකයෙහි තුබුනු පාඨ අධොලිපි වශයෙන් දක්වා ඇත. එහෙයින් කවර පාඨයක් නිරවද්‍ය ද යනු නිරවුල් කර ගැණුම සුධීන්ට අපහසු නො වේ. මූල පාඨය ශුද්ධ කර ගත් ඉක්බිති විස්තර කට යුතු පදයන් උද්ධරණය කරමින් විස්තරාර්ථ වර්ණනාවන් දැක්වූම්හ. අන්වයානුගත ව පදයක් පාසා පර්‍යායවචන දැක්වීමෙන් අර්ථ කීම අයහපත් පුරුද්දක් හෙයින් පද්‍යයට අනතුරු ව පදගතාර්ථ නො දැක්වූම්හ. එහෙත් සන්නය බලා අර්ථ ඉගෙණිමෙහි පුරුදු වූවන්ගේ පහසුව සඳහා ව්‍යාඛ්‍යානයක් ග්‍රන්ථයාගේ අවසන්හි උපග්‍රන්ථයක් වශයෙන් යෙදූ නමුත් සන්නය නො බලා අන්වය සලකා අර්ථ ඉගෙණීමට පුරුදු වියයුතුයි. එසේ ඉගෙණීමෙන් සරල (ඍජු) නුවූ ක්‍රියාකාරකපදසම්බන්ධ ඇති පද්‍යයන්ගේ පවා අර්ථය වහා වටහා ගැණීමට ශක්තිය නොබෝකලෙකින් ලැබේ. අනුත්තාන වූ (උඩුකුරු නුවූ=ගැඹුරු) පදයන් බෙහෙවින් වර්ණනා කළම්හ. සුගම (**සුඛාවබොධ**) පදයන් වර්ණනාවෙන් හළම්හ. ආඛ්‍යාත (ක්‍රියා) කෘදන්ත (පසරුත්) ශබ්දයන්ගේ ධාතුප්‍රකෘති ආදිය විවරණ ඉගෙණ ගන්නන්ගේ ප්‍රයොජනය තකා දැක්වූම්හ. ග්‍රන්ථබාහුල්‍යභීතීන් බොහෝ තැන් සංක්‍ෂෙප කළම්හ.

මේ විතීය මුද්‍රණයෙහි දී වැඩිදුරටත් මේ ග්‍රන්ථය ශුද්ධ වූ නමුත් අපගේ ප්‍රමාදදියෙන් තවත් අශුද්ධ ස්ථාන ඉතිරි ව තිබිය හැකි බවත්, එබඳු තැන් ශුද්ධ කර ශිෂ්‍යයන්ට ඉගැන්වීම සුධීන්ට අපහසු නො වන බවත් සඳහන් කරමු.

Weliwitiye Sorata.

2478
1934 ජුලි 25 වෙනි දින
විද්‍යෝදය පිරිවෙණේ දී ය:

පරිකථා

සහිත

# දහම්සොඬකාව.

## නමො බුඬාය.

ශ්‍රීමත්සුගතතථාගතයන් වහන්සේගේ පෙරසිරිතක් පවසනු වස් **දහම්සොඬකාව** කරණු කැමැති **අලගියවන්න මුකවෙටිතුමානෝ** නිර්විඝ්නපරිසමාප්ත්‍යාදි අර්ථයන් තකා ඍෂ්ටදෙවතාසඞ්ඛ්‍යාත රතනත්‍රය ප්‍රණාමය කරණුවෝ “සවුදෙව් සැවු” යනාදිය කියත්.

1. **සවුදෙව්සැවු** [1] **වො** **රද**
**පසුන් කල තිත්මුව** **රද**
**මැඩ හල කොලෙස්** **රද**
**වඳිම් අදරින් සුගත්ගත** **රද**

**අන්වය:–** සවුදෙව්සැවු වොරද තිත්මුවරද පසුන් කළ කොලෙස්රද මැඩ හළ සුගත් ගතරද අදරින් (මම) වඳිම්.

**පරිකථා:–** 1. **‘සවුදෙව්සැවු’**-(දෙවියන්ගේ සැව්ව=දෙව් සැව්ව. සව්වෝ ම දෙව්සැව්ව=සවුදෙව්සැව්ව.) විභක්තිසමාස ගර්භිවිශෙෂණසමාසයි. “රූපක සමාස” යනු ද මෙබඳු සමාස යන්ට නමෙකි. (“රූපක” යනු උපමාඋපමෙය දෙක එකක් ලෙස සැලකීම යි. මෙහි උපමෙය වූ සව්වන්ගේත් උපමා වූ දෙව්සැව්වෙත් අභෙදය පැණේ.) “තිත්මුවරද” යනාදිය ද එබඳු ය. සාවකවාචි ‘සවු’සදත් චාපවාචි ‘සැවු’සදත් ‘ව්’ කාරාන්ත නො වේ. ‘වු’කාරාන්ත ය. පදසිද්ධියෙහි ‘සව්වා, ‘සව්වෝ’ යි ද, ‘සැව්ව’ යි ද වකාරය ද්විත්වයට යන්නේ උකාරාන්ත හෙයිනි. මේ දෙසද ‘මහලු, පොතු’ යනාදි ශබ්ද ගණයට ඇතුළත් ය. ‘ව්’කාරාන්ත වුවොත් වකාරයට ද්විත්ව නො වේ. පව් කව් යනාදීන් ‘පව, කව’ යන විසින් වර නැහෙන්නාක් මෙනි.

---

[1] සව දෙව සැව

'සවු' සඳ 'සාවක' යන්නෙන් ආයේ ය. වචන අසනුයේ සාව කයි. 'සැරියුත්' ආදි බුදුන්වහන්සේගේ ශිෂ්‍යයෝයි.

**සංලක්‍ෂ්‍යː**– සුගතයන් වහන්සේ මේඝරාජත්‍වයෙන් රූපිත බැවින් තදීයශ්‍රාවකයෝ මේඝාවයව ඉන්‍ද්‍රචාපත්‍වයෙන් රූපිතයහ.

2 **'දෙව්සැවු'** යනු වාතවේගයෙන් අහසට ගත් දිය මත ආලෝකය වැටීමෙන් මැවෙන්නකි. පෘථිවිය ගොලාකාර හෙයින් හෙ ද චාපාකාර වේ. අතිපුරාතනයෝ ඒ පැණෙන්නේ ශක්‍රයා ගේ දුන්න යයි සිතා ඊට 'ඉන්‍ද්‍රචාප, දෙවධනුස්' යනාදි නම් ද යෙදූහ.

3. **'වොරද'**- 'වොරද-බැබලුම්හි' දයින් නිපන් අතීතකාලීනකාරකකෘදන්තයි. 'වොරැදි' යනු මූලයයි. අ, ඉ දෙකට අකාරා දෙශයි. ඒ 'සුගත්ගතරද' යන්නෙහි තුල්‍යාධිකරණවිශෙෂණයි. මේ දයෙහි මූලය 'වි' පූර්‍ව 'රාජ' ධාතුවයි. සිංහලයෙහි දී විකෘත වූ විළපසනීය ධාතුවෙහි අවයවයක් ලෙස ම ගැණෙ. වජඹ, සලකා, පවත් යනාදිය මෙති.

**සංː**– මේඝය ඉන්‍ද්‍රචාපයන්ගෙන් බබලන්නාක් මෙන් බුදුහු ශ්‍රාවකයන්ගෙන් බබලති.

4. **'සාල'**– 'සර' දයින් අතීතකාලීනකාරක උප්‍රත්‍යය වීමෙන් සිද්ධයි. ප්‍රත්‍යයට අකාරාදෙශයි. තුල්‍යාධිකරණවිශෙෂණ හෙයින් මින් පර වූ සාම්විබත්පස ලොප් වී ය. සමාසයක් නැත ද, තුල්‍යාධිකරණවිශෙෂණයන්ගෙන් පර ව යෙදෙන සියලු විභක්තිහු සිංහලයෙහි දී බෙහෙවින් ලොප් වෙති.

5. **'තිත්මුවරද'**– 'තිත්' යනු තිත්‍ථිය' යන්නෙන් ආයේ ය. ඔහු තම මිසදිටු ගත්තාහුයි. **'මුවරද'** යනු 'මකරන්ද' ශබ්දයෙන් භින්නයි. මල්පැණියට ඒ නාමෙකි. ('තිත්හු ම මූවරද' යනු විග්‍රහයි.)

**සංː**–යම් සේ මේඝය මකරන්ද වනසා ද, එසේ ම බුදුහු තීර්ථකයන් වනසති. ති ් සඞ්ඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටි වනසන හෙයිනි. මකරන්දය මඞ්ගලසම්මතවස්තුවක් හෙයින් ඒ වැනසීම දක්වනු මේ මඞ්ගලාචරණයෙහි අනුචිතයයි සමහරු කියති. මකරන්දය නසා ලීම මේඝයාගේ ස්‍වාභාවික ගුණයක් හෙයින් එය දැක්වීම කිසි සේත් අනුචිත නො වේ. මඞ්ගලාචරණයෙහි "තිත්ගජකැතට කෙසරා" යනුවෙන් **මුවදෙව්දාහි** මඞ්ගලසම්මත හස්තීන්ගේ ද, 'කුමතිකුමුදනාසං බුද්ධපුබ්බාචලග්ගා' යනුවෙන්

**සමන්තකූටවණ්ණනා**වෙහි මඞ්ගල සම්මතකුමුදයන්ගේ ද වැන සිම දැක්වූහ. එසේ ම මෙහි ද මකරන්ද විනාශය මෙඝායතන ගුණයක් හෙයින් ඒ දැක්වීම නිදොස් වේ. 'මුවරද' යන්නට 'මිරිඟු' යයි අරුත් බිණීමට ඇතැම්හු සැරසෙති. එහෙත් ඔහු ඒ අර්ථයෙහි මේ සද යෙදුනු අන් තැනක් දැක්විය නො හෙති.

6. **'මැඩ'**– 'මඩ–මැඩුම්හි' දයින් නිපන් පෙරකිරියපදයි. 'ඇ'හට අකාරාදෙශයි.

7. **'හල'**– 'හර' දයින් නිපන් කෘදන්තයි. 'සාල' යනු මෙනි. මෙහි මූලය 'හළ' යනු බව "බරත සැක හළවෝ" යන ගුත්තිල පාඨයෙන් පැහැදිලි වේ.

8. **'කොලෙස්රද'**– සිත කිලුටු කරණ ලොභ, ද්වෙෂ, මොහ, මද, මානාදීහු කොලෙස් නම් වෙති. 'කිලෙස' යනු පාළියි. 'රද' යනු 'රජ' යන පාළි සදින් නිපන්නයි. ඒ ධූලි වාචකයි. (කොලෙස් ම රද=කොලෙස්රද.)

**සං:**– මෙඝය රජස් නසන්නාක් මෙන් බුදුහු කොලෙස් නසති.

9. **'වඳිම්'**–'වඳ–වැඳුම්හි' දයින් නිපන් වර්තමානකාලාඛ්‍යාතයි.

10. **'සුගත්ගනරද'**– (සුගත් ම ගනරද=සුගත්ගනරද.) 'සුගත්' යනු සුගත ශබ්දයෙන් නිපන්නයි. (මාතෘ භාෂාවන්හි **අකාරාන්තශබ්ද** සිංහලයට පැමිණිවිට බොහෝ සේ ව්‍යඤ්ජනාන්ත වේ. **වඞ්ගභාෂා**යෙහි ද මේ රීතිය ලැබේ. එහෙත් වඞ්ගයෝ අකාරාන්ත වශයෙන් ලියා හලන්තවශයෙන් උසුරුවති. සිංහලභාෂාව ද වඞ්ගභාෂාවෙන් පැමිණියකැයි කියති.)

11. **'ගනරද'**–'ගන' සද මෙඝවාචී 'ඝන' ශබ්දයෙන් නිපන්නයි.

**සං:**– මෙහි නමස්කාරය මෙඝරාජයාට නො ව බුදුරදුන්ට ම වේ.

**2.** **මොක්වෙරලින් දිමු** **ත්**
**මගපලඅමාරස යු** **ත්**
**සෙවි මහසවුසියො** **ත්**
**සදම් මහගඟ සදම් මුදුන** **ත්.**

**අ** – මොක්වෙරලින් දිමුත් මගපලඅමාරසයුත් මහසවුසියොත් සෙවි සදම් මහගඟ මුදුනත සදම්.

**පරිභාෂා:**– 1. **'මොක් වෙරලින්'**–(මොක් ම වෙරල=මොක් වෙරල.) 'මොක්' නම් නිර්වාණයයි. එහි වන්විට ඉපදුම්, දිරුම්,

මැරුම් ආදි සංසාරදුඃඛයෙන් මිදෙන හෙයින් ඒ 'මොක්' නම් වේ. **'වෙරල'** යනු 'වෙලා' ශබ්දයෙන් පැමිණියකි. මේ ම 'වෙලල' සි ද ලැබේ. සද්ධර්මය මහගඟකැයි ගත්කල එහි වෙරල වශයෙන් ගැණෙනුයේ මොක්ෂයයි. ගඟ වෙරළ නො ඉක්ම පවත්නාක් මෙන් සද්ධර්මය මොක්ෂය ඉක්ම නො පවත්නා හෙයිනි.

2. **'දිමුත්'**– 'දීප්තිමත්' ශබ්දයෙන් භින්නයි.

3. **'මගපල අමාරස'**– (මග ද පල ද=මගපල) 'මග' නම් සම්‍යග්දෘෂ්ටි ආදිඅවයව අට එකොකිනුදු නො අඩු ව එකවිට ම යෙදී පවත්නා චිත්තයයි. නිවන් කැමැතියන් විසින් දීඝීකාලාන්තර යක් මාර්ගණය (–සෙවීම) කරණු ලැබෙනුයෙන් ඒ එනම් වේ. සෝවාන්, සෙදගැමි, අනගැමි, රහත් යි මාර්ග සතරෙකි. මෙයින් එකොකින් එකොකින් නොයෙක් කෙලෙස් නසනු ලැබේ. නිවන් යනුයේ පිළිවෙළින් මේ මාර්ග සතරට ම පැමිණේ. 'පල' නම් මාර්ගචිත්තයට අනතුරු ව ම ඒ මාර්ගසංඛ්‍යාතලොකොත්තර කුශලයාගේ විපාකවශයෙන් උපදනා චිත්තයයි. ඒ ද අවස්ථා භෙද වශයෙන් 'සෝවාන්' ආදි වශයෙන් සතරෙකි. (අමා වූයේ ද ඒ රස වූයේ ද=අමාරස; මගපල ම අමාරස=මගපලඅමාරස.) මෙහි 'අමා' සද මධුර වාචී ද, 'රස' සද ජලවාචී ද වෙයි. 'මිහිරි දිය' යනු අර්ථයි.

**"අමාරස"** යනු සුධාභොජනයට ද නමෙකි. ඒ අර්ථය මෙහි නො යෙදේ.

**සං:**– ධර්මය ගඞ්ගාත්වයෙන් රූපණය කොට, මාර්ගඵල එහි වූ අමාරස ලෙස තැකිත.

4. **සෙවි** යනු 'සෙවු–සෙවුම්හි' දයින් අතීතකාලිකකර්ම කාරක ඉ ප්‍රත්‍යය කොට සිඬ කරණු ලැබේ.

5. **'මහසවුසියොත්'**–'මහසවු' නම් සාප්සුවහසක් පිරූ පෙරුම් ඇති ප්‍රධානබුඬශ්‍රාවකයෝයි. උන්වහන්සේලාගේ නාමා දිය **අමදානාවහයෙහි** කී නියායෙන් දත්තෝ ය.

'සියොත්' සද මෙහි පක්ෂිවාචි ය. කෑදැතිවාචි 'සියොත්' සදක් ද විද්‍යමාන ය. ඒ 'වාතක' සදින් නිපන්නේ යි. ඒ ම රූඪි වශයෙන් සිංහලයෙහි දී පක්ෂිවාචක ද වේ. මුලින් දැක්වූයේ එයයි.

6. **'සඳම්මහගඟ'**- යන්නෙහි මූලය 'සද්ධම්මමහාගඞ්ගා' යන්නයි. 'සදම්' නම් බුදුන් වදාළ පයර්‍යාප්ති ප්‍රතිවෙධ වශයෙන් දෙවැදෑරුම් වූ සද්ධර්‍මයයි. 'පයර්‍යාප්තිධර්‍ම' නම් තුන්පිටකයයි. 'ප්‍රතිවෙධ ධර්‍ම' නම් මාර්‍ග, ඵල, නිර්‍වාණ යන නවයයි. සත්පුරුෂ යන්ගේ ධර්‍ම නුයි 'සද්ධම්ම' නම් වේ.

7. **'සඳම්'** යනු 'සඳ-සෑදුම්හි' දයින් නිපන් වර්‍තමානකාල උත්තම පුරුෂ එකවචනාන්තආඛ්‍යාතයි.

8. **'මුදුනත්'** යනු එලිසමය සඳහා විභක්තිප්‍රත්‍යය ලොප් වීමෙන් ප්‍රකෘතියෙන් සිටි තැනි.

අන්තයෙහි වූ 'අත්' යන්න ස්වාර්‍ථයෙහි ය. 'මුදුන' යන්නෙන් ලැබෙන අර්‍ථයට වැඩියක් 'මුදුනත්' යන්නෙන් නොලැබෙන හෙයිනි. එ ද පාලියෙහි පාදපූරණයෙහි වැටෙන 'අන්ත' සඳින් ආයේ යි.

**සං**:- මුදුනෙහි සැදුම නම් මස්තකයෙන් දැරීමයි. ධර්‍මය මුදු නෙන් පිළිගෙණ, එලෙස පිළිපදනෝ ධර්‍මයෙන් මස්තකය සජ්ජිත කෙරේ. මෙයින් ධර්‍ම නමස්කාරය කීහ. මේ කව **පැරැකුම්බා සිරිතෙහි**

"මුනිමුවයින් පග ළ-මහපල සිලිල සිහිල ළ
පිවිතුරු මොක් වෙර ළ-වඳිම් අදරින් දහම්ගඟලෙ ළ"

යන කව හා **කාව්‍යශෙඛරයෙහි** "සෙව් සුවිමල්සවග" යනාදි කව ද බලා සරණලද්දක් සේ පැණේ.

**3. සෙව් මුනිසඳ නිම ළ**
**වැජඹි සදහම්නුබන ළ**
**සිල්කැලුමෙන් උදු ළ**
**වදිම් නිති මහසඟනතුරුවැ ළ**

අ:-නිමල මුනිසඳ සෙව්, සදහම් නුබතල වැජඹි, සිල්කැලු මෙන් උදුල, මහසඟන තුරුවැල නිති වඳිම්.

**ප**:-1 **සෙව්**-'සෙවු' ධාතුයි. කතුකරුහි ඉපසයි. ඒ 'මහ සඟන' යන්නට තුල්‍යාධිකරණ විශෙෂණයි.

2. මුනි ම සඳ=**මුනිසඳ.**

3. **'වැජඹි'**-'වජඹ' ධාතුයි. කතුකරුහි ඉපසයි. පූර්‍වඅකාර යන්ට ඇකාර ව 'වැජැඹි' යි තුබූ තැන්හි මධ්‍යඇකාරයට අකාරා දෙශයි. 'මහසඟන' යන්නෙහි තුල්‍යාධිකාරණවිශෙෂණයි.

4. **'සඳහම්නුබනල'** යනු 'වැජඹි' යන්නෙහි ආධාරයි. ආධාර විභක්ති ඇ ප්‍රත්‍යයයට අකාරාදෙශයි. (නුබෙහි තල=නුබ තල. සදහම් ම නුබතල=සදහම් නුබතල.)

5. **'උදුල'**- පාළි 'උජ්ජල' ශබ්දයෙන් භිත්තයි.

6. **'නිති'** යනු නිපාතපදයි. සිංහලයෙහි ඇතැම් නිපාත විභක්තිප්‍රතිරූපකප්‍රත්‍යය ගන්නා හෙයින් මේ ද 'නිතියෙන්, නිතියේ' යන වසයෙන් ද පෙණේ.

7. **'මහසඟන තුරුවැල'** යනු එක ම සමාසපදයෙක් නො වේ. සමාස වුවොත් "මහසඟතුරුවැල" යනු ම වේ. 'මහ සඟන' යනු 'තුරුවැල' යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණ පදයි. සාමිවිභක්ත්‍යන්තයි. විශෙෂ්‍ය පදය පර වන විට සමාස නැති වතුදු විශෙෂණයාගෙන් පර වූ විබතට ලොප් කොට ශබ්දප්‍රකෘතිය තැබීම සිංහල භාෂාවෙහි බහුල ප්‍රයොගයි. නො එසේ වුව-

"අසිපත් සැපත්රඹ-වනට ගිහිගෙ **දළසඳ,**
**කිරණවට** සුනෙරමත්-වැසන් තමට සහස්රැස්" (මු. දා.)

යනාදි සියගණන් මහාකවිප්‍රයොගයෝ පදිදුබාදෙසින් නො මිදෙත්. ව්‍යාප්ත රීතිය මේ වුව ද, ඇතැම්තැන ඡන්දොරක්‍ෂණාදිහෙතුන් නිසා විබත් නො ලොපා ද තබති. මේ ද එබඳු ව්‍යක්තරූපකයෙකි.

**සං:**-තාරකා සඳ සෙවුනෝ ය. අහස්මැද සිටිනෝ ය. කැලු මෙන් යුතු ය. එසේ ම මහසඟ මුනිසඳ සෙවුනාහ. සදහම්නුබ තල වැජඹෙති. සිල්කැලුමෙන් උදුලයහ. එහෙයින් මහසඟ තුරුවැලකි.

| | | | |
|---|---|---|---|
| **4.** | **පස්නෙන** [1] **සහස්** | | **නෙන** |
| | **අට නෙන** | **තිනෙන බර** | **නෙන** |
| | **දිය නෙන** | **කමල** | **නෙන**[2] |
| | **දෙ නෙන** | **රැක දෙන යොමා දිව** | **නෙන** |

**අ:**-පස් නෙත-කමල නෙත (යන මොහු) දිවනෙත යොමා දෙනෙත රැක දෙත.

**ප:**- [1] **'පස්නෙන'** යනු එළිසමය සඳහා පාදන්තආකාරයට හ්‍රස්ව කිරීමෙන් සිඩයි. 'පස්නෙත්' යනු අන්‍යාර්ථසමාසපදයෙකි. මෙහි සමාසයෙන් සම්බන්ධය උක්ත වේ.

1 පසනෙත. 2 නුත.

‘නෙත් පසක් වූයේ යමෙකුට ද හේ=පස් නෙත්’ යනු විග්‍රහයි. ‘සහස්නෙත්’ යනාදීහු ද මෙසේ සි. “පස්නෙත්” යනු බුදුන්ට නමි. “පසැස්” යනු ද මේ අර්ථය ම ගෙණ දේ.

පසැස් නම් කවරැ? යත්:- මසැස, දිව ඇස, පැණඇස, බුදු ඇස, සමතැස යන මේ සි. ‘මසැස්’ නම් ප්‍රකෘති නෙත්‍රයයි. ‘දිව ඇස්’ නම් මැරෙණ උපදිනා සත්‍වයන් බැලිය හැකි, දුර පිහිටි අරමුණු පවා පැණෙන ඥානවිශෙෂයයි. ‘පැණ ඇස්’ නම් සියලු ධර්මයන් සියලු අයුරින් දත හැකි නුවණයි. ‘බුදුඇස්’ නම් සත්‍වයන්ගේ අදහස් උදහස් දැනගන්නා (ආශයානුශය) ඥානයයි. ‘සමතැස්’ නම් සියල්ල දන්නා නුවණයි. ඇසින් කරණ දෑය කරණ හෙයින් ඥාන ද ‘ඇස්’ නම් වී.

2. **‘සහස්නෙත්’**- දහසක් නෙත් ඇතියේ **ශක්‍රයි**. දහස් දෙනෙකුන් විසින් සිතන දෑ එකවිට සිතිය හැකි හෙයින් හේ මෙනම් වී. මේ නෙත් දහස ප්‍රකෘතිනෙත්‍ර යයි ගෙණ, ඒ ඉප දීමට හෙතුවශයෙන් නො ඇදහිය හැකි අසභ්‍යකථා පුරාණ ග්‍රන්ථයන්හි දක්වති. **ශක්‍ර** දහසක් නෙත් ඇත්තෙකැයි කවීහු ද කියති.

3. **‘අටනෙත්’- මහාබ්‍රහ්මයි.** හේ මුහුණු සතරක් ඇත්තේ ය. එහෙයින් මහාබ්‍රහ්ම අෂ්ටනෙත්‍ර ය.

4. **‘තිනෙත්’- ඊශ්වර** තෙමේ ය. ඔහුට නෙත් තුණක් ඇත්තේ ය. එක් නෙතක් නලළ මැද වෙයි.

5. **‘බරනෙත්’- කඳකුමරුයි.** මුණු සයක් ඇතියෙන් නෙත් දොළොසක් ද වේ. “බර” යනු පාළි “බාරස” ශබ්දයෙන් භින්න ය.

6. **‘දියනෙත්’**- (නෙත වැනි නුයි=නෙත්; දියට නෙත්=දිය නෙත්.) **සූර්‍ය්‍යයි**. රූපයන් හැඳිනීම වනුයේ නෙත්‍රයෙනි. සූර්‍ය්‍යයා නැති කල්හි රූපයන්ගේ හැඳිනීමෙක් නො ලැබේ. (ප්‍රදීපාදීහු ද සූර්‍ය්‍යයාගෙන් පුෂ්ට වෙතැයි කියති.) එහෙයින් සූර්‍ය්‍යයා මුළු ලොවට ම නෙත්‍රයෙක් වේ. ‘දිය’ සද ලොකවාචියි.

7. **‘කමලනෙත’**- යනු **විෂ්ණු**දෙවියන් සඳහා යෙදුනකි. ප්‍රබුද්ධ පද්මයක් වැනි මනොඥ නෙත්‍ර ඇති හෙයින් විෂ්ණු තෙම එනම් වේ. ‘කමලනත’ යනු ද පාඨයි. “කමලානාථ” යනු එහි මූලයයි. ‘කමලාවගේ (සිරිකතගේ) ස්වාමි’ යනු එහි අර්ථයි.

‘කමලනෙත’ යන්නට ‘පද්මාක්ෂි (=ශ්‍රී දෙවි) ය’යි සමහරුන් අර්ථ කියතත් ශ්‍රීවාචක පද්මාක්ෂිශබ්දයෙක් නැත්තේ ය.

8. **'දෙමනත'**– ආකාරයට හ්‍රස්ව වීමෙන් සිද්ධයි. 'දන' සදින් සමූහාර්ථයෙහි 'තා' ප්‍රත්‍යය කොට සිදත්හි සිදු කරණ නමුදු 'ජනතා' යන්නෙන් පැමිණියකැයි කිය යුතු වේ.

9. **'රැක දෙත'**– 'රැක' යනු 'රක්' දයින් නිපන් පෙරකිරිය පදයි. අනත්‍ය ඇකාරයට අකාරාදේශයි. 'දෙත' යනු 'දා (=දෙ) දයින් නිපන් වර්තමානකාලීනකාරකප්‍රථමපුරුෂ බහුවචනාඛ්‍යාතයි. "දෙත්"යි තුබූ තන්හි අකාරාගමයෙන් සිද්ධයි. ආශීර්වාදාර්ථය එහි අන්තර්ලීන ය. 'රැකදෙත' යනු එක ම පදයක් සේ ගැණේ. එහි උක්තය අධ්‍යාහාර කට යුත්තේ ය.

10. **'යොමා'**– 'යොමු' සදින් කරධාත්වර්ථයෙහි 'අ' ප්‍රත්‍යය කොට සිදු කර ගත් නාමධාතුවෙන් පූර්වක්‍රියා අ ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධ නාමධාතුකපූර්ව ක්‍රියාවකි.

11. **'දිවනෙත'**– කර්මවිභක්තිඑකවචනාන්තයි. දෙවියන්ට පෙරපින්බෙලෙන් ලැබෙන්නා වූ, ඉතාදුර පිහිටි අරමුණු පවා ගැණීමට සමර්ථ වූ, පිත් සෙම් ආදියෙන් පීඩිත නුවූ නෙත්‍රය 'දිවනෙත්' නම්. (දිව වූයේ ද ඒ නෙත් වූයේ ද ඒ නුයි=දිවනෙත්.)

**5. බඹඋපතින් සැප ත්**
**මහාසම්මතරජගො ත්**
**නුබතල මැද දිමු ත්**
**සරාපුන්සඳමඬලසිරි ග ත්**

**අර්ථ සරල (ඍජු) යි.**

**ප:**– 1. **'බඹඋපතින්'**– (බඹහුගේ උපත=බඹඋපත.) මෙහි 'බඹඋපත' යි ගන්නා ලද්දේ ලොකාරම්භයේ දී බඹලොවින් බඹුන් මෙහි පැමිණ තවාතැන් ගැණීමයි. (විස්තර **අග්ගඤ්ඤ්ඤසූත්‍රයේ** ලොකවිවරණ කථාවෙන් දත යුතු.)

2. **'සැපත්'**– යනු "සම්පත්ති" ශබ්දයෙන් බිඳුනේ ය. ඒ සම්බන්ධ විභක්තිරූපයි. (නොහොත් සම්බන්ධාර්ථයෙහි කර්මවිභක්ති රූපයි.) 'නුබතල' යන්නට තුල්‍යාධිකරණවිශෙෂණ හෙයිනි.

3. **'මහාසම්මතරජගොත්'**– (මහාසම්මත වූයේ ද හේ රජ වූයේ ද හේ නුයි=මහාසම්මතරජ. ඔහුගේ ගොත්.) මේ ද සම්බන්ධවිභක්ත්‍යන්තයෙකි. නොහොත් සම්බන්ධාර්ථයෙහි කර්ම විභක්ත්‍යන්තයෙකි.) විභක්තිප්‍රත්‍යයලොපය වී. "මහාසම්මත රජගොත් නුබතල"යි එක ම සමාසපදයක් සේ ගතොත් පදිදුබා දෙසට දෙර හැරියේ වේ. එහෙයින් ව්‍යස්ත සේ ම සැලකිය යුතු. (3–7 බලනු.)

‘මහාසම්මතරජ’ නම් කල්පාරම්භයෙහි සත්වයන් විසින් තමන්ට නිග්‍රහ අනුග්‍රහ කරණු සඳහා මහාජනසම්මතයෙන් පත් කර ගන්නා ලද **වෛවස්වතමනුරජ**යි. ඔහුගේ දරු මුනුබුරු පරපුර “මහාසම්මතරජගොත්” නමි. (**සැ.ස.කුම්බාසිරිතෙහි** නවවන කවෙහි පටන් මේ වංශකථාව පැණේ.) **ශාක්‍යවංශ** යනු ද මේ ගොත්‍රයට පසුකාලයෙහි වූ නාමයෙකි. **සිංහලරාජ වංශය** ද ශාක්‍යවංශයෙන් ම පැමිණියකි. එහෙයින් “**මහා සම්මතරජගොත් නුබතල මැද සරාපුන්සඳමඬලසිරි ගත්**”යි. කීහ.

4. **‘සරාපුන්සඳ මඬලසිරි’**– ‘සරා’ නම් වප් ඉල් දෙමසයි. ශරත්කාලයෙහි නභස්තලය (=අහස) නිර්මල වේ. වලා රහිත ය. එහෙයින් ඒ කාලයෙහි චන්ද්‍රයා අතිශයදීප්තිමත් වේ. පූර්ණ වන විට එහි ශොභාව අධිකතර වේ. ඔහුගේ සිරි ගතැයි කීමෙන් භුවනෙකබාහු රජයන් මහාසම්මතවංශයෙහි සෙසු රජුන් ඉක්මවා ශ්‍රීසම්පත්තියෙන් වැජඹෙන බව හැඟවූහ.

5. **‘ගත්’** යනු ‘ගන්–ගැණුම්හි’ දසින් අතීතකාලකෘත් කාරක උ ප්‍රත්‍යය හා, ‘න්’ කාරයට තකාර ද, ප්‍රත්‍යය ලොප ද කොට සාධ්‍යයි. ඒ ‘බුවනෙකබුජ’ යන්නට විශෙෂණයි.

**සං:**– මේ කව පටන් එකොළොස් වන කව තෙක් වූ කවි එකොළොස එක ම වාක්‍යයෙකි. පද්‍ය සතරකින් වඩා එක් ක්‍රියා කාරකපදසම්බන්ධයෙන් යුක්ත වූයේ **කුලක** නමි. කියනලද මැයි:–

ද්වාභ්‍යාං තු යුග්මකං ඥෙයං–ත්‍රිභිඃ ශ්ලොකෛර් විශෙෂකම්,
චතුර්භිස්තු කලාපං ස්‍යාත්–තදූර්ධ්වං කුලකං මතම්”යි.

පද්‍ය දෙකකින් **යුග්මකය** ද, පද්‍ය තුණකින් **විශෙෂකය** ද, දත යුතු. පද්‍ය සතරකින් **කලාපක** වන්නේ ය. ඉන් මත්තෙහි වූයේ **කුලක** යයි දන්නා ලදී–යනු භාවයි. අන්‍යපද්‍යයක් හා සම්බන්ධ නුවූයේ **මුක්තක** නම් වේ. කුලකයෙහි පද්‍යයක් පාසා අන්වය යෙදීමෙහි පූර්වාපරසම්බන්ධය ද සිතිය යුතු.

6 **බුවනෙකබුජනමි** **ත**
**පවර නරනිඳු සිත් ගෙ** **ත**
**නනතුරු ලත් නොමි** **ත**
**වැජඹි පරසිඳු වෙමින් හැමතැ** **ත**

අ:- බුවනෙකබුජනමින් පවරනරනිඳු සිත් ගෙණ නොමින් තනතුරු ලත්, හැම තැන පරසිදු වෙමින් වැජඹී— (අනන්තර පද්‍යය හා සම්බන්ධයි.)

ප:- 1. **'බුවනෙකබුජ'**-මෙහි 'බුජ' සද 'බාහු' යන්නට සමානාර්ථශබ්දයෙකි. 'බාහු' නම් කිසිල්ලෙහි පටන් මැදැගිල්ල තෙක් ඇති අවයවයයි. මෙයින් දක්වනලද්දේ සත්වන භුවනෛකබාහු රජතුමායි. හෙතෙම බු: ව: 2078 දී රාජ්‍යයට පැමිණ සත් හවුරුද්දක් විසී.

2. **'නමින'**- නම් සදින් කාරණවිබත් 'ඉන්' සයි. එළිසමය සඳහා අන්තයෙහි අකාරාගමයි.

3. **'නරනිඳු'**-යනු අලුප්තසමාසනාමයෙකි. 'නරන්හට ඉඳු' යනු විග්‍රහයි. 'නර' සදින් වූ සබඳවිබත් 'අන්' පස ලොප් නො වී ය. විබත් ලොප් වූ විට ලැබෙනුයේ 'නිරිඳු' යන්නයි. මෙහි 'ඉඳු' සද ශ්‍රෙෂ්ඨාර්ථවාචී ය. 'නරශ්‍රෙෂ්ඨ' යනු අර්ථයි. ඒ නම් රජයි.

4. **'සිත් ගෙණ'**- 'සිත්' යනු නපුංසකලිඞ්ගකර්මවිභක්ති බහුවචනාන්තයි. සිත් ගැණුම නම් අධ්‍යාශයානුකූල ව පැවැත් මෙන් සිත් සතන් තුටු කිරීමයි.

5. **'ගෙණ'** යනු 'ගන්' දයින් නිපන් පෙරකිරියපදයි. 'ගන්' දයින් පෙරකිරිය 'ඇ' පස කොට ගකාරසථ අකාරයට පරඇකාරහෙතුවෙන් 'එ' ආදෙශ කොට 'ඇ' යන්නට අකාරාදෙශ කොට නිපදවනු ලැබේ. ('ගන්' ධාතුවෙහි මූලය 'ගණ්හා' යන පාළික්‍රියාවයවයයි. හාකාරලොපයෙන් 'ගණ්'යි සිංහලයට පැමිණිවිට ස්වරරහිතමූර්ධන්‍ය 'ණ්' කාරය සිංහලභාෂාව්‍යවහාර යෙහි අප්‍රයුක්ත හෙයින් ඊට එළුවෙහි විද්‍යමාන 'න්' යන්න ආදෙශ කරණු ලැබේ. එහෙත් 'න්' යන්න ස්වරාරූඪ වන විට මූලාවස්ථාවට පැමිණ 'ගණි' යනාදිවසයෙන් පද සිද්ධ වේ. මේ පද්‍යයෙහි එළිසමය සඳහා 'ණ' කාරයට නකාරය ආදෙශ කොළේ ය. එළිසම කිරීම යමකාඞ්ගයෙකි. සංස්කෘතයෙහි යමකාඞ්ගවිෂයයෙහි "ර, ල" - "ඩ, ල" - "ශ, ස" - "බ, ව" යන අක්‍ෂරයන්ගේ සාම්‍යය තකති. (සකුබසෙහි මූර්ධන්‍ය වූ ළකාරයක් නැති හෙයින් මූර්ධන්‍ය වූ ර, ඩ දෙකට දන්තජ ලකාරය සම කොට ගණිති. සිංහලයෙහි ද යමකාඞ්ගවිෂයයෙහි 'න-ණ' "ල-ළ" යනාදීන්ගේ සාම්‍යය වේ.)

6. **'තනතුරු'** යනු 'ස්ථානන්තර' යන්නෙන් භින්නයි. නපුංසක ලිඞ්ගකර්මවිභක්ති බහුවචනයි.

7. **'ලත්'**- 'ලබ-ලැබුම්හි' ධාතුයි. අයුකල්සාපුකාරු 'උ' පස කොට 'බ'හට 'ද' කොට 'ලදු'යි සිද්ධ කර, පසු ව 'උ පස ලොපං දකාරට තකාර කිරීමෙන් සිද්ධ යි. ප්‍රත්‍යය ලොප් කළ නමුත් ඔහුගේ අර්ථය නො නැසී ධාතුවට ම එක් වී ය. මේ 'ලත්' යනු අටවැනි කවෙහි පැණෙන "පලිහ වඩවන මැනිඳු" යන්නට තුල්‍යාධිකරණවිශෙෂණයි. එහෙයින් සම්බන්ධවිභක්ත්‍යන්තයි. විබත්පස ලොප් වී.

8. **'පරසිඳු'** යනු 'ප්‍රසිද්ධ' යන්නෙන් භින්නයි. මේ වෙනු වට පූර්වමහාකවීන් විසින් ආදෘත වූයේ පාළි 'පසිද්ධ' ශබ්දයෙන් බුන් "පසිඳු" යන්නයි.

9. **'වෙමින්'** යනු නිෂ්පන්නනිපාතපදයෙකි. වූ ධාතුවෙන් 'මින්' පස යොදා 'වූ' යන්නට 'ව' ආදෙශ කොට වකාරසථඅකාර යට එකාරාදෙශ කොට ඒ නිපදවනු ලැබේ. (මිශ්‍රක්‍රියාවෝ ද නිපාතලක්‍ෂණයෙන් යුක්ත වෙති. සියලු ලිඞ්ග, විභක්ති, වචන, කාල, පුරුෂයන්හි නො වෙනස් ව පැවැත්ම නිපාතලක්‍ෂණයි.)

10. **'හැමතැන'**- 'හැම' සද සර්වාර්ථවාචි 'සම' සදින් ආයේ ය. 'ස්ථාන' ශබ්දයෙන් 'තැ න'යි බිඳේ. මෙහි ආධාරවිභක්ති 'ඇ'පසට අකාරාදෙශයි.

7 **සොත්වතු[1] යුතු නො ම ඳ**
**සව්සිරිනි සැදි මතන ඳ**
**සුදනන් රැඳි පබ ඳ**
**පාණබුනු කෝරළය බද සො ඳ**

අ:- නොමඳ සොත්වතු යුතු මතනඳ සව්සිරිනි සැදි සුදනන් පබඳ රැඳි සොඳ පාණබුනු කෝරළය බද- (අනන්තර පද්‍යය හා සම්බන්ධයි.)

ප:- 1. **'සොත් වතු'**- 'යුතු' යන්නෙහි කරණයි. කරණ විභක්තිප්‍රත්‍යයට ලොප් වී. 'සොත්' නම් ධාන්‍ය වපුරණ කුඹුරුයි. 'වතු' යන්නෙන් ගැණෙනුයේ ගෘහොද්‍යානයි.

1 සොත්වත්.

මේ 'වතු' යන්හෙහි මූලය වූ 'වත්‍ථු' ශබ්දය ගෘහොද්‍යාන වාචක නො වේ. එයින් ලැබෙනුයේ 'ගෘහාරාම තැනීමට ආධාර වන ඉඩම' යන අර්‍ථයයි. 'විහාරවත්‍ථු' නම් විහාරය සදනු ලබන ගෙපලයි. 'ආරාමවත්‍ථු' යනු ආරාම (උයන්) තනනු ලබන ඉඩමයි.

2. **'නො මඳ'**– 'සොත්වතු' යන්නට විශෙෂණ හෙයින් කාරණවිභක්ත්‍යන්තයි.

3. **'සැදි'**- 'සද–සැදුම්හි' ධාතුයි. අතීතකාර්‍ත්‍රර්‍ථකාරක 'ඉ' ප්‍රත්‍යයයි. 'සව්සිරිති' යනු සැදි යන්නෙහි කාරණයයි. 'සැදි' යනු ද 'සෝරළය' යන්නෙහි විශෙෂණයි.

4. **'රැඳි'**- 'රඳ–රැඳුම්හි' දයින් ආධාරකාරකයෙහි 'ඉ' පස කිරීමෙන් සිද්ධයි. "සුදනන්" යන්න එයින් හැඟෙන ක්‍රියාවෙහි අනුක්තකර්‍තෘයි. මෙහි 'ඉ' පසින් රැඳීමට ආධාරය වන පදාර්‍ථය උක්ත වේ (=කියවේ). ඒ නම් සෝරළයයි. එහෙයින් ම ඊට තුල්‍යාධිකරණ විශෙෂණයි. සම්බන්ධවිභක්ත්‍යන්තයි.

5. **'පබඳ'** යනු 'රැඳි' යන්නෙන් හැඟෙන ක්‍රියාවට විශෙෂණයි. 'ප්‍රබන්ධයෙන් හෙවත් අතර නැති ව' යනු එහි අර්‍ථයි. "ප්‍රබන්ධයෙන් රැඳි"යි කී කල්හි රැඳීමෙහි විශෙෂයෙක් හැඟේ.

6. **'පාණබුනු සෝරළය'**– වර්‍තමාන පළාත්බෙදුමේ අයුරු මේ සෝරළය **සල්පිටි** සෝරළයයි හැඟේ.

7. **'සෝරළ'** යන්නෙහි ප්‍රභවය 'කුරණ්ඩ' යයි කියනත් ඒ පිළිගත නො හැක. 'කුරණ්ඩ' යනු මෑත දී කල්පිත ශබ්දයෙකි. එබඳු සදක් ඒ අර්‍ථයෙහි පාලිභාෂාව්‍යවහාරයෙහි නො පැණේ. පාළියෙහි ඇතත් බිඳිය හැක්කේ 'කුරට' කියා ය. සෝරළ සද සිංහලභාෂාවට ඇතුළත් ව අවුරුදු සත්සියයකට වඩා ගත වී නැත. ඉන් පැරණි ලිපිවල ඒ නො පැණේ. කාරුණු මෙසේ හෙයින් දෙමළබසින් හෝ දකුණු ඉන්දියාවේ ව්‍යවහාරප්‍රාප්ත භාෂාවකින් හෝ පැමිණියකැයි නිශ්චය කළ යුතු වේ.

8 **මාම්පය නම් ස** රැ
**පියෙස**[1] **හිමි වන සිව්තු** රැ
**විජයදජ නම් ග** රැ
**පලිහ**[2] **වඩවන මැතිඳු මුතුබු** රැ

---

1 පියස. 2 පලිය.

අ:– මාම්පය නම් සරු ජිවිතුරු පියෙස හිමි වන ගරු විජය දජ නම් පලිහ වඩවන මැතිඳු මූනුබුරු--

ප:- 1. **'මාම්පය'**– මහ+අඹ+පා යන ශබ්දයන් අන්‍යාඩි සමාස වීමෙන් 'මාම්පා' යනු සිද්ධ වේ. 'මහ අඹපා වනුයේ යම්තැනෙක්හි ද ඒ' යනු විග්‍රහයි. මෙහි යෙදුනෝ ඒ සදෙහි සම්බන්ධකවචනයි. 'පියෙස' යන්නෙහි විශෙෂණයි.

2. **'නම්'**– නිපාතපදයෙකි. 'නාම' යන්නෙන් නිපනයි. 'නම්' සද [illegible]සින් අනෙකකි.

3. **'පියෙස'** යනු 'පදෙස' සදින් 'පෙදෙස්=පෙයෙස්=පියෙස්'යි ක්‍රමයෙන් බිඳී ආ 'පියෙස්' සදින් නිපන් සම්බන්ධවිභක්ත්‍යන්ත පදයෙකි. 'හිමි' යන්නෙහි සම්බන්ධයයි

4. **'විජයදජ පලිහවඩවන මැතිඳු'**– 'විජයදජ' යනු නාම යයි. 'පලිහවඩවන' යනු ඔහුගේ තනතුරයි. 'පලිහ' යනු සතුරන් විසින් දෙනු ලබන පහර වළකනු පිණිස යුදකරුවන් අත තිබෙන ලොහොමුවා වූ හෝ සම්මුවා වූ උපකරණයකි. එය තිසි තැන රජතුමන්ට පිළිගන්වනුයේ පලිහවඩවන නිලමේ ය. මෙතෙම රජහුගේ ආරක්‍ෂකාමාත්‍යයා යයි හැඟේ. 'මැතිඳු' යන්නෙන් පර සම්බන්ධවිභක්තිප්‍රත්‍යය ලොප් වී ය.

5. **'මූනුබුරු'**= 'නප්තෘ' ශබ්දයෙන් 'නබුරු'යි බිඳී ආදියෙහි මකාරාගමාදියෙන් සිද්ධ ශබ්දයෙකැයි කියනු ලැබේ එහෙත් පුරාතන ශිලාලිපිවල 'මනුමරක'යි ද, ඉන් මෑත ලිපිවල 'මුනුම්බුරු–මිනුපුරු'යි ද දක්නා ලැබෙන හෙයින් මෙහි මූලය අනෙක් සදකැයි සිතිය හැක.

**9. රුපුරජගජන් එ ඞි**
**බිඳ හළ කෙසර මෙන් දූ ඞි**
**රිවිකුලපහග කො ඞි**
**රාජසිහරජු[1] පාසෙවන වැ ඞි**

අ:– කෙසර මෙන් රුපුරජගජන් දූඞි එඞි බිඳ හළ රිවිකුල පහග කොඞි රාජසිහරජු පාසෙවන වැඞි—

ප:– 1. **'රුපුරජගජන්'**– රුපුහු වූවාහු ද ඔහු රජහු වූවාහු ද ඔහු ම නු සි රුපුරජහු. රුපුරජහු ම ගජහු=රුපුරජගජහු. ඔවුන්. සම්බන්ධවිභක්ත්‍යන්තයි. 'රුපු' සද 'රිපු' සදින් ආයේ ය.

---

1 රජ.

2. **'එඩි'**– 'බිඳහළ' යන්නෙහි සාමීයි. 'දූඩි' යනු නාවිශෙෂණයි.

3. **'බිඳහළ'**– 'බිඳ' යනු 'බිඳු–බිඳුම්හි' දයින් 'අෑ' ප්‍රත්‍යය වී සිද්ධ පෙරකිරියපදයෙකි. 'හළ' යනු 'හර' දයින් නිෂ්පන්න ය.

4. **'කොසර'**–'මෙන්' නිපාතයොගයෙහි සාමිවිභක්ත්‍යන්ත යි. 'කොසර' නම් කෙසරසිංහයායි. සිංහයෝ–තෘණසිංහ ය, කාල සිංහ ය, පාණ්ඩුසිංහ ය, කෙසරසිංහ යයි සිව්වැදෑරුම් වෙත්. ඔවුනතුරෙන් කෙසරසිංහ තෙමේ ලාකඩින් කැටයම් කළාක් වැනි මුඛයෙන් හා වාලධියෙන් ද පාදාග්‍රයන්ගෙන් ද යුක්ත වේ. හිසෙහි පටන් නගුට දක්වා පිට මැද මනහර රේඛා තුණෙක් වේ. ග්‍රීවායෙහි වූ ලොම්රුස මහාඝී වූ කම්බලයක් මෙන් දිලි සෙයි. හේ ඇතුන් මත පැන නියෙන් කුඹ පළා හිස්මොල ගෙණ කන්නේ ය. ඔහුගේ නාදට ද හැමසත්හු බිය වෙති. **රාජසිංහරාජයා** ඔහු මෙනැයි කිමෙන් රජුගේ තෙජොබල පරාක්‍රමය මහත්බව හැඟවී.

5. **'රිවිකුලපහගකොඩි'**– 'රිවිකුල' නම් මහාසම්මත වංශ යයි. සූය්‍ර්‍යයාගෙන් පැවතෙන හෙයින් ඒ එනම් වී. ප්‍රාසාද මස්තකයෙහි බැඳි කොඩිය සෙසු ගෘහාවයවයන්ට වඩා උච්චෛස්තර වේ. එයින් ප්‍රාසාදය විශෙෂශොභාවක් උසුලයි. රාජසිංහරජ ද සූය්‍ර්‍යකුල නමැති ප්‍රාසාදයට කොඩියකි. ඔහුගෙන් ඒ කුලය ශොභාවත් වී යයි මේ කිවිහු මෙයින් හඟවති.

6 **'රාජසිහරජ'**– මෙහි 'සිහ' සද ශ්‍රෙෂ්ඨාර්ථවාචී ය. මේ තෙම පළමුවන රාජසිංහයි. විස්තර **ලඞ්කාකථාදි** ඉතිහාසග්‍රන්ථ යන්ගෙන් දතයුතු.

7. **'පාසෙවන වැඩි'**– මෙයින් **සමරදිවාකර** මැතිඳුන් **රජසිහරජුගේ** ආශ්‍රයයෙහි වැඩුනු බව කීහ. "පාසෙවන" යනු ගැණීමෙන් රජු කෙරෙහි වූ නීමගුණය ව්‍යක්ත කෙරේ. නීමාදි නෘපගුණ හෙයින් රජු ලඟ වැඩිය නො හැක. එසේ ම ඔහුගේ 'පාදයට ද ලං විය නො හැක. එහෙයින් පාදයාගේ සෙවනෙහි වැඩුනේ ය. එසේ ම 'රජුට සැළ කරණ ලදැ'යි කිය යුතු තැන 'රජවාසලට සැළ කොළේ ය'යි ද 'රජුගේ පා වැන්දේ ය'යි කිය යුතු තැන '(කර මුදුනේ වහන්සේ=) රජුගේ උපාහනච්ඡායාව මස්තකයෙහි කොළේ ය'යි ද කියති. එබඳු යෙදුම්වලින් මහත් වූ ගෞරවයෙක් දක්වනු ලැබේ.

8. **'වැඩි'**– 'වඩ–වැඩුම්හි' ධාතුයි. කතුකරුහි 'ඉ' පසයි·

10. **සුගුණරුවනා** **කර**
**යසසින් සරිසුඳ** **කර**
**මෙ සමරදිවා** **කර**
**මුකවෙට්ටි මැතිසඳ දයා** **කර**

අ:- සුදකර සරි යසසින් (යුත්) සුගුණරුවනාකර දයාකර මේ සමරදිවාකර මූකාවෙට්ටි මැතිසඳ-

ප:- 1. **'සුගුණරුවනාකර'**- මනාගුණ=සුගුණ. මේ වනාහි විශෙෂණසමාසයෙකි. (තුල්‍යාධිකරණවිශෙෂණයක් පෙරටු වූ අන්‍යපදාර්ථයක් අපෙක්‍ෂා නො කරණ සමාසය 'විශෙෂණසමාස' නමි. 'කර්මධාරය' යනු ද ඊට ම නමි.) මෙහි 'සු' සද 'ගුණ' සදට තුල්‍යාධිකරණවිශෙෂණයි. **සිදත්සඟරාහි** මෙබඳු සමාස ද අව්‍යය සමාස යයි ගණිතත් මාතෘභාෂාව්‍යාකරණයන් හා ඒ නො ගැළපේ. (සුගුණ ම රුවන්=සුගුණරුවන්. සුගුණරුවනුන්ට ආකර=සුගුණරුවනාකර.)

**'ආකර'** යනු රත්නාදීන් උපදින තැනයි. මේ **සමර දිවාකර**මන්ත්‍රි ද සුගුණයන්ට ප්‍රසවභූමියකි. සුගුණයන් රුවන් ලෙස සැලකෙන කල්හි මන්ත්‍රිහු ද ආකරයක් වශයෙන් ගැණුම යුතු ය. එහෙයින් 'සුගුණරුවනාකර'යි කිහ. ඒ ප්‍රථමා විභක්ත්‍යන්තයි.

2. **'යසසින් සරි සුදකර'**-'යසස්' යනු කිර්තියයි. ඒ ශ්වෙත වර්ණය යනු කවිසමයයයි. (විද්‍යමාන වුවත් නුවුවත්, මේ දෙය මෙබඳු ය යි පූර්වකවීන් විසින් කර ගන්නාලද සම්මතය කවිසමය යයි.) සුධාකර(=චන්ද්‍ර)යා ද සුදු ය. එහෙයින් යශස චන්ද්‍රයාට සමාන වේ. 'යසසින්' යනු උපලක්‍ෂණාර්ථයෙහි කරණයි. 'කීර්තියෙන් චන්ද්‍රයා සමාන' යි ඇතැම්හු අර්ථ කියති. අනන්තර පද්‍යයෙහි චන්ද්‍රොපමාව ව්‍යක්ත ව පෙණෙන හෙයින් ඒ අර්ථය මෙහි නො යෙදේ.

3. **'මුකවෙට්ටි'**- "මූකාවෙට්ටි" යනු විනිශ්චයකාරයින්ට නමෙකි. ඒ බව හංසසන්දෙශයෙහි කියන ලදී. 'මොහොට්ටි' යනු ද ඊට පර්‍යායයෙකි.

4. **'මැතිසඳ'** යන තන්හි 'සඳ' සද උත්තමාර්ථයෙහි ය.

11. **ගුණඅමරසින් කො** **ද**
**පුබුදු කර දනමනකො** **ද**
**සියකුල ගුවන් මැ** **ද**
**දිලේ පුන්සඳයිරින් හැමය** **ද**

අ:- සොඳ ගුණඅමරුසින් දනමනසොඳ පුබුදු කර සියකුල ගුවන් මැද හැමසඳ පුන්සඳසිරින් දිලේ.

ප:- 1. **"ගුණඅමරුසින්"**- දෙවියෝ සඳෙහි අමෘතය රැස් කර තබති. පුරපස පසළොස් දවසෙහි ක්‍රමයෙන් අමෘතය රැස් කරණ හෙයින් චන්ද්‍රයා ඒ කාලය තුළ වැඩේ. චන්ද්‍රයා පිරිගිය පසු දෙවියෝ අමෘතපානයට පටන් ගණිති. ක්‍රමයෙන් පානය කොට අවසන් වූ කල චන්ද්‍රයා නො පෙණී යයි. ඒ දුක නැවත ද එහි අමෘතය රැස් කරති. මෙසේ හෙයින් චන්ද්‍රමණ්ඩලය අමෘතයෙන් වැඩෙන්නෙක යනු **පුරාණාගත** කථායි. එහෙයින් සඳමඬලින් නිකුත් වන රශ්මිය ද අමෘතරශ්මි වෙයි. මෙහි අමරුස් බැවින් රූපිත වූයේ ගුණයි. 'රුසින්' යන්නෙහි ප්‍රකෘතිය 'රස්' යන්නයි. වර්තමානව්‍යවහාරයෙහි ඒ 'රැස්'යි ලැබේ.

2. **'කර'** යනු 'කර- කිරීමෙහි' දයින් 'ඇ'පස වීමෙන් 'කැරැ'යි නිපන් පෙරකිරියපදය උච්චාරණසෞකර්‍ය්‍යහෙතුවින් විපර්‍ය්‍යස්ත වූ තැනි.

3. දනන්ගෙ මන=දනමන. දනමන ම සොඳ=**දනමන සොඳ.** 'සොඳ' නම් රාත්‍රිකාලයෙහි පිපෙන්නා වූ පුෂ්පවිශෙෂ යෙකි. ඔවුන්ගේ පිපුමට සඳරුස කාරුණු නො වතුදු, 'කුඳ යෝ සඳරුසින් පිපෙති' යනු කවිසමයයි.

ප:- මෙහි ජනමානසයන් කුඳකඩයෙන් රූපිත ය. 'ගුණ අමරුසින් දනමනසොඳ පුබුදු කර' යනු 'ගුණධර්මයන්ගෙන් ජන යන් තුටු කොට'යි කී තියායි.

4. **'සියකුලගුවන්'** යනු ද විශෙෂණ සමාසයෙකි. මෙසින් වංශය ගගනකඩයෙන් රූපිත ය. **සමරදිවාකර** මැතිඳුන් පුන් සඳක් සේ සැලකෙන හෙයිනි.

5. **'දිලේ'** යනු 'දල්—දිලුම්හි' දයින් නිපන් වර්තමාන කාලික ප්‍රථමපුරුෂ (=අන්‍යකාරක) එකවචනක්‍රියාපදයි. 'දල්' ධාතුව අකර්මක ය.

6. **'පුන්සඳසිරින්'**- පුන් වූයේ ද ඒ සඳ වූයේ ද ඒ නුයි= පුන්සඳ. පුන්සදේ සිරි=පුන්සඳසිරි.

ස:- මෙසින් සමරදිවාකර මැතිඳුන් නිසා භාදීයවංශය බබ ලනබව හැඟවූහ.

12. පතා [1] මොක්සැපත ම
සිතු නතු කර කුසලට ම
කරවා පෙතිපිළි ම
ලියවී තෙවලාදහම් මනර ම

අ:- (හේ) මොක්සැපත ම පතා සිතු කුසලට ම නතු කර පෙතිපිළිම කරවා මනරම්තෙවලාදහම් ලියවී.

ස:- 1. **'පතා මොක්සැපත ම'**- 'පතා' යනු 'පත-පැතුම්හි' දයින් නිපන් පෙරකිරියපදයි. **'ම'** යනු අවධාරණාර්ථයෙහි නිපාත පදයි. එයින් මොක්සැපත ම මිස දිව්‍යසම්පත්ත්‍යාදි අනෙකක් නො පතන බව ප්‍රකාශ කෙරෙයි.

ස:- පින් කිරීමෙහි දී මොක්සැපත ම පැතිය යුතු ය. නො පැතුව ද ලෞකික වූ දිව්‍යසම්පත්ත්‍යාදිය පුණ්‍යයට අනුරූප වූ විපාකවශයෙන් ලැබේ. නො පැතූ කල්හි ලෞකිකකුශලයකින් ලොවුතුරා මොක් සැපත නො ලැබේ.

2. **'කරවා පෙතිපිළිම'**- (පෙති ද පිළිම ද=පෙතිපිළිම) **'පෙති'** නම් වස්ත්‍රයන්හි සිතියම් කළ බුද්ධරූපසංස්ථානයි. **'පිළිම'** නම් මැටි ලොහ ආදියෙන් කරණු ලබන බුද්ධරූපයි.

3. **'ලියවී'** යනු 'ලිය-ලියුම්හි' දයින් නිපන් අතීතකාලික අන්‍යකාරකහෙත්වර්ථ (=ප්‍රයොජ්‍ය) ක්‍රියාපදයි.

4. **'තෙවලාදහම්'** නම් සූත්‍ර, අභිධර්ම, විනය යන තුන්පිට කයට ඇතුළත් ධර්මයි. බුදුන් වදාළ තාක් ධර්ම මේ තුන්පිටකයෙහි අන්තර්ගත ය.

i එහි 'සූත්‍රපිටක' නම් ලොකසම්මුතියෙහි දක්‍ෂ වූ බුදුරදුන් විසින් සත්‍වය, පුද්ගලය යනාදි ලොකව්‍යවහාරයන් නො ඉක්ම වදාළ ධර්මසමූහයයි. දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුක්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ක්‍ෂුද්‍රනිකාය යන මහාග්‍රන්ථපඤ්චකයකින් ඒ සූත්‍රපිටකය සැදුම් ලද්දේ වේ. එහි අධිචිත්තශික්‍ෂාව හෙවත් සිතෙහි එකඟකම උපදවන අයුරු පවසනු ලැබේ.

ii 'විනයපිටකය' නම් තථාගතශ්‍රාවකයන් හික්මවනු සඳහා පැණවූ ශික්‍ෂාපදසමූහයයි. ඒ පිටකය චුල්ලවග්ග, මහාවග්ග, පාරාජික, පාචිත්තිය, පරිවාර යන ග්‍රන්ථ පසෙකින් යුක්ත වේ. එයින් අධිශීලශික්‍ෂාව උගන්වනු ලැබේ.

---

1. වණා.

iii 'අභිධර්මපිටකය' නම් පරමාර්ථයන්හි දක්ෂ වූ බුදුරදුන් විසින් සත්ව පුද්ගලාදි සම්මුතිමාත්‍රයන් ඉක්ම පරමාර්ථධර්මයන් ගෙණ වදාළ ඉතා ගැඹුරු වූ ධර්මයයි. ඒ ද ධම්මසඞ්ගණි, විභඞ්ග, කථාවත්ථු, පුග්ගලපඤ්ඤත්ති, ධාතුකථා, යමක, පට්ඨාන යන ප්‍රකරණ ග්‍රන්ථ සතෙක්හි අන්තර්ගත ය. එයින් අධිප්‍රඥශික්ෂාව උගන්වනු ලැබේ.

**13 බොරුතෙපල රහමෙ — ර**
**තුඩ නො වකයි විස සෙ ගො — ර**
**අන් සතු දනපක — ර**
**සිතයි කැටකැබැලිති[1] සෙ හැමව — ර**

අ:– (හේ) බොරුතෙපල රහමෙර ගොර විස සෙ තුඩ නො වකයි. අන් සතු දනපතර කැටකැබැලිති සෙ හැමවර සිතයි.

**ප:**- 1. **'බොරුතෙපල'**– බොරු වූයේ ද ඒ තෙපුල් වූයේ ද ඒ ම නුසි=බොරුතෙපුල්. 'බොරු' නම් ඇතියක් නැති සේ හඟ වන මිථ්‍යාවචනයි. 'තෙපල' යනු 'තෙපුල්' සදෙහි කර්ම විභක්ත්‍යන්ත යයි. ලකාරසථඅකාරහෙතුවෙන් පකාරසථ උකාරයට අකාර දෙශයි. (**කාව්‍යශෙඛර** 9 පරිච්ඡෙදයෙහි 32 කව බලනු.)

2. රහ ද මෙර ද=**රහමෙර**. 'රහ' යනු පිටිවලින් කළ සුරා ය, කැවුම්වලින් කළ සුරා ය, බතින් කළ සුරා ය, සුරාබීජයන් ලා කළ සුරා ය, නොයෙක් උපකරණ ලා කළ සුරා ය යන පස්වැදෑරුම් මත්පැන් වර්ගයි. **'මෙර'** නම් මල්, ගෙඩි, උක්සකුරු, මී, සෙසු උපකරණ යන මේ දෑයින් පෙරාගත් පස් වැදෑරුම් ආසවයි. **'මිරා'** දෙශයෙහි උපන් හෙයින් මීට 'මෙරය' යයි කියනු ලැබේ.

3. **'තුඩ'** යනු ආධාරවිභක්ත්‍යන්තයි.

4. **'වකයි'** යනු 'වකා+යි' සිටි තන්හි ආකාරය හ්‍රස්ව වීමෙන් සිද්ධ යි. කරයි, දරයි, සිතයි බලයි, යනාදිය ද මෙසේ යි. 'වකා' යනු ද 'වක–වැකුම්හි' දයින් නිපන් වර්තමාන කාලිකක්‍රියාපදයි.

5. **'ගොරවිස සෙ'**– ඝොරවිෂයක් වූ කලි මුවෙහි වැකුන හොත් වහා ජීවිතක්ෂය වේ. මුසාවාදය හා රහමෙර ද එ ලෙස සලකා එයින් වෙන් වූ බව මෙයින් කීහ. ආගමයෙහි ද "බොරු කියන පුගුලා විසින් නො කට හැකි පවක් නැතැ"යි ද "සුරා පානය සියලු අයහපතට හෙතු වේ ය"යි ද එදෙක්හි සාවද්‍යත්වය ප්‍රකාශිත ය. එහෙයින් එදෙක ගොරවිස සේ සැලකීම සුදුසු ම ය.

---

1 කැබිලිති.

9. **'සැටසැබැලිනි'**- සැට ද සැබැලිනි ද=සැටසැබැලිනි. 'සැබැලි' සදින් අල්පාර්ථයෙහි 'ඉනි' ප්‍රත්‍යය වීමෙන් "සැබැලිනි" යනු සිද්ධ වේ. 'කුඩා සැබැලි' යනු නිර්වචනයි. 'සැට' නම් කුඩා ගල් ය. 'සැබැලිනි' නම් භාජනාදිබණ්ඩයි.

**14 ලොව හැමතැන විත ත**
**පුන්සිසි:යැලුම් එසයු න**
**හිතාහිතසත වෙ න**
**පතුරුවසි එසරගට මෙත්සි න**

**අන්වය** සුබොධ යි.

ප:- 1. **'විතත'** යනු 'විතත' (=විස්තෘත) යන පාළි ශබ්දය හා සමයි. 'පැතුරුණු' යනු අර්ථයි.

2. **'එසයුන'** යනු උපමාද්‍යෝතකශබ්දයෙකි. 'එබඳු' යන්න හා සමාන වූ අර්ථ ඇත්තේ ය.

3. **'හිතාහිතසත'**- හිතයෝ ද අහිතයෝ ද=හිතාහිතයෝ. හිතාහිත වූ සත්හු=හිතාහිතසත්හු.

4. **'පතුරුවසි'** (පතුරුවා+සි)-'පතුර-පැතුරුම්හි' ධාතුයි. වර්තමානකාල හෙත්වර්ථ (=ප්‍රයොජ්‍ය) ආඛ්‍යාතයි.

5. **'එසරගට'**- සරණාර්ථයෙහි සම්ප්‍රදානවිභක්තියි.

6. **'මෙත්සිත'**- "සියලු සත්හු සුව පත් වෙත්වා; දුකින් මිදෙත්වා"යි යම් සිතකින් සිතා ද, එබඳු සිත මෙත්සිත නම්.

ස:- සඳරැස් උසස්පහත් බව ආදි භෙදයක් නො තකා ලොවහැමතැන ම එසා සේ පැතිරෙන්නාක් මෙන්, විරුද්ධාවිරුද්ධභෙදයක් නො ගෙණ මේ මන්ත්‍රිතෙම හැමදෙනා කෙරෙහි මෙත්සිත පතුරුවයි-යනු භාවයි.

**15 අසා බැවහර[1]බ ස**
**දූන ගෙණ සිවුඅගතිදෙ ස**
**කිර'බ වෙන් සල හ ස**
**ලෙස විනිස කරු කරවි තුතිගො ස**

අ:- බැවහරබස අසා සිවුඅගතිදෙස දූන ගෙණ හස කිර'බ වෙන් කළ ලෙස විනිස කරු තුතිගොස කරවි.

1. **'බැවහැරබස'** යනු නඩු කීමයි.

"සමන්ත්‍යාචාරව්‍යපෙතෙන-මාර්ගේණාධර්ෂිතඃ පරෛඃ,
ආවෙදයති චෙද් රාඥෙ-ව්‍යවහාරපදං හි තත්"

1 වැවහරු.

යනුවෙන් "ශාස්ත්‍රාන්තශිෂ්ටාචාරයෙන් තොර වූ මාර්ගයකින් අනුන් විසින් ගැහැට කරණ ලද්දෙක් තෙමේ රජහට ඒ නඩුව සැළ කරු ද, ඒ 'ව්‍යවහාරපද' ය"යි කියනලදී. පැරණි නඩුතීන්දු වලට ද 'බැවහරබස' යයි කියනු ලැබේ.

2. **'සිවුඅගතිදොස'** නම් ඡන්දයෙන් හෙවත් ලොභහෙතු වෙන් වන අගතිය, ද්වේෂයෙන් වන අගතිය, භීතියෙන් වන අගතිය, මෝහයෙන් වන අගතිය යන මේයි. 'අගති' යනු අසත් මාර්ගයයි. මෙයින් යුක්ත වූයේ යශසින් පිරිහෙන්නේ වේ. වදාළේ මැයි:-

"ඡන්දා දොසා භයා මොහා-යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො-කාළපක්ඛෙ'ව චන්දිමා"යි.

"ලොභයෙන් හා ක්‍රොධයෙන් ද, බියෙන් හා නුනුවණින් ද යමෙක් තෙමේ ධර්මය ඉක්මවා ද, ඔහුගේ යශස කෘෂ්ණපක්ෂයෙහි සඳ මෙන් පිරිහෙන්නේ ය" යනු භාවයි.

3. **'කිරඹ'**- 'කිරි+අඹ' යනු සංහිතායි. 'කිරි' යනු අවධි විභක්තිප්‍රත්‍යය ලොපයට යාමෙන් ශබ්දප්‍රකෘතිය ම සිටිතැනි.

**සං**- කිරි හා දිය මිශ්‍ර කොට දුන් කල්හි හංසයෝ කිරි පමණක් උරා බොති යනු ප්‍රසිද්ධ ය. **සුභාෂිතයෙහි** ද "කිරියෙන් දියර වෙන් කළ හස මෙන් පවර"යි මේ ම කියන ලදී. "කොස්වා ලිහිණි කිරඹ වෙන් කරත්" යනු පාළිපොත්හි පැණේ.

**සං**:- මේ මැතිඳු නඩු අසයි. සිවු අගතීන් පිළිබඳ දෝෂ දන්නාහෙයින් නඩු ඇසුම්හි දී අගතියට නො යයි. හංසයා කිරින්.වතුර වෙන් කරන්නාක් මෙන් සාපරාධ නිරපරාධ පුද්ගල යන් විනිශ්චය කොට සාපරාධීන්ට දඬුවම් දීමෙන් සතුතිඝොෂය කරවී. ධර්මනීත්‍යානුකූල විනිශ්චය දැක සන්තුෂ්ට වූ ජනයෝ මෙතුමන්ට සතුති කළහයි සේයි.

**16 රුසිරි ගුණ නුව ණ**
**යසබල විකුම් විතර ණ**
**එක් කොට මෙ හැම ගු ණ**
**මැවූ වැනි මහබඹ මෙමැති මි ණ**

අ:- මහබඹ රුසිරි ගුණනුවණ යස බල විකුම් විතරණ (යන) මෙ හැම ගුණ එක් කොට මෙමැතිමිණ මැවූ වැනි (වේ.)

පා:- **'රුසිරි'** යනු 'රූපසිරි' ශබ්දයෙන් භිනනයි. 'රුසිරු යනු මෙයින් අන්‍යයෙකි. ඒ 'රුචිර' ශබ්දයෙන් ආයේ ය. 'රුසිරි' යනු ලිඞ්ගාර්ථප්‍රථමාවිභක්ත්‍යන්තයි. 'ගුණ-විතරණ' යන පද සය ද එසේ යි. 'රුසිරි-විතරණ' යනු දඅරුත්සමස්පදයෙකැයි ගතොත් අවිභක්තිකයයි කිය යුතු ය. සමස්ත වුව හොත් පදඤ්ඪය ම එක් පදයෙකි. එවිට ඒ කර්මවිභක්ත්‍යන්තයි.

2. **'යස'** යනු ශූරභාවාදියෙන් හටගත් ප්‍රසිද්ධියයි.

3. **'විකුම්'** නම් අධික වූ ශූරභාවයයි.

4. **'විතරණ'** යනු ත්‍යාගයයි හෙවත් දීමයි. මේ තත්සම ශබ්දයෙකි.

5. **'මැවූ'** යනු 'මව-මැවුම්හි' දයින් අයු කම්කරු 'ඌ' පස කිරීමෙන් සිද්ධකෘදන්තපදයෙකි. 'වැනි' යන නිපාත යොග යෙහි කර්මවිභක්ත්‍යන්තයි.

6. **'මහබඹ'**- මොහුගේ වාසය බ්‍රහ්මලොකයෙහි ය. මොහු විසින් සත්වයා මවන ලදැයි වෛදිකයෝ කියති. බෞද්ධයන්ගේ එබඳු පිළිගැන්මෙක් නැත. අවිද්‍යාදිහෙතුධර්මරාශියකින් මිස නිර්මාතෘකෙනෙකුන් විසින් සත්වයා නො මැවූ බව බෞද්ධමත යෙහි ප්‍රසිද්ධ ය. එහෙත් බෞද්ධයෙකු වූ **අලගියවන්නමුකවෙටි** තුමන් "මැවූ වැනි මහබඹ මෙමැති මිණ"යි කියනලද්දේ මේ කවි සමයාගතයක් හෙයිනි. පරමසෞගත **ෂිතිය පරාක්‍රමබාහු** මහිපාලයෝ---

"විමල යස තද තෙද-තියුණුනිය අැ ගුණරස්,
සිවුවත් රස් කැරැ තමා-කොළේ ඔහු මැ මහනදන්"

යනුවෙන් ද, ශ්‍රීමත් **කවීශ්වරයෝ**

"ලොවට උතුම් කුලසිරි නුවණගුණරැ ස
අවට පැතිරි යසතෙද අණසක සක ස
රුවට මෙහැම ගෙණ මවමින් උවිඳු ලෙ ස
තිවට මෙහිම් කොළෙ ලකරජ සිරි පිණි ස"

යනුවෙන් ද, **වීදගම මෙත්මහනෙත්පාමුලමහතෙරිඳුසඳ**-

"මුන් වරලසකලඹ-සරි වන වතක් නො ම ලැ බ
නුදුටු නො ඇසූ සුබ-මුහුල කොලෙසින් මැවී ඡේ! බඹ"

යනුවෙන් ද බඹහුගේ මැවුම වැණූහ. මෙලෙසින් මෙය කවිසම යෙහි එන්නකි.

7. **'මැතිමිණ'**– (මැති ම මිණ=මැතිමිණ.) 'මිණි 'සද මෙහි ශ්‍රෙෂ්ඨාර්ථවාචී ය. මේ අර්ථයෙහි 'මැණි' මෙණි' යන ශබ්දරූප ද යෙදේ.

**17 මෙමැතිඳුසඳ පව** ර
**මුනිරජුගෙ සිරිතක් පෙ** ර
**අසනුව කර අද** ර
**කොළෙන් ආරාදනා මනහ** ර

අ:– මෙමැතිඳුසඳ පවරමුනිරජුගෙ පෙර සිරිතක් අසනුව අදර කර මනහරආරාදනා කොළෙන්–(මතුකාව හා සම්බන්ධයි.)

ප:– 1. **'මැතිඳුසඳ'**– මැතිනට ඉඳු=මැතිඳු, මැතිඳු ම සඳ= මැතිඳු සඳ.

2. **'මුනිරජුගෙ'** – මෙහි 'ගේ' යන්න ඡන්දෝ හෙතුවෙන් හ්‍රස්ව වී ය. ඒ නිපාතයෙකැයි පැරණියෝ තැකූහ. "ඇත්හු ම ගේ"සි ද "මසි දු ගේ"සි ද අතිසකින් ව්‍යවධාන කොට **ගුරුළුගොමිහු** යෙදූහ. විභක්තිප්‍රත්‍යය නම් එසේ යෙදිය නො හැක. මේ 'ගේ' යන්න කර්මවිභක්තිරූපයන් කොරෙන් යෙදූවිට සම්බන්ධාර්ථය ප්‍රකට කෙරේ. හුදුකර්මවිබත ද ඒ අරුත්හි යෙදේ.

3. **'පෙර'**– 'පෙර' සදින් අදර විබත් ඇපස වීමෙන් 'පෙරැ'සි සිද්ධ වූ තැන එලිසමය සඳහා ඇයන්නට අයනු වී. මුනි රජුගේ පෙර සිරිත් නම් බොධිසත්ව චරිතයි.

4. **'කොළෙන්'**– 'කළ' සදින් කරණවිබත් 'එන්' පස වීමෙන් සිද්ධයි.

ස:– මෙයින් කාව්‍යකරණයට නිමිති කීහ.

**18 කොරෙමින් සිත එක** ග
**ඇසූ සතහට මනර** ග
**දෙන සැප සගපව** ග
**කියමි පද බැඳ දහම්සොඬව** ග

අ:– සිත එකහ කොරෙමින් ඇසූ සතහට මනරඟ සගපවිග සැප දෙන දහම්සොඬවග පද බැඳ කියමි.

ප:– 1. **'එකඟ'**–'එකගග' ශබ්දයෙන් භින්නයි. 'ක–ග' දෙදෙනා මැද අඞවර්ණාගමය වී ය. අන් කරුණු නො සිතා එක් අර මුණෙක්හි ම සිත රඳවාලීම සිතා එකඟ කිරීමයි.

2. **'ඇසූ'**– 'අස–ඇසුම්හි' දයින් අයුකාතුකාරු 'ඌ' පස වීමෙන් සිද්ධයි.

3. **'සතහට'**– මෙහි 'හට' යන්න ප්‍රත්‍යයයෙකැයි **සිදත් සඟරාහි** පැණෙතත් නිපාතයෙකැයි පැරණියන් තැකූබව පැණේ. 'උව්දුහට'යි යෙදූව මනා තන්හි 'හට උව්දු'යි 'හට' යන්න පූර්වයෙන් හෙලා යෙදූ තැන් ද ඇත්තේ ය. පැරණියන් එසේ යොදන ලද්දේ එය ප්‍රත්‍යයක් නො ව නිපාතයක් හෙයිනි. සාම්විභක්ති රූපයන් කෙරෙන් මෙය යෙදුනුවිට සම්ප්‍රදානාර්ථය ප්‍රකට කෙරේ. සම්බන්ධාර්ථයෙහි ද යෙදේ.

4. **'සගපවග'**– සග ද අපවග ද=සගපවග. සම්බන්ධවිභක්ත්‍යන්තයි. 'සැප' යන්නෙහි සම්බන්ධයි. 'සග' නම් දිව්‍යලොකයි. ඒ වනාහි චාතුර්මහාරාජික, ත්‍රයත්‍රිංශත්, යාම, තුෂිත, නිර්මාණරති, පරනිර්මිතවශවර්ති යයි සවැදෑරුම් වේ. 'අපවග' නම් නිර්වාණයයි.

5. **'කියමි'**– 'කිය–කියුම්හි' දයින් නිපන් වර්තමානකාලික උත්තමපුරුෂ (=මශබ්දකාරක) එකවචනාන්තාඛ්‍යාතයි. 'දහම්සොඬවග' යනු එහි කර්මයි.

6. **'පද'**– 'පජ්ජ' ශබ්දයෙන් භින්නයි. 'පද්‍ය' නම් කවීන් විසින් කළ සිව්පදයි.

7. **'බැඳ'**– 'බඳ–බැඳුම්හි' දයින් පෙරකිරිය ඇපස වීමෙන් සිද්ධ පූර්ව ක්‍රියාපදයි. අන්ත්‍යඇකාරයට අකාරාදේශයි.

8. **'දහම්සොඬවග'**– (දහම්සොඬහුගේ වග=දහම්සොඬවග.) මෙහි 'වග' සද වර්ගාර්ථයයි ගෙණ "ධම්මසොණ්ඩකවග්ගය"යි අර්ථ කියනත්, ඒ නො යෙදේ. ඒ වර්ගයෙහි කථාවස්තු දශයෙකි. එහි මුනිරජුගේ පෙර සිරිත් පමණක් නො ව අන්‍යයන්ගේ චරිතයෝ ද වෙති. මේ කාව්‍යකරණයෙහි ආරාධනය වූයේ මුනි රජුගේ පෙරසිරිතක් කියන ලෙසට ය. අන්‍යයන්ගේ චරිත කථනයෙක් මෙහි අනභිප්‍රේත ය. එසේ ම මෙහි එබන්දකු දු නො පැණේ. එහෙයින් මෙහි 'වග' යන්න වර්ගාර්ථයෙහි නො යෙදූ බව පැහැදිලි ය. 'වග' සද 'ප්‍රවෘත්ති' අර්ථයෙහි ද ව්‍යවහෘත ය. මෙහි යෙදෙනුයේ ද ඒ අර්ථයයි. දහම්සොඬහුගේ ප්‍රවෘත්තිය (=තොරතුර) යනු අර්ථයි.

**19 වියතුනි නැණපබ ද**
**හැර මෙහි දෙසක් දුටුව ද [1]**
**බුදුගුණයට පැහැ ද**
**අසවු දෙසවන් නමා බැතින ද**

අ:- නැණපබඳ වියතුනි, මෙහි දෙසක් දුටුව ද, (එය) හැර බුදුගුණයට පැහැද බැතින් දෙසවන් නමා අද අසවු.

ප:- 1. **'නැණපබඳ'**- (නැණයන්ගේ පබඳ ඇතියේ=නැණ පබඳ.) මෙහි 'පබඳ' සද සමූහාර්ථවාචකයි. ඥානරාශි ඇත්තාවූ යනු අර්ථයි. 'වියතුනි' යන ආලපනයට විශෙෂණයි. **'වියතුනි'** යනු දුෂ්ට යයි ඇතැම්හු තකත්. **සිදත්හි** දු මෙබඳුපදයන්ගේ සිද්ධිය සඳහා ප්‍රත්‍යය නො දක්වී. එහෙත් මේ දුෂ්ට ය යි කිය නො හැක. මෙබඳු වූ "සමතුනි, මිනිසුනි, බළලුනි" යනාදි තවත් පද භාෂා ව්‍යවහාරයෙහි ඇති හෙයිනි.

2. **'හැර'**- 'හර-හැරුම්හි' දයින් වූ පූර්වක්‍රියාපදයි. ඇකාර යට අකාරාදෙශයි.

3. **'දුටුව ද'**-'දුටු' යන කෘදන්තයෙන් පර ව අප්‍රත්‍යය හා වකාරාගම ද වීමෙන් සිද්ධයි. 'ද' නිපාතයි. වර්තමානයෙහි මේ 'දුටු වත්' යි ලැබේ.

4. **'බුදුගුණයට'**-(බුදුන්ගේ ගුණ=බුදුගුණ.) බුදුගුණ නම් ශිල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාන දර්ශන යනාදියයි.

5. **'පැහැද'**-'පහද-පැහැදුම්හි' ධාතුවෙන් නිපන් පූර්වක්‍රියායි අන්ත්‍ය ඇකාරයට අකාරාදෙශයි.

6. **'අසවු'**-'අස-ඇසුම්හි' දයින් නිපන් විධික්‍රියාපදයි.

7. **'දෙසවන්'**-සවන් දෙකක් එක් කොට සලකන ලද්දේ= දේසවන්.

8. **'අද'**- යනු 'අජ්ජ' ශබ්දයෙන් භින්නයි.

**20 මෙ ම කපෙහි පුවත ර**
**තුන්වන අතුරු සපතු ර**
**ලොවැ පහළ පින්ස ර**
**සසුජ් මුනිරජතුමා මනහ ර**

අ:-පුවතර මෙ ම කපෙහි තුන්වන අතුරු සපතුර ලොවැ පහළ පින්සර මනහර සසුප්මුනි රජතුමා-(මතුසම්බන්ධයි.)

---

1 දුටුමෙද.

ප:-1. **'මෙ ම කපෙහි'**-මෙහි 'කප්' සද අසඞ්ඛ්‍ය කල්පයෙහි වැටේ. කල්ප යනු අතිදීර්ඝකාලපරිච්ඡෙදයෙකි. ඒ වනාහි අන්තඃකල්පය, අසඞ්ඛ්‍යකල්පය, මහාකල්පයයි ත්‍රිවිධ වේ. අවුරුදු දහස කට අඟලක් බැගින් වැඩෙන මහපොළොව යම්තාක් කලෙකින් එක්යොදුන් තුන්ගව්වක් පමණ වඩී ද, ඒ තරම් කාලයක් එක් අන්තඃකල්පයකි. අන්තඃකල්ප විස්සක් එක් අසඞ්ඛ්‍යකල්පයෙකි. අසඞ්ඛ්‍යකල්ප සතරක් එක් මහාකල්පයෙකි. විස්තර **ධර්මප්‍රදීපිකාවෙහි** කී නියායෙන් දන්නේ ය. "මෙ ම කපෙහි" යනුවෙන් විවර්තස්ථායි අසඞ්ඛ්‍යකල්පය දක්වන ලදී. එහි බුදුවරුන් පස්නමක් පහළ වන හෙයින් ඒ 'භද්‍රකල්ප' නම් වී. එහෙයින් ම මෙහි "පුවතර"යි වෙසෙසන ලදි.

2. **'ලොවැ'**- ලෝ' යන්නෙන් ආධාරවිභක්ති ඇප්‍රත්‍යය වීමෙන් සිද්ධයි.

3. **'කකුසඳමුනිරජනුමා'**- මූන්වහන්සේ මේ 'කල්පයෙහි පෙවෙනු ව බුදු වූහ. **බ්‍රහ්මදත්ත** නම් බමුණෙකු නිසා **ධනවතී** නම් බැමිණියක කුස පිළිසිඳගෙණ බිහි ව අවුරුදු දෙදහසක් ගිහි ගෙයි වැස **සුනන්දා** නම් අගමෙහෙසුන් බැමිණිය **විජිතසේන** නම් පුතනුවන් වැදූ දා නික්ම පැවිදි ව තුග ගසක් මුල දී බුද්ධත්වයට පැමිණියහ. **තිස්ස, භාරමාජ** නමැති දෙනමක් අග්‍රශ්‍රාවක වූහ. උන්වහන්සේ විසිරියනක් උස ය. විසිදහසක් අවුරුදු ආයුෂ වී ය.

| | | |
|---|---|---|
| 21 | **දෙතිසක් ලකුණෙ** | **නුදු** |
| | **සවන් ගන බුදු රැසි** | **නුදු** |
| | **කොත්මල් ලකරි** | **නුදු** |
| | **බබලමින් විසිරියන්බඳි** | **නුදු** |

**අන්වය** සුගමයි.

ප:- 1. **'දෙතිසක්ලකුණු'**- සක්විතිරජුන්ට හා බුදුවරුන්ට පමණක් පිහිටන්නා වූ සුප්‍රතිෂ්ඨිතපාදතාදි මහාපුරුෂලක්ෂණ දෙතිසයි. එහි විස්තරකථා අතිදීර්ඝ ය. විස්තරාර්ථීන් **ධර්මප්‍රදීපිකාව** හෝ **අමාවතුර** (=බුත්සරණ) බලා දත යුතු.

2. **'සවන්ගනබුදුරැස්'**- වර්ණ සයකින් යුක්ත ඝන වූ බුද්ධ රශ්මියයි. එහි වර්ණ සය නම් නීල, පීත, ලෝහිත, අවදාත, මාඤ්ජිෂ්ඨ, ප්‍රභාස්වර යන මේ යි. ඒ බුදුරැස් විහිදෙන අයුරු **අමාවතුරෙහි** පෙණේ.

3. **'කොත්මල්ලකර'**-බුදුන්ගේ ශිරොධාතු මස්තකයෙහි වඩුරියනක් පමණ උසට පැතිර සිටි රශ්මිමාලාවයි. මේ අශීත්‍යනුව්‍යඤ්ජනයන්ගෙන් එකකි.

4. **'බබලමින්'** 'බබල-බැබලුම්හි' ධාතුවෙන් නිපන් මිශ්‍ර ක්‍රියාපදයි. මිශ්‍රක්‍රියාපද ද නිපාතභෙදයෙකි.

5. **'විසිරියන්බඳ'** 'බඳ' සද ශරීරවාචක ය. උච්චතාව ගෙණ 'විසිරියන්'යි කීහ.

6. 'ලකුණෙන්+දු, රැසින්+දු' යනාදි වසයෙන් තුබූහන්හි උකාරාගමයෙන් **'ලකුණෙනුදු'** යනාදිය සිද්ධයි.

**22 බවසයුරෙහි මහ ත්**
**පිවිස පරතෙර නො ම ද ත්**
**සූවිසි අසෙකි ස ත්**
**පමුණුවා මොක්පුරට සිරිම ත්**

අ:- මහත් බවසයුරෙහි පිවිස පරතෙර නො ම දත් සූවිසි අසෙකිසත් සිරිමත් මොක්පුරට පමුණුවා–

ප:- 1. **'බවසයුරෙහි'**– බව ම සයුර-බවසයුර. ප්‍රකෘතිය 'සයුරු' යනුයි. සාගරය අනන්ත වූ උපද්‍රවයන්ගෙන් යුක්ත ය. සංසාරය ද එබඳු ය. එහෙයින් භවය සාගරත්‍වයෙන් රූපිත ය.

2. **'පිවිස'**– 'පිවිස-පිවිසුම්හි' දයින් නිපන් පෙරකිරිය පදයි. ඇකාරයට අකාරාදෙශයි.

3. **'පරතෙර'**– භවසාගරයාගේ 'පර තීරය' නම් නිවණයි.

4. **'දත්'**– 'දත්-දැනුම්හි' දයින් නිපන් අතීතකතෘකාරක කෘදන්තයි. ප්‍රකෘතිය 'දතු' යනුයි. උකාරලොපයි.

5. **'සූවිසි අසෙකි සත්'**– 'අසංඛ්‍ය' යනු ගණිතශාස්ත්‍රයට විෂය නො වන, සංඛ්‍යාපථය ඉක්ම සිටි, සමූහයකි. එසේ නම් එකක් ම මිස සූවිස්සක් කෙ සේ වේ ද? යත්:- ස්ථාන සූවිස්සක දී එබඳු සංඛ්‍යාපථය ඉක්ම සිටි පිරිස් සූවිස්සක් නිවන් පැමිණිවූ හෙයිනි. 'සිවුවිසි'යි තුබූ හන්හි සන්‍ධිවිධියෙන් 'සූවිසි' යනු සිද්ධයි.

6. **'පමුණුවා'**–'පමුණ-පැමුණුම්හි' දයින් නිපන් හෙත්වර්ථ පූර්වක්‍රියාපදයි.

7. **'මොක්පුර'**– මොක් ම පුර=මොක්පුර.

8. **'සිරිමත්'**- සිරි ඇතියේ=සිරිමත්. සිරිසදින් මත් ප්‍රත්‍යය යයි. ඒ ප්‍රත්‍යයෙන් සම්බන්ධය උක්ත වේ.

**23 සත වෙන සකල ලො දු**
**සිවු බඹ විහරණින් මු දු**
**ඒ මුනිසඳ පරසි දු**
**විසි විසි දහසක් ම අඩුරැ දු**

අ:- සත වෙත පතළ උදු සිවුබඹවිහරණින් මුදු පරසිදු එ මුනි සඳ අවුරුදු විසිදහසක් ම විසී.

ප: 1. **'සත වෙත පතළ'**- 'සත' යනු සම්බන්ධවිභක්ත්‍යන්තයි. 'පතළ' යනු 'පතුර පැතුරුම්හි' දයින් නිපන් අතීත කර්තෘකාරක කෘදන්තයි.

2. **'බඹවිහරණ'**- යනු මෛත්‍රී, කරුණා, මෘදුතා, උපෙක්ෂා යන චතුර්විධ භාවනාවන්ට නමෙකි. බඹලොව බ්‍රහ්මයෝ මේ සතරින් යුතු ව වෙසෙති. එහෙයින් මොවුන්ට 'බ්‍රහ්මවිහාර'ය යි කියනු ලැබේ. ශ්‍රේෂ්ඨ වූ විසුම් හෙයිනුදු නිදෙස් විසුම් හෙයිනුදු 'බ්‍රහ්මවිහාර' නාමය ලැබේ. ඔවුනතුරෙන්—

i "මෛත්‍රිය" නම් 'සියලු සත්තු සුව පත් වෙත්වා. දුකින් මිදෙත්වා' යන වශයෙන් පවත්වන භාවනාවයි.

ii "කරුණාව" නම් නානාවිධදුඃඛයෙන් පීඩිත වන සත්ත්වයන් බලා සිත කම්පිත කිරීම් වශයෙන් පවත්වන භාවනාවයි.

iii "මෘදුතාව" නම් දරුවෙකු සමපත් ලත් කල සතුටු වන මැනියක මෙන් සත්ත්වයන්ගේ සමපතති බලමින් සතුටු වීම් වසයෙන් පවත්වන භාවනාවයි.

iv "උපෙක්ෂාව" නම් මුහුකළ නුවණැති දූ පුතුන් කෙරෙහි මධ්‍යස්ථ ව සිටින මවුපියන් මෙන් සියලුසතුන් කෙරෙහි මධ්‍යස්ථ වීම් වසයෙන් පවත්වන භාවනාවයි.

3. **'විසී විසිදහසක් අවුරුදු'**- 'විසී' යනු 'වස විසුම්හි' දයින් නිපන් අතීතකාලඅන්‍යකර්තෘඑකවචනක්‍රියාපදයි. 'විසිදහසක්' යනු ද 'අවුරුදු' යනු ද අත්‍යන්තසංයොගයෙහි කර්මවිභක්ත්‍යන්තයි.

ස: විසිවනකවෙහි පටන් මේ කව තෙක් එක ම ක්‍රියා කාරකපදසම්බන්ධයෙකි. පඤ්චතුෂ්කාත්මක හෙයින් 'කලාප' යන නාමයෙක් ද වේ. මෙහි අපර ක්‍රියාව 'විසී' යනුයි. එහි උක්තය වශයෙන් ලැබෙන පදාර්ථය වාක්‍යයෙහි දෙතැනෙක්හි ම 'කසුප්මුනිරජනුමා'යි ද 'එමුනිසඳ'යිද් දක්නට ලැබේ. ලඝුවාක්‍ය යෙක්හි නම් එකාර්ථවත් පද නැවත නැවත යෙදීම මහාදෝෂයෙකි. මෙය දීර්ඝවාක්‍යයක් හෙයින් ඒ නිරවද්‍ය ය. **ගුත්තිලයෙහි** 227 වන කවෙන් පටන් ගත් කුලකයෙහි ද තවත් බොහෝතන්හි ද එබඳු යෙදුම් පැණේ.

**24 බැබලි සුනෙරසි ර**
**නිවී ගිය පහනක්සු ර**
**එ මුනි පිරිනිවිව ර**
**පිරිහිනි ය මුනිසසුන්[1] මනහ ර**

අ:-සුනෙරසිර බැබලී නිවී ගිය පහනක් සුර එ මුනි පිරිනිවී වර මනහර මුනිසසුන් පිරිහිනි ය

ප:-1. **'බැබලී'**-'බබල' දයින් නිපන් පෙරකිරිය පදයි.

2. **'සුනෙර'** යනු මහාමෙරු පර්වතයයි. **'සිර'**-පාළිය හා සමයි.

3. **'එමුනි'** යනු 'පිරිනිවි' යන්නෙහි අනුක්ත කර්තෘයි.

4. **'පිරිනිව්වර'**-පිරිනිවීම 'ක්ලේශ පරිනිර්වාණය, ස්කන්ධ පරිනිර්වාණය'යි දෙවැදෑරුම්. 'ක්ලේශ පරිනිර්වාණ' නම් නැවැත නූපදනා සේ රහත්මගින් කෙලෙසුන් සිඳලීමයි. 'ස්කන්ධපරිනිර්වාණ' නම් රහතුන්වහන්සේගේ චුත වීමයි. රහතුන්වහන්සේගේ ස්කන්ධ සන්තතිය චුතියෙන් මතු සිදී යන්නේ ය, හෙවත් අන් තැනෙක්හි නො උපදින්නේ ය.

5. **'පිරිහිනි ය'**-'පිරි' උපසර්ග පූර්ව 'හෙ' දයින් නිපන් අතීත කාලික නිරුත්සාහිතක්‍රියාපදයි. නිරුත්සාහිතක්‍රියාවෝ අකර්මක ධාතූන්ගෙන් සිද්ධ වෙති. එහෙත් එහි කර්මකාරකක්‍රියා සාධනයෙහි දි යෙදෙන ප්‍රත්‍යයාදිය යෙදේ. "ය" යනු පරිසමාප්ත්‍යර්ථයෙහි වැටෙන නිපාතයෙකි.

6. **'මුනිසසුන්'**- සම්බන්ධ විභක්තිසමාසාන්තයි.

**25 සව් ඉසුරෙන් තිද ස්**
**පුර සිරින් දිසි සුවිසෙ ස්**
**සුදනන් හට නිවෙ ස්**
**වී ය පුරයෙක් නමින් බරණැ ස්**

අ: සුවිසෙස් සව්ඉසුරෙන් තිදස් පුරසිරින් දිසි සුදනන්හට නිවෙස් බරණැස් නමින් පුරයෙක් වී ය.

ප:-1. **'සව්ඉසුරෙන්'**-'දිසි' යන්නෙහි කරණයයි.

2. **'තිදස්පුර'** යනු සාමාන්‍යයෙන් සියලු දිව්‍යලොකයන්ට ද, විශෙෂයෙන් දෙවන දිව්‍යලොකයට ද නම් වේ. "තිදසුන්ගේ පුර" යනු තද්විග්‍රහයි. මනුෂ්‍යයන්ට මෙන් වෘද්ධිහානි ආදි විකාරයකට නො පැමිණි උත්පාද, ස්ථිති, මරණ යන දශා (=අවස්ථා) තුණක් ඇති හෙයින් දෙවියෝ 'තිදස්' නම් වෙති. දෙවන දෙව්ලොව

---

1. මූ, පිරිහි ගිය පසු සසුන්, පිරිහුනෙයි මුනිසසුන්-ඇතැම්.

වාවසා සාල්හි ''තිතිදස්''යි කිය යුතු වුවත් එක් 'ති' සදක් ලොප් වීමෙන් 'තිදස' සද සිදු වේ. 'තුණක් අධික දහයවල් තුණක් හෙවත් තිස්තුණක් ඇත්තාහු' යන අර්ථයෙන් දෙවන දෙව්ලොව වැසියෝ එනම් වූහ. එහි විස්තර කථාව **මඝමාණවක** වස්තුවෙන් දන්නේ ය. (144-2 බලනු)

3. **'දිසි'**- 'දිස්' දයින් නිපන් කෘදන්තපදයි.

4. **'බරණැස්'**-දැනුදු මේ නමින් ප්‍රසිද්ධ ය.

**26** **තුඟු ගොපුර පෙණ සාර**
**නන ලූ[1] දරණවැල සූර**
**එපුර පිළිමිණි වූර**
**දිලෙසි සුරපුර හිමි ව හැමවර**

**අන්වය** සුගමයි.

ප:-1. තුඟු වූ ගොපුර=තුඟුගොපුර. තුඟුගොපුර ම පෙණ-**තුඟු ගොපුර පෙණ. 'ගොපුර'** යනු වාසල් (=ගේට්ටු) නමින් ප්‍රකට නුවර දොරටුවයි.

2. **'සාර'**-පූර්වක්‍රියා පදයි.

3. **'නන'**-සර්පරාජ වූ අනන්තයායි. මේ ම **ශෙෂ, වාසුකි** නාම යන්ගෙන් ද ප්‍රසිද්ධ ය. **ක්ෂීරසාගර** මථනයෙහි සුරාසුරයන් විසින් මන්දර පර්වතය බැඳ ගැණුමට රැහැන වසයෙන් ගන්නා ලද්දේ ද මෙතෙමේ ය. එයින් මොහුගේ ශරීර දීර්ඝත්වාතිශයය පැහැදිලි වේ. මොහුට හිස් දහසක් ඇතැයි කියති.

4. **'ලූ'**-'ලා-ලිමෙහි' දයින් නිපන් අතීතකර්මකාරක කෘදන්ත පදයි.

5. **'දිලෙසි'**-''දිලේ සි'' තුබූ තන්හි 'සි' නිපාත පරනිමිත් තෙන් පූර්ව හ්‍රස්ව වී. ''දල්'' දයෙහි වර්තමාන ප්‍රථම පුරුෂ එක වචනය ''දිලේ'' යනුයි. ප්‍රවෘත්ති කාලයෙහි වර්තමාන ප්‍රයොග ඉෂ්ට ය.

6. **'සුරපුරහිමි ව'**- මෙයින් ප්‍රාකාරයාගේ ප්‍රාංශුභාවය කොතරම් දැයි අතිශයොක්තියෙන් දැක්වීත. සුරපුර පොළොවට උඩින් අහස්හි සිටියේ ය. මේ ප්‍රාකාරයාගේ උපරිමසීමාව ඒ සුර පුරයයි.

---

1 නාගතා.

ස:– මේ නගරයෙහි ප්‍රාකාරය පළිඟුමිණියෙන් නිර්මිත ය. සුරපුර දක්වා උස් වෙයි. ඒ වනාහි අනන්තනාගරාජයා විසින් ලූ භෝගාවලියක් වැන්න. ඒ භෝගාවලියෙහි ඵණය. නම් උස් වූ ගොපුරයි.

27 සහගුම් බිඟු වන ළ
තඹර පිරි[1] පිරි සුලකා ළ
පුරඹ මහවුරැකු ළ
රැපැසි අනුබඳ බඳරසන්වැ ළ

අන්වය සුගමයි.

ප:– 1. **'වනළ'** යනු 'වනර–වැතුරුම්හි' දයින් නිපන් කෘදන්තයි. 'පැතුරුණු' යනු අර්ථයි.

2. **'තඹර'** යනු 'තාමරස' ශබ්දයෙන් භින්නයි. පද්මවාච කයි. 'පිරි' යන්නෙහි අනුකරණයි.

3. **'පිරි'**–'පුර–පිරුම්හි' දයින් නිපන් කෘදන්තයි.

4. **'පිරි'**– 'පරිඛා' යන්නෙන් භින්නයි. 'පරිඛාව' නම් දිය අගලයි.

5. **'පුරඹ'**– පුර ම අඹු=පුරඹු. 'අඹු' සද මෙහි සත්‍රීවාචකයි. (129–2 බලනු.)

6. මහවුර ම උකුළ= **මහවුරැකුළ**.

7. **'රැපැසි'** යනු 'ඇරැ' යන පෙරකිරිය පෙරටු කොට ඇති 'පා– පැමෙහි' දයින් නිපන් අතීතකාලික ආඛ්‍යාත පදයි. 'සි' නිපාතය පර නිමිත්තෙන් 'පැ' යන්න හ්‍රස්ව වී ය. 'ඇරැ' යන්නෙහි පූර්ව ඇකාරයට ලොප් වී ය.

8. **'අනුබඳ'** යනු නිරන්තරාර්ථවාචී ශබ්දයෙකි. 'නිරන්තරය' නම් අතරක් නැති සේ නැවත නැවත බැඳීමයි. 'අනුබඳ' යනු ද ඒ අර්ථයෙන් යුක්ත ය.

9. **'රසන්වැළ'**– නම් හවඩිය වැනි ස්ත්‍රීන්ගේ කටිභූෂණයෙකි. එහි මිණිගෙඩි ද බඳිති. ඒ කිහ **ශුත්තිල**කව්හි ද–

"බමරකිකිණි සැදි සියපත්මෙවුල්දමා"යි.

ස:– මේ නගරය කාන්තාවක වැන්න. මහත් වූ ප්‍රාකාරය ඇගේ උකුළයි. ප්‍රාකාරය සමීපයෙහි වූ පරිඛාව ඒ උකුළෙහි බැඳි මෙබලාදමයයි. එහි බැඳි මිණිගෙඩි නම් නද කරණ භෘඞ්ගයන් ගෙන් යුත් පද්මයෝ යි.

1. පළ.

මේ කාවෙහි ආශ්‍රය-

"පුරකත නුබඳ බඳ-මහවුරු උකුළුවටහි,
සහගුම් බිඟුවැල පියුම්-පිරි කියෙලි රසන්දම්"

යන **කාව්සිළුමිණෙහි** ගීයයි.

**28** **පහසොනග රැස්[1] වැ** **ද**
**පුරඹර දිසි සුපුන් ස** **ඳ**
**රන්මිණියට මොර** **ද[2]**
**සේසතෙව් දනමන නුවන් බ** **ඳ**

**අන්වය** සුගමයි.

**ප:-** 1. **'පහසොනගරැස්'**-පහවල කොත්=පහසොත්. පහ කොත්හි අග= පහසොතග. පහසොතග්හි රැස්=පහසොතගරැස්.

.2 **'වැද'**-'වද-වැදුම්හි' දයින් නිපන් පෙරකිරියපදයි.

3. **'සේසත්'**-යනු සුදුකුඩයයි.

4. **'බඳ'** යනු කෘදන්ත නාමපදයෙකි.

**සං:-** ඒ නගරයෙහි ප්‍රාසාදයන්ගේ කොත්වල රශ්මිය වැදී පෙණුනු පූණිචන්ද්‍රයා කෙබඳු ද? යත්: රණින් හා රත්නයන්ගෙන් කළ යෂ්ටියෙක්හි (=මිටෙක්හි) වූ ශ්වෙතච්ඡත්‍රයක් මෙනි. ඡත්‍රය නම් චන්ද්‍රයි. එහි යෂ්ටිය නම් ශෘඞගාග්‍රරශ්මියයි.)

මෙය **කාව්සිළුමිණෙහි**

"කැරුළුමිණි රුස්යට-ගෙහි සෙස්තෙ'ව් තෙවුනේ,
විමනුදුල එපුරනුබේ-සුපුන්සරා සරාසඳ"

යන ගිය බලා බැඳුනකි.

**29** **සුනිල්මිණිබිම දු** **ළ**
**පිළිබිඹු ව දිසි දද වැ** **ල**
**කෙළි සාලිඳුගග තු** **ළ**
**අමින්මින්රළවිලස් පල කා** **ළ**

**අ:-** දුල සුනිල් මිණිබිමැ පිළිබිඹු ව දිසි දදවැල සාලිඳුගග තුළ කෙළි අමින් මින්රළ විලස් පළ කළ.

**ප:-.** **'සුනිල්මිණිබිම'** - ආධාරවිභක්ත්‍යන්තයි. ඇකාරයට අකාරාදෙශයි.

2. **'පිළිබිඹු'** යනු සමාන කොට තැනූ රූපයට ද ඡායාවට ද නාමෙකි. මෙහි ඡායාර්ථයෙහි යෙදේ.

---

1 රැස්. 2. ඔරද.

3. **'කාලිඳුගඟ'**- යනු යමුනාගඞ්ගාව ය. එහි ජලය කෘෂ්ණ වර්ණ ය.

**සං:**- මේ නගරයෙහි (වීථි) භූමිය නිල්මැණික්වලින් තනන ලද්දේ ය. අහස්හි ලෙලදෙන ධ්වජයන්ගේ ඡායාව එහි පැණේ. ඒ කෙබඳු ද? යත්: **කාලින්දී** ගඞ්ගාවෙහි ක්‍රීඩා කළ අප්‍රමාණ මත්ස්‍ය සමූහයක් වැන්න. (නිල්මිණිබිම කාලිඳුගඟ වැනි ය. ධ්වජච්ඡායාව මත්ස්‍යයන් වැන්න.)

මෙය **කව්සිළුමිණෙහි**-

"සුනිල් මිණිවේබිමැ-පිළිබිඹු බඳ දදසුඹු,
පෙරළෙන කාලිඳුගඟැ මින්-කැල කෙළි පෑ එපුරවර"

යන ගිය බලා තැනුනකි.

**30 පහඟ රන්මිණි රැ ස**
**වැද රන්නරිඳු මැද ස ස**
**බෝසත් සස දව ස**
**රුපැයි ගිනිරුස්මැදට පැනි ලෙ ස**

**අන්වය** සුගමයි.

**ස:**- 1. **'නරිඳු'**-නරුවලට ඉඳු=නරිඳු.

2. **බෝසත්**-'බොධිසත්ත' යන්නෙන් භිත්‍යයි. 'බොධි' යනු සර්වඥතාඥානයට ද නමෙකි. ඒ සර්වඥතාඥානයෙහි ආසක්ත වූවාහු (ඇලුනාහු) බොධිසත්ත නම් වෙති. බෝසත්හු නිරතුරු සර්වඥතාඥානය පතා පැරුම් පිරුමෙහි ඇලී වෙසෙති.

3. **'සසදවස'** යනුවෙන් සසජාතකය උද්දෙශ කළහ.

අප මහබෝසතාතන්වහන්සේ අතීතයෙහි සාවෙක් ව උපන්හ. හේ හැකි තාක් පින්දහම්හි හැසුරෙණුයේ එක්පොහෝ දිනෙක්හි අටසිල් ඉටා "ම වෙත දන් දිය යුතු කිසි දෑයක් නැත. එහෙයින් යදියෙකු පැමිණියොත් ඇඟමස් දන් දෙමි"යි සිත මින් සිටියේ. බෝසත්හුගේ මේ උදාරාධ්‍යාශයබලයෙන් හා සිල් බෙලෙනුත් ශක්‍රයාගේ පඬුපුල්සලස්න උණු වී ය. ශක්‍රතෙමේ දිවනෙත් යොමා ලොව බැලූයේ මොහු දෑක දිළිඳු බමුණු වෙසක් ගෙණ බෝසතුන් වෙත එළඹ කෑ යුතු දෑයක් යැදී. බෝසත්තෙමේ ඇඟමස් දෙනඅටියෙන් ඔහු ලවා ගිනිරුසක් දල්වා ඒ මැදට පැන්නේ ය. ගින්නෙන් ඔහුගේ රොමකූපමාත්‍රයකට ද හානියක් නො වී ය. ශක්‍රතෙමේ ඔහුගේ උදාරාධ්‍යාශයට පැහැදී ඔහුගේ රුව මුළුලොවට පැණෙන සේ සඳෙහි ඇඳ ඔහු විසින් පැතූ වර දී ගියේය. මේ **සසදාහි** සංක්ෂිප්තයෙකි. විස්තර **ජාතක පොතෙන්** ගන්නේයි.

4. **'පැනිලෙස'**– 'පැනි' යනු 'පන්–පැනුම්හි' දයින් අතීත කාලීනකාරක 'ඉ' පස වීමෙන් සිද්ධකෘදන්තපදයි.

**සං:**– ප්‍රාසාදශෘඞ්ගාග්‍ර රක්තමාණික්‍යරශ්මිය වැදී ඒ නගරාකාශයෙහි චන්ද්‍රයා රක්තවර්ණ වීමෙන් ගිනිගොඩක් මෙන් වී ය. එවිට එහි වූ සසලපය බෝසතුන් ශශජාතකයෙහි දී ගිනිමැදට පැනි අයුර පෙන්වී ය.

**කුශජාතකයෙහි** 26 පද්‍යය ද මෙබඳු ය.

| | | |
|---|---|---|
| 31 | **එහි නලඹ රඟ ග** | **ත්**[1] |
| | **පිළිබිඹු**[2] **පෙණුනු මිණි බි** | **ත්** |
| | **පිළිමල් වෙමිනවු** | **ත්** |
| | **රඟන සුරඟන**[3] **වැන්න සිරිම** | **ත්** |

අ:– එහි මිණිබිත් පෙණුනු, රඟ ගත් නලඹ පිළිබිඹු පිළිමල් වෙමින් අවුත් රඟන සිරිමත් සුරඟන වැන්න.

ප:– 1. **'රඟගත්'**–යන්නෙහි අර්ථය නම් "නෘත්‍යාරම්භ කළාවූ" යනුයි. "ගත්" යනු 'ගන්–ගැණුම්හි' දයින් නිපන් අතීතකාලීනකාරකකෘදන්තයෙකි.

2. **'පෙණුනු'**–'පෙන්–පෙණුම්හි' දයින් කතෲකාරු 'නු' පස වීමෙන් සිද්ධ කෘදන්තයි. 'පිළිබිඹු' යන්නට විශෙෂණයි.

3. **'මිණිබිත්'** යනු ආධාරවිභක්ත්‍යන්තයි. එලිසමය සඳහා විභක්තිප්‍රත්‍යය ලුප්තයි.

4. **'පිළිමල්'**– "පටිමල්ල" සදින් භිූනයි. ඒ විරුද්ධපක්‍ෂයෙහි වූ බාහුයුද්ධකාරයාට (අතින් පහර දෙන්නාට නමක් වුවත් අවිශෙෂයෙන් 'විරුද්ධ' යන අර්ථයෙහි ද බොහෝ සේ යෙදේ. මෙහි ද එබඳු ය.

5. **'වෙමින්'**–'ව (වූ)–වීමෙහි' දයින් සිද්ධ මිශ්‍රක්‍රියාපදයි. මෙහි පූර්වක්‍රියාර්ථයෙහි යෙදින. මිශ්‍රක්‍රියාවෝ පූර්වක්‍රියාර්ථයෙහි ද යෙදෙති. **සැළලිහිණිඅස්නෙහි** "තිලතුරහට නැහෙමින් රිවිදෙව් සිරිනි" යනාදිය සාධකයි.

6. **'අවුත්'** යනු 'ආගත්‍ය' යන්නෙන් බුන් පෙරකිරියපදයි. සිංහලයෙහි ප්‍රකෘතිප්‍රත්‍යයකල්පනයෙන් සිද්ධ නො කට හැකි හෙයින් නිපාතනවිධියෙන් සිද්ධ යයි කියනු ලැබේ. සිංහලධාතු ප්‍රත්‍යය විභාගය නො කට හැකි වන්නේ ද බිදී ආහෙයිනි. "ගොස්, ගොසින් කොට, කොටින්, ලදින්, අවුදින්," යනාදිය ද නිපාතනවිධියෙන්

1. එහි නිලඹරඟහත්. 2 පිළිමිණ්. 3. සුරඟර.

සිද්ධ ය. 'ගොසින්' යනාදිය බලා පෙරකිරිය 'ඉන්' පසක් ඇතැයි කිම නො යෙදේ. "ගනත්වාන" යනාදියෙන් 'ගොසින්' යනාදිය බිඳේ.

7. **'රඟන'**-'රඟ' දයින් නිපන් කතෘකාරකකෘදන්තයි.

8. **'වැන්න'**-'වැනි+ය' දෙදෙනාගේ සන්ධියෙන් සිද්ධයි.

**සං:**- මේ පද්‍යයෙන් නගරවිභූතිය වැණිනා. මේ නගරයෙහි ගෘහභිත්ති මිණිමුවා ය. එහෙයින් ගෘගාභ්‍යන්තරයෙහි නටන්නාවූ නාටිකාවගේ ප්‍රතිබිම්බයෝ මණිභිත්තීන්හි පැණෙති. ඒ පිළිබිඹු කෙබඳු ද? යත්:- නාටිකාවන් හා විරුඬ වී අවුත් (තරඟයට) නටන දෙවඟනන් වැනි ය. (උත්ප්‍රේක්‍ෂායි.)

මේ පද්‍යය **කව්සිළුමිණෙහි**

"නටතොංතමතහහනක-පිළිබිඹුනි එපුරේහි,
පිළිමිණිගෙ පිළිමල්නස්-නා කියෙලි දිවසරන්සැන්"

යන ගීය බලා බඳනා ලද්දකි. **තිසරසඳෙස්හි** 12 වන කව ද අර්ථයෙන් බෙහෙවින් මෙය හා සම ය.

32 **සරදඹිනුනඟ තෙ** ද
**දදනියරැසිනි යසස** ද
**විසිබැලුමෙන් සර** ද
**සාලෝ පළ[1] එපුරෙහි සරණ ල** ද

අ:-එපුරෙහි සරණ ලද සාරදරින් උනඟ තෙද (ද) දදනිය රැසිනි යසස ද විසිබැලුමෙන් සර ද පළ සාලෝ.

**ප:**- 1. **'සරදඹිනුනඟතෙද'**- මේ නගරයෙහි හැසිරෙණ කාන්තාවන්ගේ සර (=අතුල්) හා අදර (තොල්) ද රක්තවණී ය. එසින් අනඬගයාගේ තෙජස ඒ කාන්තාවෝ ප්‍රකට කෙරෙති. ,තෙජස වනාහි කාව්සමයයෙහි රක්තවණීවත්වයෙන් සැලකේ.

2. **'උනඟ'**- 'ඌනාඬග' ශබ්දයෙන් නිපන්නයි. ඌන වූ ශරීර ඇත්තා හෙවත් ශරීරය නැත්තා යනු අර්ථයි. මෙතෙම වනාහි සත්වයන්ගේ චිත්තයන්හි කාමාශාව උපදවන්නාවූ දෙවියා යයි කියනු ලැබේ. අසුරයන්ගෙන් පරාජය ලත්, ඔවුන් පරදවනු කැමැති **ශක්‍රයාගේ** නියොග ලැබ ඒ **කාමදෙව** තෙමේ ව්‍රතචරණ යෙහි යෙදී සිටි **ඊශ්වරයාගේ** චිත්තයෙහි ඊශ්වරොපස්ථානයෙහි ආසක්ත වූ **පාර්වතිය** පිළිබඳ ව කාමාශාව ඉපිදවී. (**ස්කඳකුමරු** ඉපදීම එසින් වූ ප්‍රතිඵලයයි.) ඊශ්වර තෙමේ ඉන් කුපිත වී ලලාටාක්‍ෂියෙන් ගිනිදැල් නිකුත් කෙළේ ය. ඒ ගින්නට අසු ව

1 පළ සාලෝ.

**කාමදේව** තෙමේ භස්ම වී ය. පසු ව **රතියගේ** ඇවිටිලිබසින් දුඃඛිත වූ **ඊශ්වරයා** විසින් **කාමදේවයා** ජීවමාන කරණ ලදී. එහෙත් හේ එතැන් පටන් 'අනඞ්ග' නම් වි ය-යනු පුරාණයන්හි ආ කථාවයි. මේ මිථ්‍යාකථාවන්හි නො එල්බ සලකනවිට අනඞ්ග නාමය රාගපර්‍ය්‍යායවශයෙන් නිපන් බව හැගේ.

3. **'දදනියරැසිනි යසස ද'**- දන්තයන් හා නබයෝ සුදුවන් වෙති. ඉන් නිකුත් වන රශ්මිය ද ශ්වේතවර්ණ ය එයින් අනඞ්ගයාගේ යසස මෙබඳු යයි පවසති. යශස් ශ්වේතවර්ණය යනු කවි සමයයි.

4. **'දද'**- 'විජ' ශබ්දයෙන් භිත්තයි. දෙවරකට උපදින හෙයින් දත් 'විජ' නම් වේ.

5. **'රැසිනි'**- 'රස්' යනු ප්‍රකෘතියි.

5. **'විසිබැලුමමෙන් සර ද'**- විසිබැලුම නම් මඳ සිනා සහිත ව නෙත්කොණින් බැලුමයි. යම් සේ ඊතලයකින් විදිකල්හි ඉලක් කය සිදුරු ව යේ ද, එසේ ම රසිකයන්ගේ හෘදය මේ කතුනගේ අපහාස්‍යනිරීක්ෂණයෙන් දෑදුරු ව යේ. එහෙයින් අපහාස්‍ය නිරීක්ෂණයෙන් උනගගේ බාණයන් පෙන්වන බව කිහ.

'අනඞ්ගශර' නම් පියුම්, හෝපලු, මීඅඹ, දෑසමන්, නිලුපුල් යන මල් පසයි. මේ හිවලින් විදිකල රාගවේතනාවෝ උපදිති. මෙහි 'විසි' සි යෙදුම සම්භාව්‍ය නො වේ. සම්භාව්‍යයෝ මේ අර්ථයෙහි 'වහස්' යනු යෙදූහ.

7. **'ලද'** -'(ලඳහු=)-ලඳු'සි කුබූතන්හි එලිවැට රකිනු සඳහා උකාරයට අකාරාදේශ යි. නො එසේ නම් "කාලෝ" යන බහු වචනාන්තකෘදන්තය හා නො ගැළපේ.

**සං** :- මෙයින් ඒ නගරයෙහි කාන්තාවන්ගේ රූපාතිශයය වර්ණිත ය. මේ පද්‍යය-

"නියරැසිනුනහ යස-කුනුසොසර රුජිනුදහස්,
තෙද ලවනහ අත්ලෙන්-සරරැස් වහස්බැල්මෙන්"

යන **කව්සිළුමිණි** ගීයෙන් බැඳුනකි.

**33**
**එපුරගනන්ගෙ දු** ල
**දූවවි නෙත්සැලුම් දෑ** ල
**මදහසපණිනැකි** ල[1]
**සිවිති යා නො හි[2] සලෙලුමුවකැ** ල

**අන්වය සුගමයි.**

1. පණ පැකිල. 2. සං හො ව.

ස:- **'නෙත්සැලුම්දල'**-නෙතින් විහිදෙන කාන්තීහු සියුම් රැහැන් වැනි වෙති. **පැරැකුම්බාරජහු** ද "අනේදනන් නුවන්-පැහැරජයොත්දහස්නෙන්"සි නෙත්‍රකාන්තිය යොත් සේ ගත්හ. දෙපස සිටිත කාන්තාවන්ගේ නෙත්‍රකාන්ති ප්‍රතිවිරුඬ ව හුනු සාල්හි දූලක් වැනි වේ. **සාවසිළුමිණෙහි** ද කිහ:- "මහවේ දෙපස සලුන්-බැලුම්දලවුලෙ තිරිඳු වත"සි.

2 **'දූවටී'**- 'දවට-දූවටීමෙහි' දයින් නිපන් පෙරකිරියයි.

3 **'මදහසපණින්'**-මඳහාස නමැති පණියෙන් යනු අර්‍ථයි. අදිනලද පන් දූක මුවෝ බිය ව ඇකිලෙති. මුවන් කුඹුරුවලට නො එනු සඳහා දූනුදු කෙත් අවට පන් අදිති. **පූජාවලියෙහි** ද මෙය කිහ:- "කුඹුර සිසාරු අතු තබාලුව මැනව. පන් ඇද්ද මැනවැ"යි. මේ සිරිත බෝසතුන් **නිග්‍රොධමිග** ව උපන්කාල යෙහි පටන් පැවැතෙන්නකි. **ජාතකඅටුවාහි** ද "තතො පට්ඨාය කිර ඛෙත්තෙසු පණ්ණබන්ධනසඤ්ඤං උදපාදි. තතො පට්ඨාය පණ්ණසඤ්ඤං අතික්කමණකමිගො නාම නත්‍ථි" -"එතැන් සිට කෙත්හි පන් බඳින ලකුණ උපන්නේ ල. එදා පටන් පන්ලකුණ ඉක්මවන මුවෙක් නම් නැතැ"යි කීහ.

**සැවුල් අස්නෙහි-**

"මදහස **පණැද** මනරුනෙපුල සත් කා ර
පියයුරුවළ වසාපස යොදමින් පත ර"

යන්නෙහි "පණ ඇද-ජාලය ප්‍රසාරණය කොට'යි කී අර්‍ථ නො යෙදේ. එහි ම "පණී බන්ධනය කොට"යි අරුත් බිණිය යුතු වේ.

4 **'ඇකිල'**- 'අකුල-ඇකිලීමෙහි' ධාතුයි. 'ඇකිලීම' නම් පයෙහි යම් කිසිවක් ගැටීමෙන් හෝ භයජනක දෙයක් හෝ ආශ්චර්‍යයක් හමු වීමෙන් යමක පටලැවුනාක් මෙන් නැවතීම හෝ පසුපසට හැරී සිටීම යි.

**සං**:- රසිකජන නමැති මුවෝ කාන්තාවන්ගේ මඳහාස නමැති පන් දූක ඇකිලෙති.

5 **'සිටිති'**- 'සිටු- සිටුම්හි' ධාතුවෙන් නිපන් බහුවචනක්‍රියා පද යි. මෙහි උක්තකර්තෘ 'සලෙලු මුවකැල' යන්න යි. ඒ ඒක වචනාන්ත යි. සප්‍රාණසමූහවාචකශබ්දයන්ගේ ප්‍රථමෙක

වචනාන්තය හා යෙදෙන ක්‍රියාපදය බහුවචනාන්ත කොට යෙදීම සිංහලරීති යි. "පිරිස සාධුකාර දෙන්නට වන්හ." "මින්රළ වෙර ලව රුස් වූ" යනාදිය ඊට සාධකයි. ඇතැම් තැන එකවචනක්‍රියා ද යෙදේ. "ගජසෙන් සිතියම් ගජසිරි කියෙලි" යනු සාධකයි.

5. **'යා නො හි'**–'යා' යනු යාත්‍රා ශබ්දයෙන් බිඳුන යි. 'ගමන්' යනු අර්ථයි. 'හි' යනු 'හෙ–සමත්බැව්හි' දයින් නිපන් පෙරකිරි යකි. 'හෙ' ධාතුව වරනැගෙන්නේ (අයු=)හිති, හුනු; (වත්මන්=) හෙයි, හෙත්, යනාදි පියිති. මෙහි ඡන්දෝහෙතුවින් 'හි' යන්න හ්‍රස්ව වී ය. **තිසරසන්දේශයෙහි** "පයැද යා නො හි මහවෙවුළුල්ලෝ"යි හ්‍රස්ව නො කොට ම යෙදී.

| | | |
|---|---|---|
| 34 | **රතදඟිනි** | **නාලිය** |
| | **ගමනින් සදිසි** | **නාලිය** |
| | **එපුර සර** | **ණාලිය** |
| | **කාවුරු නම් හැකි වෙති ව** | **ණාලිය** |

**අන්වය** සුගමයි.

**ප**:– 1 **'රතදඟිනි නාලිය'**– මෙපුර කතුන්ගේ අධරයෝ (තොල්) රතු වෙති. නාදලු ද රක්තවර්ණ ය. එහෙයින් මොහු රක්තාධරයෙන් නාගලතාතුල්‍යයහ. **තිසරසන්දේශයෙහි** ද මේ කිහ:– "නුවනින් නිල්උපුල් **රතදඟිනි නාලිය**"යි.

2. **'ගමනින් සදිසි නාලිය'**– නාගාඞ්ගනාවන්ගේ (=ඇතින්නන්ගේ) ගමන් ලීලොපෙත ය. මේ කතුන්ගේ ගමන් ද එබඳු වෙයි. මෙය **රහල්** හිමියන් විසින් ද බැඳුනකි. (කාව්‍යශෙඛර 13. 6)

3. **'කාවුරු නම් හැකි වෙති වණාලිය'**– මේ කතුන්ගේ වර්ණකථනයට කාවුරුත් සමර්ථ නො වෙති යනු පිණ්ඩාර්ථයි.

4. **'වණාලිය'**– 'වණා' යන පෙරකිරිය පෙරටු කොට ඇති 'ලා' දයින් 'ඉය' ප්‍රත්‍යය වීමෙන් සිද්ධ කෘදන්තනිපාතපදයෙකි.

**සං**:– කුසජාතකයෙහි 29 වන පද්‍යය ද මෙබඳු ය.

| | | |
|---|---|---|
| 35 | **තනයුගැති යි** | **පිනා**[1] |
| | **ඉඟසුග ගතැකි මි** | **පිනා** |
| | **මෙමුළුලොව ව** | **පිනා** |
| | **සඳලු සුසැඳිනි**[2] **කළුන් යි** | **පිනා** |

අ:– පිරිනා තනයුග ඇති මිටින් ගතැකි ඉඟසුග ඇති මෙමුළු ලොව වපිනා කළුන් පිරිනා සඳලු සුසැඳිනි.

1. සොබනා. 2. සුසැදුනු.

**පෘ:-1 'තනයුගැති සිටිනා'**- තනවල යුග=තනයුග; 'සිටිනා' යන්නෙන් පයොධරයන්ගේ විශිෂ්ටත්වය කීහ. අධොමුඛ වූ (=වැටුනු) පයොධරයෝ කාන්තාරූපයන් හෙබවීමෙහි සමර්ථ නො වෙති.

2. **'ඉඟසුඟ'**-සුඟ වූ ඉඟ=ඉඟසුඟ. මෙහි 'සුඟ' සද සවල්පාර්ථ යෙහි යෙදින. මෙසින් ම අා 'හුඟ' යන්න වත්මන්හි බහ්වර්ථ යෙහි යොදති.

3. **'ගතැකි'**-(ගත+හැකි=ගත+ඇකි) 'ගත' යනු 'ගත්' දයින් නිපන් කෘදන්ත නිපාතයෙකි.

4. **'මිටිනා'**-'මිටින්'යි තුබූ තන්හි එලිවැට සඳහා ආකාරාගම යි.

**සං:-** මෙසින් මධ්‍යභාගයෙහි (ඉඟෙහි) කෘශත්වය වැණීන. සිහින් ඉඟ ඇති බව කාන්තාවන්ට ලක්‍ෂණයෙකි.

5. **'වටිනා'**- 'වට' දයින් නිපන් කෘදන්තපද යි.

6. **'සඳලු'**-සඳරැස් වැටෙන සේ ගෘහ මතුවෙහි තනනු ලබන ශාලා විශෙෂයකි.

7. **'සුසැදිනි'**- සු පූර්‍ව 'සද' දයින් නිපන් අතීතකාලික සවයං කර්තෘ සවයංකර්මකක්‍රියාපදයි. 'සුසැදුනු' යනු බහුවචන ක්‍රියායි. 'සඳලු' යන නපුංසකලිඞ්ගබහුවචනාන්තය හා ඒ නො ගැළපේ. නපුංසකලිඞ්ගබහුවචනාන්තය උක්තය ව සිටි කල්හි යෙදෙනුයේ එකවචනාන්තක්‍රියාපදයෙකි.

| | | |
|---|---|---|
| 36 | මල්පලුපල දූ | රූ |
| | නද දෙන කොවුල් බම | රූ |
| | රිවිකිරණ ඇවු | රූ |
| | එයුර ගෙවුසන් වණති කවු | රූ |

**අන්වය** සුගමයි.

පෘ:-1 **'දූරූ'**-'දර-දූරුම්හි' දයින් නිපන් අතීතකර්තෘකාරක කෘදන්ත යි.

2. නද දෙනුයේ=නදදෙන. කොවුලෝ ද බමරූ ද=කොවුල් බමරූ. නදදෙන කොවුල්බමරූ යම් තැනෙක්හි ද ඒ=**නදදෙන කොවුල් බමර**. 'බමර'යි සිටිය යුතු තැන එලිවැට සඳහා අකාරයට උකාරාදෙශයෙන් 'බමරූ'යි සිද්ධ යි.

3 **'ඇවුරූ'**- 'අවුර-ඇවුරුම්හි' දයින් නිපන් අතීතකර්තෘ කාරක කෘදන්තපද යි. සූය්‍යීරශ්මි ආවරණය වනුයේ නිරන්තරා සන්න වෘක්‍ෂලතාවන්ගේ සාන්‍ද්‍රච්ඡායාවෙනි.

4. **'ගෙවුයන්'**- ගෙවල් අසල පිහිටි උයන් වතු යි.

37 **කෙළිනා ලද ලසා ල්**
**කුල්නා තිසරමිහිලො ල්**
**සිහිලඹ පිරි නිම ල්**
**පමණ නො සාළැකි එහි ගෙදිගුවි ල්**

අ: එහි ලසාල් ලද කෙළිනා තිසරමිහිලොල් කුල්නා නිමල් සිහි ලඹ පිරි ගෙදිගුවිල් පමණ නො සාළැකි (වේ.)

පඃ- 1. **කෙළිනා**-'කෙළ' දයින් ආධාරකාරකයෙහි නා ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්තපද යි.

2. **'ලසාල්'** (=ලයට සාල්)-ල+සාල් දෙදෙනාගේ සමාවය යෙන් සිද්ධ යි. මනොඥ යනු අර්ථ යි. 'අලඞ්කාර' ශබ්දයෙන් එන 'ලසාල්' යන්නකුදු ඇත්තේ ය.

3. **'කුල්නා'**-'කුල්-හැඬුම්හි' දයින් ආධාරකාරකයෙහි නාපස වී සිඩ කෘදන්ත පද යි. කූජනය කාරණ (හඬන) -යනු අර්ථයි.

4. **'තිසර මිහිලොල්'**-'තිසර' නම හංසයෝ යි. 'මිහිලොල්' නම් මීමැස්සෝයි.

5. **'සිහිලඹ'** මෙහි 'අඹු' සද 'අම්බු' ශබ්දයෙන් භින්න යි.

6. **'පිරි'**-'පුර' දයින් කතෘකාරැහි සිද්ධ කෘදන්ත යි.

7. සාළ+හැකි=සාළ+ඇකි=**සාළැකි.**

8. **'ගෙදිගුවිල්'**-ගෘහාසන්නයෙහි පිහිටි දික් වූ තඩාගයෝයි.

38 **උස්කුඹු[1] දළ දළි න**
**දෙරණ සුපිහිටි සතඟි න**
**ලකුණෙන් යුතු සොඬ න**
**මතඟසෙන් එහි සරති හැමදි න**

**අන්වය** සුගම යි.

පඃ- 1. **'දෙරණ සුපිහිටි සතඟින'**-'බිම පිහිටි සතඟ' නම රහසඟ, වලග, සොඬ, සතරපය යන මේ යි. කියන ලද මැයි **සැවුල් අස්නෙහි**-

"වලග කර සතරපද රහසඟ ය ය න
සතඟ දෙරණ සුපිහිටි තුහු දළ දකු න" යි.

2. **'මතඟ'**-හස්තිවාචී 'මාතඞ්ග' ශබ්දයෙන් භින්නයි.

3. **සරති**-'සර-සැරුම්හි' ධාතුයි.

---

1 උසකුඹු.

**39.** **පස්කලණ[1] සුනු ව** **න**
**මහරු[2] ලකුණින් වොරද** **න**
**කෙසරුන් මෙන් පනි** **න**
**තුරඟසෙන් එහි සරති නිතිසෙ** **න**

**අන්වය** සුගමයි.

**ප:-** 1. **'පස්කලණ'** මේ වනාහි අසුන්ට පිහිටන යහපත් ලක්‍ෂණ පසකි. එනම්: සුදුවන් පාසතර ඇඟිබව හා නලලෙහි අඩසඳ ලකුණ ඇති බව ද යන මේ යි. මෙබඳු අශ්ව හිමියාට යහපත කරන්නෝ වෙති. කියන ලද මැයි:-

"යස්‍ය පාදාඃ සිතාඃ සර්වේ-චන්ද්‍රාකාරශ්ච ලලාටකෙ,
කල්‍යාණ පඤ්චකඃ ප්‍රොක්තො-නෘණාඃ කල්‍යාණ කාරකඃ"යි.

**'පස්දහර'** යනු ද පාඨ යි. ආස්කන්දිත, ධෞරිත, රේචිත, වල්ගිත, ප්ලුත යන අශ්වයන්ගේ පස්වැදෑරුම් ගමන් වෙසෙස් පඤ්ච ධාරා නම්. ඒ පඤ්චධාරායෙන් යුක්ත වන්නේ එහි ඉතා ශික්‍ෂිත වූ විට ය.

2. **'මහරු ලකුණින්'**-මෙයින් යථෝක්ත ලක්‍ෂණයෙන් අන්‍ය වූ ධ්‍රැවාදි ශුභලක්‍ෂණ දක්වූහ. (**කව්සිළුමිණෙහි** 388, 389 වන ගී වලින් අසුන්ගේ මහරු ලකුණු සමහරක් කියවේ.)

3. **'නිතිසෙන'**-'නිති' යන ක්‍රියාවිශෙෂණනිපාතපදය කාරණ විභක්ති ප්‍රතිරූපක 'එන්' පස ගැණීමෙන් සිද්ධයි. සිංහල යෙහි ඇතැම් නිපාතයෝ විභක්තිප්‍රතිරූපකප්‍රත්‍යයන් ගණිති. අදින්, අදට, හෙටින්, හෙටට, යටින්, යටට, උඩින්, උඩට (සේ=) සෙයින්, යනාදිය මෙති.

**40** **ලෙලරන් රිදී ද** **ද**
**යෙඳූ සුදුසිඳු මනන** **ද**
**එපුර රිය සක්න** **ද**
**පැතිර පවති දිගන විනිවි** **ද**

**අන්වය** සුගමයි.

**ප:-** 1. **'ලෙලරන් රිදීදද'** යනු ද්වන්ද්ව-විභක්ති සමාසගර්භ කොට ඇති අන්‍යාර්ථසමාසපදයෙකි. රන් ද රිදී ද=රන්රිදී. එයින් කළ දද=රන්රිදීදද (මධ්‍යපදය ලුප්තයි.) ලෙල රන්රිදී දද වනුයේ යමෙක්හි ද ඒ=ලෙලරන්රිදීදද.

2. **යෙඳූ**- 'යොද' දයින් ආධාරකාරකයෙහි නිපන්කෘදන්තයි. 3. **'සිඳු'** 'සින්ධව' යන්නෙන් භින්නයි. සින්ධුදෙශයෙහි උපන්හෙයින් එනම් වේ. ඒ අශ්වයෝ උතුමැයෙන්. 4. **'රිය'**-'සක්' යන්නෙහි සම්බන්ධයි. 5. **'පැතිර'**-'පතුර-පැතුර-පැතුරුම්හි' ධාතුයි. 6. **'පවති'**-'පවත්'-පැවතුම්හි' ධාතුයි. 7. **'විනිවිද'**-'වි නි' පූර්ව 'විද-විදුම්හි' දයින් නිපන් පෙරකිරිය පදයි.

---

1 පස්දහර. 2 කලණ.

41 **බිමට බට අහ සෙන්**
**වික්‍රමින් සදිසි මහ සෙන්**
**ජය ගෙණ සතුරු සෙන්**
**එපුර හැසිරෙයි තුමුල බළ සෙන්**

**අ:–** වික්‍රමින් අහසෙන් බිමට බට මහසෙන් සදිසි තුමුල බළ සෙන් සතුරු සෙන් ජය ගෙණ එපුර හැසිරෙයි.

**ප:–**1. **'බට-'** 'බස්– බැසුම්හි' දැයින් අතීතකාලීනකාරක උත ප්‍රත්‍යය ව සිද්ධකෘදන්තයි. 'උත' හට 'අ' ආදේශයි.

2. **'වික්‍රමින්'** සත්‍ත්‍වෙන් මහාසේනයන් සදෘශ වීමෙහි හෙතුව දැක්වූහ. 3. **'මහාසෙන්'** නම් දෙවියන්ගේ සෙනාපතියා වූ ස්කන්ද කුමාර දෙවහොමේයි. හේ අතිශය වික්‍රමවත් ය යි ප්‍රසිද්ධ ය.

4. **'හැසිරෙයි'**–(හැසිරේ+යි) 'හසුර– හැසුරුම්හි' ධාතු යි. (33–5 බලනු.)

**සං:–** මෙය **කුසදාකි** 34 වන කව හා බෙහෙවින් සදෘශ ය. මින් අනතුරු ව

"අත ලෙලවි නන්වග–සුදට සැරසී බැණ මිග
එපුරෙහි මහසෙනඟ–නිතර සපිරි සරති වේමග"

යන කව සමහර පොත්හි පැණෙතත් ප්‍රථමපද්‍යයෙන් වර්ණිතය ම එයිනුත් වැණෙන හෙයින් පුනරුක්තනු යි එය බැහැර කළම්හ. එය **කුසදාකි** 92 වන කව බලා බැළුනකි.

42 **සුදනන්ගෙන් දිමුත්**
**එපුරෙහි සියලු සම්පත්**
**වණනා නරඹනා හොත්**
**අනන සසා මුත් සාවුරු පොහොසත්**

**අන්වය** සුගමයි.

**ප:–** 1 **'වණනා'**–'වණ' දැයින් නිපන් අසම්භාව්‍ය ක්‍රියාපද යි. මොහු ද නිපාතසංඛ්‍යාවෙහි ම වැටෙති.

2. **'නරඹනා'**– 'නරඹ' දැයින් නිපන්නේ ය.

3. **'හොත්'**–අසම්භාව්‍යාර්ථය ප්‍රකට කිරීමෙහි වැටෙන නිපාතයෙකි. 'බලතොත්' යනාදියෙහි ලැබෙන 'ඔත්' යන්න ද මෙහි හකාරලොපයෙන් සිදු වන්නකි.

3. **'අනන'**– මුඛ දහසක් ඇතැයි සලකනු ලබන නාරජෙකි. එහෙයින් හේ වැණුමෙහි සමර්ථ ය. (26–3 බලනු.)

4. **'සසා'**–4–2 බලනු.

5. **'මුත්'**–'මුක්ත්වා' යන්නෙන් භින්නයි. සිංහලයෙහි නිපාතනවිධියෙන් සිද්ධ පෙරකිරියකැයි ගණු ලැබේ.

6. **'පොහොසත්'**–'පහුසන්ත' යන පාළිවචනයෙන් භින්නයි.

**සං:–** වණනා හොත් අනත මුත් සාවුරු පොහොසත් වෙත් ද ? නරඹනා හොත් සසා මුත් සාවුරු පොහොසත් වෙත් ද ? (සාවුරුත් නො පොහොසත්හ යි යුසු සේයි.)

"බලන වණන මෙනුවර සිරි මනා ලෙ ස
සො වන දියත සුරනන අනතනා මි ස"

යන **තිසර සඳෙස්** බැඳුම බලා මේ බැඳුනෝ ය.

**43 එපුරවර සිරිම න්**
**සත වෙත පතල මෙන් යු ත්**
**කිසි අවගුණ නො ද ත්**[1]
**වී ය නිරිඳෙක් නමින් බඹද ත්**

අ:- එපුරවර කිසි අවගුණ නො දත් සත වෙත පතළ මෙන් යුත් සිරිමත් බඹදත් නමින් නිරිඳෙක් වී ය.

ප:-1 **'අවගුණ'** නම් දුර්ගුණයි. හෙවත් අයගපත්ගතියි. මේ රජ කිසි අවගුණයක් කරණු තබා නො දන්නේ ද වේ.

2 **'දත්'**-'දත්-දැනුම්හි' දයින් නිපන් කෘදන්තපද යි.

**44 එරජුගෙ යසපබ ඳ**
**දසත පැතිරෙන එකාලෙ ද**
**කිරිසිඳු නිල්මුහු ද**
**එවෙන් වෙන් නො ම**[2] **දනි ය පිරිසිඳ**

අ:-එරජුගෙ යසපබඳ එකාලෙද දසත පැතිරෙත එවෙන් කිරිසිඳු නිල්මුහුද වෙන් පිරිසිඳ නො ම දනි ය.

ප:-1 **'පැතිරෙන'**-'පතුර' දයින් නිපන් කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාපදයෙකි. මේ ක්‍රියාපදයෝ ද නිපාතයෝ ම වෙත්. මෙහි කර්තෘ "යසපබඳ" යනුයි. ඒ කර්තෘවිභක්ත්‍යන්තයි. ආධාරාර්ථයක් හෝ කාමාර්ථයක් එහි නැත්තේ ය.

2. **'කිරිසිඳු'**-ශ්වේතවර්ණ සමුද්‍රයයි. **"මහමෙර** පූර්විදිග් භාගය රිදීමය ය. එසේ හෙයින් ඒ මුහුණෙහි පෑ පතළ ඒ දිග මුහුද දිය විරිවාපී රිදී සේ සුදු ය." මේ ය **කිරිමුහුදු** නම්. මෙහි විෂ්ණුනු වසන බව ප්‍රසිද්ධ ය.

3. **'නිල්මුහුද'**- "**මෙරුව දකුණු මුහුණ ඉන්ද්‍රනීලමණිමය ය.** එහෙයින් එදිග මුහුද නිල්පැහැ වෙයි". මේ ය නිල්මුහුද.

4. **'එවෙන්'**- මෙහි 'එ' සද උක්තපරාමර්ශනයෙහි නො ව ප්‍රසිද්ධාර්ථයෙහි වැටේ. 'ප්‍රසිද්ධ වූ විෂ්ණු' යනු අර්ථයි. නො එසේ වී නම් "යම්' ශබ්දයාගේ ප්‍රයොගයක් නැති තැන 'එ' සද යෙදීම දුෂ්ට ය. මුල දී 'එ' යන්නෙන් වාච්‍යයා නො හඳුන්වා, 'ඒ විෂ්ණු'යි කී කල 'කවර විෂ්ණු දැ'යි ප්‍රශ්නයක් ඉපිදවීමට අවකාශ තිබෙන හෙයිනි.

5. **'වෙන්'**-'විනා' යන නිපාතයෙන් භින්නයි. "වෙනස් බව"යි භාවප්‍රධානවශයෙන් අර්ථ ගතයුතු.

6. **'දනි'**-'දන් දැනුම්හි' දයින් නිපන් අතීතකර්තෘකාරක ආඛ්‍යාතපදයි.

7. **'පිරිසිඳ'**-"පිරි' පූර්ව 'සිඳු' දයින් නිපන් පෙරකිරිය පදයි.

සං:-යශස් ශ්වේතවර්ණත්වයෙන් සැලකේ. මේ රජුගේ යශස් පැතිරී යනකල්හි නිල්මුහුද සුදු වී ය. එහෙයින් කිරිමුහුදෙහි

1. මුළුලොවට අගපත්. 2. ඉතාම.

වසන විෂ්ණුතෙමේ **කිරිමුහුද** හා නිල්මුහුදෙහි වෙනසක් දත නො හිනි. 'මේ සැබවින් ම කිරිමුහුදැ'යි සිතා නිල්මුහුදට වනැයි යනු පිණ්ඩාර්ථයි.

මේ පද්‍යය කාව්සිළුමිණෙහි,

"විමලිඳු නිල්මිණිතර-පතර හෙබි මහමුහුදු,
වෙන් නො වෙත්හි නිබී-යෙසෙනොහු කිරිමුහුදු හා"

යන පද්‍යයෙන් බැඳුනකි.

**45** **නවමේ කුළෙ'වි දු** **ළු**
**තුහුනුල් අඳුන් ගිරිකු** **ළු**
**ඔහු යසිනි පලහෙ** **ළු**
**කොලෙස්ගිරිරද විලස් පළ සා** **ළු**

**අන්වය** සරලයි.

**ප**:-1 **'නවමේකුළ'**-අළුත් වැසි වලාකුළයි.

2 **'අඳුන්ගිරිකුළ'** **හිමාලය** පර්වතයෙහි උස්මුදුනකි. අනව තප්තවිල සමීපයෙහි පිහිටියේයි. කෘෂ්ණවර්ණහෙයින් 'අඳුන්ගිර'යි කියනු ලැබේ. 'කාලකූට' යනු ද මීට ම නාමෙකි.

3 **'කොලෙස්ගිරිරද'**-හිමාලයපර්වතයෙහි උස්මුදුනයි. මේ රජත මය යි ද, **කුවේර, ඊශ්වර** දෙදෙනාගේ වාසස්ථාන යයි ද කියති.

**ස**-ඒ රජුගේ යශස් වැද **අඤ්ජනකූට** පර්වතය ශ්වේතවර්ණ වත් වී කෛලාසපර්වත ශොභාව ඉසිලී.

"හෙබි සිරින් පැහැසර-පඬෙර කොලෙස්ගල්රජ,
නවමේකුළෙව් නෙවුනා-යෙසෙනොහු අඳුන්ගල්රජ"

යනුවෙන් **පැරකුම්බා** මිහිපල්හු ද මෙය කිහ.

**46** *****එවිරු යස පළ මෙහ** **ළු**
**පැතිරි සුරගඟ යට දු** **ළු**
**දිය තෙක් සෙවන සා** **ළු**
**මුදුන බඹු සේසතෙසා ලෙස් සා** **ළු**[2]

**අ**:-එවිරු පැතිරි පළ හෙළ යස සුරගඟයට දුළ, දිය තෙක් සෙවන සළ, බඹු මුදුන සේ සතෙසා ලෙස් සාළ.

**ප**:- **'සුරගඟ'**-**දෙව්ලොව** සිට පෘථිවියට ගලා බස්නා නදියයි. එය **විෂ්ණුහුගේ** පයෙහි මාපටැගිල්ලෙන් පටන් ගෙණ **කෛලාස** පර්වතවැසි **ඊශ්වරයාගේ** ජටාවෙනි තෙවරක් පැදකුණු කොට අනතුරු ව පොළොවට බැස **'ගඞ්ගානදී'** නාමයෙන් මුහුදට වැටෙන ගඟයයි කියනු ලැබේ. **කපිල**ඍෂියාගේ ශාපයකින් හළු වී ගිය **සගර**රජුගේ හැටදහසක් පුත්‍රයන්ට ස්වර්ගය ලබා දෙනු වස් මේ ගඟ පොළොවට බස්වන ලදැයි ද කියනු ලැබේ

---

*මේ කවට මුලින් මතු දක්වනු ලබන කව පැණෙතත් එය මේ හා සමාන අර්ථ ඇතිබැවින් ත්‍යක්ත ය.

"ඔහු යස දසනු දිග-නො හැර පැතිරි එකර ඟ
දිලි සුරගඟ යට ග-සේසතෙව් දිසි බඹනු උතුම ඟ"

1 පැතිර. 2 බඹ මුදුන සේසත විලස් හ ළු.

මේ පුරාණග්‍රන්ථයන්හි ආ කථායි. **අමරකෝශය**යේ 80 වන අංශ යෙන් මේ පිළිබඳ බෞද්ධග්‍රන්ථයන්හි ආ කථාව සැකෙවින් දත හැක..

2 **'දියතෙක්'**-'දිය' යනු 'තෙක්' නිපාතයොගයෙහි කර්මවිභක්ති රූපයයි. 'තෙක්' යන්න අභිව්‍යාප්තියෙහි වැටේ 'අභිවිධිය' නම් සීමාව ද සීමා කර වෙන් කරණු ලබන්නට ම එක් කොට ගැණු මයි. මෙහි සෙවන වැටුමට සීමාව වසයෙන් දැක්වූයේ දිය (=ලොක ය) යි· එය ද සීමා කරණු ලබන්නට ම එක් කොට ගණු ලැබේ. "දක්වා" යන්න යෙදෙනුයේ මර්‍යාදාර්ථයෙහි යි. මර්‍යාදාව නම් හරිණු ලබන සීමාවයි. 'පර්වතය දක්වා කෙත'යි යනාදිය මෙනි. පර්වතය කෙතට නො ඇතුළත් හෙයින් මර්‍යාදාසීමායි.

ස:-එරජුගේ ප්‍රකට වූ යශස ලොව පුරා පැතිර බඹලොව දක්වා ගියේ බඹහුගේ මතුයෙහි ආකාශගඞ්ගා නැමැති මිටක් ඇති මුළු ලොවට ම සෙවන දෙන ශ්වේතච්ඡත්‍රයක් මෙන් සිටියේ ය.

"ඔහු යසස සේසත්-සිරි රුකුළෙ බඹ මුදුනේ,
සුරඟග යටගැ රඳනා දිය තෙක් සෙවන බඳනා"

යන කව්සිළුමිණිගීය බලා මේ බැඳුනේ ය. (**සැවුල් සඳෙස්හි** 50 වන කව ද අර්ථයෙන් මෙබදු යි.)

| | | |
|---|---|---|
| **47** | **එ රජුගෙ තෙදලැව** | **ග** |
| | **දවන[1] දසදිග එකර** | **ග** |
| | **සඳවෙලසඳින් ර** | **ග** |
| | **අහෝ කර[2] රැවටුනෙ ලු පඬෙර** | **ග** |

අ:-එරජුගෙ තෙදලැවග දසදිග එකරග දවන පඬෙරග සඳ වෙලසඳින් රග කර රැවටූනෙ ලු. අහෝ!!.

ස:- 1 තෙද ම ලැවග=**තෙදලැවග** 'තෙද' නම් අනුන් මැඩ ලීමෙහි පොහොසත් වූ ප්‍රභාව නම් ගුණවිශෙෂයයි. ඒ රක්තවර්ණ යයි කවිහු කියති.

2 **'ලැවග'**- 'දවග්නි' යන්නෙන් භින්නයි. වනයන්හි වෘක්ෂ ශාඛා ගැටීමෙන් උපදනා ගින්න දවාග්නියයි.

3 **'දවන'**-'දව-දිවුම්හි' ධාතුවෙන් නිපන් කාලාර්ථ අසම්භාව්‍යක්‍රියායි.

4 **'සඳින්'**-(=සඳ+ඉන්). 'සඳ' යනු මෙහි සන්ධ්‍යාවාචියයි ගණිත්. එහෙත් මෙහි 'චිත්ත' වාචි යයි ගැණීම යොග්‍ය ය. 'සිතින්' (=අදහසින්) යනු අර්ථයි.

5 **'රැවටුනෙ ලු'**-'රැවටුනු' සදින් ප්‍රථමාවිභක්ති 'ඒ' පස කිරී යෙන් සිද්ධයි. 'ලු'-ශ්‍රැතිසූචනයෙහි නිපාතයි.

6 **'පඬෙරග'**-ශ්වේතවර්ණ අඞග (ශරීර යක් ඇතියෙන් **ඊශ්වර** තෙම මෙනම් වේ. මෙතෙම සන්ධ්‍යාකාලයෙහි නෘත්‍ය කෙරේ කෛලාසපර්වතය මොහුගේ වාසස්ථානය ලෙස සලකනු ලැබේ.

ස:-ඊශ්වර තෙමේ බඹදත්රජුගේ තෙජස දසදිග දිවනකල්හි, තෙජස රක්තවර්ණ හෙයින්, ඒ සන්ධ්‍යාවලාහක ය යන අදහසින් නෘත්‍යාරම්භ කොට රැවටුනේ ලු. ඛෙදයකි.

---

1 දිවන. 2 කර අහෝ.

මෙය **කව්සිළුමිණෙහි** 39 වන-

"දස අත සඳන තෙදෙ-හුගෙ එක්වන් මෙහෙසරා,
සැඳෑසඳින් පෙර සේ-පිරිසේ නො දත නැටුමේ"

යන ගීයෙහි පරිවර්තනයෙකි.

**48 ඔහු තදතෙදගිමි න**
**රුපඹුවන් තනහසර න**
**පුඩු තුඩු උඩ[1] තබමි න**
**ඔවුන් උරවිල කුමුටු වූ මෙ න**

**අ:-** ඔහු තදතෙදගිමින රුපඹුවන් තනරණහස පුඩුතුඩු උඩ තබමින ඔවුන් උරවිල කුමුටු වූ මෙන.

**ප:-** 1. **'තන හස රණ'**- වෙන් වශයෙන් ප්‍රථමාබහුවචනාන්ත පදයෝයි. (3-7 බලනු) බහුවචනප්‍රත්‍යය ලුප්තයි. "හස" යනු 'වූ' යන අතීතකාලබහුවචනාන්තක්‍රියායෙහි උක්තයයි.

**ස:-** පයොධර හංසයන් වැනියයි කියති. එයින් කිහ **හංස සන්දෙශයෙහි:-** "අප සර ගත් තැනටත් බැඳ දෙති නිගා," "තොප සැටි රැගෙණ සිටි තැනටත් කෙරෙති රුති"යි. එහෙයින් "තන හස" යි කිහ. **'රණහස'** නම් රන්වන් පියාපත් ඇති හංසයෝයි.

2. **'කුමුටු'**-'කුමුදු-ගැලුම්හි' දයින් නිපන් කර්තෘකාරක කෘදන්තපදයි.

**සං-** "සතුරුකිරින්දන්ගේ පයොධරහංසයෝ එරජුගේ ඝනබධ තෙජස නො ඉවසිය හි ආශ්වාසප්‍රශ්වාසය සඳහා තුඩු පමණක් මතු කොට ලය නැමැති විලෙහි නිමගන වූවන් වැනි වෙතැ"යි යනු "මෙ රජුගෙන් සියහිමියන්ට උවදුරු වෙතැයි රුපු වනිතාවෝ බිය පත් වූහ. එයින් පයොධරයෝ ඇකිල ගියහ"යි කී අයුරුයි.

"පැලඹෙතොහු තෙදගිම් - පැදුම්හි රුපුවමියන්,
තනහස පුඩුතුඩු තබා - උරුවිල් කුමුටුවන් වූ"

යන **කව්සිළුමිණි** ගීයෙන් මේ ගන්නාලදී.

**49 ඔහු තෙද ගමඩලි න[2]**
**හළ කරන රුදුරුපුව න**
**රුපඹුන්[3] රන්නුව න**
**වී ශ ඉන් නැගි පුලඟුවිලයි න**

---

[1] පුඩුතුඩු. [2] ඔබලෙත. [3] රුපඹුව.

**අ:**- ඔහු තෙදගමඩලින රුදුරුපුවන හළු සරත රුපඹුන් රත් නුවන ඉන් නැගි පුලිඟුවිලසින වී ය.

**ප:**- 1. **'නැගි'**-'නහ-නැගුම්හි' දයින් නිපන් කෘදන්තයි.

2. **'පුලිඟු'**-'විප්ඵුලිඞග' යන්නෙන් ආයේ ය. 'ගිනිපුපුරු' යනු අර්ථයි.

**සං:**- මේ රජුගේ තෙජස් නැමැති ගින්නෙන් රෞද්‍ර වූ හෝ මහත් වූ සතුරු සමූහ නැමැති වනය අළු සරණ කල්හි, එය දැක අඬා වැලපීමෙන් රතු සර ගත් සතුරු කිරින්දන්ගේ නෙත්‍ර ඒ ගින් නෙන් නැගුනු පුපුරු වැනි වී ය.

රජුගේ තෙදින් සතුරන් එකැහින් වැනසෙනබව මෙයින් සූචිත ය.

**කව්සිළුමිණෙහි-**

"සරත රුපුඉළු හළු-නරවිරු තෙදගමඩලෙන්,
විසුළ ගිනිරොන් වන් වී-රුපුනඹුවන් නුවන් රත්"

යන ගීයෙන් ද පැවසෙනුයේ මේ අර්ථය මැයි.

**50 එනිරිඳුගෙ තෙදන ල**
**පැතිරි දිගන නො පැකි ල**
**දිගඟන තනමඩ ල**
**සොකුමහරසිරි රුපැයි පැහැදු ල**

**අ:**- එනිරිඳුගෙ තෙදනල නො පැකිල දිගන පැතිරි දිගඟන තනමඩල පැහැදුල සොකුමහරසිරි රුපැයි.

**ප:**- 1 **'දිගඟන'**-දික් ම අඟන=දිගඟන. 'දිශාවෝ අඟනු'යි කවීහු කියති.

2. **තනමඩල සොකුමහර සිරි'**-පුරුතනසත්‍රීහු පයොධර යන්හි කුඩකුමාඞගරාග ගැල්වූහ. 'සොකුම්' යනු කුසුම් වෙසෙසකි. සිංහලයන් අතර සොකුම්පොතු නමින් ප්‍රසිද්ධ ඇඟ ගානා ද්‍රව්‍යය මින් අන්‍යයක් බව වෛද්‍යග්‍රන්ථානුසාරයෙන් සපුට වේ. එයින් යුත් අඟරා=සොකුමහර. 'අඞගරාග' නම් ඇඟ ගානා විලෙවුන් ය.

**සං:**- බඹදත් නිරිඳුගේ තෙජස් නැමැති ගින්න දශදිශාවන්හි සෙලවර තෙක් නො පැකිල පැතිරෙයි. ඒ රක්තවර්ණ ය. එහෙයින් ඒ තෙද දිශාඞගනාවන්ගේ පයොධරයන්හි ආලෙප කළ කුඩකුමාඞගරාග වැනි ය.

මෙසින් මොහුගේ තෙජස මුළුලොව පුරා සිටිබව කීහ. මේ කව **කව්සිළුමිණෙහි** 40 වන

"දසවමියන් විසිතුරු-රුඳු පියසුරුමඩලේ,
දුලූ සළ සොකුමහරු-ගී වී තෙදෙ නරවරා"

යන ගිය හා සදෘශයි.

51 ඔහු සාගමේ නග ගා
රුපඹුබැමසිකි නලළ ගා
රන්ගිරිඅතල ම ගා
කියඹුසඳපිල්සැල විදුග ගා

**අන්වය** සරලයි.

**පෘ:**– 1 **'නලළන රන්ගිරිඅතල'**– සමාසපදයෙක් නො වේ. වෙන් වසයෙන් විභක්ත්‍යන්ත පදයෝයි. සමාසයක් වුවොත් පදී දුබාදෙසින් නො මිදේ. (3–7 බලනු.)

2 **'සිකි'**– 'සිඛි' යන්නෙන් භින්නයි. සිඛාව (කුඩුම්බිය) ඇත්තේ සිඛියි.

3 **'කියඹු'**–නළලෙහි වූ කොට සාර කැපූ රැළි සහිත කොට පිරුණු ලබන සොස් රෙද කියඹු නම්.

4 **'සඳපිල්'**–මොනරුන්ගේ සඳැස්ලකුණින් යුත් පිච්ඡයයි.

5 **'ගන'**– 'ගති' යන්නෙහි ඉකාරයට අකාරාදෙශ වී සිද්ධයි.

**සං:**– මොනරු මෙඝයට ප්‍රිය වෙති. මෙඝය දුටු විට පිල් සලඹ විහිදා නටති. මේ රජු කඩුව නැමැති මෙඝය නහන විට සතුරු අඹුවන්ගේ බැම නැමැති මොනරු කියඹුවැල් නැමැති පිල් නලළ නැමැති ස්වර්ණපර්වතස්ථලයෙහි විහිදා ගත්හ.

මෙසින් මේරජහු කඩුව ඔසොවන විට සියහිමියන්ට අනත රාය වෙතැයි කියෙන් කියඹුවැල් තැබුම් ආදි ප්‍රසාධනකාර්‍යයන්හි නො යෙදී ශත්‍රුභාර්‍යාවන් ශොකයෙන් සිටිනබව හැඟවූහු. මෙය කව්සිළුමිණෙහි 38 වන

"ඔහු සාගමෙහිවි- රුපුනඹුවන් බැමමියුරු,
නලල් තල රන්අතලේ කියඹුසිකිපිල් අතුළෙ"

යන ගීයෙන් ගැණුනකි.

52 ඡනිඳිඳු හැමදව ස
විතරණවිකුම්සබව ස
එනමන් දිවි විල ස
රකි නුවණින් යෙදී නිසි ලෙ ස

අන්වය සරලයි.

ප:- 1 'සබවස'-සභ්‍යභාෂණයි හෙවත් සත්‍යවචනයි.

2 'එනමන්'- මෙහි 'එ' යන්න නිරර්ථක පදයෙකි. මෙබඳු වචන යෙදීම මහත් වූ දෝෂයෙකි. ඡන්දස් පිණිස 'එ, මෙ' යනාදි වචන යෙදුමෙන් වැළකිය යුතුයි.

3 'රකි'-'රක්' ධාතුයි. ප්‍රවෘත්තිකාර්ථ හෙයින් වර්තමාන ප්‍රයොග අදුෂ්ට ය.

53 එනරවර සුරතු රූ
වැලඳි කප්ලිය එකයු රූ
කැත්කුලගනක් සු රූ[1]
සැපත් වූ අගබිසෝ තනතු රූ

අන්වය සුගමයි.

ප:- 1 'සුරතුරූ'-දිව්‍යලොකයෙහි ඇතැයි කියනු ලබන සිතු පැතු දී දෙන වෘක්ෂයෝ යි. ඔහු පසෙකි- මන්දාර, පාරිජාතක, සන්තාන, කල්පවෘක්ෂ, හරිචන්දන යයි කියා.

2 'කප්ලිය'- දිව්‍යලොකයෙහි ඇතැයි කනකුලබන සිතුපැතු දී දෙන ලතාවිශෙෂයෙකි. කල්පවෘක්ෂශාඛාව ද කල්පලතා නම් වේ. කල්පලතාවක් කල්පවෘක්ෂයෙක්හි එතුනුවිට විශෙෂශොභා වක් උද්වහනය කෙරේ.

3 'සුරූ'- මනා රූ ඇත්තීයි.

4. 'වූ'- කෘදන්තාඛ්‍යලිඞ්ගිකපදයෙකි. සත්‍රිලිඞ්ගිකයක් උක්තය වන විට අතීතාඛ්‍යාතය වෙනුවට කෘදන්තපද යෙදීම සිංහලයෙහි ව්‍යාපාරීතියෙකි.

ස:- රාජ, මහිෂී දෙදෙනාට උපමාවශයෙන් කල්පවෘක්ෂ කල්පලතා ගැණුනේ මේ දෙදෙනා ද සත්ත්වයන්ට අභිමතාර්ථ දායක බව හැඟවීම පිණිසයි.

54 සිරිරනි පළමු කො ට
මවා බලමින් නෙත්අ ට
රුසිරුගුණ කැපි කො ට
මැවූ වැනි යලි මෙලඳ මනතු ට

අන්වය සුගමයි.

---

1 පිරූ.

ප:- **'සිරි'**- විෂ්ණුහුගේ දෙවිය වූ ශ්‍රීකාන්තාවයි. ක්ෂීර සාගරමථනාවසථායෙහි එයින් උද්භූත ව විෂ්ණුහු සමීපයට එළඹුනු ඕතොමෝ රූපශොභාවෙන් අග්‍ර ය.

2 **'රති'**- මෝතොමෝ අනඞ්ගයාගේ දෙවිය වූ දිව්‍යාඞ්ගනාවකි. මෝ ද රූපශොභාවෙන් මුළුලොව ඇති තාක් කාන්තාවන් මැඩ ගෙණ සිටී.

3 **'නෙත්අට'**-අටනෙත් යි තිබිය යුතු වුවත් එලිසමය පිණිස පදවිපර්‍යාසයයි. 'බ්‍රහ්මයා ලොකය මව'යි යනු කවි සමයාගතයි. (16-3 බලනු.)

4 **'රුසිරුගුණ'**- මෙයින් අර්ථද්වයයෙක් ලැබේ. පළමු වැන්න 'රුචිර (=මනොඥ) ගුණ' යනුයි. 'රූපශ්‍රීගුණ' යනු දෙවැන්නයි. සමහරු 'රුසිරිගුණ'යි වෙනස්කර ඒ අර්ථය කියති. මෙහි ඒ දෙක ම අයොග්‍ය නො වේ.

සං:- සිරි රති දෙදෙනා මවා නිර්මාණයෙහි නිපුණ වූ මහබඹහු විසින් මේ බිසොව මවනලදැයි කීමෙන් මේ බිසොව රුසිරු ගුණයෙන් සිරි රති දෙදෙනා ඉක්මවා සිටී යයි හඟවත්.

**55 වතින් සරි ස　　　ල කා ය**
**පවතින පවින් වැ　　　ළ කා ය**
**එලඳ යුතු දු　　　ල කා ය**
**නොයෙක් රජගන තලළුති ල කා ය**

අ:- වතින් සලකාය සරි පවින් වැළකා පවතින දුලකාය යුතු එලඳ නොයෙක් රජගන තලළ තිලකාය (වේ).

ප:- 1 **'සලකාය'**- සාවෙකුගේ ලකා ඇතියේ= 'සලකා.' සාවාගේ සටහන් ඇතියේ චන්ද්‍රයි.

2 **'පවින්'**-අපායට පමුණුවන කර්මයෝ 'පාප'නම් වෙති. සතුන් මැරීම, හොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, රහමෙර බීම යන මේ පස්පව් නම් වේ.

3. **'වැළකාය'**- වැළකිමෙහි 'වළක්' දයින් නිපන් පෙරකිරිය පද යි. ඇකාරයන්ට අකාරාදෙශයි. 'ය' යනු ඡන්දස් පිණිස හෙළු නිපාතයෙකි.

4. **'තිලකාය'**- ස්ත්‍රීන්ගේ නලළෙහි කරණු ලබන චක්‍රාකාර ආලෙප බින්දුවකි. ද්‍රවිඩ ස්ත්‍රීන්ගේ නලළෙහි දැනුදු මේ පැණේ.

සං:- මේ බිසොව සියලු රජ බිසොවුන්ට වඩා උතුම් බව මෙයින් දැක්වූහ.

**56 තුනුරුසිරෙන් වෙසෙ ස**
**දිසි පසක් සිරි සඳ[1] ලෙ ස**
**කුලදම් රැකි නිදෙ ස**
**පවර ගුණ යුතු එබිසොවුන් කු ස**

අ:- වෙසෙස තුනුරුසිරෙන් පසක් සිරිසඳ ලෙස දිසි නිදෙස කුලදම් රැකි පවර ගුණයුතු එ බිසොවුන් කුස— (මතු සම්බන්ධයි.)

ප:- 1 **'දිසි'**–'දිස්' දයින් නිපන් කෘදන්තයි.

2. **'පසක් සිරිසඳ'**– ශ්‍රීකාන්තාව දෙව්ලොව වසන්නී ය. එහෙයින් ඕතොමෝ මිනිසුන්ට ප්‍රත්‍යක්‍ෂ නො වේ. මේ බිසොව ශරීරශොභායෙන් සිරිකාන්ත වැන්න. එහෙයින් ඕතොමෝ ප්‍රත්‍යක්‍ෂ වූ ශ්‍රී කාන්තාවකි. මෙයින් දෙවියගේ රූපශොභාධික්‍යය වර්ණිතයි.

3. **'කුලදම්'**– දයාදාක්‍ෂිණ්‍ය ප්‍රතිව්‍රතතාදියයි.

4. **'බිසොවුන්'**– "බිසෝ" යනු ප්‍රකෘතියයි.

**57 දන්සිල් ඈ වෙසෙ ස**
**පුරණ පෙරුමන් සමති ස**
**තිලොවෙක සදිසි ඈ ස**
**දිනි බෝසත්නුමා පින්රු ස**

අ:- දන්සිල් ඈ වෙසෙස සමතිස් පෙරුමන් පුරණ තිලොව එක ඇස සදිසි පින්රුස බෝසත්නුමා දිනී.

ප:- 1 **'පෙරුමන් සමතිස'**– පාරමිතා දශයෙකි: දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය (=පැවිදිවීම), ප්‍රඥා, වීය්‍ය්‍ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්‍ෂා යයි කියා. මේ එකක් එකක් පාරමිතා, උපපාර මිතා, පරමාර්ථපාරමිතා යන වශයෙන් ත්‍රිවිධ වේ. එවිට පෙරුම් සමතිසකි. නපුංසකලිඞ්ගික හෙයින් 'පෙරුම්' සි සිටියයුතු වුවත් විශෙෂවිධි හෙයින් "පෙරුමන්" සි සිටී. 'උපුලන්, කුසුමන්' යනාදිය මෙනි.

2. **'තිලොවෙක සදිසි ඇස'**– එක් ඇසක් ඇතියේ එය දිවි දෙවනු කොට රකියි. එහි දක්වනු ලබන ආදරය ද අනන්තය. බෝසත්හු ද ලෝවැසියන් විසින් එසේ ම ආදර කටයුත්තෝ වෙති.

3. **'දිනී'**–'දන-ඉපැද්මෙහි' ධාතුවෙන් නිපන් අතීතාඛ්‍යාත පදයි.

4. **'පින් රුස'**–රුසක් පින් ඇතියේ=පින්රුස.

---

1 පූරගත.

58 ගනකුලෙකින් නිඳෙ  ස
නිකුත්සඳමඬලක් ලෙ  ස
පිරි දස'කඩ ම  ස
බිහි වි කුමරිඳු තුමා නිසි ලෙ  ස

අ:- ගනකුලෙකින් නිකුත් නිදෙස් සඳමඬලක් ලෙස අකඩ දස මස පිරි කුමරිඳු තුමා නිසිලෙස බිහි වී.

ස:- 1 'නිදෙස'- චන්‍ද්‍රයාට දෙෂ පසෙකි: වලාකුල්, මීදුම්, දුම්, රාහු, රජස්සි. මෙයින් යුක්ත වූයේ නො දිලිසෙන්නේ ය.

2. 'නිකුත්'-'නිකුම්' දයින් අතීත කතෘකාරක 'උ' ප්‍රත්‍යය කොට, මකාරයට තකාර ද උප්‍රත්‍යයට ලොප ද කොට නිපදවනු ලැබේ.

3. 'පිරි'-'පුර' දයින් නිපන් පෙරකිරයපදයි.

4. 'දස'කඩමස'-මේ පිළිබඳ මතභෙදයෝ වෙති. ගර්භමාස යන් දක්වන ඒ ඒ ආචාර්‍ය්‍යවරයෝ ගර්භමාසසඞ්ඛ්‍යාව නානාවිධ කොට දැක්වූහ. අර්ථකථාචාර්‍ය්‍යවරයෝ-

i. "දසමාසච්චයෙන- (දසමස් අයාමෙන්)" යි ද,

සකස්කඩකාරයෝ-

ii "දශමාසාර්ධමාසයෙන්" යි ද,

රසවාහිනීකාර වෙදෙහ සවාමිපාදයෝ-

iii "දසමාසඩ්ඪමාසච්චයෙන- (දසමස් අඩමස් අයාමෙන්)"යි ද,

දම්පසිහිනාවෝ දළදාසිරිතෙහි-

iv. "දසඑකඩමස" යි ද,

යශෝකත වෙදෙහ සවාමිපාදයෝ ම සමන්තකූටවණ්ණනාවෙහි-

v "දසෙකාදසමාසෙන- (දසමසෙකින් හෝ එකොළොස් මසෙකින්)"යි ද යෙදූහ.

මෙහි ii iii iv වන පාඨයන්ගේ අර්ථය එකෙක් මැයි. එහෙයින් හෙද තුනක් බව පෙණේ. අන්‍යයන් කෙසේ වුවත් සිද්ධාර්ථකුමාරයානෝ නොඅඩු නොවැඩි දසමසකින් ම උපන්හ. යට දැක්වූ පාඨ පඤ්චකයෙන්ම උන්වහන්සේ මවුකුසෙහි විසූ කාලය දක්වයි. එහෙයින් මෙයින් ලැබෙන අර්ථය එකක් ම විය යුතුයි.

i සිදුහත් කුමරු ඇසළමස මැදිපොහෝද පිළිසිඳ ගෙණ වෙසක්මස මැදිපොහෝද බිහි වූහ. ඒ කාලය දින වශයෙන්

තුන්සියයකි. මාසයකට දින තිසක් වසයෙන් ගෙණ ඒ කාලය දස මාසයකැයි අර්ථකථාචාර්‍ය්‍යයෝ කීහ.

ii දින වශයෙන් මාස දශයක් වුවත්, නම් වශයෙන් ඇසළ, නිකිණි, බිණර, වප්, ඉල්, උඳුවප්, දුරුතු, නවම්, මැදින්, බක් යි මාස දසයක් හා වෙසක් මසින් අර්ධයකුත් ලැබෙන හෙයින් "දසමස් අඩ මස්" යි **දම්පසඟිනාවන්** ආදි ඇදුරෝ කීහ. මේ පක්‍ෂය දින වශයෙන් නො ව නාම වශයෙන් මාසසඞ්ඛ්‍යාව දැක්වූ බව පෙණේ. මෙයින් ද දින තුන්සියය ගැණුමට බාධාවෙක් නැති.

iii දින වශයෙන් මාස දශයක් ද නාම වශයෙන් මාස එකොළොසක් ද පැණෙන හෙයින් උභයමතය ම සැටි කොට **සමන්තකූට වණ්ණනා**වෙහි "දසෙකාදසමාසෙන" යනු කීහ යි හැඟේ. එයිනුදු දවස් තුන්සියය ම ලැබිය හැක.

මෙසේ බලනකල ප්‍රයොගයාගේ විෂමත්වයක් මිස, අර්ථයාගේ විෂමත්වයෙක් නො ලැබේ.

එහෙත් ඇතැම්හු "දසෙකඩ මස" යනු සාවද්‍යපාඨයෙකැයි ද, ඒ "දසකඩ" යි විය යුතු යයි ද, "දසමාසද්ධමාසච්චයෙන" යනාදි පාඨ මේ සාවද්‍යවචනය අවලම්බනය කොට ඇත්තාහු යයි ද, (දස+අකඩ) 'අකඩ සද "අඛණ්ඩ" ශබ්දයෙන් නිපන යයි ද, 'නො කැඩුනු හෙවත් සම්පූර්ණ වූ දසමාසයක්' යනු අර්ථ යයි ද, නොකඩ, අකඩ ශබ්ද අනූනාර්ථයෙහි යෙදුනු තවත් තැන් ඇතැයි ද කියති. හෙ ද හළ යුතු මතයෙක් නො වේ. පුරාතනයන් විසිනුදු සිංහලවචනයාගේ නියත අර්ථය අවබොධ නො කොට භාෂාන්තර පරිවර්තනයට යාමෙන් අර්ථ විපරීත කළ තැන් තවත් ඇති හෙයිනි.

සිද්ධාර්ථකුමාරයන් දවස් තුන්සියයකින් ම උපන් බව සිද්ධාන්ත ය. සෙස්සෝ අටවැනි මාසය ඉක්ම ගිය තැන් පටන් උපදිති. ඔවුන් පිළිබඳ ව කාලනියමයෙක් නැත. එහෙයින් මෙහි දින තුන්සියපසළොසකිනැයි ගනත් නිවරද ය. එහෙත් මේ වචනය ව්‍යවහාරයට පැමිණියේ බෝසතුන්ගේ ගර්භ මාසයන් පිළිබඳ ව ම ය. එහෙයින් දින තුන්සියයකින් පරිමිත අඛණ්ඩදශ මාසයෙකිනැයි ගැණීම අතිශය යුක්තියුක්ත ය.

4. **'බිඟි වි'**– 'බිඟි' යනු නිපාතයෙකි. ඒ 'බහි' යන්නෙන් ආයේ ය. 'පිටත' යනු අර්ථ යි.

59 බිහි වන ඒ බුදු කු　　　රෑ
සව්ලෝ දනෝ හදතු　　　රෑ
සදහම් ලකුණු දූ　　　රෑ
ඉන් දහම්සොඬ නම් වි ඒකුම රෑ

අ:– ඒබුදුකුරු බිහි වන සව්ලෝ දනෝ හදතුරු සදහම් ලකුණු දූරෑ. ඉන් ඒකුමරු දහම්සොඬ නම් වී.

ප:– 1 **'බුදුකුරෑ'**– බොධිසත්ත්වයෝයි. 'බුද්ධඞ්කුර' යනු ප්‍රභව යයි. බුද්ධත්වයට පැලයක් වැනි හෙයින් ඔහු ඒනම් වෙති. 'වන' යන්නෙහි අනුක්තකර්තෘයි.

2. **'සදහම්ලකුණු'**– මෙහි භාවය "සද්ධර්මය පිළිබඳ හැඟීම" යනුයි.

3. **'දූරෑ'**– 'දර- දූරුම්හි' දයින් නිපන් අතීත කර්තෘකාරක බහුවචනාඛ්‍යාතපදයි. ඒකවචනය 'දූරී' යනුයි.

4. **'ඉන්'**– මෙයින් 'දහම්සොඬ' නම සෑදුමට හෙතු දක්වූහ. මේ කුමරුන් උපදින කල්හි සියලු සත්ත්වයන්ගේ හෘදයාභ්‍යන්තර යෙහි ධර්මචින්තා පහළ වූ හෙයින් 'දහම්සොඬ' නාමය වී.

5. **'දහම්සොඬ'**– 'ධර්මයෙහි ලොල් වූ' යනු අර්ථයි.

සං:– මේ පද්‍යය "තස්සුප්පත්තිකාලසමනන්තරමෙව සබ්බ සත්තානං මනසි ධම්මසඤ්ඤා උදපාදි. තස්මාස්ස ධම්මසොණ්ඩොති නාමමකංසු" යන පාළිපාඨයාගේ සිංහලපරිවර්තනයකි.

ඇතැම් පොත්වල මේ පද්‍යය හා මීට අනතුරුව අධික පද්‍ය යෙක් ද දක්නා ලැබේ. ඔහු නම් :–

1 "බිහි වන ඒබුදුකු　　　රෑ
සව්ලෙව් දනෝ නිරතු　　　රෑ
තම තමන් ලය පි　　　රෑ
දූරෑ සදහම් ලකුණු පිවිතු　　　රෑ
11 සියලු දුසිරිත් මෑ　　　ඬ
ඒකුමරෑ සදිසි පින්පි　　　ඬ
වූයෙන් දහම්සො　　　ඬ
නමින් පරසිදු වී දහම්සො　　　ඬ*

---

* 1 ඒබුදුකුරෑ-ඒ බුද්ධාඞ්කුරයා; බිහිවන,- බිහි වන කල්හි; සව්ලෙව් දනෝ- සියලු ලෝකවාසි ජනයෝ; තමතමන්-ස්වකීය ස්වකීය වූ; ලය-හෘදයෙහි; පිරෑ- පූරණය කළ; පිවිතුරු- පවිත්‍ර වූ; සදහම්ලකුණු- සද්ධර්මලක්ෂණයන්; දූරෑ- ධාරණය කළහ.

11 පින්පිඬ සදිසි- පුණ්‍යපිණ්ඩයක් සමාන වූ; ඒකුමරු- ඒ කුමාරයා; සියලු දුසිරිත්- සකල දුශ්චරිතයන්; මැඬ- මර්දනය කොට; දහම්සොඬ වූයෙන්- ධර්මයෙහි ලොල් වූ හෙයින්; දහම්සොඬ නමින්- ධම්මසොණ්ඩ යන නාමයෙන්; පසිදු වී- ප්‍රසිද්ධ වී.

යනුයි. ආශ්‍රය වූ පාළිපාඨයෙහි එන අදහසට නො ගැළපෙන හෙයින් ඒ දෙසා මූලයෙන් හළම්හ. වුවමනා කෙනෙකුන්ට මූල යෙහි යොදුගැණුමට බාධාවෙක් නැත.

60 දෙගුරුන් පෙම්සයු රු
ඔද වඩවමින් නිරතු රු
නවසඳසිරින් ස රු
වැඩිනි[1] රුසිරෙන් යුතු ව එ කුම රු

අ:- සරු රුසිරෙන් යුතු ව දෙගුරුන් පෙම්සයුරු නිරතුරු ඔද වඩවමින් නවසඳසිරින් එ කුමරු වැඩිනි.

ප:-1 **'දෙගුරු'**- මවුපිය දෙදෙනායි. ළදරුකාලයෙහි දී "මෙසේ කළ මනා ය, මෙසේ කිව මනා ය" යනාදි වසයෙන් හික්ම වන හෙයින් මවුපියෝ ගුරුහු වෙති.

2. **'පෙම්සයුරු'**- මවුපියන් විසින් දරුවන් කෙරෙහි කරණු ලබන ප්‍රේමය අප්‍රමාණ ය. එහෙයින් මෙහි ප්‍රේමය සාගරත්‍වයෙන් සැලකිත.

3. **'ඔද වඩවමින්'**- සයුරෙහි ඔදවැඩීම නම් වැඩිදිය ඇති වීමයි. සඳ දැක්මෙන් සයුර ඔද වැඩෙන බව කාව්‍යසමයයෙහි ප්‍රසිද්ධ ය.

සං:- මවුපියන්ගේ ප්‍රේමය සාගරයෙකි. පුත්‍ර නැමැති චන්‍ද්‍රයා දැක්මෙන් එහි ඔජෝධිකත්‍වය වී. එහෙයින් පුත්‍රතෙමේ ප්‍රේමසාගර යාගේ ඔජස අධික කරන්නෙකි.

4. **'නවසඳ'**- අළුත් සඳයි. හේ ක්‍රමයෙන් වැඩෙන්නේ වේ. මේ කුමාරතෙමේ ද ක්‍රමයෙන් වැඩෙනුයෙන් ද පෙම්සයුර ඔද වඩනුයෙන් ද නවසඳක් වැනි වී. **'සිරි'** සඳ මෙහි ශොභාර්‍ථ යෙහි වැටේ.

1 වැඩි.

5. **'වැඩිනි'**– 'වඩ- වැඩුම්හි' දැයින් නිපන් අතීතකාලික නිරුත්සාහික ක්‍රියාපදයි. නිරුත්සාහිකක්‍රියාවෝ කර්මකාරක ක්‍රියා වන්ට නියමිත ප්‍රත්‍යය ගෙණ අකර්මකධාතූන්ගෙන් සිද්ධ වෙති. 'වඩ' ධාතුව සකර්මක ද වේ. සකර්මක වනවිට 'වඩා, වඩත්' යනාදි වශයෙන් ද, අකර්මක වන විට 'වැඩේ, වැඩෙත්' යනාදි වශයෙන් ද වරනැගේ.

**61 සිවුසැට කලාව ද**
**දසටක් පොරණ මනන ද**
**නෙක අවිසිල්පය ද**
**ඉගෙණ එකුමරු නැණින් පිරිසි ද**

අන්වය– සරලයි.

පැ:– 1 **'සිවුසැටකලා'**– ගීත, වාද්‍ය, නෘත්‍යාදි හැටහතරක් පමණ වූ ශිල්පයෝ යි. (**පූජාවලියෙහි** 135 වන පිටෙහි හා **සද්ධර්මාලඞ්කාරයෙහි** **දහම්සොඬවගෙහි** ද ඒ සියල්ල පැණේ.

2. **'දසටක් පොරණ'**– ව්‍යාසාදීන් විසින් කරණලද ඉතිහාස ග්‍රන්ථවිශෙෂයෙකි. බ්‍රහමපුරාණ, පද්ම, විෂ්ණු, ශිව, භගවත්, නාරද, මාර්කණ්ඩෙය, අග්නි, භවිෂ්‍යත්, බ්‍රහමවෛවර්ත, ලිඞ්ග, වරාහ, ස්කන්ද, වාමන, කූර්ම, මත්ස්‍ය, ගරුඩ, බ්‍රහමාණ්ඩපුරාණ යන මේ අටළොස යි.

3. **'මනනද'** යනුවෙන් පුරාණ ග්‍රන්ථයන්ගේ චිත්තප්‍රීතිකර භාවය කිහ. පුරාණග්‍රන්ථයන්හි බෙහෙවින් දක්නට ලැබෙන්නේ දෙවියන් පිළිබඳ වූ අද්භූතරසයෙන් යුත් කථා යි.

4. **'අවිසිල්පය'** නම් මුක්ත, අමුක්ත, මුක්තාමුක්ත, යන්ත්‍ර මුක්ත යන චතුර්විධආයුධයන් මෙහෙයීම උගන්වන ශිල්පයයි. එහි 'මුක්ත' නම් අතින් දමා ගසන පාරුවලලු ආදියයි. 'අමුක්ත' නම් අතින් නො මුදා පහරණ කඩු ආදියයි. 'මුක්තාමුක්ත' නම් පැහැර නැවත ඇද ගණු ලබන තොමරාදියයි. 'යන්ත්‍රමුක්ත' නම් යන්ත්‍ර

වෙගයෙන් මෙහෙයනු ලබන වෙඩිඋන්ඩ ඊතල ආදියයි. (**ශර භඞ්ගජාතකය**යෙන් ධනුශිල්ප ප්‍රභෙද දන්නේ ය.)

5. **'ඉගෙණ'**– 'උ' 'පූර්‍ව 'ගන්' දයින් නිපන් පෙරකිරිය පදයි. 'ඇ' හට 'අ' ආදෙශයි. උපසර්‍ගය ද ධාතුවෙහි අවයවයක් සේ ගෙණ ඉකාරාදෙශ කිරීමෙන් සිද්ධයි.

**62 සුගුණමිණි මුහු — දු ව**
**සතසතන්සොාඳ තරි — ඳු ව**
**සිරිසඳට උවි — ඳු ව**
**විසි මුළුදඹදිව්හි[1] පසි — දු ව**

අන්වය සුගමයි.

ප:–1. **'සුගුණමිණිමුහුදු'**– මුහුද සියලු මණීන්ට උත්පත්ති ස්ථානයි. එහෙයින් ඊට "රත්නාකර" යනාදි නාමයෝ ද යෙදෙති. මුහුද මණීන්ට ආකර වන්නා සේ මෙතෙම ගුණයන්ට ආකර වෙයි.

2. **'සතසතන්සොාඳතරිඳු'**– මෙහි සතන් (=සන්තාන) ශබ්දය චිත්තවාචි ය. 'තරිඳු' යනු තරුවලට අධිපති හෙයින් චන්ද්‍රයාට නමෙකි. චන්ද්‍රයා යම් සේ කුන්දයන් ප්‍රබොධ කෙරේද, එමෙන් ම මෙතෙමේ ද සත්‍වයන්ගේ චිත්තසන්තානයන් ප්‍රබොධ කෙරේ.

3. **'සිරිසඳ'**– ශ්‍රී සම්පත්තියට අධිපති දෙවතාවයි. උපෙන්ද්‍ර (=විෂ්ණු) ඇගේ වල්ලභයා යි. යමෙක් ධනසම්පත්ත්‍යාදියෙන් ආඪ්‍ය ද, ඔහු වෙත ද සිරිකත වෙසේ ය යි කියති. "සිරි සියබා තෙලෙ පොලඹා රැඳි නිතොර" යනාදිය ඊට සාධක ය. යම් සේ විෂ්ණු වෙත සිරිකත වසා ද, එසේ ම මොහු වෙත ද සිරිකත වසයි. මෙයින් මේ කුමරුගේ ශ්‍රීමද්භාවය දැක්වූහ.

4. **'උවිඳු'**– විෂ්ණුහු වාමනරූපි ව කාශ්‍යපහට ද ව අදිතියගේ කුසෙහි ඉන්ද්‍රයාට (=ශක්‍රයාට) අනතුරු ව උපන් හෙයින් 'උපෙන්ද්‍ර' යයි කියති.

---

1 දඹදිවට.

5. **'දඹදිව'**– දඹරුකින් ප්‍රකට වීපය යි. ඒ දසදහසක් යොදුන් පමණ වේ. විස්තරයථා **ධම්ප්‍රදීපිකා අමාවතාවහාදි** යෙන් උගන්නේ ය.

6. **'පසිඳු'**-'පසිද්ධ' ශබ්දයෙන් 'පසිදු' යි බිඳී අඝ වර්ණාගම වීමෙන් සිද්ධයි.

**63 පෙරඩමස සඳ ලෙස**
**දින දින වැඩි නිසි ලෙස**
**පැමිණෙන සොළොස්ව ස**
**කුමරු දුසා රජ වෙමින් සහතොස**

**අන්වය** සුගමයි.

ප:– 1. **'පෙරඩමස'**- පුරපෑළවියෙහි සිට පුරපසළොස්වක අවසන් කොට ඇති පසළොස් දිනයි. එය චන්ද්‍රමාසයන්හි මුලට යෙදෙනුයෙන් 'පෙරඩමස' නම් වේ. ඒ කාලයෙහි චන්ද්‍රයා ක්‍රම යෙන් වැඩේ.

2. **'පැමිණෙන'**– 'පමුණ පැමිණීමෙහි' දයින් නිපන් කාලාර්ථක්‍රියායි.

3. **'දුසා'**– 'දිස්' ධාතුවට 'දක්' ආදෙශ වීමෙන් සිද්ධ පූර්ව ක්‍රියාපදයි.

4. **'වෙමින්'**–'ව (=වූ)' දයින් 'මින්' පස වීමෙන් සිද්ධ මිශ්‍ර ක්‍රියාපද යි.

**64 සිවුරඟ සෙනඟ සරු**
**මැතිවරන් සහ කිසරු**
**සමගින් සව් ඉසුරු**
**බාර කොළෙ යුවරාජතනතුරු**

අ:– කිසරු මැතිවරන් සඟ සරුසිවුරඟසෙනඟ (ද) සව් ඉසුරු සමගින් යුවරාජතනතුරු (ද) බාර කොළේ.

ප:– 1. **'සිවුරඟ සෙනඟ'**– ඇත්, අස්, රිය, පාබළ යන අඞ්ග සතරක් ඇති සෙනාවයි. 'සෙනඟ' යන තන්හි අඟ සද සවාර්ථයෙහි ය. මෙහි 'සෙනඟ' යන්නෙන් 'සෙන්' සදෙහි අර්ථයට වැඩි අර්ථයෙක් නො ලැබේ.

2. **'කිසාරු'**-'කිඞ්කර' ශබ්දයෙන් නිපන්නයි. 'කුම් කොරෙමි දෑ?'යි පිළිවිස කරණුයේ 'කිසාරු' නම් වේ.

**සං:**–'සිවුරඟසෙනන භාර දිනැ'යි කීමෙන් සෙනාපති තන තුරට පත් කළැයි හඟවත්.

3. **'සමගින්'**- 'සමඟ' යන නිපාතයා කෙරෙන් කරණ විභක්ති ප්‍රතිරූපක 'ඉන්' පස යෙදීමෙන් සිද්ධයි.

4. **'යුවරාජනනතුරු'**- 'යුවරාජ' යන්නෙහි අර්ථය 'තරුණ රජ' යනුයි. මහරජුගෙන් සිදු විය යුතු ඇතැම් කාර්‍ය්‍යයන්හි යෙදෙන රාජපුත්‍රතෙමේ "යුවරාජ" නමි.

**65 එතුවක් පටන් සි ට**
**සිහි නැණ යුතු ව හැම වි ට**
**සියනෙත්යුග ලෙස ට**
**රකී සව්ලෝසතුන්[1] තුටු කො ට**

**අ:**– එතුවක් පටන් හැමවිට සිහිනැණ යුතු ව සිට සව්ලෝ සතුන් තුටු කොට සියනෙත්යුග ලෙසට රකී.

**ප:**– 1. **'එතුවක්'**– මෙහි 'තුවක්' යන්න 'තෙක්' යන නිපාතයට සමානාර්ථ වූ නිපාතයෙකි. ශිලාලිපිවල මේ ම 'තුවාක්' යි ආයේ ය.

2. **'පටන්'**–යනු ද නිපාත යි.

3. **සිහි නැණ**– 'සිහිය' නම් ඉතා පෙර පවා කළ කී දෑ සිතට කොමු කරවන, හොඳ නොහොඳ විවෙචනය කරණ චෛතසිකයයි. 'නැණ' නම් කාරණයෙනි ඇති තතු ඒ වූ සේ අවබොධ කරවන චෛතසිකයයි.

4. **'රකී'**– 'රක්' ධාතුයි. වර්තමානකාලික ආඛ්‍යාත පදයි. ප්‍රවෘත්ති කථනය හෙයින් වර්තමාන ප්‍රයොග ඉෂ්ට ය.

**66 ඈවෑමෙන් පියර ද**
**පෙර රජදහම පිළිපෑ ද**
**මිණිකිරුළිස පැල ද**
**වී ය දඹදිව්තලට අගර ද**

1. සව්ලෙව්සතන්.

අන්වය සුගමයි.

පඃ- 1 **'පෙර රජ්දහම'**- රාජධර්මයෝ දසදෙනෙකි. එනම්:- දන්දීම්, නොකටයුතු නො කිරීම යයි කියනලද ශීලය, පරිත්‍යාගය, ඍජුභාවය, යටත් වැසියන් කෙරෙහි මෘදු ව විසීම, ඇස් ආදි ඉඳුරන් හික්මවා ගැණුම යයි කියනලද තපස, ක්‍රොධ නො කිරීම, හිංසා නො කිරීම, වරදෙහි සාමා කිරීම, අවිරුද්ධභාවය යන මේ යි. කියන ලද මැයි:-

"දානං සීලං පරිච්චාගං-අජ්ජවං මද්දවං තපං,
අක්කොධො අවිහිංසා ච-ඛන්ති ච අවිරොධිතා"යි.

2. **'පිළිපැද'**-'පිළි' පූර්ව 'පද' දයින් නිපන් පෙර කිරිය පදයි. අනන්‍ය ඇයන්නට අසාරුදෙශයි.

3. **'මිණි කිරුළ'**- මිණි බැඳි වොටුන්නයි. 'කිරුළ' යනු ප්‍රසෘතියි. 'කිරීට ශබ්දයෙන් භින්නයි.

4. **'පැලඳ'**- 'පලඳ-පැලදීමෙහි' දයින් නිපන් පෙර කිරි ය යි.

**67 සිවුපා පදූනි[1] දි ඩ
බස්මද[2] වැහෙන නො ව[3] ඉ ඩ
සුතු වූ දහම් සො ඩ
වරණසිරි ඉසිලි දහම් සො ඩ**

අඃ- දිඩ සිවුපාපදූනි ඉඩ නො ව බස්මද වැහෙන දහම්සොඩ සුතු වූ වරණසිරි දහම්සොඩ ඉසිලී.

පඃ- 1 **'සිවුපාපදූනි'**- රජුන්ට පරසතුරන් නසාලීමෙහි ඉව හල් වූ සාම, දාන, භෙද, දණ්ඩ යන ක්‍රම සතරයි. 'සාම' නම් බලවත් රජුන් හා ගිවිසුම් කොට මිත්‍ර ව සිටීමයි. 'දාන' නම් සතුරුපසෙහි වූවන් සවකීය පක්‍ෂයට ගණු පිණිස ද, සවපක්‍ෂයෙහි වූවන්ගේ අධික ප්‍රසාදය පිණිස ද සුදුසු අවසථාවෙහි වසතුව දීමයි. 'භෙද' නම් බලවත් වූවන් කේලාම් කියවීම් ආදියෙන් ඔවුනොවුන් බිඳුවා ලීමයි. 'දණ්ඩ' නම් රාජද්‍රොහීන්ට අනුරූප සේ සුදුසු දඬුවම් දීමයි. මෙහි

1. සිවු උපා දූත. 2. බස මං. 3. නොම.

චතුරුපාශයෙයෝ සතරපාදයන් සේ ගන්නාලදහ. මොවුන් විසින් ම **සැවුල් අස්නෙහි** ද මේ කියනලදී:-

"තරසිවුපා ගුණදම් බැදෙමින් සිටි න
දළ දම්සොඬ පිරිසිඳු කිත්සිරි රඳ න" යි.

(තරසිවුපා-සවිරවූ චතුරුපාය නොහොත් පාද සතරක් ඇති.)

2 දහම් ම සොඬ වනුයේ යමෙකුට ද හේ=**දහම්සොඬ**. මෙහි 'සොඬ' සද ගජකාරවාචි යි.

3. **'වරණසිරි'**-'වරණ' නම් හස්තියා යි. වාරණ ශබ්දයෙන් භිත්‍යනයි.

4. **'ඉසිලී'**- 'උසුල' දයින් නිපන් අතීතකාලාඛ්‍යාතයි.

68 **ඉස යසස් බිජුව ට**
**තර සර තදතෙදණවැ ට**
**දඹදිව්කෙතැ වැ තු ට**[1]
**රකි සරුණාදියෙන් තෙත් කො ට**

ඇ:- දඹදිව්කෙතැ යසස්බිජුවට ඉස තදතෙදණවැට තර සර සරුණාදියෙන් තෙත් කොට තුටු වැ රකී.

ප:- **'ඉස'** – 'ඉස්-ඉසිමෙහි' දයින් වූ පෙරකිරය පදයි. ඇයන් තට අකාරාදෙශයි.

2. යසස් ම බිජුවට=**යසස් බිජුවට** විශෙෂණසමාසයි.

3. දඹදිව ම කෙත=**දඹදිව්කෙත.**

4. **'වැ තුට'** – 'වැ' යනු 'ව(=වූ)' දයින් නිපන් පෙරකිරිය පදයි. 'සතුට' යන්න මෙහි අර්ථයක් ගෙණ දීමෙහි අසමර්ථහෙයින් ත්‍යකත ය.

සං:- දඹදිව කෙතයි එහි වපුල බිජුවට නම් යශස් ය. අවට බැඳි වැට නම් සත්‍යඛධ වූ තෙජසින් යුත් ආඥාවයි. එහි ශස්‍ය වර්ධනයට වුවමනා ජලය නම් සරුණාවයි.

---

1. ▪තස් ය තුට.

මේ රජතුමන් මුළු දඹදිව්හෙලෙහි ම ප්‍රසිද්ධ ව මහත්වූ තෙජසින් හා ආඥවෙන් ස්වරාජ්‍යය නිරුපද්‍රව කොට ගෙණ කාරුණ්‍යාවෙන් යුක්ත ව වසන බව මෙයින් හැඟවූහ.

69 **සතරක් උපායෙ** **න**
**තුන්සත්සගුණ[1] සගගි** **න**
**සිවුසගරාවති** **න**
**යුතු ව ලොව රැසා වෙසේ වෙසෙසි** **න**

**අන්වය** සුගමයි.

ප: 1. **'සතරඋපාය'** යට දක්වනලදී. (67-1 බලනු)

2. **'තුන්සත්'**- 'ප්‍රභාව, උත්සාහ, මන්ත්‍රණ යන මෙයින් හටගත් ශක්ති තුණයි. ධනසම්පත්තිය දණ්ඩනය යන මෙයින් වූ තෙජස 'ප්‍රභාවශක්තිය'යි. වික්‍රමයට හෙතු වූ බලය නොහොත් කටයුතු කාර්‍ය්‍යයන්හි සපිරත්බය 'උත්සාහශක්තිය'යි. සන්ධිවිග්‍රහාදි මන්ත්‍රණයෙන් සතුරා සුදුසුතැන සිටුවීම මන්ත්‍රණශක්තියයි.

3. **'සගුණ'**- සන්ධි, විග්‍රහ, යාන, ආසන, වෛධ, ආශ්‍රය යන රජුන්ගේ ක්‍රියාසිද්ධියට ඉවහල් වන කරුණු සයයි. 1 'සන්ධි' නම් අල්ලස් දීම් ආදියෙන් සතුරන් හා මිතුරු වීමයි. 2. 'විග්‍රහ' නම් පරමණ්ඩලයන් දූවීම්, කලහ, සොරකම් ආදිය කරවීමෙන් යටත් කර ගැණීමයි. 3. 'යාන' නම් දිනනු කැමැත්තෙන් සතුරන් හා යුදට යාමයි. 4. 'ආසන' නම් යුද කිරීමට ශක්ති නැති කල්හි දුර්ගස්ථානාදියෙහි සැඟවී සිටීමයි. 5. 'වෛධ' නම් බලවත් සතුරන් හා මිතුරු වීම ද දුර්වල සතුරන් හා කලහය දූසි යන දෙයාකාරයයි. 6. 'ආශ්‍රය' නම් තමන්ට බලවත්සතුරන් විසින් පහර දෙනකල්හි අන්‍යබලවතුන් ඇසුරු කිරීමයි.

4. **'සතඟ'**-රාජ්‍යයට ඉවහල් අඞ්ගඅටෙන් 'රාජ' සඞ්ඛ්‍යාත අඞ්ගය හළ විට ලැබෙන අමාත්‍යයෝ ය, මිත්‍රයෝ ය, කොශ ය හෙවත් ධනාගාර ය, ජනපදභූමිප්‍රදෙශ පවත්නා රාෂ්ට්‍ර ය,

---

1. තුන්සගුණ හා.

පණ්තාදි දුගීසත්ාන ය, බළසෙන් ය, පෞරශ්‍රේණිය හෙවත් පුර වැසි ශිල්පොපජීවි මනුෂ්‍ය සමූහය දැ යි යන අඞග සතයි.

5. **'සිවුසඟරාවත්'**– දන, ප්‍රියවචන, අර්ථචය්‍යා, සමානාත්මතා යන ජනසඞග්‍රහය කරණ කරුණු සතරයි. 'අර්ථ චය්‍යා' නම් හිත වැඩෙහි හැසිරීමයි. 'සමානාත්මතා' නම් අන්‍යයන් තමන් සම කොට සැලකීමයි.

6. **'වෙසෙ'**– 'වස්–විසුම්හි' දයින් නිපන් වර්තමාන කාලාඛ්‍යාත පදයි.

**70 තමන්[1] රජසිරි ප ත**
**නොබෝ දවසක් ඇතුළ ත**
**ඉඳ සිරියහන් ම ත**
**මෙසේ සැලකී මෙ අප මහස ත**

අ– මෙ අප මහසත් තමන් රජසිරිපත් නොබෝ දවසක් ඇතුළත සිරියහන් මත ඉඳ මෙසේ සැලකී.

ප:– 1. **'ඉඳ'** යනු 'හිඳු–හිඳුම්හි' දයින් නිපන් පෙරකිරිය පදයි. ආදිහකාරය ලුප්තයි.

2. **'සිරියහන්'**–රජුන්ගේ ශයනය 'සිරියහන්' නම් වේ.

3. **'සැලකී'**– 'සලක' දයින් නිපන් අතීතාඛ්‍යාත පදයි.

4. **'මහසත්'**– මහත් වූ හෙවත් පූජ්‍ය වූ සත්ව තෙමේයි එනම් බොධිසත්වයි.

**71 සසරෙහි සැරිසර ත**
**සතුන් වෙත මෙත් කුළු ණෙ ත**
**මොක්පුර පමුණුව ත**
**මෙ අප මුනි වදහළ අමා මෙ ත**

අ:–සසරෙහි සැරිසරණ සතුන් වෙත මෙත් කුළුණෙන මෙ අප මුනි වදහළ අමා මෙත මොක්පුර පමුණුවන (මතුමඞඛඩයි.)

---

1. එතම.

**ප:- 1 'සසරගි'**- සසර නම් නො සිඳී පවත්නා **පඤ්චස්කන්ධ** පරිපාටියයි.

2. **'සැරි සරණ'**-'සැරි' යන්න පෙරටු කොට ඇති 'සර'දයින් නිපන් කර්තෘකාරක කෘදන්තපදයි. එලිසමය සඳහා ණකාරට නකාර දෙශයි.

3. **'මොක්පුර'** යනු මොක්ෂය මැ යි. (2. 1 බලනු.)

4. **'වඳහල'**-'වඳුර' දයින් නිපන් කර්මකාරක කෘදන්ත යි. මධ්‍යයෙහි හකාරාගම ද, හකාරයෙන් පූර්වය හ්‍රස්ව ද වේ.

72 පිහිටි මුනි නැණද   ර
මගපල අමාපල බ   ර
බවගිමන හල දු   ර
සුරතුරෙක සිරි රැඟන් පුවත   ර

**අන්වය** සුගමයි.

**ප:- 1 'පිහිටි'**- 'පිහිටු-පිහිටීමෙහි' දයින් නිපන් අතීත කර්තෘකාරක කෘදන්තයි.

2 **'නැණදර'**- නැණ ම දර = නැණදර. 'දර' යනු 'ධරා' ශබ්දයෙන් භින්නයි. පෘථිවීවාචකයි. "සතරපය සුපිහිටි **දර**" යන **කුසද** කව්පදයෙහි ද මේ පෙණේ.

3. **'බවගිමන'**- බවෙහි වූ ගිමන්=බවගිමන්. 'භවග්‍රීෂ්මය' නම් නානාවිධ ව්‍යසනයි.

73 මෙබඳුගුණ සඳහ   මි
නො ම දැන නො කර සැලකු   මි
කරණ මේ රජ[1] ක   මි
අහෝ අපහට[2] වේ ය නොනර   මි

**අන්වය** සරලයි.

**ප:- 'සැලකුම්'**- 'සලක' දයින් භාවයෙහි 'උම්' ප්‍රත්‍යය වී සිද්ධයි.

---

1. සකරණ මෙරජ. 2. මෙ අපට.

2 **'කරණ'**- 'කර' දයින් කම්කාරු 'න' පස වී සිද්ධය. 'න' පස සෙසු කාරකයන්ට ද සාධාරණ ය.

74 වෙලනැති සයුර මෙන
රිවිසඳ නැති අහස මෙන
පහන් නිවි ගෙය මෙන
සුවල දළ නැති මහගිජිඳු මෙන

**අන්වය** සරලයි.

**පː- 1 'වෙලනැති සයුර මෙන'**- 'වෙල' යනු 'වෙලා' ශබ්ද යෙන් භින්න යි. මේ බොහෝ තන්හි 'වෙරළ, වෙලල' යන වස යෙන් ද ව්‍යවහෘත යි. වෙරල මුහුදෙහි සීමාවයි. ඒ නැත හොත් සමු ද්‍රයාගේ ශොභාවක් නො වේ.

2. **'නිවි'**-'නිව්'-නිවුම්හි දයින් නිපන් කෘදන්ත පදයි.

75 කමල නැති විල මෙ න
තරලම්ණ නැති හර මෙ න
ගහණසුන් වත මෙ න
දහම් නැති ලොව නො වේ සසොබ න

**අන්වය** සුගම යි.

**පː- 1 'තරලම්ණ'** යනු හාර මධ්‍යයෙහි පිහිටි ප්‍රධාන මාණික්‍යයයි. 'හාර' නම් මුතුපටයි. 'තරල' සඳ තත්සම යි.

2. **'ගහණසුන්'**- ගහණ සුන් වූයේ යමෙක්හි ද ඒ ගහණ සුන්. 'ගහණ' යනු 'ඝාණ' යන්නෙන් භින්නයි. නාසය කැපූ මුහුණ අශොභන යයි මෙයින් හැඟවූහ. අන්තන්හි "ඇස් උදුරාපූ මුහුණක් සේ හැරපියා ගිය තැන් අශ්‍රීක කෙරෙමින්" යනුවෙන් ඇස් ඉගිළු මුහුණ අශොභන යයි කීහ.

76 රිවිසඳ නො පත් ක ල
නො දිලෙන වත් සෙ සුදු නි ල
සඳහම් නො මැති ක ල
නො ම දනෙයි පින් පව් දෙකෙහි ප ල

**අː-** රිවිසඳ නො පත් කල නො දිලෙන සුදුනිල්වත් සෙ සදහම් නො මැති කල පින්පව් දෙකෙහි පල නො ම දනෙයි.

පඃ- 1 **'දිලෙන'**- 'දල්- දිලුම්හි' දයින් නිපන් කර්තෘකාරක කෘදන්ත පදයි.

2. **'වත්'**-'වත්‍රු' (=වස්තු) ශබ්දයෙන් භින්නයි. චක්‍ෂුසූර්‍ය්‍යයන් නැති කල්හි වස්තුහු නො බබලත්.

3. **'සුදුනිල'**- සුදු ද නිල් ද=සුදුනිල්. සෙසු වර්‍ණයන් තිබිය දී මේ දෙක ගන්නාලද්දේ උපමෙය ස්වභාවය හඟවනු පිණිසයි. පින් සුදුවන් ලෙසත්, පව් නිල්වන් ලෙසත් සැලකේ.

4. **'දූනෙසි'**- (=දූනේ+සි)- 'දන්- දූනුම්හි' දයින් නිපන් කර්මකාරක ක්‍රියාපදයි. 'පල' යනු උක්තකර්මයි. 'අප (විසින්)' යන අධ්‍යාහෘතය අනුක්තකර්තෘයි.

77 මේ ලෙස සලකමි න
එ රුදින පසු කරමි න
පනද උදුස න
සිරුර සනහා සුවඳ සිලිලෙ න

අර්‍ථය සුගමයි.

පඃ- **1. 'කරමින'**- පූර්‍ව ක්‍රියාර්‍ථයෙහි මිශ්‍ර ක්‍රියායි. "නිල තුර ගුට නැගෙමින්" යනාදියෙහි මෙනි.

2. **'පනද'**- මෙහි 'පන' යන්න 'පුන' යන නිපාතයෙන් ආයේයි.

3. **'සිරුර'**- 'සිරුරු' යනු ප්‍රකෘතියි. මේ කර්මවිභක්ත්‍යන්තයි.

4. **'සනහා'**- 'සනහ- නැමෙහි' දයින් නිපන් පූර්‍ව ක්‍රියාපදයි.

5. **'සුවඳසිලිලෙන'**- 'සිලිල්' යනු සලිල ශබ්දයෙන් භින්නයි.

78 රසමසවුලෙන් යු ත්
බුදිමින් බොජුන් රසව ත්
වඩමින් සිනිඳු ව ත්
පැලඳ සිවුසැටබරණ සිරිම ත්

**අන්වය** සුගමයි.

ස:- 1. **'රසමසඅවුලෙන්'**- 'රස' නම්, ද්‍රව්‍ය නම්බාගත් ජලය හෙවත් සූප (හොදි) යි. 'මස්' යනු එලවලු සහ ජලජස්ථලජසත්ව මාංසයි. 'අවුළු' යනු ඛාද්‍ය (කැවිලි) වගීයි.

2. **'බුදිමින්'**-පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියායි.

3. **'වඩමින්'**- පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියායි. ගමනාර්ථයෙහි වැටෙන සකර්මක 'වඩ' ධාතුව මෙහි ආච්ඡාදනයෙහි (=ඇඳුමෙහි යෙදේ. ධාතුහු අනේකාර්ථ වෙති.

4. **'සිවුසැටබරණ'**- රන්පට, රුවන්තෝඩු, නාගවඩම්, කාදු කාප්පු, කයිපෝට්ටු යනාදි ආභරණ සැටසතරකි. (සඞ්ඛ්‍යානාම විභාගය බලනු.) සිංහල පොත්හි මේ සූසැට අබරණ දක්වෙන්නේ ඔවුනු ද එක් කොට හැඟීමෙනි. එහෙත් වොටුනු සූසැටබරණ වලට නො ඇතුලත් බව **පැරකුම්බාසිරිතෙහි** පෙණේ.

6. **'සිරිමත්'**- 'කාන්තිමත්' යනු අර්ථයි. 'සිරි' සද කාන්ති යෙහි ද වැටේ. මෙයින් ආභරණයන්ගේ භාස්වරත්වය කිහ.

**79 විජයොත් පහතුළෙ**      ත
**නික්ම සුරසබයට ය**      ත
**පසක් සක් විලසි**      ත
**පිවිස සබයට සෙනග සමගි**      ත

**අන්වය** සුගමයි.

ස:- 1. **'විජයොත්පහය'**- තව්තිසා දෙව්ලොව පිහිටි ශක්‍ර යාගේ මහාප්‍රාසාදයයි. ඒ සත්සියක් යොදුන් උස ය. තුන්සියක් යොදුන් උස ඇති දදයෙන් හොබනේ ය. එහි රන්මය යටෙහි මැණික්මය දද වන්නේ ය. මැණික්මය යටෙහි රත්රන්මය දද වන්නේ ය.

2. **'නික්ම'**- 'නිකුම්' දයින් නිපන් පෙරකිරියපදයි. 'ඇ'හට ,අ' ආදෙශයි.

3. **‘සුරසබය’**- බොධිසත්‍වයන් මඝමාණවකකාලයෙහි කරවූ අම්බලම හෙතුකොටගෙණ මේ උපන්නේ ය. මෙහි නාමය **‘සුධර්මා’** යනුයි. ඒ දෙව්සභාව දිගින් ද පළලින් ද තුන්සියක් යොදුන් පමණ ඇත්තේ ය. සියලු කර්මාන්ත රන්රුවනින් නිමියේ ය. ඒ සභාව මධ්‍යයෙහි යොදනක් පමණ රුවන්පලඟෙක් බණ ආසනයෙක් වන්නේ ය. ඒ මත්තෙහි තුන්යොදුන් පමණ හෙලකුඩයෙක් නඟනු ලැබෙයි. ඊට ඉක්බිති ව සක්දෙව්රජහට ආසනයෙක් අතුරණු ලැබෙයි. ඊට ඉක්බිති ව දෙතිස් දිව්‍යපුත්‍රයන්ට ආසන අතුරණු ලැබෙයි. ඊට ඉක්බිති ව සෙසු ප්‍රධාන දෙවතාවන්ට ආසන වන්නේ ය. ලොකයෙහි ඇතිතාක් විසිතුරු එහි වෙයි. මේ ය සුරසබය නම්.

4. **‘පසක් සක්’**- ශක්‍රදෙවෙන්ද්‍රයා චාතුර්මහාරාජික- ත්‍රයත්‍රිංශත් යන දෙදෙව්ලොවට අධිපති ව දෙව්ලොව වසන්නෙකි. එහෙසින් හෙතෙම මනුෂ්‍යයන්ට ප්‍රත්‍යක්‍ෂ නො වේ. සූසැට ආභරණයන්ගෙන් සැරසුනු මේ **දහම්සොඬ** රජයා වූ කලි ශ්‍රී විභූතියෙන් හා තෙජොබලයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන් හා සමාන වෙයි. එහෙසින් මෙතෙම ප්‍රත්‍යක්‍ෂ ශක්‍රයා මෙනි

**80 දිසි පුන්සිසි ලෙස ට**
**දළපුඩුසේසතෙසි ය ට**
**සැදි සිහසුන් පි ට**
**අග සිය තදතෙදණ පළ සො ට**

අ:- පුන්සිසි ලෙසට දිසි දළපුඩුසේසතෙසි යට සැදි සිහසුන් පිට සියතදතෙදණ පළ සොට අරු—

ප:- 1. **‘පුන්සිසි’**- පූර්ණචන්ද්‍රයා මණ්ඩලාකාර ය. ශ්වෙත වර්ණවත් වේ. ශ්වෙතච්ඡත්‍රය ද එබඳු ය.

2. **‘දළපුඩුසේසතෙසි’**- කුඩයෙහි කර්ණිකාව හෙවත් මුදුනෙහි පිටතට තෙරු සිටි අවයවය ‘පිණ්ඩ’ (=පුඩු) නම් වෙයි. මේ ශ්වෙතච්ඡත්‍රයෙහි ඒ අවයවය ඇත්දළින් නිමියේ වේ. එහෙසින් ම **“දළපුඩුසේසතා”** යන කාව්‍යශෙඛරපාඨයට අරුත් බණනුවෝ “දන්තපිණ්ඩමයශ්වෙතච්ඡත්‍රය”යි කිහ. **‘සේසතෙහි’**යි තුබූ තන්හි හකාරයට යකාරාදෙශ වීමෙන් “සේසතෙයි” වී ය. ‘ගෙහි=ගෙයි, ලෙහි=ලෙයි’ යනාදීන්හි මෙනි.

3. **'සැදී'**– 'සද' දයින් නිපන් අතීත කර්මකාරක කෘදන්තයි.

4. **'සිහසුන්'**– රජවරුන්ගේ ස්වර්ණමය ආසනයයි. සෙසු ආසනයන්ට වඩා ශ්‍රේෂ්ඨ හෙයින් 'සිංහාසනය'යි කියනු ලැබේ. සිංහරූප විහිත හෙයින් 'සිංහාසන' නම් වෙතැයි මතයෙකුදු වේ. පද්ම, ශඞ්ඛ, ගජ, හංස, සිංහ, භෘඞ්ග, මෘග, හය යයි සිහසුන් අටෙකි.

5 **'අරා'**– 'අර ඇරුම්හි' දයින් නිපන් පෙරකිරියපදයි.

**81 මැතින් වත් තඹර ට**
**හැර නෙත්සෑන්බිඟුන් තු ට**
**මඳහස පෙරමු කො ට**
**වඳුරයි රසබසින් මෙමලස ට**

අන්වය සුගමයි.

අ:– 1. **'නෙත්සෑන්බිඟුන්'**– නෙත්හි සෑන්–නෙත්සෑන්. නෙත්සෑන් ම බිඟුහු=නෙත්සෑන්බිඟුහු. "මන්ත්‍රීන්ගේ මුඛපද්මයට නෙත්‍රකාන්ති භෘඞ්ගයන් හැර" යනු "මන්ත්‍රීන්ගේ මූහුණ බලා"යි කී සැටියි.

2. **'තුට'** යනු **'කොට'** යන්නෙහි එක් නාමයෙකි. 'තුෂ්ටිය (ද)' යනු අර්ථයි.

3. **'වඳුරයි'**– (වඳුරා+යි) 'ප්‍රකාශ කෙරෙයි' යනු අර්ථයි.

**82 මුනිඳු ගුරු තිලොව ට**
**බඹසුරනරන් තුටු[1] කො ට**
**මොක්පල පසක් කො ට**
**දෙසූ සදහම් කියාලව් ම ට**

අ:– තිලොවට ගුරු මුනිඳු බඹසුරනරන් තුටු කොට මොක්පල පසක් කොට දෙසූ සදහම් මට කියාලව්.

ප:– 1. **'තිලොවට'**– සම්බන්ධවිභක්ත්‍යන්තයි. 'තිලොව' නම් කාමලොක, රූපලොක, අරූපලොකයෝයි. 'කාමලොක' නම්

1 තොස.

කාමරාගය පවත්නා ෂඩ්විධදිව්‍යලොක, මනුෂ්‍යලොක, සතරඅපාය යන මේ යි. 'රූපලොක' නම් කාමරාගය නැත්තා වූ පඤ්චස්කන්ධය ම පවත්නා වූ ද, රූපස්කන්ධය පමණක් පවත්නා වූ ද බ්‍රහ්මලොකයි. 'අරූපලොක' නම් රූපස්කන්ධය හැර සෙසු ස්කන්ධ පවත්නා බ්‍රහ්මලොකයි.

2. **'මොක්පල පසක් කොට'**- මෙයින් සර්වඥයන් වහන් සේගේ ධර්මය අසනුවන්ට මොක්ෂය ප්‍රත්‍යක්ෂ වන බව දැක්වූහ.

3. **'දෙසූ'**- 'දෙස' දයින් නිපන් අතීතකර්මකාරක කෘදන්තයි, 'මුනිඳු' යනු මෙහි අනුක්තකර්තෘයි.

4. **'කියාලව්'**- 'කියා' යන පෙරකිරිය පෙරටු වූ 'ලා-ලීමෙහි' දයින් නිපන් විධික්‍රියාපදයි. වර්තමානකාලිකක්‍රියා යෑ කිව ද වර දෙක් නො වේ. (ලහු=ලවු-ලව්) සිදතෙහි විද්කිරිය 'අව්' පස යයි ගත්තේ වර්තමානවිභක්ති 'හු' ප්‍රත්‍යයාගේ විකෘතියයි.

5. **'මට'** යනු සම්ප්‍රදානයි.

**83.** **මහට[1] කිව හොත් බ — ණ**
**රජසිරිසර ද අපම — ණ**
**සමගින් මුළුදෙර — ණ**
**පුදම් සැක නො ම කරව්[2] මෙකරු — ණ**

**අන්වය** සුගමයි.

**ප:-** 1. **'මහට'**- 'මාහට'යි සිටිතන්හි ඡන්දෝරක්ෂණය සඳහා හ්‍රස්වයි.

2. **'බණ'** යන්නෙහි සාමාන්‍යාර්ථය 'කථාව' යනුයි. එහෙත් මෙහි වනාහි විශෙෂරූඪිවශයෙන් බුද්ධවචනයෙහි වැටේ. 'බුද්ධ ධර්මය' යනු අර්ථයි.

3. **'මුළුදෙරණ'**- මෙහි 'මුළු' සද ප්‍රදෙශවාචී ය. මේ රජුට සකලධරණිය ම නො ව දඹදිව පමණක් අයත්වනබව "වීය දඹදිව් තලට අගරද" යනුවෙන් කිහ. 'මුළුදෙරණ' යන්නෙන් ජම්බුද්වීපය ම ගණු ලැබේ. 'සියලු' සද මෙන් ම 'මුළු' සද ද ප්‍රදෙශසර්වවාචී ය, සර්වසර්වවාචී යයි විවිධ වේ. "මුළුඅත මුවෙහි දමයි" යනු ප්‍රදෙශසර්වවාචී 'මුළු' සදට නිදර්ශනයි. 'මුළුඅත' යන්නෙන් අතෙහි පෙදෙසක් කියවේ. "සුගාන්තයෙහි මුළු ලොව වැනසේ" යනු ඉතරයට උදහරණයි.

**84** **මෙලෙසින් වරින් ව — ර**
**කියතුදු එරජ බස නි — ර**
**නො ම දත් බැවින් පෙ — ර**
**නො හැකි බව පළ කළෝ මැතිව — ර**

අ:– මෙලෙසින් එරජ වරින් වර තිරබස කියනුදු පෙර (බණ) නො ම දත් බැවින් මැතිවර නො හැකි බව පළ කෑළෝ.

ප:– 1. **'කියනුදු'** (=කියන+දු= කියනුදු.) අකාරයට උකාර දෙශයි. 'දු' නිපාතය පරකල්හි ඇතැම් තැන උකාරාගම ද වේ. (=නම්+දු=නමුදු.)

3. **'බසතිර'**- මෙයින් "මුළුදෙරණ සමගින් අපමණ රජසිරි සර ද පුදම්"යි කී වචනයාගේ ස්ථිරත්වය කීහ. බණ කීව හොත් රජසිරිපිදුම ස්ථිර ය.

3. **'නො ම දත් බැවින් පෙර'**–මෙයින් අමාත්‍යයන් මින් පෙර ධර්මය නො දත්බව හා මත්තෙහි ධර්මය අසන්නට ලැබුන හොත් දත හැකි බවත් හඟවත්.

4. **'කෑළෝ'**–කර්තෘකාරකයෙහි තිපත් කෘදන්තනාමයි. ප්‍රථමා බහුවචනාන්තයි.

5. **'මැතිවර'**- සමූහාර්ථයෙහි ඒකවචනයි. මීට තුල්‍යාධිකරණ වන ක්‍රියාපදය බහුවචනාන්ත වේ.

**85 ද හ මු න්[1] නො ම දත් බව පැවසූ ව ර**
**ස ද මි න් මඟුලැතු ගෙන්වා පුවත ර**
**ද හ සි න් බැඳි පියැලි[2] ද තබමින් ස ර**
**මෙලෙසින් බෙර පියෙවි[2] කොළෙ පුරතු ර**

අ:– උන් දහම් නො ම දත්බව පැවසූවර පුවතර මඟුලැතු සදමින් ගෙන්වා දහසින් බැඳි සර පියැලි ද තබමින් පුරතුර මෙ ලෙසින් බෙර පියෙවී කොළේ.

ප:- 1. **'දහමුන්'**– 'දහම්+උන්' යනු විසන්ධියි. 'දහම්' යනු කර්මවිභක්ත්‍යන්ත ද 'උන්' යනු කර්තෘවිභක්ත්‍යන්ත ද වේ.

2. **'වර'**– ආධාරවිභක්ත්‍යන්තනාමපදයි. 'ඇ' හට 'අ' ආදෙශයි.

3. **'සදමින්'** පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියාපදයි. **'තබමින්'** යනු ද මෙසේයි.

4. **'මඟුලැතු'**– රජුන් උත්සවදිනයන්හි නැඟෙන හස්ති තෙමේ මඟුලැත් නමින් දන්නා ලැබේ. 'මඞගල' නමින් ඇත්කුල යෙක් ද වේ. ඒ කුලයෙහි ඇතෙකුට සාමාන්‍ය ඇතුන් කෝටියක කායබලය වෙයි. ඇත්කුල දසය අතුරෙන් සත්වන ඇත්කුලය එයයි.

1. සදහම් 2. පියලි 3. පියවි.

5. **'ගෙන්වා'**-'ගෙන්' දයින් නිපන් හෙත්වර්ථපූර්වක්‍රියාපදයි. වර්තමානවිභක්තියෙහි ලැබෙන "ගෙණේ, ගෙණේත්" යනාදිය හැර මේ දයින් නිපන් ක්‍රියාරූපයෝ භාෂාවෙහි අප්‍රයුක්තයෝ ය. 'ගන්' දය අර්ථයෙන් ද රූපසිද්ධියෙන් ද මෙය හා විසදෘශ ය.

6. **'දහසින්'**-කාරණවිභක්ත්‍යන්තයි.

7. **'පියැලි'**-ජීර්ණවස්ත්‍රඛණ්ඩවාචියි. කියන ලද මැයි **රුවන් මලෙහි**:- "දුණුවත් රෙදි පියැලි වේ" යි.

8. **'පියෙව්'**-'පියොව්' දයින් නිපන් අතීතකර්මකාරක කෘදන්තපදයි. 'කොළෙ' යන්නෙහි විකෘතිකර්මයි. ප්‍රකෘතිකර්මය 'බෙර' යනුයි. මෙහි 'බෙර' යනුවෙන් භෙරීනාදය ගැණේ.

සං:- මෙතැන සිට 113 වන පද්‍යය තෙක් කීපයක් හැර **'පෙද'** නම් වෘත්තයෙන් බඳනා ලදී. පෙදවිරිතෙහි ලක්ෂණ මෙසේයි:-

"සතර සතරමතින්-යති සතරක් දුට හොත්,
සොළොස් මතින් රැදියේ-පෙද නම් විරිත් හෙ මෙසේ"

**86 මු නි ඳු න් වඳහල දහමින් අමයු ත්**
**ග ය කි න් වත් ඉන් අඩිනඩකින් ව ත්**
**ම ට දූ න් කිසිවෙකු[1] බණ කිව, තුටුයි ය්**
**ව ඩ මි න් ඔහට දෙමි නෙක සම්ප ත්**

**අන්වය** සුගමයි.

ප:-1. **'දහමින්'**- නිර්ධාරණාර්ථයෙහි අවධිවිභක්තියි.

2. **'ගයකින්'**- ගාථාවකින්; ඡන්දෝනිබද්ධ පද්‍යයෝ 'ගාථා' යයි පාලියෙහි දී සාමාන්‍යසංඥවශයෙන් කියනු ලැබෙත්. **එක්** පාදයකට අකුරු අට බැගින් පාදසතරෙහි අකුරු දෙතිසක් ඇති වෘත්තයෙන් රචිත පද්‍යයන්ට ද ගාථා ශ්ලොක ,යන නම් ව්‍යවහාර කරණු ලැබේ. ඒ ද මෙහි යොග්‍ය ය.

3. **'වන්'**- අපෙක්ෂාර්ථයෙහි නිපාතපදයි. මෙයින් අන් තන්හි අන්‍යාර්ථයන්හි ද වැටේ.

4. **'අඩිනඩකින්'**-ඉන් අඩ නම් ගාථාපාදදෙකකි. ඉනුත් අඩ නම් ගාථාපාදයෙකි. ඒ කාලයෙහි බුද්ධ භාෂිත ගාථාපාදයකුදු නැති බැව් හා රජහුගේ අතිශයධර්මකාමිත්වය ද මෙයින් හඟවත්.

---

1. කිසිංවෙක්.

5. **'කිසිවෙකු'**– මෙය පුරාතනව්‍යවහාරයෙහි 'කිසිවකු' යි සිටියේ ය. 'මිනිසකු, දෙදෙනකු, සසකු, පැණැතියකු' යනාදිය ද මෙසේයි. කාල් යාමෙන් මේ තන්හි ද 'අකු' වෙනුවට 'එකු' යන්න ම යෙදීමෙන් 'මිනිසෙකු' යනාදි රූපයෝ ව්‍යවහාරයට පැමිණියහ. මින් අවුරුදු දෙසියපණසකට ද වඩා ඉහත දී ලියනලද ලෙඛන යන්හි පවා මෙය දක්නට ලැබෙන හෙයින් දුෂ්ටයයි හළ හැකි ද නො වේ. **අලගියවන්න**තුමාගේ කාලයෙහි මෙය අතියමින් පැවැතිබව පෙණේ. කාල් යාමෙන් වන විපර්‍ය්‍යාසයන්ට ගරු නො කරණ ශාබ්දිකයෝ "කිසිවෙකු" යනාදිය දුෂ්ටත්‍වයෙන් සල කත්. අතීතයෙහි ද් අව්‍යක්තයන් විසින් ම "කිසිවෙකු" යනාදිය ව්‍යවහාර කළ බව තම් නිසැක ය. භාෂාවක් පළල් කරන්නෝ අව්‍යක්තයෝ ය. චිරකාලප්‍රවෘත්තියෙන් අව්‍යක්තව්‍යවහාර සාධුත්‍ව යෙන් ගැණේ. එහෙයින් මේ ප්‍රයොගවයය ම නිර්දෙෂයයි සල කම්හ.

6 **'දෙමි'**– 'දා' දයට 'දෙ' ආදෙශ වීමෙන් සිද්ධ වර්‍තමාන කාලික උත්තමපුරුෂඑකවචනාන්තාඛ්‍යාතයයි. පාළි 'දා' ධාතුව සිංහලයට පැමිණ 'දෙ' යි සිටි. මේ ක්‍රියාපදයාගේ අර්ථය අනාගත ය. මෙයින් අන්තන්හි ද ගද්‍යපද්‍යදෙක්හි ම අනාගතකාලික ක්‍රියාව හා වර්‍තමාන ක්‍රියාව ද රූපයෙන් සමාන ව දක්නා ලැබේ. ඊට උදාහරණ දහස්ගණින් ලැබිය හැක. එහෙයින් 'සිංහලයෙහි විශෙෂ වූ අනාගතකාලිකක්‍රියාරූපයෙක් නැත' යන මතය සම්භාව්‍ය වේ. අනාගතකාලිකක්‍රියා ලෙස සැලකෙන 'යන්නේ, දෙන් නේ' යනාදිය ස්ත්‍රීලිංගිකපදයක් උක්තය වනවිට 'යන්නී, දෙන්නී' ඈවිසින් යෙදෙනු විනා 'යන්නෙ' යනාදි විසින් නො යෙදෙන හෙයින් කෘදන්තපද යයි සැලකීම යුක්තියුක්ත ය. ආඛ්‍යාතපද යන් ලිඞ්ගභජනය නො කරණ හෙයිනි. ප්‍රතිරාජපරිවෙණාධිපතීහු ඒ වියරණවිදිය මාතෘභාෂාවන් බලා කිහ.

**87 ද හ ස්, පටන් සොළසුවහස් හිමි සො ට**
**වෙසෙ ස් අනගි මුතුමිණි සහ රට නො ට**
**සතො ස් වඩන රජසිරි දි හිමි සො ට**
**ද හ ස් බවට පැමිණෙමි මම ඹහ ට**

**අන්වය** සුගමයි.

ප:–1. **'දහස්'**–'සහස්ස' ශබ්දයෙන් භිත්‍තයි.

2. **'සුවහස්'**– 'සතසහස්ස' යන්නෙන් ආයේ ය. 'ලක්‍ෂය යනු' අර්ථයි.

3. **'දහස්'**– 'දස' ශබ්දයෙන් භිත්‍තයි. මධ්‍යයෙහි හකාරා ගම ද පූර්වය හ්‍රස්ව ද වී ය.

4. **'පැමිණෙමි'**– 'පමුණ' ධාතුයි. අනාගතාර්ථයෙහි වර්තමාන රූපයයි.

88 **මෙලෙසින් කිසමින් විමසා හැමතැ න**
**නොලදින් බණ දන්නකු[1] කලකිරෙමි න**
**හරිමින් රජසිරි වෙනිංනසාංවසෙකි න**
**නොලසින් නික්මිනි[2] වනයට ඝන මෙ න**

**අන්වය** සුගමයි.

**ප:**– 1. **'විමසා'**– 'විමස– විමසුම්හි' ධාතුයි.

2. **'ලදින්'**– 'ලද්ධාන' යන්නෙන් භින්නයි. සිංහල ව්‍යාකරණයෙහි නිපාතනවිධියෙන් සිද්ධ කරණු ලැබේ.

3. **'කලකිරෙමින්'**– 'කලකිරු' දයින් නිපන් පූර්වක්‍රියාර්ථ මිශ්‍ර ක්‍රියායි. මේ ධාතුව අකර්මකයි. 'කලකිරිණි, කලකිරුණු' යනාදි විසින් අතීතයෙහි ද 'කලකිරේ, කලකිරෙත්' යනාදි වශයෙන් වර්තමානයෙහි ද වරනැගේ.

4. **'හරිමින්'**– යනු ද පූර්වක්‍රියාර්ථයෙහි ය.

5. **'නික්මිනි'**– 'නිකුම' දයින් නිපන් අතීතකාලික ක්‍රියාපදයි. කකාරස්ථ උකාර ලුප්තයි. 'නිකුත්' යනු මෙයින් වූ කෘදන්තපදයි.

89 **ඉසිමින් ගිනිරොන් පහරින් ද ළ ද ළ**
**බසිමින් පැන ලොබ වඩමින් දෙ ළ දෙ ළ**
**කොණෙරුන් පොච්චන් සමගින් කො ළ කොළ**
**දකිමින් මතගිජිඳුන් සිටි ප ළ ප ළ**

**අ:**– දළ දළ පහරින් ගිනිරෙණ් ඉසිමින් පැන ලොබ වඩමින් දෙළ දෙළ බසිමින් කොණෙරුන් පොච්චන් සමගින් කොළ කොළ පළ පළ සිටි මතගිජිඳුන් දකිමින් (මතුසම්බන්ධයි.)

**ප:**– 1. **'ඉසිමින්'**–'ඉස්' ධාතුයි. 'මින්' ප්‍රත්‍යය පරකල්හි ඉකාරාගම වීමෙන් සිද්ධයි.

**සං:**– මේ ප්‍රථමපාදයෙන් හස්තීන්ගේ යුද්ධ වැණීත. ඇතුන් පොර ගසන විට දළ වූ දළාප්‍රහාරයෙන් ගිනිපුපුරු නැගේ. **ගුරුළුගොමිහු** ද "නිල්අඹරෙහි උල්කාපාත සෙයින් මතැත් යුද්ධි දළගැහැටමෙන් නිල්වන අතුරෙන් පලන ගිනිදල බලමින්" යනු වෙන් එය කීහ.

2. **'බසිමින්'**- 'බස්' ධාතුයි.

---

1. දන්නෙකු 2. නික්මුනි.

3. **'දෙළ දෙළ'**– **'දෙළ'** සද 'ඛර' ශබ්දයෙන් ආයේ ය. වීප්සාවෙහි විත්‍වයි. වෙන් වෙන් වූ වස්තූන් ක්‍රියාවකින් හෝ ගුණයකින් හෝ ද්‍රව්‍යයකින් එක් කොට ගණු කැමැත්ත 'වීප්සා' නම්. මෙහි වෙන් වෙන් වූ දෙළවල් 'බයිමින්' යන ක්‍රියාවෙන් එක් කොට ගැණේ.

4. **'කොණෙරුන්'**–'කණෙරුකා' ශබ්දයෙන් භිත්‍නයි. හක්තිනී වාචකයි.

5. **'පොව්වන්'** පොවු සද 'පොතක' ශබ්දයෙන් භිත්‍න යි.

90 **දි ලෙ මි න් ලඹ දෙන නවතඹ ප ල් ල න්**
**ලොල සෙ න් තොලු දි සිඹි මුව පොල් ල න්**
**වි ල සි න් ඉඳුනිල්පැහැති සු නි ල් ල න්**
**ද කි මි න් රඟ දෙන සිකි පිල් ව ල් ල න්**

**අන්වය** සුගමයි.

**ප**– 1 **'දිලෙමින්'**–'දල–දිලුම්හි' දයින් නිපන් මිශ්‍ර ක්‍රියායි.

2. **'ලඹ දෙන'**– මෙහි 'ලඹ' සද 'එල්බීම' යන අරුත්හි යෙදින.

3. **'නවතඹපල්ලන්'**– තඹවන් වූ පලු= තඹපලු. නව වූයේ ද ඒ තඹපලු වූයේ ද=නවතඹපලු. 'තඹපැහැති ලාදලු' යනු අර්‍ථයි. ආධාරාර්‍ථයෙහි කර්‍මවිභක්තිරූපයයි.

4. **'මුවපොල්ලන්'**– මෙහි ප්‍රකෘතිය 'මුවපොලු' යනුයි. 'මුව පෙලි' යනු එහි ස්ත්‍රීලිඞගරූපයයි.

5. **'ඉඳුනිල්පැහැති'**– මෙය මයූරග්‍රීවයෙහි වූ නීලවර්‍ණය ගෙණ කිහ.

**සං:**- මේ පද්‍යය **කාව්‍යශේඛරයෙහි** 4 සර්‍ගයෙහි 14 වන කව බලා කරණලද්දකි.

91 **පි පි ම ල් මුවරඳ පලරසයෙන් ම ත්**
**මිහිලො ල් පරපුටු සුව සැල නද ග ත්**
**ග න නි ල් ගනකුළු විලසින් එමහ ත්**
**තු ඟු තු ල් වන පත් තුරු සෙවනලු යු ත්**

**අ:**- එමහත් පිපිමල් මුවරඳපලරසයෙන් මත් මිහිලොල් පරපුටු සුව සැළ නද ගත් ගනකුළුවිලසින් තුඟුඅතුල් තුරු ගනනිල් සෙවනලු යුත් වන පත්.

**ප:**– 1. **'පිපි'**–'පුප්' දයින් නිපන් කර්තෘකාරක කෘදන්තයි.

2 **'මිහිලොල් පරපුටු සුව සැළ'**- මිහිලොල් නම් මීමැස් සෝ ය. 'මධුලොල' යනු ප්‍රභවයි. 'පරපුටු' නම් කොවුලෝයි. පරා විසින් පුස්නා ලද හෙයින් ඔහු එනම් වෙත්. කොවුලෝ කපුටු කැදූල්ලෙහි කවුඩන් විසින් වඩනු ලැබෙත්. 'සුව' යනු ගිරව් ය. 'සැළ' නම් ශාරිකාපක්‍ෂීහු (සැළලිහිණි) යි.

3. **'ගන නිල්'**- 'සෙවනලු' යන්නෙහි විශෙෂණයි. 'ගනකුළු' යනු උපමායි. භූමියෙහි පතිත වූ වෘක්‍ෂච්ඡායාවෝ මෙඝකූට (වැහි වලා) වැනි වෙත්.

4. **'පත්'**-පාළි 'පත්ත' (සංස්කෘත-'ප්‍රාප්ත') ශබ්දයෙන් භින්න නාමපදයෙකි. විභක්තිප්‍රත්‍යය ලුප්තයි. 'පමුණ' දයින් නිපන් අතීතකාලාඛ්‍යාත යයි ගත ද නිවරද ය. 'පමුණ' ධාතුවට 'පත්' ආදෙශ යි. ක්‍රියාරූපය 'පති' යනුයි. ඉකාරය ලොප් කළ විට 'පත්'යි සිද්ධ වේ.

5. **'සෙවනලු'**- වර්තමාන ව්‍යවහාරයෙහි 'සෙවනැලි' යි ලැබේ.

92 ර ග න මොනරගණ කෙළනා මුව කැ ල
සො බන එවන සුරගන රැඳි මනක ල
නැහෙන අහස්ගඟ රළපෙළ මෙන් දු ල
න ඳ න පුලිනතල සැතපී සුනිම ල

අ:- මොනරගණ රඟන මුවකැල කෙළනා මනකල සුරඟන රැඳි සොබන එවන අහස්ගඟ නැහෙන රළපෙළ මෙන් දුල නඳන සුනිමල පුලිනතල සැතපී-

ප:- 1. **'රඟන'**- ආධාරකාරකයෙහි නිපන් කෘදන්තයි. 'එවන' යන්නෙහි විශෙෂණයි. **'කෙළනා'** යනු ද මෙසේ යි.

2. **'නැහෙන අහස්ගඟ රළපෙළ මෙන්'**- මෙයින් පුලින තලයන්ගේ සැටි කිහ. අහස්ගඟෙහි උද්ගත වන තරඞ්ගපඞ්ක්තීහු ශ්වෙතවර්ණ වෙති. වාලුකාස්ථලයෝ ද එබඳු වෙති.

3. **අහස්ගඟ**:- යට දක්වන ලදි.

4. **'සැතපී'**- 'සතප්' දයින් නිපන් පෙරකිරිය පදයි.

93 ල ම ග සබර සිඳුවර කර කළුහ ර
පෙ න ග ඬබර ඝොර මොර පර සහක ර
වෙ ල ග වරණ රැරඟ බෙලි බිඳුපු ර
සි ත හ පිවිස තුඟු තුරු සැදි වනතු ර

**අන්වය** සුගමයි.

ප:- **'සාලුහර'**- සාලු හර වනුයේ යමෙක්හි ද ඒ=සාලුහර. 'සාලු වර' යි වත්මන්හි ලැබේ.

2. **'රැරග'**- රාත්‍රියෙහි ආලෝකය පතුරුවන වෘක්ෂවිශෙෂ යෙකි. මේ හිමවත්හි මිස ලක්දිව නො ලැබේ.

3. **'සිතග'**- 'සිතාඞග' ශබ්දයෙන් භිත්‍රාසි. හෙලඉඹුල් වලට ඒ නමෙකි. 'සිතග' යන්නට 'සිත් වූ පරිද්දෙන්' යි ද අරුත් බණිති. 'සිතැගි' යි වුවොත් ඒ අර්ථයෙහි වඩා යොග්‍ය වේ.

4. **'පිවිස'**- 'පිවිස' දයින් නිපන් පෙරකිරියයි.

94 **වි ස ද ර  නා තෙලිසප් පොලගුන්ගෙ  න**
**බි ය සාර  සි ගජ වග වලසුන්ගෙ  න**
**ගොරතර  යක් බූ පිසස් සොරුන්ගෙ  න**
**උ ව දු ර  සාට නො පැමිණ පින්මහිමෙ  න**

**අන්වය** සුගමයි.

ප:- 1. **'තෙලිසප්'**- පොළොං වෙසෙසකි. 'තෙලිස්සා' නමින් ප්‍රසිද්ධ ය.

2. **'පොලගුන්ගෙන'**- මෙහි ශබ්දප්‍රකෘතිය 'පොළොං' යනුයි. විභක්තිප්‍රත්‍යය පර වන විට ගකාරාගම ද බින්දුවට අඞය ද ඔකාරයට අකාරාදෙශ ද වේ. "සොළොම්" සදත් මෙබඳු වේ. "සොලඹ" යනාදිය එයින් නිපදනා රූපයෝ යි.

මෙහි 'ගෙන්' යන්න **සිදත්**සඟරාහි විභක්තිප්‍රත්‍යයක් ලෙස සැලකූන ද, කර්මවිභක්තිරූපයන්ගෙන් පර ව කාරණ අවධිඅර්ථ යන් හැඟවීමෙහි යෙදෙන නිපාතයෙකැයි සැලකීම වඩා යොග්‍ය වේ. මසිදු ගෙන්' 'වෙළඳහු ම ගෙන්' යනාදිය වැනි ප්‍රයොගයෝ ද ඇත්තාහ. සිදත්හි කී අයුරින් යෙදෙතොත් මාගෙන් දු, වෙළඳහු ගෙන් ම' විය යුතුය. 'මා දු ගෙන්' යි 'ගෙන්' යන්නට මුලින් 'දු' නිපාතය යෙදීමෙන් 'ගෙන්' යන්න ප්‍රත්‍යයක් නොවනබව හැඟේ.

3. **'ගොරතර'**-(ඉතා ගොර=ගොරතර)- 'තර' යනු අතිශ යාර්ථප්‍රත්‍යයෙකි.

4. **'යක්බූපිසස්'**- 'යක්ෂයෝ' නම් මිනිසුන් බිය ගන්වා රොග උපදවන්නා වූ දෙවයොනි භෙදයෙකැයි කියත්. 'භූතයෝ' නම් යක් පිසසුන්ගෙන් අන්‍ය වූ අමනුෂ්‍යයෝ යි. ඔහු ද මිනිසුන්ට උපද්‍රව කෙරෙත්. 'පිසස්' නම් මනුෂ්‍යමාංස අනුභව කරණ ප්‍රෙතවිශෙෂ යෙකි. ඔහු ද මිනිසුන් තැති ගන්වත්.

5. **'මහිම'** යන්නෙහි අර්ථය 'මහද්භාවය (=මහත්කම)' යනුයි

95 මහසත්[1] එවනෙහි උන්සඳ ල තැ වී
එමහත්[2] තෙදගුණ බලයෙන් සතැ වි
විදුරත් සලසුන් සිහිලස නො ම වී
දිලිරත් යවටක් විලසින් හුණු වී

අ:- මහසත් එවනෙහි ල තැවී උන්සඳ එමහත් තෙද ගුණ මහිමෙන් විදුරත් සලසුන් සතැවී සිහිලස නො ම වී දිලිරත්යවටක් මෙන් හුණු වී.

ප -- 1. **'උන්සඳ'**– 'උන්' යනු 'හිඳු' දයින් අදරකරු 'උ' පස යෙදීම් ආදියෙන් සිද්ධයි. **'සඳ'** යනු 'සන්ධි' ශබ්දයෙන් භින්නයි. මෙහි කාලාර්ථයෙහි යෙදේ. ආධාර විභක්ත්‍යන්තයි.

2. **'ල තැවී'**– 'ල' යනු කරණ විභක්ත්‍යන්තයි. විභක්ති ප්‍රත්‍යය ලුප්තයි. **'තැවී'**– යනු 'තව--තැවුම්හි' දයින් නිපන් පූර්ව ක්‍රියාපදයි. 'තව' දය අකර්මක ද වේ. එවිට වරනැගෙනුයේ 'තැවේ, තැවෙත්' යනාදිවිසිනි.

3. **'සතැවී'**– 'ස' උපසර්ග පූර්ව 'තව' ධාතුයි.

4. **'විදුරත්'**– විදුර අතෙහි වූයේ යමෙකුගේ ද හේ=(විදුරු+ අත්) විදුරත්. **ශක්‍රයාගේ** හස්තයෙහි වජ්‍රායුධය වෙයි. එහෙයින් හේ 'වජ්‍රහස්ත' නම් වේ. 'වජ්‍රායුධය' යනු දියමන්තියෙන් කළ අවියකි. එයින් පහරණ ලද්ද සුණුවිසුණු ව යෝ. ඒ අවිය කොපමණ දෘඪදෙයෙක්හි වුව ද අතර නො රඳයි.

5. **'සලසුන්'**– පාණ්ඩුකම්බල ශෛලාසනයයි. ඒ දිගින් ගවු දෙසියයක් ද, පළලින් ගවු සතළිසක් ද, බොලින් (=ඝනකමින්) ගවු සැටක් ද ඇත්තේ වේ. බඳුවදමල්ගොඩක් සේ රත්පැහැයෙන් යුත් ඒ අස්න සුවපහස් දීමෙහි ද අග්‍රෙසර වේ. **ශක්‍රයා** එහි උන් කල්හි ඉහ දක්වා එරී යෙයි. ලොකයෙහි අතිශය ගුණවත්කෙනෙකුන්ට සන්තාපයක් වූ කල්හි මේ අසානය ද තැවී යෝ. (**කෘෂ්ණ ජාතකය** බලනු.) ඒ සලකුණෙන් ශක්‍රතෙමේ එය දැන ගණී.

6. **'සිහිලස'**–(=සිහිල් ම=සිහිලස . මෙහි 'අස' යන්න ස්වාර්ථයෙහි ය. 'සිහිල්' යන්නෙන් ලැබෙන අර්ථයට වඩා විශෙෂාර්ථයක් 'සිහිලස' යන්නෙන් නො ලැබේ. 'මුහුලස' යනාදීන්හි ද මේ "අස" යන්න පෙණේ.

7. **'රත්යවටක්'**– රත් වූ යකඩගුළියක් යම් සේ උණුසුම් වේ ද, එසේ ම පඬුඇඹුල්සලස්න ද උණු වි ය. 'යවට' යන්නෙහි ප්‍රභවය 'අයොවට්ට' යනුයි.

1 එමහත්. 2 මහසත්.

8. **'ශුණු'**–'උණු' යි සිටිතන්හි හකාරාගමයෙන් සිද්ධයි.

96 **ස නො ස් පහස් දෙන එඅසුන් මෙලෙසි න**
**නො ල ස් ව ශුණු වන රත්සවටක් මෙ න**
**ද හ ස් දිවැස් ලා මුළුලොව බලමි න**
**කු කු ස් වෙමින් උන් මහසතු දකිමි න**

අන්වය සුගමයි

පː– 1. **'කුකුස් වෙමින්'**– 'කුකුස්' නම් කළ පව් ගැණ ද, නො කළ පින් ගැණ ද පසුතැවිලි වීමයි. කියනලද මැ යි **කාව්‍යශෙඛර යෙහිː—**

"කළ නො කළ උදෙ සා
පසුතැවිලි වනු කුකු සා"යි.

මෙහි වනාහි කෙවලසන්තාපය ගැණේ. **දහම්සොඬරජ** කළ නො කළ පින්පව් උදෙසා නො ව ධර්‍මය අසන්නට නො ලැබුම උදෙසා තැවුනු හෙයිනි 'කුකකුච්ච' යනු ප්‍රභවයි. 'වෙමින්' යනු වීම් අරුත්හි වැටෙන 'ව (=වූ)' දයින් නිපනැයි ගතොත් "කුකුස්" යන්න අස්ත්‍යර්‍ථප්‍රත්‍යයාන්තතද්ධිතශබ්දයෙකැයි ගත යුතු වේ. 'කුකුස් ඇතියේ=කුකුස්" යනු විග්‍රහවාක්‍යයි. ප්‍රත්‍යය ලුප්තයි. නො එසේ වුව, "මහසතු 'පසුතැවිලි වීම්' යන ක්‍රියාමාත්‍රයක් වෙමින්" යන අර්‍ථය ලැබේ. ඒ අසම්භාව්‍ය ය; සත්‍වයෙකු ක්‍රියා මාත්‍ර යක් නො විය හැකි හෙයිනි. "කුකුසට පැමිණෙමින්" යන අර්‍ථය ගත හොත් 'ව(=වූ)' ධාතුව ප්‍රාප්ත්‍යර්‍ථයයි සැලකිය යුතු. මේ ධාතුහුගේ ප්‍රභවය වූ 'භූ' ධාතුව සංස්කෘතයෙහි වීම්අර්‍ථයෙහි මේන් ම පැමිණීම්අර්‍ථයෙහි ද වැටේ. "කුකුස්ඇත්තෙකු වෙමින් නොහොත් කුකුසට පැමිණෙමින්" යන දෙකින් එකක් මිස අනෙක් අර්‍ථයෙක් මෙහි නො යෙදේ.

3. **'දකිමින්,බලමින්'**– පූර්‍වක්‍රියාර්‍ථයෙහි ය.

97 **ද මි සොඬ මහබෝසත් ගුණ සුවිපු ල**
**ද ම් වියොවින් රජසිරි හැර වැද ව ල**
**ය ම් කිසි වෙහෙසක් වී නම් මේ කා ල**
**ම මි වැනි සුරිඳකු ඉඳ කිම වන ප ල**

අː– මේකල ගුණ සුවිපුල දම්සොඬමහබෝසත් දම්වියොවින් රජසිරි හැර වල වැද යම්කිසිවෙහෙසක් වී නම්, මම (මා) වැනි සුරිඳකු ඉඳ වන පල කිම (වේ)?.

'පː– 1. **ගුණසුවිපුල** –(ඉතා විපුල්=සුවිපුල්. මෙහි 'සු' සද අතිශයාර්‍ථයෙහි ය.) සුවිපුල් ගුණ ඇතියේ= **'සුවිපුල්ගුණ'** යි විග්‍ර

යුතු වත් සම්බන්‍ධහෙතුවින් පද විපයඖාස කොට 'ගුණසුවිපුල'සි ගත්හ. 'ගුණයෙන් සුවිපුල'සි විභක්තිසමාසවශයෙන් ද ගත හැකි වේ.

2. **'වියොවින්'**– 'වියෝ' යනු ප්‍රකෘතියි. 'පොළෝ, ලෝ, සෝ' යනාදිය මෙනි. 'වියොග' යනු ප්‍රභවයයි.

3. **'වෙහෙසක්'**–– 'වී' යන්නෙහි කර්‍තෘයි.

4. **'වි'**- 'ව' (=වූ) දය මෙහි ප්‍රාප්ත්‍යර්ථයෙහි වැටේ. 'වෙහෙස කට පැමිණියේ නම්' යනු අර්ථයි. 'වෙහෙසක් වී නම්' සි 'ව' දය සත්තාර්ථ වත් (=වීම් අරුත් ඇති) සේ ගතොත් 'බෝසත්' යන ප්‍රථමාන්තය 'බෝසතු'සි විතීයාන්තවශයෙන් ද, 'වැද' යන පෙර කිරියපදය හෙත්වර්ථයෙහි යයි ද සැලකිය යුතු ය. එවිට "වනයට වැදීම්හෙතුවෙන් බෝසතුන් (හට) පිළිබඳ ව වෙහෙසක් වීනම්" සි අර්ථ ගත යුතු වේ. නො එසේ වුව පද්‍යය දුෂ්ට වේ. 'වී' යන අතීතාර්ථක්‍රියාපදයාගේ ප්‍රයොගය 'නම්' යන අසම්භාව්‍යාර්ථ ද්‍යෝතකනිපාතයොගය හෙයිනි.

5. **'මම වැනි'**– මෙවැනි ප්‍රයොගයෝ දුෂ්ට වෙති. 'මම්' යනු ප්‍රථමාවිභක්ත්‍යන්තයෙකි. වාක්‍යයෙක්හි ප්‍රථමාන්තය යෙදිය යුත්තේ අවසානක්‍රියාවකින් උක්ත වන කල්හි ය. 'මම්' සි උක්තය වීමට උත්තමපුරුෂක්‍රියාපදයෙක් මෙහි නැත්තේ ය. තුබුන ද 'වැනි' යන උපමාද්‍යෝතක නිපාතයාගේ යොගය හෙයින් ප්‍රථමාන්තය හුදක් ම නො යෙදේ. මෙහි යෙදිය යුත්තේ 'මා' සි විතීයා(කර්‍මවිභක්ත්‍ය)න්තවශයෙනි. එළිසමය සඳහා 'ම්' යන්න ආගම කොට පූර්‍ව හ්‍රස්ව කිරීමෙන් 'මම්' සි ගැණුම නිදොස්බවට සම්තම්කාරුණෙකි. මොවුන් ම "මම එන තුරු සිටුවයි පවසමිනෝ"සි **කුසදා** මෙවැනි ම දොසක් කළබව පැණේ. මෙබඳු තැන් විභක්තිවිපයඖාස යයි වසා තැබීම යොග්‍ය නො වේ. එළිසමය සඳහා මෙබඳු දෑ කිරීමට අවසර නැත. 'මා වැනි'සි ශුද්ධ කර ගැණීම වඩා යොග්‍ය වේ.

6. **'ඉඳ'**–මේ පෙරකිරිය හෙත්වර්ථයෙහි ය. 'ඉඳීම්හෙතුවෙන්' යනු අර්ථයි. හෙත්වර්ථ වන විට පූර්‍වක්‍රියාපදයෝ භින්නකර්‍තෘක ව ද යෙදෙති. මෙහි ද භින්නකර්‍තෘක ය. අධ්‍යාහෘත 'වේ' යන්නෙහි කර්‍තෘ පදය වන 'පල' යන්න 'ඉඳ' යන්නෙහි කර්‍තෘ ද නො වන හෙයිනි. සාමාන්‍යයෙන් පූර්‍වක්‍රියාපදයෝ අපරක්‍රියාව හා සමාන කර්‍තෘකයහ. **දහම්සොඬරජ වල් වැද** මෙසේ සිති" යනු නිදර්ශනයි. මෙහි 'වැද' යන පෙරකිරියපදයට හා 'සිති' යන අවසානක්‍රියාපදයට ද කර්‍තෘ වූයේ එක ම දහම්සොඬරජ ය. "දිවියා **දැක** බිය

"උපනි" යනු හෙත්වර්ථපූර්වක්‍රියාවට උදාහරණයි. එහි 'උපනි' යනු අවසානක්‍රියායි. ඊට කර්තෘ වනුයේ 'බිය' යන්නයි. 'දැක' යන්නෙහි කර්තෘ ඒ නො වේ. එහෙයින් ඒ භින්නකර්තෘක (=වෙන් වෙන් කර්තෘ ඇත්තේ) වේ. හෙත්වර්ථයක් නැතිතැන භින්නකර්තෘක ව යෙදීම මහත් වූ දොසෙකි.

ස:- මේ සුරෙන්ද්‍රයන්ගේ ඉදීමේ පරමාර්ථය ගුණවතුන් විවිධ පීඩාවන්ගෙන් රැකගැණුම බව මෙයින් හඟවත්.

98 **මෙලෙස් සකස් කොට සිතමින් එවිග ස**
**වෙසෙස් සුරඹ සමගින් වඩවන තො ස**
**ති ද ස් පුරය හැර සහ සුරසිරිරැ ස**
**ම නි ස් ලොවට බසිමින් සෙද සහතො ස**[1]

අ:- මෙලෙස් සකස් කොට සිතමින් එවිගස තොස වඩවන වෙසෙස් සුරඹ සමගින් සහ සුරසිරිරැස තිදස්පුරය හැර සෙද සහතොස මිනිස්ලොවට බසිමින්- (මතුසම්බන්ධයි.)

ප:- 1. **'සකස් කොට'**- 'සකස්' යනු 'සක්කච්ච' ශබ්දයෙන් භින්න නිපාතයෙකි. 'සක්කච්ච' යනු ද 'යහපත් කොට' යන අර්ථ ඇත්තේ ය. එලුවට පැමිණ 'යහපත්' යන අර්ථයෙහි යෙදේ.

2. **'සහසුරසිරිරැස'**- මේ අන්‍යාර්ථසමාසපදයෙකි. සුරසිරි රැසින් සහ වනුයේ=සහසුරසිරිරැස. 'තිදස්පුරය' යන්නට විශෙෂණයි.

3. **'බසිමින්'**- 'බැස' යනු අර්ථයි.

4. **'සෙද'**-ශීඝ්‍රාර්ථයෙහි නිපාතපදයි.

5. **'සහතොස'**- 'තොස වඩන සුරඟනන් හා සුරසිරිරැස හළ නමුදු අසන්තොෂයක් නො වී ය' යනු මෙයින් හඟවත්. 'සහසැස්' යනු මෙහි නො යෙදේ. අනන්තරපද්‍යයෙහි ද පැණෙන හෙයිනි.

99 **වෙසෙස් උසස් ගත් අඳුන්කුළක් මෙ න**
**සි ර ස් කොරොස් කොස් යබළිස**[2] **විලසි න**
**සරො ස් රතැස්යුග යුගකොළ රිවි මෙ න**
**ර කු ස් විලස් ගති සහසැස් මෙලෙසි න**

අ:- සහසැස් අඳුන්කුළක් මෙන වෙසෙස් උසස් ගත් යබළිස විලසින සිරස් කොරොස් කොස් යුගකොළ රිවි මෙන සරෙස් රතැස්යුග රකුස්විලස් මෙලෙසින ගති.

ප:- 1. **"අඳුන්කුළක්"**-"අඳුන්" යනු දූලිවෙසෙසකි. ඒ පැහැති කූටය අඤ්ජනකූටයයි. කූටය (කඳුමුඳුන) උස් වූයේ ද වේ. මෙයින් මොහුගේ ගාත්‍රය (=ශරීරය) අතිකාලවර්ණබව හැඟවූහ.

---

1 සහසැස. 2 යබොලොස.

2. **“කොරොස්”**–“කාකීෂ” ශබ්දයෙන් භින්නයි.

3. **“යබලිස”**–“ය” යන්න “අය” යන්නෙන් භින්නයි. “බලිස” යනු තත්සම වචනයෙකි. ඒ බිළීකටුවට නමෙකි. යකඩින් කළ බලිසය කාකීෂ වෙයි. ඒ අගින් නැමියේ ද වේ. මොහුගේ හිසකෙස් ද එබඳු වේ.

‘යබොලොස’යි ගෙණ ස්ථානයට අනුරූප සේ “අයොමයබිර යන්”යි අර්ථ ද කියත නමුත් එබඳු අර්ථයක් එහි ඇතැයි නො පැණේ. ‘යබොලොස’ යනු “යබලිස” යන්න ම ‘යබොර’ යන්න හා සැසඳීමෙන් ලිපිකාරයන් විසින් කළ දෙසෙකැයි සිතිය හැක.

4. **“යුගකොළ පිව්”**–‘යුගාන්තය’ යනු කල්පාන්තයයි. කල්පය යුගවශයෙන් සතරකට බෙදේ. සත්‍ය, ත්‍රේතා, ද්වාපර, කලි යනු ඒ යුගයන්ගේ නාමයෝයි. කලියුගයාගේ අවසානයෙහි ලොව වැනසෙන්නේ ය. ඒ කාලයෙහි සූර්ය්‍යයා අතිශයක්‍රූරරශ්මි ඇත්තේ වෙයි. හිරුරැසින් මුළුපොළොව දැවී යන්නේ ය.

5. **‘ගති’**—‘ගන්’ දයින් නිපන් අතීතාඛ්‍යාතපදයි. මේ ම ‘ගත්, ගත’ යන වශයෙන් ද පැණේ.

**100 දියවක් සඳ මෙන් නැමි දළ යුවලැති**
**රියසක් ලෙස කන්[1] නෝඩු දෙකක් ඇති**
**මිටිදික් පුන් මැද බුන් නාසක් ඇති**
**කොරසක් පමණට ලොකු මුහුණක් ඇති**

**අන්වය** සුගමයි. (‘රකුස්විලස් ගති’යි අධ්‍යාහාර කර ගත යුතු.)

**ප:**– 1. **‘දියවක්සඳ’**–මෙහි ‘දියවක’ යනුවෙන් ශුක්ලපක්ෂයෙහි දෙවෙනි දිනය ගැණේ. එදින චන්ද්‍රයා දෘශ්‍යාවක ශොභාව දරයි. **රාහුල** මාහිමියෝ ද **විභීෂණයන්ගේ** දෙදළ ලසඳ වැන්නැයි “පැහැසර ලසඳ යුවලෙක් ඇත් නම් එ මෙන” යනුවෙන් කීහ.

2. **“කොරසක් පමණට”**–‘කොරස’ යනු භාජනවිශෙෂයෙකි. ‘පමණට’ යනු කරණාර්ථයෙහි සම්ප්‍රදානවිභක්ති රූපයයි.

**101 හැසුණු හුරුකර වන් බඳ කරි නා**
**පිරුණු මසින් උර සලතල ලෙසි නා**
**තෙරුණු සැලක් වන් මහබඩ බරි නා**
**නැමුණු පෙරට දන යුවලින් තෙවු නා**

**අ:**– හැසුනු හුරුකර වන් බඳකරින් (ද,) සලතල ලෙසින් මසින් පිරුණු උර(යෙන් ද) තෙරුණු සැලක් වන් මහබඩබරින් (ද) පෙරට නැමුනු දන යුවලින් ද) තෙවුනා (රකුස් විලස් ගති).

1 කණ.

ප:- 1. **'හැසුනු'**–'හැස' දයින් නිපන් කෘදන්තපදයි. 'ඝන වූ' යනු අර්ථයි.

2. **'උර'**–වක්ෂඃස්ථලයයි. කරණ විභක්තිප්‍රත්‍යය ලුප්තයි. වත්මන්හි 'උර' සද මෙයින් අන්‍යාර්ථයෙක්හි යෙදේ.

3. **'තෙරුණු'**–'තෙර–තෙරුම්හි' දයින් නිපන් කෘදන්තයි. 'පිටතට නික්ම සිටි' යනු අර්ථයි.

4. **'තෙවුනා'**–'තෙවු' ධාතුයි. මේ 'සෙවු' දයෙහි සකාරයට තකාරාදෙශයෙන් සිද්ධයෙකි. 'සෙසු=තෙසු' යනාදිය මෙති.

**102 එ ක් අතකින් යගද ගෙණ නැඹි**
**එ ක් අතකින් ඇද ඇද දැළි රැවු ළු**
**ද ක් කවමින් සියලගෙහි[1] ම විසු ළු**
**වි ක් ම පමින් බස් බැණ රළු පර ළු**

**අන්වය** සුගමයි.

ප:-1. **'යගද'**–යකඩින් කළ ගදායුධයයි. 'ගද' යනු මුගුරු වෙසෙසෙකි.

2. **'දැළිරැවුළු'**–'දැළි' යනු උඩුරැවුල ය. 'රැවුළු' සදින් නිකටෙහි වූ ලොම් ගහනුවූ සේ පෙණේ. එහෙත් දැළි, රැවුළු දෙසද ම එකාර්ථිකබව–

"පුමන් කොපුලතෙහි වූ-ලොම් නිකට ද 'මස්' නම්,
උඩොට පිට දිනූ ලොම්–'රවුළු' දු 'දැළි' දු නම් වේ."

යනුවෙන් හැඟේ.

3. **'දක්කවමින්'**–මේ දුෂ්ටප්‍රයොගයෙකි. 'දිස්' දයින් 'ව' පස හා 'මින්' පස කොට ධාතුවට 'දක්' ආදෙශ කළවිට 'දක්වමින්' සි ද, වකාරයට පූර්වරූප කිරීමෙන් 'දක්කමින්'සි ද ලැබෙනු මිස කකාරද්විත්වයෙන් 'දක්කවමින්'සි රූපයෙක් නො ලැබේ. එහෙයින් ඒ ව්‍යාකරණානුකූල නො වේ. ඡන්දෝරක්ෂණයට ද මෙබඳු විපර්‍ය්‍යාස කිරීමට ඉඩ නැත. "පෙන්නවමින්, බස්සවමින්" යනාදිය ද මෙබඳු ම දුෂ්ට ප්‍රයොගයි.

4. **'විසුළු'**–'විසූක' ශබ්දයෙන් භින්නයි.

5. **'වික්ම'**–'විකුම්' යනු ප්‍රකෘතියි. කර්මවිභක්ති අප්‍රත්‍යය කොට කකාරස්ථ උකාරලොපයෙන් සිද්ධයි. දැකුම=දැක්ම, රැකුම=රැක්ම, බෙදුම=බෙත්ම, පවතුනෙන්=පවත්නෙන්, බැසුම=බැස්ම, තෙපුල=තෙප්ල, කැලුම=කැල්ම යනාදිය ද මෙබඳු ය.

---

1 සියොලඟෙහි.

6. **‘පමින්’**–‘පා’ දයින් මින්පස වීමෙන් සිද්ධයි. ඡන්දොරක්‍ෂණ හෙතුවින් ආකාරය හ්‍රස්ව වී ය.

103 ග ති න් විහිද[1] ගිනිදල් යුතු රුදු රු
ක ටි න් නොමඳ ඉස ඉස ගිනිපුපු රු
දි ගු න් බිහිරි කර අඩ ඇන කුරි රු
පි යෙ න් පියට මැඩ මැඩ සහලඟු රු

අ: රුදුරු යුතු ගිනිදල් ගතින් විහිද, කටින් නොමඳ ගිනි පුපුරු ඉස ඉස, කුරිරු අඩ ඇන දිගුන් බිහිරි කර, පියෙන් පියට සහලඟරු මැඩ මැඩ–

ප:- 1. **‘රුදුරු’**–මේ සද මෙහි භාවප්‍රධාන ය. ‘රෞද්‍රභාවයෙන් (යුතු)’ යනු අර්ථයි.

2. **‘කටින්’**–මෙහි මුඛාර්ථයෙහි යෙදූ ‘කට’ ශබ්දය මුවදෙව්ද වත්කාරයෝ කපොලාර්ථයෙහි යෙදූහ. සංස්කෘතයෙහි ද ‘කට’ ශබ්දය කපොලාර්ථයෙහි යෙදේ. එයින් ම තත්සමවශයෙන් පැමිණි ‘කට’ ශබ්දය කල් යාමෙන් මුඛාර්ථයෙහි ද රූඪ වී ය. මෙසේ සමහර ශබ්දයන්ගේ අර්ථ විපර්‍යාස වන බව පැණේ. ‘හනික යන්න ද එකකි. එහි ප්‍රභවය ‘සෙමින්’ යන අරුත්හි වැටෙන ‘සනිකං’ යන පාළි නිපාතයයි.

3. **‘ඉස ඉස’**–‘ඉස්’ දයින් සිද්ධ පූර්වක්‍රියායි.

4. **‘දිගුන් බිහිරි කර’**–මෙහි ‘දිගුන්’ යන්නෙන් තාත්ස්ථ්‍යොප චාර වශයෙන් දිශාවන්හි වැසියෝ ගැණෙත්.

5. **‘අඩ ඇන’**-ඝෝර වූ ශබ්දයක් කණෙහි ගැසීමෙන් ද බිහිරි වේ. ‘ඇන’ යන්න ‘හප්පා’ යන අර්ථ ඇත්තේය. ‘අන්’ දයින් සිද්ධයි. ඒ ධාතුව පාළියෙහි ගමනාර්ථයෙහි වැටෙන ‘හන’ ධාතුවෙන් භින්නයි.

6. **‘සහලඟුරු’**-ගිනි ගෙණ දිලිසෙන අඟුරුයි. “සහලඟ රකතිනතට පෙරළි කර ගැන්මෙව්” යනු කව්සිළුමිණි පාඨයි

104 දු ටු ව න් මුස පත් වන ලෙස බිය වැ ද
ග ණි මි න් රුදුරු රකු ස් වෙස් යුතු තෙ ද
එ හි හු න් මහබෝසතුහට[2] මනන ද
පෙ ණෙ මි න් සහසැස්[3] නුදුරු ව සිටි ස ද

අ:–දුටුවන් බිය වැද මුස පත් වන ලෙස තෙද යුතු රුදුරු රකුස්වෙස් ගණිමින් සහසැස් එහි හුන් මනනද මහබෝසතුහට පෙණෙමින් නුදුරු ව සිටි සඳ–

1 විහිදි. 2 උත් මහබෝසත්හට. 3 එරකුඳ.

–1 **'ගණිමින් රුදුරු රකුස්වෙස්'**–බෝසතුන්ට සංග්‍රහයට පැමිණි ශක්‍රතෙමෙ කවරහෙයකින් දුටුවන් මුසපත් වන ලෙස රකුස්වෙස් ගත්තේ ද? යත්:- බෝසතුන්ගේ ධර්මලොලත්වය ශක්‍රයාට තරම් අන්‍යයන්ට ප්‍රකට නො වේ. සෙස්සන් අතර ද එය ප්‍රකට කර ලනු සඳහා රකුස් වෙස් ගෙණ අවුත් ඇඟමස් ඉල්ලී ය. මහබෝසතුන්ගේ චිත්තධෛර්‍ය්‍යය විමසනු සඳහා රකුස්වෙස් ගතැයි ද කියහැක.

2. **'පෙණෙමින්'**- 'පෙන්' ධාතුයි.

3. **'සහසැජ්'**- කර්‍තෘවිභක්තියි. මෙහි 'එරකුසු' යනු නො යෙදේ. රකුසෙකු වුව රකුසුවෙස් ගැණුම අයුතු හෙයිනි.

105 කලෙකින් දුටු ඉටුමිතුරකු වෙත ය න
අදමින් සුතු මිතුරෙකු ලෙස සනොඹි න
නොවමින් කිසි සැකයක් දම්ලොලයෙ න[1]
නොලසින් ගොස් රකුසා වෙත සිට ගෙ න

අන්වය සුගමයි.

පː– **'මිතුරකු වෙත'**– 'මිතුරකු' යනු 'වෙත' යන්නෙහි සම්බන්ධයි. වර්‍තමාන ව්‍යවහාරයෙන් මේ "මිතුරෙකු"යි ද ලැබේ. 'වෙත' යනු කර්මවිභක්ත්‍යන්තයි.

3. **'මිතුරකු'**– 'ලෙස' යොගයෙහි කර්මවිභක්තිරූපයි.

4. **'නො වමින්'**– 'වමින්' යන තැන්හි වූ '(=ව)' ධාතුව ප්‍රාප්ත්‍යර්ථයෙහි ය.

4. **'රකුසා'** යනු 'වෙත' යන්නෙහි සම්බන්ධයයි. මෙහි 'රකුස්' සද යෙදුම උචිත ය. ශක්‍රයා බව දහම්සොඬරජු නො දන්නා හෙයිනි.

106 දෙලොවින් වැඩ සිදු කරණා නොවැරැ ද[2]
මුනිඳුන් වදහළ බවදුක් පිරිසි ද
තවිසින් බණපදයක් කිව හොත් අ ද
සමගින් රජසිරි මදිවි කොරෙම් පු ද

අː– නො වැරද දෙලොවින් වැඩ සිදු කරණ මුනිඳුන් බවදුක් පිරිසිඳ වදහළ බණපදයක් තවිසින් අද කිවහොත්, රජසිරි සමගින් මදිවි (තට) පුද කොරෙම්.

පː– 1 **'දෙලොවින්'**– 'දෙලොව' නම් මෙලොව හා පරලොවයි. 'මෙලෝ' යනුවෙන් පවත්නාවූ සකන්ධපඤ්චකය ද, 'පරලෝ' යනුවෙන් මරණින් මතු ලැබෙන සකන්ධපඤ්චකය ද ගණුලැබේ.

---

1 ලොබයෙන 2 වරද

2. **'නො වැරද'**– 'නො'යනු ප්‍රතිෂේධාර්ථයෙහි නිපාතයි. 'වැරද' යනු 'වරද–වැරදුම්හි' දයින් නිපන් පෙරකිරියපදයි. 'නො වරද්දා' යනු අර්ථයි.

3. **'බවදුක්'**–සසරෙහි ලැබෙන ඉපදීම, දිරීම, මැරීම, ශෝකය යනාදි අනිෂ්ට දුයි.

4. **'තා විසින්'**–'තා'යි සිටියයුතු තැන ඡන්දෝහේතුවින් හ්‍රස්වයි. කර්තෘවිභක්ත්‍යන්තයි. 'විසින්' යනු 'වසෙන' යන පාළිනාමපදයෙන් බිදී ආ සිංහල නිපාතපදයෙකි. කර්ත්‍රර්ථයෙහි පමණක් නො ව කරණාර්ථාදියෙහි ද 'විසින්' යනු යෙදේ.

5. **'බණපදයක්'**–යන්නට 'දෙලොවින් වැඩ සිදු කරණ' යන්න ද, '(බවදුක් පිරිසිඳ) වදහළ' යන්න ද විශෙෂණ වේ. **එක්** බණපදයක් එබදු වෙසෙසුම් ලැබුමට සුදුසු ද? සුදුසු ම ය. බුදුන් දෙසූ **එක් එක්** බණපදයෙක්හි ම චතුරාර්‍යසත්‍යය ඇතුළත් වේ. නො **එසේ** වූයේ බුද්ධවචන නො වේ. යම් වචනයක චතුරාර්‍යසත්‍යය ඇතුළත් නම්, ඒ බවදුක් පිරිසිඳ වදාරණලද්දකි. ඒ ම දෙලොවින් වැඩ සිදු කරන්නේ වේ.

6. **'අද'** යනු 'දැන්' යන අර්ථයෙහි යෙදුනකි. 'අජ්ජ' යන්නෙන් භින්නයි. 'මේ කාලයෙහි' යනු 'අජ්ජ' යන්නෙහි අර්ථයි.

**107 මෙලෙසා අප බෝසතු [1]පැවසූ බ ස**
**ර කු සා අසමින් පැවසි මේ ලෙ ස[2]**
**බ ඩ සා ඉවසිය නො හෙමි, එසින් මි ස**
**ප ව සා ලම් මුනිබණ නොප සාර නො ස**

අන්වය සුබොධයි.

ප:– 1 **'පැවසි'**–'පවස' දයින් නිපන් අතීතකාලාඛ්‍යාතයි.

2. **'ඉවසිය'**–'ඉවස' දයින් ඉයප්‍රත්‍යය වීමෙන් නිපන් කෘදන්ත නිපාතපදයි. 'ඉය' ප්‍රත්‍යයාන්තපදයෝ 'අටි, යුතු, හැකි' යන ශබ්ද යන් හා ද 'හෙ' දයින් නිපන් ශබ්දයන් හා ද යෙදෙත්. "බැලියටි බැලියයුතු, බැලිය හැකි, බැලිය හෙයි" යනාදි වශයෙනි.

3. **'මිස'**–'මුස්–මිදුම්හි' දයින් නිපන් පූර්වක්‍රියා පදයි.

4. **'පවසාලමි'**–අනාගතාර්ථයෙහි වර්තමාන රූපයයි.

**108 එ බැ වි න් දම්සොඬ රජතුම මන න ද**
**බු දි මි න් නොප ඇගමස් සහ උපිරු ද**
**නි ව මි න් බඩසාගිනි සැනපී ඉ ද**
**සනො සින් පවසාලම් කි බණප ද**

---

1 බෝසත්, 2 මෙබස,

අ:– 'මනනඳ දම්සොඬ රජතුම!, එබැවින් තොප ඇඟමස් සහ උරිරු ද බුදිමින් බඩසාගිනි නිවමින් සැනපී ඉඳ සතොසින් බණපද පවසාලමි' කී.

ප:– 1. **'බැවින්'**–'බව්' සදින් 'ඉන්'ප්‍රත්‍යය ව සිද්ධ නාමපදයෙකි.

2. **'බුදිමින්'**–'බොමින්' යන්නට ද මේ උපලක්‍ෂක ය, හෙවත් ලකුණකි. එහෙයින් 'ඇඟමස් බුදිමින් උරිරු බොමින්' සි අර්‍ථ ගත යුතුයි. 'බුදිමින් නිවමින්' යන පද දෙක ම පූර්‍වක්‍රියාර්‍ථයෙහි යෙදින.

3. **'උරිරු'**–'රුධිර' ශබ්දයෙන් (රුහිරු=හුරිරු=උරිරු) භින්න සි. 'ලකාර=ලුවර=රුවල්' යනු මෙනි.

4. **'සැනපී'**–'සනප්' දයින් සිද්ධයි. 'මොනවට තෘප්ත වී (පිණා ගොස්)' යනු එහි අර්‍ථයි. විඩා හැරුමෙහි ද මේ ධාතුව යෙදේ. ඒ අර්‍ථය ම ප්‍රධාන කොට ගෙණ පූජ්‍යයන් පිළිබඳ නිද්‍රාවෙහි ද වැටේ.

5. **'කී'**–'කිය' දයින් නිපන් අතීතාඛ්‍යාතපදයි.

109 එ ප ව න් අසමින් මහසත් මන මෙ න
පණ ඇ ත් නම් වද[1] අණ ඇත්තේ ය න
නුව ණැත් තන් පෙර පැවසූ බස මෙ න
ම ම නැ ත් නම් සාවුරු ද තගෙ බණ ස න

අ:– මහසත් මන මෙන එපවත් අසමින් පෙර නුවණැත්තන් පැවසූ 'අණ ඇත්තේ පණ ඇත්නම් වද' යන බස මෙන මම නැත් නම් තගෙ බණ අසන සාවුරු (වෙත්) ද? (කී–යනු අධ්‍යාහාර්‍යයි.)

ප:– 1. **'පණ ඇත් නම් වද අණ ඇත්තේ'**–මේ වනාහි "මම නැත් නම් තගෙ බණසන සාවුරු ද?" යන්නට නිදර්‍ශනයි. "ආඥාව පැවැත්විය හැක්කේ ප්‍රාණය ඇතිකල්හි ය. පණ නැතිකල මඳ අණකුදු නො පවතී. එසේ ම මා පණ ගිය කල නුඹ විසින් මට කියනුලබන බණ ඇසුමට කිසිවෙකු විය නො හැක."

2. **'පණ'**–මේ ශබ්දය ජීවිතෙන්ද්‍රියයෙහි ද බලයෙහි ද ආශ්වාසාදිවාතයෙහි ද වැටේ. මෙහි ජීවිතෙන්ද්‍රියයෙහි යෙදින ප්‍රථමා එකවචනයි. 'ඇත්' යන්නෙහි උක්තකර්‍තෘයි. මේ 'ඇත්' සද පාළි 'අත්ථි' යන්නෙන් භින්නයි. සිංහලයෙහි දී නාමපදයෙක් ද නිපාත පදයෙක් ද වේ.

---

[1] වෙද,

3. **'වද'**– ප්‍රශනාර්ථයෙහි නිපාතයෙකි. මේ ම "මම් ම වේද, කාරන්නමෝ වේ ද" යනාදීන්හි "වේද" යි ද සිටී.

4. **'මම'**– 'නැත්' යන්නෙහි උක්තකර්තෘයි.

5. **'නැත්'**– 'නත්‍ථි' (න+අත්‍ථි) යන්නෙන් භින්නයි.

**110** **තෙ ද සා යුතු රකුසානෙනි ඉදුම ත්**
**තො ප සා ගිනි සහ මගෙ දම්දෙළය ත්[1]**
**නොලසා එකාවිට පසිඳන[2] විලස ත්**
**වි ම සා කියවයි කි අප බෝස ත්**

අන්වය සරලයි.

ප:– 1. **'තෙදසා'**– 'තෙජස්' ශබ්දයෙන් භින්න "තෙදස්" යනු ප්‍රකෘතියි. කරණාර්ථයෙහි කර්තෘවිභක්ත්‍යන්ත පදයි.

2. **'දෙළ'**– 'දොහළ' ශබ්දයෙන් භින්නයි. 'දොහළ' යනු ගර්භිණීන්ට උපදනා ආශාවන්ට (දොළදුකට) නමෙකි. කුක්ෂිගත දරුවාගේ සහ මවගේ ද හෘදය දෙක සම්බන්ධ හෙයින් ඒ එනම් වේ. 'දෙළ' ශබ්දයාගේ උත්පත්තිනිමිත්ත මේ වුව ද සාමාන්‍ය ආශාවෙහි ද මේ යෙදේ. මේ 'දෙළ'යි ද ලැබේ.

3. **'පසිඳන'**– 'ප' පූර්ව 'සිඳු' දයින් නිෂ්පන්නයි. 'සිඳු වන' යනු නො යෙදේ. සාගිනි හා දම්දෙළ දෙදෙනා තුළ තිබේ. එහි තවත් සිඳුවිය යුත්තෙක් නැත.

4. **'විලසත්'**– විලස ද=විලස ද්=විලසත්.) මෙහි 'ද (=ත්.) නිපාතය පාදපූරණමාත්‍රය ප්‍රයොජන කොට ඇත්තේ ය.

**111** **එ බ ස ට එ රකුසු යුතු තෙ ද**
**මෙතොපට සඳහම් ලාබ ද**
**අ ප හ ට[3] වන මස් ලාබ ද**
**එ කා වි ට පසිඳමි හිමිස ද**

අ:–එබසට තෙද යුතු එරකුසු 'හිමිසඳ! මෙතොපට වන සඳහම් ලාබ ද අපහට වන මස්ලාබ ද එකාවිට (මම) පසිඳමි.'– (මතු සම්බන්ධයි.)

ප:– 1. **'තොපට'**– සම්බන්ධාර්ථයෙහි ය. 'අපහට' යනු ද එසේ ම ය.

2. **'එකාවිට**– මෙහි **'විට'** යනු ආධාරවිභක්ත්‍යන්ත නාම පදයෙකි.

3. **'පසිඳමි'**– 'විනිශ්චය 'කරමි' යනු අර්ථයි. 'යුක්ති පසිඳ' යනාදියෙහි ද මේ පැණේ.

---

1 ළොබයන් 2 සිඳුවන 3 නම අපට

**ඝං:-** මේ පද්‍යය **'වසත්'** විරිතින් බැඳුනකි. මාත්‍රා දෙළොසක් ඇති ඡන්දසෙහි මාත්‍රා සයකින් යතිය (විශ්‍රාමය) තබා බඳන ලද්දේ 'වසනත්' නම්. කියතලද මැයි:- "සමත් විරම් කොමල-පෙදෙන් බඳ වසත් නම්" යි. මෙහි "එබසට එර-" යනාදි වශයෙන් මාත්‍රා සයකින් විශ්‍රාමය වේ. 126 වන පද්‍යය තෙක් මේ වෘත්තයි.

**112** **කියා රකුසු එ විදුර** **වි**
**බබලන කුළු සියෙන් දැ** **වි**
**අඳුන්ගිරෙව් අහස ගැ** **වි**
**තුන්ගවු උස ගිරක් මැ** **වි**

**අ:-** කියා විදුරවි එරකුසු දැවි කුළුසියෙන් අහස ගැවී බබලන අඳුන් ගිර එව් තුන්ගවු උස් ගිරක් මැවී.

**ප:-** 1 **'කුළුසියෙන්'**- 'කුළු' සද 'කූට' ශබ්දයෙන් භිත්‍යයි. "උස්මුදුන" යනු අර්ථයි. මෙහි 'සිය' සද අනේකාර්ථයෙහි වේ. 'සිය ගණනින්' යනු අර්ථයි.

2. **'දැවි'**- 'දැ' දයින් නිපන් කෘදන්තපදයි. 'දඟ වූ' යනු අර්ථයි. **රුවන්මලෙහි ද** "පුලුටු දම් දැවි-පැලහුනු පිලිසි සම් අත්"යි මේ සද දඟ්ධාර්ථයෙහි දක්වූහ. රකුසා විසින් මැවූ පර්වතය කාලවර්ණ ය. කාලවර්ණත්වයට හෙතුව 'දැවි' යන්නෙන් දක්වූහ.

3. **අඳුන්ගිර**- කාලවර්ණ පර්වතයෙකි.

4. **'ගැව්'**- 'ගා- ගෑමෙහි' දයින් නිපන් සවයංකර්තෘ සවයං කර්මක පූර්වක්‍රියාපදයි.

5. **'තුන්ගවු'**- යාර 4000 ක් ගව්වකි.

6. **'මැව්'**- 'මව-මැවීමෙහි' දයින් සිද්ධ අතීතකාලාඛ්‍යාතපදයි.

**113** **සපුරා පෙරුමන් සමති** **ස්**
**කොරෙමින් බඹසුරනර තො** **ස්**
**මතු බුදුබව ලබන නිදෙ** **ස්**
**බුදුකුරු හිමිසඳිනි වෙසෙ** **ස්**

අ:- සමතිස් පෙරුමන් සපුරා බඹසුරනර තොස් කෙරෙමින් මතු නිදෙස් බුදුබව ලබන වෙසෙස් හිමිසඳිනි-

ප:- 1 **'සපුරා'**- 'ස' පූර්ව 'පුර' දයින් නිපන් පෙරකිරියපදයි.

2. **'වෙසෙස්'**- යන්න 'බුදුකුරුහිමිසඳිනි' යන්නට තුල්‍යාධිකරණ විශෙෂණයි. එහෙයින් එයින් පරවිභක්තියට ලොප් වී ය. මෙයින් බොධිසත්ත්වයන්ගේ අසාමාන්‍යත්වය කීහ. "මකාටට පැනුමට වහා මෙගිරට නැහෙව්' යන විධානය සාමාන්‍යයෙකුට නො කටයුතු බැවින් මෙහි "වෙසෙස්" සද උචිත ම ය.

114 මෙ ගිරට නැගෙමින් සහතු ට
මඝාටට පනිනා අනර ට
නොපහට දම් දෙසමැ'සුම ට
විගසට නැගෙඩසි කිවි ට

අන්වය සරලයි.

පඃ– 1. 'අනරට'–ආධාරාර්ථයෙහි සම්ප්‍රදාන විභක්ති රූපයි.

2. 'දෙසම්'–'දෙස්' ධාතුයි.

3. 'විගසට'– ක්‍රියා විශෙෂණයි.

115 ගොරතර බවදුක් වැල කි
ලබනුව මොක් සැප නිසැ කි
මොකැදුරු මුනිවරයන් කි
උවදෙස් බෝසත් සැල කි

අඃ– ගොරතර බව දුක් වැලකි මොක් සැප නිසැකි ලබනුව මොකැදුරු මුනිවරයන් කී උවදෙස් බෝසත් සැලකී.

පඃ–1. 'ගොරතර'–මෙහි 'තර' යන්න අතිශයාර්ථ ප්‍රත්‍යය යෙකි. (ඉතා ගොර=ගොරතර).

2. 'වැලකි'– වලක්' දයින් නිපන් සෘදන්ත පදයි.

3. 'නිසැකි'–'ලබනුව' යන භාවක්‍රියාවෙහි විශෙෂණයි.

4. 'මොකැදුරු'–සත්ඣයෝ නිර්වාණයට මාර්ගය උගන්වති. එහෙයින් උන්වහන්සේ 'මොකැදුරු' නම් වන සේක.

5. 'සැලකී'–'සලක–සැලකීමෙහි' දයින් නිපන් අතීතාඛ්‍යාතයි.

116 සුදනන් කී බස් පැහැ රා
ගෙණ දද දන බස් නැ රා
කර සමහරු පරදු රා
වැනසෙත් වද විඳ ගෝ රා

අඃ– සමහරු සුදනන් කී බස් පැහැරා දද දන බස් නැරා ගෙණ පරදුරා කර ගෝරා වද විඳ වැනසෙත්.

පඃ–'සුදනන්'– (=මනා දනෝ=සුදනෝ) බුද්ධාදි උත්තම යෝයි.

2. 'පැහැරා'–'පහර–පැහැරීමෙහි' දයින් නිපන් පූර්ව ක්‍රියා පදයි. 'පහර දී' යනු අර්ථයි. තදනුරූප ව නො පිළිපැදීම බසට පහර දීමයි.

3. 'නැරා'– (නො+හැරා=නො+ඇරා=නැරා) 'නො' නිපාත පූර්වවූ පූර්ව ක්‍රියාපදයි.

4. **'පරදාරෙ'**-මෙයින් පරදාරකර්මය හෙවත් කාමමිථ්‍යාචාරය ගැණුලැබේ. 'පරදාරකම්' නම් අන්‍යයන්ට අයත් ස්ත්‍රීන් සෙවනය කිරීමයි. බුද්ධාදි සත්පුරුෂයෝ එහි ආදීනව නන්අයුරින් දක්වති. **ධර්මප්‍රදීපිකාවෙහි** 108 පිට බලනු.

"ඉත්ථි ත මුඤ්චති සද පුත ඉත්ථිභාවා
නාරී සදා භවති සො පුරිසො පරත්‍ථ,
යො ආචරෙය්‍ය පරදාරමලඞ්ඝනීයං
ඝොරඤ්ච වින්දති සදා ව්‍යසනඤ්ච නෙකං"

යනු බින්දුමාත්‍රයකි.

(කාමමිථ්‍යාචාරය කරණ ස්ත්‍රී තොමෝ හැමකල්හි ම ස්ත්‍රීභාව යෙන් නො මිදෙන්නී ය. අලඞ්ඝනීය වූ පරදාරකර්මය කරණ පුරුෂ තෙමේ ද මරණින් මතු ස්ත්‍රියක් ව උපදින්නේ ය. නොයෙක් දරුණු ව්‍යසනයන්ට ද පැමිණෙන්නේ ය.)

මූර්ඛ වූ ධූර්තයෝ "ස්වදාරාවන් හැර පරදාරාවන් සෙවනය කිරීම ව්‍යසන(ඇලීම)නැති බව ය" යනාදීන් පරදාරකර්මයෙහි ගුණ කියති.

5. **'වැනසෙත්'**-'වනස' දයින් නිපන් වර්තමානාඛ්‍යාතපදයි

117 **මිගබස් පවසමින් කුරි රු**
**රණ මැද වැද නො වමින් සු රු**
**ලැබ ගෙණ අවිපහර රුදු රු**
**නො මඳ ව වැනසෙත් සමහ රු**

**අ:- සමහරු** මිගබස් පවසමින් කුරිරු රණමැද වැද සුරු නො වමින් රුදුරු අවිපහර ලැබගෙණ නො මඳ ව වැනසෙත්.

**ප:**-1. **'මිගබස්'**-සාඩම්බර කථායි. "අපි කවු ද? ඔහු කවු ද? අපගේ අවිපහර තබා දර්ශනමාත්‍රය වත් ඔහු ඉවසිය නො හෙති. අප දුටු කෙණෙහි ම ඔහු පලා යෙති" යනාදිය වැනි කථා 'මිගබස්'නම්.

2. **'රණමැද'**-'රණ' සද යුද්ධවාචී ය.

118 **සුදනන් බස් නො ගෙණ සිත ට**
**තැන තැන ගොස් සොරකම් කො ට**
**නැසෙමින් විඳ රුදුරු ගැහැ ට**
**පැමිණෙත් සමහරු නිරය ට**

අ:-සමහරු සුදනන් බස් සිතට නො ගෙණ තැන තැන ගොස් සොරකම් කොට රුදුරු ගැහැට විඳ නැසෙමින් නිරයට පැමිණෙත්.

පඃ- 1. **'සුදනන් බස්'**-අදත්තාදානාදීනව **ධම්ප්‍රදීපිකාවෙහි** 107 වන පිටෙහි බැලිය යුතු.

"සො යාචකො භවති භින්නකපාලහත්ථො
මුණ්ඩො ධිගක්ඛරසතෙහි ච තජ්ජිතත්තො,
භික්ඛං සදරිභවනෙසු කුචෙලවාසො
දෙහෙ පරත්ථ පරවිත්තහරො නරො යො"

"අදත්තාදානය කළාහු නරකයෙහි ඉපිද අනෙකවර්ෂකොටි සහස්‍රයෙහි පැසී එයින් මිදී ගිය කලැ ප්‍රෙතාත්මභාවයට පැමිණ බලවත් ක්ෂුත්පිපාසායෙන් අභිභූත ව අනෙකඅනන්තඃකල්පයෙහි වෙහෙසී මිනිස් පියක් ලදහු නම්- යදි වැ කපණ වැ විවණ වැ 'ධික්! ධික්!' යන අක්ෂරශතයෙන් සන්තර්ජිත වැ භිණ පිරුණු රෙදි ඇති වැ හිස පිරුණු උකුණන් ඇති වැ වෙර පිරුණු දූලි ඇති වැ සිත පිරුණු ශොක ඇති වැ ඇස පිරුණු කඳුලු ඇති වැ මුව පිරුණු වලප් ඇති වැ කැඳ නො ලදින් බත් නො ලදින් මනුෂ්‍ය ප්‍රෙත වැ වෙවුලමින් ඇවිදිත්."

2. **'නැසෙමින්'**-පූර්වක්‍රියාර්ථයෙහි ය.

119 වැටෙමින් ගංහෝ ශිලි ලා
වැද බිය කරු වලා ද ලා
තුඟුතුල් ගිරගින් පැන ලා
සමහරු වැනසෙන් මෙක ලා

**අන්වය** සුගමයි.

පඃ-1. **'ගං හෝ ශිලිල'**-මෙහි 'හෝ' සද ශ්‍රොතස හෙවත් සැඩ පහර යන අර්ථයෙහි වැටේ. "අවා මුහුදුදර පමා-දෙනෙ **හෝ** වාර හදනා" යන තන්හි මෙනි. 'හෝ' සද ගඞගාර්ථයෙහි ද වැටේ. කිහු මැයි-"ගඟ හෝ සිදු වසා නී"යි

2. **'වලාදල'**-සෙනට නමෙකි. වලාකුළෙන් නික්ම එන ගින් නක් හෙයින් සෙනට 'වලාදල' යයි කියති. 'දල' සද අග්නිවාචී ය.

120 සමහරු වසවිස කෑමෙ න
සමහරු ගෙලෙ වැල් ලා ගෙ න
සමහරු නම දිවැද කමි න
සමහරු ශියතින් ඇන ගෙ න

අඃ-"සමහරු වසවිස කැමෙන වැනැසෙත්" යනාදි වසයෙන් තැකිය යුතු.

පඃ-1. **'වසවිස'**-මේ ශබ්දදෙක ම එකාර්ථවාචි ය. වචන ශලිෂ්ටතාව සඳහා 'වස' යනු යෙදින.

2. **'කෑමෙන'**–'කා–කෑමෙහි' දයින් සිද්ධ පූර්වක්‍රියාර්ථ මිශ්‍ර ක්‍රියා පදයි.

**121** **මෙලෙසින් අනුවණ ලෝ ස ත**
**දෙලොවින් තමහට වන'සෙ ත**
**නො දැන නැසී නිරයට ප ත**
**විමසුව මෙතෙකැයි හිමි නැ ත**

–අ:–දෙලෝහින් තමහට වන අසෙත නො දැන මෙලෙසින් නැසී නිරයට පත් අනුවණ ලෝසත විමසුව මෙතෙකැයි හිමි නැත.

ප:–1. **'දෙලොවින් තමහට වන 'සෙත'**– යට කී සේ වන මරණයන්ගෙන් මෙලෝ පරලෝ දෙක්හි ම තමහට ශාන්තියෙක් නො වේ. වනුයේ මෙලොව ගහී ද, පරලොව අපායාදි දුඃඛ ද පමණෙකි. ඒ බව අඥලොකවාසීහු නො දත හී යට කී සේ මරණ යට පත් වෙති.

2. **'විමසුව'**–'විමස' දයින් අසම්භාව්‍යාර්ථයෙහි 'උව' ප්‍රත්‍යය වීමෙන් සිද්ධයි. 'බැලුව, දූරුව, මැරුව, යනාදිය ද මෙබඳු ය. විමසු සදින් අප්‍රත්‍යය වීමෙන් සිද්ධයයි ගත ද මැනවි.

3. **'මෙතෙකැයි'**–'මෙතෙක් යැ යි' තුබූ තන්හි සන්ධියෙන් 'මෙතෙකැයි' යනු සිද්ධයි. 'යැ' යනු වත්මන්හි 'ය' යි සිටී. ඒ වාක්‍යපරිසමාප්තියෙහි යෙදෙන නිපාතයෙකි. 'යි' යනු වාක්‍ය සමාප්තියෙහි ද අන්තර්වාක්‍යයක් මුඛ්‍යවාක්‍යය හා සම්බන්ධ කිරීමෙහි ද යෙදෙන නිපාතයෙකි. මෙහි දෙවනු කී අර්ථය යෙදේ.

**122** **සසරෙහි සැරි සරණ මා ද**
**සිහදිවි වලසුන්ගෙන් ත ද**
**අනිකුත් උවදුරින් නොම ද**
**නැසුනු ජාති මෙතෙකැයි කො ද**

**අන්වය සරලයි.**

ප:–1. **'අනිකුත්'**–'අනික් දු' යනු විසන්ධියි. මධ්‍යයෙහි උකාරාගමයෙන් හා අනත්‍ය උකාරලොපයෙන් ද සිද්ධයි. 'තම් දු=තමුදු=තමුත්' යනු මෙනි.

2. **'නැසුනු'**–'නස්'දයින් ආධාරකාරකයෙහි නුප්‍රත්‍යය වීමෙන් සිද්ධයි. නැසීමට ආධාර වූ සත්වය එයින් කියවේ. එහෙයින් ම 'ජාති' යන්නට විශෙෂණ වී. 'මා' යනු එහි අනුක්තකර්තෘයි.

3. **'ජාති'**–මෙයින් රූපාදි ස්කන්ධපඤ්චකය ගණුලැබේ. 'ජාති' 'භව' යන වචනයන්ගෙන් ඉපදීම යන අර්ථය හෝ ස්කන්ධාර්ථය ගණුලැබේ.

1. **'මෙතෙකැයි'**-මෙතෙක්+යැ+යි යන සංහිතා සන්ධි වීමෙන් සිද්ධයි.

5. **'කො ද'**-'කො'යනු 'කෙ' ශබ්ද ප්‍රථමෛක වචනාන්තයි. ප්‍රථමා බහු වචනය 'කො' යනුයි. "යුගදහ මඬුලු කෙ වණත්" යනාදී යෙහි ඒ පෙණේ. මේ සද සෙසු විභක්තීන්ගේ බහුවචන ගන්නා බවක් නො පෙණේ. 'කොහි' යන අණි ඇති 'ඛ' යන්නෙන් භින්න 'කො' යන්නකුදු "වත්නට වැරදූ කො රැකෙත්" යනාදී යෙහි පෙණේ. **'ද'** යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාතයි.

සං:- සසර සැරිසරණ තමන් ද සිංහාදීන්ගෙන් හා නානා උපද්‍රවයන්ගෙන් ද නිරර්ථක සේ විනාශයට පැමිණි ජාති අසංඛ්‍ය බව මෙයින් හඟවයි.

123 **අ ද ර සිතින් ඇසූ සත ත**
**අ ජ ර අමර මොක්සිරි දෙ න**
**ප ව ර සදහමට මුනිදු න**
**මෙ ව ර මදිවි පුදම් බැති න**

**අන්වය** සුබොධයි.

**පද:-** 1. **'අදරසිතින්'**-මේ දහම ඇසුමෙන් කුසල් සිදු වේ යයි සිතමින් අන්‍ය විහිත නො ව ඇසුම අදර සිතින් බණ ඇසුම නම් වේ. කියේ මැ නුः-

"මේ බණ ඇසූ කල-ඇතැයි සිතමින් පින් ප ල
එකහ ව මුනිතෙපල-අසනු බණසනු කුසලි මතකල"යි.

2. **'ඇසූ'**-'අස්' දයින් නිපන් අතීත කර්තෘකාරක කෘදන්තයි.

3. **'සතන'**-'දෙන්' යන්නෙහි සම්ප්‍රදානයි. කර්මවිභක්ති රූපය ද මෙබඳු ය.

4. **'අජර අමර මොක්සිරි'**-'මොක්සිරි' යනු නිර්වාණ සම්පත්තියයි. එය අවබොධ වීමෙන් සංසාරයෙහි උත්පත්තිය මූලොච්ඡෙද වේ. එහි රූපාදිස්කන්ධ ද නැත. ජරාමරණයෝ ඉපදීම ඇති කල්හි ම වත්නෝ ය. ස්කන්ධයන්හි ම වත්නෝ ය. ඉපදීම හා ස්කන්ධයන් මුල් කොට පවත්නා ජරාමරණ ස්කන්ධයන් නැති උත්පත්තිරහිත නිර්වාණයෙහි ලැබිය හැකි නො වේ. එහෙයින් නිවණ 'අජර' නමුදු, 'අමර' නමුදු වේ.

5. **'මුනිඳුන්'**-'සදහම්' යන්නෙහි සම්බන්ධයයි. කර්මවිභක්ති රූපය හා සමානයි.

**සං:**-අනන්තජාතීන්හි නිරර්ථක සේ දිවි වැනසුනු නමුත් මෙවර ධර්මයට පූජා කිරීමෙන් ජීවිත විනාශය සාර්ථක වන බව මෙයින් දක්වයි.

124 සි ත මි න් මෙපවත් සුනිම ල
නැගෙමින් ගිරිසිරට තුමු ල
අ බි ම න් කොසරෙකු සෙ උදු ල
සතො සි න් ගිරගෙහි සිටි කා ල

අ:– සුනිමල මෙපවත් සිතමින් තුමුල ගිරිසිරට නැගෙමින් උදුල අබිමන් කොසරෙකු සේ සතොසින් ගිරිගෙහි සිටිකාල–

ප:– 1 **'නැගෙමින්'**– පූර්වක්‍රියාර්ථයෙහි ය. මෙහි පූර්වක්‍රියාව වෙනුවට මිශ්‍ර ක්‍රියාව බොහෝ සේ යෙදූබව පෙණේ.

2. **'ගිරිසිර'**– පාලිය හා සමයි. පර්වත (ශීර්ෂය) මස්තකය යනු අර්ථයි.

3. **'අබිමන් කොසරෙකු'**– (කොසරුන්ගෙන් එකෙක්=කෙස රෙක්. අනියමාර්ථයෙහි එක්ප්‍රත්‍යයයි. අබිමනින් යුත් කොසරෙක්= අබිමන් කොසරෙක්.) 'සේ' නිපාත යොගයෙහි කර්මවිභක්ති රූපයයි. 'අබිමන්' නම් අහඞ්කාරයයි. කොසරසිංහරාජයා අභිමානසම්පන්න වෙයි. හේ ශයනය කරණකල හස්තපාදාදිය සම සේ තබාගෙණ හෙව නිදා උත්‍රාසන නො ව ප්‍රබුද්ධ ව අවයව පිරික්සා පෙර තුබූ තැන ම තුබූයේ නම් සන්තුෂ්ට ව ගොචරයට යේ. නො එසේ තුබූ යේ නම් 'තාගේ ජාතියට ද ශුරභාවයට ද උචිත නො වේ'යි දොම් නස් ව ගොචරයට නො ගොස් එහි ම හොවී. හේ ගොචරයට ගියේ හස්ත්‍යාදීන් මිස ශශාදීන් ඝාතනය නො කෙරෙයි. හෙන පහරිනුදු හේ ත්‍රස්ත නො වේ.

4. **'ගිරගෙහි'**– 'ගිරිසිරට' යි මුල දී කියූ හෙයින් මේ සර්නාම පදයක් යෙදුව මනා තැනකි. මෙබඳු යෙදුම් ප්‍රශස්ත නො වේ.

125 කා ර ත ර සක්රකුසු පුව ළ
දෙ ප සෙහි සිටුවූ[1] ගිනිව ළ
ය හු ල් දෙකොන සිරි පළ කා ළ
උ ඩු කු රු කරමින් යුග ද ළ

අ:– කරතර සක්රකුසු පුවළ ගිනිවළ දෙපසෙහි සිටුවූ යහුල් දෙකොන සිරි පළ කාළ යුගදළ උඩුකුරු කරමින්–

ප:– 1 **'කරතර'**– (ඉතා කර=කරතර) 'තර' යනු අතිශයාර්ථ ප්‍රත්‍යයෙකි.

2. **'සිටුවූ'**–'සිටු' දයින් හෙත්වර්ථ (ප්‍රයොජ්‍ය) ව ප්‍රත්‍යය හා අතීත කර්මකාරක උ ප්‍රත්‍යය ද වීමෙන් සිද්ධ කෘදන්ත පදයි.

ස:– මුව දෙපස වූ දෙදළ ගිනිවළෙහි දෙපසෙහි සිටුවූ යවුල් දෙකක් වැනි වී ය.

1. සිටවූ.

126 විලසින් දිසි සුරත් සව ට
බමවා බලමින් නෙත් ව ට
තෙවුනා ගිරි ලෙනක් ලෙස ට
සිට ගෙණ දල්වා මහසා ට

අ:- සුරත් යවට විලසින් දිසි නෙත් බමවා වට බලමින් ගිරි ලෙනක් ලෙසට තෙවුනා මහසාට දල්වා සිට ගෙණ-

ප:- 1 'දල්වා'- 'දල්' ධාතුවෙන් නිපන් හෙත්වර්ථ පූර්වක්‍රියා පදයි.

127 ම හ ත සසරගත සත මොක්පුර ලව ත
ස ම ත මුනිවරන් වදහල තිලෝ වෙ ත
'අනි ත වත සඞාර' යන ගය අමායු ත
කි ය ත සක්රකුසු දිලි තද තෙදින් යු ත

අ:- මහත සසරගත සත මොක්පුර ලවත සමත් තිලෝ නෙත් මුනිවරන් වදහල අමායුත් 'අනිත වත සඞාර' යන ගය දිලිතද තෙදින් යුත් සක්රකුසු කියත-

ප:- 1 'ලවත'- 'ලා' දයින් නිපන් හෙත්වර්ථකාලාර්ථ නෛපාතිකක්‍රියාපදයි.

2. 'අනිත වත සඞාර යන ගය'-

''අනිච්චා වත සඞ්ඛාරා-උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්‍වා නිරුජ්ඣන්ති-තෙසං වූපසමො සුඛො''

යන මේයි. (සඞ්ඛාරා-හෙතු ධර්මයන්ගේ උපන් ඵලධර්මයෝ හෙවත් රූපාදි සකන්ධයෝ; වත—ඒකාන්තයෙන්; අනිච්චා- (හෙතුහුගේ විනාශයෙන් ඵලයාගේ ද විනාශය වන හෙයින්) අනිත්‍යයහ. උප්පාද වයධම්මිනො-ඉපදීම හා නැසීම සවභාව කොට ඇත්තාහ. උප්පජ්ජිත්‍වා-ඉපිද; නිරුජ්ඣන්ති-නිරුද්ධ වෙත්. තෙසං-ඔවුන්ගේ; වූපසමො- සන්සිඳීම; සුඛො සැපයි.)

3. 'අමායුත'-සර්‍වඥයන්වහන්සේ හැම වචනයක් ම විමුක්ති රසයෙන් ආර්ද්‍ර කොට තිවන් කුළු ගන්වා දෙශනා කරති. චතුරාර්‍ය සත්‍යයෙන් තොර වූ බුද්ධ වචනයෙක් නැත්තේ ය. නිරොධය (නිවණ)ද එක් සත්‍යයෙකි. බුද්ධභාසිතයක් වූ මේ ගයෙහි චතුරාර්‍ය සත්‍යය අන්තර්ගත ය. ''අමායුත'' යි කියේ එහෙයිනි.

4 'කියත'- 'කිය' දයින් නිපන් කාලාර්ථක්‍රියායි. එහි කර්තෘ 'සක්රකුසු' යනුයි.

සං:- මෙතැන සිට 143 වන කව තෙක් කව් බැඳි විරිතට 'සමුද්‍ර ඝොෂ' යයි කියති. එහි ලක්ෂණ මෙසේයි:-

"දෙසෙන් අටින් යති–අටළොස් මතින් බඳ හොත්,
වේ ය 'සමුදුරුගොස්' නම්–... ............... ..........."

(මාත්‍රාදශයකින් හා අටකින් යති තබා මාත්‍රා අටළොසකින් බඳනා ලද්දේ 'සමුද්‍රඝොෂ' නම් වෘත්තය වේ.)

128 අ බි ම න් සුතු එකාසර කොසරෙකු සිරි න
නො ව මින් මඳක් වත් බිය සදහම් ලොලි න[1]
සො බ ම න් මෙ අප මහබෝසත් ගුණනද න
මෙ ලෙ සින් පතයි බුදුසිරි සතවෙත මෙති න

අ:– අබිමන් යුතු එකාසර කොසරෙකු සිරින් සදහම් ලොලින් මඳක් වත් බිය නො වමින් සොබමන් ගුණනදන් මෙ අප මහබෝසත් සත වෙත මෙතින් මෙලෙසින් බුදුසිරි පතයි.

ප 1. 'එකාසර'– තනි ව හැසිරෙණුයේ 'එකචාරින්' නම් වේ.

2. 'නො වමින්'–'ව' දය ප්‍රාප්ත්‍යර්ථයෙහි ය.

3. 'ගුණනදන'–ගුණයන්ට නදන්=ගුණනදන්. 'නදන්' යන්න 'නිධාන' ශබ්දයෙන් භින්නයි. 'නිධාන' නම් ආරක්‍ෂාව සඳහා ධනය තබනලද තැනයි.

4. 'පතයි'- (පතා+යි.) 'පතා' යනු වර්තමාන කාලික කර්තෘකාරක ප්‍රථමපුරුෂ (අන්‍යකාරක) එකවචනාන්තාඛ්‍යාතයි. ප්‍රවෘත්ති කථන හෙයින් වර්තමානප්‍රයොගයි.

129 ස ම ගි න් සිය සුතඹ ඇස් ඉස් මස් ලෙය ද
ය දි ම න් සතුටු කොට දන් දී සිතු පැහැ ද
කෙලෙසුන් පසුන් කරමින් මරසෙනඟ බි ඳ
වි ද සු න්[2] නැණින් සව්නේ ගෙවමින් පබ ඳ

අ:– සිය සුතඹ සමගින් ඇස් ඉස් මස් ලෙය ද යදිමන් සතුටු කොට සිතු පැහැද දන් දී මරසෙනඟ බිඳ විදසුන් නැණින් කෙලෙසුන් පසුන් කරමින් සව්නේ පබඳ ගෙවමින්–

ප:– 1 'සිය'–පාළි 'සක' ශබ්දයෙන් ආයේ ය. ස්වකීය (=තමන්ට අයත්) යනු අර්ථයි. එය 'සුතඹ, ඇස්' යනාදි එක් එක් පදයක් හා සම්බන්ධ වෙයි. එයින් පර විභක්ති ප්‍රත්‍යය ලුප්තයි.

2. 'සුතඹ'- සුතහු ද අඹුවෝ ද=සුතඹ. සමාහාරචන්ව සමාස හෙයින් එකවචනාන්තයි. 'සමාහාරචන්ව' යනු සමූහප්‍රධාන දන්වාර්ථ සමාසයයි. 'සුත' සද තත්සමයි. 'අඹු' සද මාතෘවාචි 'අම්බා' ශබ්දයෙන් භින්න ව පුරාතනභාෂාවෙහි සාමාන්‍ය ස්ත්‍රී අර්ථයෙහි රූඪ වූයේ පසු ව භාර්‍ය්‍යාර්ථයෙහි ප්‍රසිද්ධ වී ය.

---

1. ලොබින. 2. සවණින්.

සං:-පුත්‍රදාරධනාදිය පිදීම 'දානපාරමී' නමි. ඇස් ඉස් මස් ආදි සිය අඟ පසඟ පිදීම 'දාන' උපපාරමී නමි. මේ ප්‍රථම පාද යෙන් එදෙස දැක්වූහ. (සියදිවිපිදීම දානපරමාත්ථපාරමීයි.)

4. **'යදිමන්'**-යදින්ගේ මන්=යදිමන්.

5. **'දන් දී'**-මෙහි 'දී' යන්න'කර'යන්නෙහි අර්ථ ඇත්තේ ය.

6. **'මරසෙනඟ'**- මරහුගේ සෙනඟ=මරසෙනඟ.) මාරයෝ පස්දෙනෙකි: රූපාදිස්කන්ධමාරය, රාගාදික්ලේශමාරය, කුශලාකුශලසංඛ්‍යාත අභිසංස්කාරමාරය, කාලක්‍රියාසංඛ්‍යාත මෘත්‍යුමාරය, වශවර්ති මාරය යි. මෙහි වශවර්තිමාරයා ගැණේ. හේ පරනිර්මිතවශවර්ති දිව්‍යලොකයෙහි වෙසෙයි. කුශලක්‍රියාවෙහි යෙදෙනුවන් හා වෛරී වෙයි. බුදුන්ගේ ඉපැද්මෙන් ලොව්හි කුශලයන්හි යෙදෙන්නන් අධික වන බව දන්නා හෙයින් බුදුන් පහළ වීම රිසි නො කෙරේ. එබැවින් මාර තෙමේ බුදුන් බුදු වන දිනෙහි ඊට අන්තරාය කරණු සඳහා දස බිම්බරක් සෙනඟ සමගින් අවුදින් නොකෑලසින් යනා කොට දිනිය නො හී බෝසතුන්ට කිසිවකුදු කට ගත නොහී පැරද පලාගියේ ය. විස්තර **පූජාවලී ථූපවංසාදියෙහි** කී නියායෙන් දන්නේ ය.

6. **'විදසුන්නැණින්'**-'විදසුන් නැණ' නම් සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් ප්‍රතිවෙධය කරණ නුවණයි. ක්ලේශප්‍රච්ඡේදය ද වන්නේ විදර්ශනා ඥානයෙනි. මාර්ගඥානය ද ලැබෙනුයේ ඒ නුවණ ඉතා මුහුකුරා ගියකල්හි ය. අර්හත්මාර්ගඥානය සමග හැම ලොවීලොවුතුරා ගුණ නැණ බුදුන්වහන්සේට ලැබෙයි. සර්වඥතාඥානය ද ලෞකිකඥානයෙකි. ඒ ද අර්හත්මාර්ගඥානය සමග ම පහළ වේ. එහෙයින් ඊට ද විදසුන් නැණ ම මුල් වේ. එහෙයින් "විදර්ශනාඥානයෙන් සකලඥෙයසමූහය ගෙවමින්"යි කිය හැකි ද වේ.

**'සව්නේ'** යනුයෙන් දත යුතු දෑ නාක් සියල්ල ගණු ලැබේ. ඒ පස්වැදෑරුම් වේ: සඞ්ඛාර, විකාර, ලක්ඛණ, නිබ්බාණ, පඤ්ඤත්ති වසයෙන්.

8. **'ගෙවමින්'**-'ගෙව-ගෙවුම්හි' ධාතුයි.

**130.** **තලැමක් පමණ සිරුරෙන් නික්ම පැහැස ර**
**පම ණක් නැති සියලු සක්වල ගැබ පැති ර**
**බව අ ක් දකින තුරු විහිදී යන පහ ර**
**සව ණක් ගන රැසින් දිලියෙම්නි මනහ ර**

අ:-තලැටක් පමණ සිර රෙන් නික්ම පමණක් නැති සියලු සක්වළ ගැබ පැතිර බව අක් දකින තුරු විහිදී යන පැහැසර පතර මනහර සවණක් ගනරැසින් දිලියෙම්නි—

ප:-1 **'පමණක් නැති සියලු සක්වල'**-සඳහිරු දෙදෙනා දශ දිශා බබුළුවා ඇවිදුනා තාක් තැන් එක් සක්වළෙක් වෙයි. මෙසේ එක් සක්වළෙක එක් සඳක් බැගින් දහසක් සඳ ඇති, එසෙයින් ම දහසක් හිරු ඇති (..............) දහසක් සක්වළ 'සහස්‍රී චූලනීය ලොකධාතු'නම් වෙයි. (..............) ලොකධාතූහු අනන්තාපරිමාණයෝයි. කිසේ යැ? යත්:-සොළ සුවහසක් සක්වළ බ්‍රහ්මාණ්ඩය දක්වා සර්ෂප (අබඇට) යෙන් පුරා යමෙක් පූර්වදිශා භාගයෙහි එක් සක්වළෙක එක් සර්ෂපයක් බැගින් ප්‍රක්ෂෙප කොරෙමින් යන්නේ වී නම්, ඒ සර්ෂපයෝ හැම පරික්ෂයට යෙති. ඒ දිශායෙහි චක්‍රවාට යෝ පරික්ෂයට නො යෙත්. දක්ෂිණදිශායෙහි දු එතෙක් එතෙක් ම ය. මෙයින් සක්වළ පමණ නැතිබව දන්නේ ය.

2. **'බවඅක් දකින තුරු'**-'බව අග (භවාග්‍රය)' නම් අකනිටා බඹලොවයි. ඒ හැමට මතුයෙහි සිටියෙන් එනම් වී. 'තුරු' යනු 'අන්තර' ශබ්දයෙන් භින්න ව සිංහලයෙහි පවතිනා නිපාතයෙකි. 'තෙක්' යන්න හා සමානඅර්ථ ඇත්තේ ය. බව අක් දකින තුරු සවණක් ගන බුදුරැස් විහිදෙන අයුරු **අමෘතාවහයේ** 94 වන අංශයෙහි කී ලෙසින් දත යුතු.

3. **'සවණක් ගණරැසින්'**-නීල, පීත, ලොහිත, අවදාත, මාඤ්ජිෂ්ඨ, ප්‍රභාස්වර යන මේ ෂඩ්වර්ණයයි. **කාව්‍යශෙඛර** ප්‍රථම සර්ගයෙහි විස්තර පැණේ. **ගුත්තිලකාව්‍යයෙන්** ද දතහැක.

4. **'දිලිසෙමිනි'** 'දිලිස-දිලිසුම්හි' ධාතුයි. මින් ප්‍රත්‍යයයි. සකාරයට යකාරාදෙශයි.

**131.** ස ස ර සයුර සරණා සව් ස නා යා
අ ජ ර අමර මොක් පුර ලම් සි නා යා
ගැඹර ගුණැති අප මහබෝ ස නා යා
ප ව ර අසිරිමත් බුදුබව ප නා යා

අන්වය සුගමයි.

ප: 1. **'සනායා, සිනායා'**-යනාදීන්හි යාකාරය ඡන්දොරක්ෂණය සඳහා ආගම කරණලද්දකි.

2. **'ලම්'**-"සමගින් සිංහ සුතඹ" යනාදීන් ප්‍රාරබ්ධ වාක්‍යයෙහි අවසාන ක්‍රියාව මෙයයි. ඒ ද අන්‍යවාක්‍යයෙක්හි ඇතුළත් ගර්භ වාක්‍යයෙකි.

3. **'ගැඹර'**–'ගැඹුරු'යි තිබිය යුතු වුවත් **එලිසමය සඳහා** 'ගැඹර'සි යෙදින.

4. **'බුදුබව පතාගා'**–සියල්ලන් විසින් ම බුදුබව පැතිය යුතු ය. ප්‍රාර්ථනාව විපන්න වුවත් පසේබුදු ව හෝ ශ්‍රාවක ව නිවන් දැකිය හැකි වේ.

**132.** **ස හ ස් රැස්බරින් හුනු දිනකර ලෙස ද**
**ත ම ස් මුවෙන් ගිලිහුනු පුන්සඳ ලෙස ද**
**මවසෙස් දහම් අසමින් දිවි පුදන ලෙ ද**[1]
**ර කු ස් මුවට පිනුවේ ගිරිහිඹින් සෙ ද**

**අන්වය** සරලයි.

**ප:**–1. **'සහස් රැස්'**–මෙහි 'සහස්' සදින් 'දහස්' යන අර්ථය නො ව 'දහස්ගණන්' යන අර්ථය ලැබේ. සූර්යයාට රශ්මි දහසක් නො ව දහස්ගණනක් වේ.

2. **'හුනු'**–'හෙ' දයින් නූපස වී සිද්ධ අතීතකර්තෘකාරක කෘදන්තයි.

3. **'දිනකර'**–තත්සම ශබ්දයෙකි. දින කරණුයේ=දිනකරයි. පර්තමසතකයෙන් රකුස්මුවට පිනූ රජතෙමේ දහස්ගණන් වූ රශ්මීන්ගේ භාරය නිසා අහසින් පතිත වූ සූර්යයා වැන්නැයි කීමෙන් රජහුගේ තෙජොධිකත්වය ද කාන්තිමත්භාවය ද හැඟවූහ. කාන්තිය ද ස්වජීවිත පූජාව සිහි කිරීමෙන් වූ සතුටින් වූයේ ය.

4. **'තමස් මුවෙන්'**–'තමස්' සද අන්ධකාරාර්ථයෙහි ප්‍රසිද්ධ ය. එහෙත් රාහු කෙරෙහි ද කොශාදියෙහි යෙදුනේ ය. මෙහි ද 'රාහු' යන අර්ථය උචිත ය. රාහුගේ ග්‍රහණයෙන් මුක්ත වූ චන්ද්‍ර තෙමේ ශොභාධික වේ. 'රාහු' නම් චන්ද්‍ර සූර්යයන් හා ශත්‍රු වූ එක්තරා අසුරයෙකැයි ද, හේ වරින්වර චන්ද්‍ර සූර්යයන් ගිල ගණී යයි ද කවි සමයප්‍රසිද්ධ ය. **ක්ෂීරසාගර** මථනයෙන් පසු දෙවියන් අමෘතය බෙදනකල **සෛංහිකෙය** නම් අසුරයෙකු අන් වෙසකින් අවුත් අමෘතය ලබාගෙණ බී ය. චන්ද්‍ර සූර්යයන් ඒ සොරකම දැක **විෂ්ණුහු** හට දැන්වූහු. විෂ්ණු තෙමේ එක පහරින් ඔහුගේ හිස සිඳලී. අමෘතයාගේ මහිමයෙන් හිස රාහු වී තමහට සතුරුකම් කළ සඳ හිරු දෙදෙනා වරින්වර ගිලියි. ඉතිරි කොටස **කෙතු** නම් වී. මේ පුරාණයන්හි ආ ප්‍රවෘත්තියි. අතීත කාලීන වූ නක්ෂත්‍ර ශාස්ත්‍රඥයෝ චන්ද්‍ර සූර්යයන්ගේ හා පෘථිවියෙහි පරිභ්‍රමණය නිසා චන්ද්‍ර සූර්යග්‍රහණ වේ යයි නිශ්චය කළහ. ඔහු පෘථිවි ඡායාවට 'රාහු' යයි කියති.

1 දිවි පුදමින් අසනලෙද-ඈහෑම

5. 'ගිළි ගුනු'–'ගල-මිදුම්හි' දයින් නිපන් 'ගිලි' යන පෙර කිරිය පෙරටු කොට ඇති 'හෙ' දයින් නිෂ්පන්නයි. 'ගලහ' ධාතුයයි ඇතැම්හු කියත්.

6. 'පිනුවේ'–'පන්-පැනුම්හි' දයින් අයු කතුකරු උව පස කිරීමෙන් සිද්ධ 'පිනු' යන කෘදන්තයෙන් වූ ප්‍රථමෛක වචනාන්ත නාමපදයි.

ස:–"මහබෝසතා ගිරිහිසින් රකුස් මූවට සෙද පිනුවේ වී"යි ක්‍රියාකාරක පදසම්බන්ධයි. 'වී' යනු ආඛ්‍යාතක්‍රියාවයි. 'මහ බෝසතා' යනු උක්තප්‍රකෘතිකර්තෘයි. 'පිනුවේ' යනු උක්ත විකෘති කර්තෘයි. 'රකුස්මූවට' යනු අනුක්ත කර්මයි. 'ගිරිහිසින්' යනු අනුක්ත අවධියි. 'සෙද' යනු ක්‍රියාවිශෙෂණයි.

133. සොඳුරු මෙ අප බෝසතු පනිත මේ ලෙ ස
අතුරු දහන් සාරමින් ගත් රකුසු වෙ ස
සිරුරු රැසින් හෙළි සාරමින් දසනු දෙ ස
මහරු එසක්රජ වෙස් ගණිමින් නො ල ස

අ:–මෙ අප සොඳුරු බෝසතු මේ ලෙස පනිත ගත් රකුසු වෙස අතුරු දහන් සාරමින් දසනුදෙස සිරුරු රැසින් හෙළි සාර මින් නොලස මහරු එසක්රජ වෙස් ගණිමින්–

ප:–1. 'දසනු දෙස'–'දිශානුදිශා' යන්නෙන් භින්නයි. දිශාවෝ නම් පූර්ව, පශ්චිම, දක්ෂිණ, උත්තර යන මොහුයි. අනුදිශාවෝ නම් ඉසාන, ගිනිකොණ, නිරිත, වයඹ යන මොහුයි. උඩ, යට යන දෙදික් එක්වූ විට දශදිශාවෝ වෙත්.

134. පියසාරු තමන් හිමියෙකු ගත් බැති සිති න
වැඩසාරු දසකු මෙන් බෝසතු වඩාගෙ න
සිතපිරු තොසින් සුරපුර ගෙණ යන සිති න
දිවයුරු මගට නැගෙමින් නික්මින සෙදි න[1]

අ:–තමන් පියසාරු හිමියෙකු බැති සිතින ගත් වැඩසාරු දසකු මෙන් සිත පිරු තොසින් බෝසතා වඩාගෙණ සුරපුර ගෙණ යන සිතින් දිවයුරු මගට නැගෙමින් සෙදින නික්මින.

ප:–1. 'වැඩසාරු'–(මෙහි 'වැඩ' සද වෘද්ධිවාචී 'වඩ්ඪි' යන පාළිවචනයෙන් භින්නයි.) වෘද්ධිය සාරණ, හිත සාරණ යනු අර්ථයි

2. 'දිවයුරු මගට'–දිවාකර(සූර්ය)යාගේ මාර්ගය නම් අහසයි. නැගෙමින් යන්නෙහි කර්මයි.

3. 'නික්මින'–මෙහි මූලය 'නිකුම්' දයින් නිපන් 'නික්මිති' යන්නයි. අන්ත්‍ය ඉකාරයට අකාරාදෙශයි.

1. සොදින

4. **'සෙදින'**-'සෙද' යන නිපාතයෙන් පරව ඉන් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ නිපාතයි. 'ශීඝ්‍ර ව' යනු අර්ථයි.

**135.** **රළ පෙළ පහළ නිල ලෙල මහ සමුදුර ද**
**පැහැදුළ හිමව් පවු රැඳි හිමවන පෙත ද**
**සිරි දුළ කොදිව් සහ සිවු මහදිවයින් ද**
**මන දෙළ වඩා දැක දැක ගොස් සිතු පැහැ ද**

**අන්වය** සුගමයි.

**පː-** 1. **'හිමව්පවු'**-මෙහි 'හිමව්පවු' යන්නෙන් හිමාලය පර්වතකූටයන් ගන්නාලද බව හැඟේ. "පෙණිති සුවාසූදහසක් හිමව් කුළු" යනුවෙන් **ගුත්තිල**යෙහි ද ඒ ආයේය.

2. **'හිමවනපෙත'**-දසදහසක් යොදුන් දිගුපුළුලු ඇති ජම්බු ද්වීපයෙන් තුන්දහසක් යොදුන් තැන් හිමාලය වි ය. උසින් පන් සියක් යොදුන් පමණ වි ය. වටින් නවදහසක් යොදුන් පමණ ඇත්තේ ය. හිමෙන් ගැවසුනු හෙයින් හිමාලය නම් වී ය. එහි සුදර්ශනකූට, චිත්‍රකූට, කාලකූටාදි පර්වතපඞ්ක්තීහු වෙත්.

3. **'කොදිව් සහ සිවුමහදිවයින්'**-මේ මඟුල් සක්වළ දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව මතු යෙහි සුවාසූදහසක් යොදුන් ගැඹුරු වූ මහාසමුද්‍රය වටින් සතළිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් පමණ වූ සක්වළ ගබ පැහැර සිටිනේ ය. ඒ සමුද්‍රය අතරතුර පිහිටි සිවුමහදිවයිනෙන් එක් එක් දිවයිනක් පිරිවරා පන්සියක් පන්සියක් කොදිව් බැගින් දෙදහසක් කොදිව් පිහිටියේ ය. එයින් **අපරගොයානය** සත්දහ සක් යොදුන. **පූර්වවිදෙහය** සත්දහසක් යොදුන. **උතුරු කුරුදිව** අටදහසක් යොදුන. දඹදිව දසදහසක් යොදුන.(**බුත්සර ණෙහි** 58 වන අංශය බලනු.)

**136.** **මෙරගිර සර ලකළ කළ දල විලස් ල ද**
**සුග දුර පටන් දිසි සත්කුල ගිරි පෙළ ද**
**එහි'තර 'තර සුසැදි සිදන් සමුදුරු ද**
**පුරඳර සමඟ ගොස් දැක එනම සිතු ලෙ ද**

**පː-** 1. **'මේර ගිර සර'**-කර්මවිභක්ත්‍යන්තයි. මහමෙර සුවාසූ දහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලී සිටියේ ය. සුවාසූදහසක් පමණ යොදුන් නැගී සිටියේ ය. අයම්තුදු සුවාසූදහසක් යොදුන් පමණ ය. විතරිතුදු සුවාසූදහසක් යොදුන් පමණ ය. (**බුත්සර ණෙහි** 77 වන අංශය බලනු.) මහමෙර 'සර' (පදුම) යයි ගත් කල, ඒ අවට සිටි සත්කුලපවු පියුම හාත්පස තිබෙන පත්‍ර වැනි වේ.

2. **'ලකළ'**–'අලඞකත' ශබ්දයෙන් භින්නයි.

3. **'දල'**–පත්‍රවාචී යි.

4. **'යුගඳුර පමන් දිසි සත්කුළ ගිරිපෙළ'**–(ගුත්තිලයෙහි 400 වන කව බලනු.) යුගන්ධර තෙමේ සුවාසූදහසක් යොදුන් උස ඇත්තේ ය. ඊශධර පර්වතය යොදුන් දෙසාළිස්දහසකි. කරවීක පර්වතය යොදුන් එක්විසිදහසකි. මෙසේ ම සුදර්ශන, නෙමිඣර, විනතක, අශ්වකර්ණපර්වතයෝ ද අඩෙකින් අඩෙකින් එකිනෙකට මිටි වෙති. මේ සප්තකූටපර්වතයෝ යි.

5. **'සිදන් සමුදුරු'**–'මෙරු යුගන්ධරාදිපර්වතයන් අතුරෙහි මුහුදු 'සිදන්තසාගර' නම් වෙයි. එහි පැන් මොනරපිලක් පවා ලුව හොත් ගැලී යන පමණ සියුම් බව ඇත්තේ ය. එහි මෙරුපර්වත යෙහි සිට යුගන්ධරපර්වතය අතුරෙහි මුහුද සුවාසූදහසක් යොදුන් පමණ පළල ඇත්තේ ය. සෙසු පර්වතයන් අතුරෙහි වූ මුහුදු පර්වත යන් සෙයින් අඩියකින් අඩියකින් පළල අඩු වෙයි. (**බුත්සරණෙහි** 78–79 අංශයන්ගෙන් විස්තර දත යුතු.) 'සීදන්ත=සීදන්' යනු 'සමන්ත-සමන්' යනු මෙනි.

6. **'පුරඳර'**–ශක්‍ර පර්‍යායයි.

7. **'එනම'**–**'එ'** යන්න නිරර්ථක ය. එයින් ලැබෙන එක ම ප්‍රයොජනය මාත්‍රාසඞ්ඛ්‍යාව පිරවීම පමණෙකි.

**137.** දුමුවන් මනනුවන් නඳ දෙන රුසිරු ස ර
සුරඹුන් කෙළින ගෙළයන් සිරිනි මනහ ර
නිතියෙන් සිවුවරම් දෙවියන් සැදි පව ර
දකිමින් ගොසින්[1] සිවුමහරද දෙව්නුව ර

**අන්වය** පහසුයි.

**ප:**– 1. **'කෙළින'**–'කෙළ' දයින් ආධාරකාරකයෙහි නප්‍රත්‍යය වීමෙන් සිද්ධයි.

2. **'ගෙවුයන්'**–ගෘහයන් අසළ පිහිටි මල්රුක්ආදියෙන් යුත් උයන්වතුයි.

3. **'සිවුවරම් දෙවියන්'**–ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන මොහුයි. මොහු සතරදෙන චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි

---

1. ඉතාසින්.

පිළිවෙළින් පූර්ව, දක්ෂිණ, පශ්චිමෝත්තර දිශාවන්ට අරගෙණ සිටිති. ධෘතරාෂ්ට්‍ර තෙමේ ගන්ධර්වයන්ට ද, විරූඪ තෙමේ කුම්භාණ්ඩයන්ට ද, විරූපාක්ෂ තෙමේ දිව්‍යනාගයන්ට ද, වෛශ්‍රවණ තෙමේ යක්ෂයන්ට ද අධිපති වෙයි.

4. **'සිවුමහරද දෙව්නුවර'**–යුගන්ධරපර්වතමස්තකයෙහි පිහිටියේ ය. යට කී මහරජහු තව්තිසාදෙව්ලොවට විරුද්ධ ව එන අසුරයන්ගේ ගමන් වළක්වනු සඳහා එහි අරගෙණ සිටිති. ඒ දෙව්ලොව එක්සියඅටපාදයකින් යුක්ත සක්විසිමහනකතකින් ද, දොළොස් රැසින් ද, නවග්‍රහයන්ගෙන් ද යනාදි වූ බොහෝ තාරකා විමානයෙන් ගැවසී ගත්තේ ය. විස්තර **සද්ධර්මරත්නාකරයෙහි** කී ලෙසින් දතයුතු.

**138.** හ ර ගි ර සිරි වෙළපා බබලන දිමු ත
ත ර ස ර විසල් වාසල් මිණි පවුරු යු ත
මෙර සි ර සුසැදි දසදහසක් සොඳුන් යු ත
ව ර සු ර පුරට වදිමින් මෙඅප බෝස ත

අන්වය සරලයි.

පඃ- 1. **'හරගිර'**–හරගේ (ඊශ්වරයාගේ) ගිර නම් කෛලාස පර්වතයයි. ඒ රිදීමුවා ය. එහෙයින් ඒ අතිශයශ්වේතවර්ණ ශෝභාවක් දරයි. තව්තිසා දෙව්ලොව ප්‍රාකාරය ද ඊට ද වඩා ශ්වේත වර්ණයෙන් බබලයි.

2. **'වෙළපා'**–'වෙළප' දයින් නිපන් පෙරකිරියපදයි.

3. **'වර සුරපුර'**–මේ තව්තිසාදෙව්ලොවයි. එහි විස්තරය බුත්සරණෙහි 22 වන අංශයෙහි කී අයුරින් දත යුතු.

**139.** දෙ ව් රු ක් පසින් හෙබි නඳුනුයන ද පබ ඳ
සි ය ස ක් සොඳුන් නන්ද නමැති පොකුණ ද
තෙ තිසක්[1] කුඹිනුදුල එරවණ වරණිඳු ද
සි ය ස ක් පුරා දක දක ගොස් සිතු පැහැ ද

අන්වය ඍජුයි.

පඃ- 1 **'දෙව්රුක් පසින්'**–දෙවවෘක්ෂයෝ පස්දෙනෙකි. ඔහු යට දක්වන ලදහ. ඔවුන්ගෙන් නඳුනුයන ශෝභමාන වෙයි.

2. **'හෙබි'**–'හොබ-හෙබුම්හි' ධාතුයි. කතුකාරු ඉපසයි.

3. **'නඳුනුයන'**–ශක්‍රයාගේ උද්‍යානයයි. එහි මෙතම් පුෂ්පයෙක් ඵලයෙක් නැතැයි නො කිය හැක්කේ ය. මරණයට ලං වූ

1. දෙත්සක්.

දෙවියෝ ද පවා ශොකවිනොදය සඳහා එහි යෙති. පැමිණි පැමිණියන් තුටු කරවන හෙයින් ඒ උයන 'නඳුනුයන' නම් වී. ඒ යොදුන් දහසක් පමණ වෙයි. **ගුත්තිලයෙහි** "දහසක් යොදුන් වන-පෙණිනි විසිතුරු වන නඳුන්වන"යි ඒ වැණිත.

4. **'නන්ද නමැති පොකුණ'**-බෝසතුන් **මඝමාණවක** කාලයෙහි උන්වහන්සේගේ නන්ද නමැති බිරින්ද විසින් මගියන්ගේ ප්‍රයොජනය සඳහා කරවූ පොකුණෙහි අනුහසින් තිපන්නකි.

5. **'තෙතිසක් කුඹිනුදුල එරවණ වරණිඳු'**-මඝමාණවක කාලයෙහි බෝසතුන්ට උපකාරී ව සිටි ඇත් තෙමේ **ඓරාවණ** නම් දෙව්පුත් ව උපනි. දෙව්ලොව තිරිසනුන් නැතිහෙයින් සක්දෙවිඳු උයන් කෙළියට යන කල ඓරාවණ නම් දිව්‍යපුත්‍රයා තමාගේ දිව අත්බව හැර ලා දිගින් ගවුහසියයක් විතර දිගඇති තුන්සියසැට ගව්වක් විතර උස ඇත්වෙසක් මවයි. එ ඇතුට කුම්භස්ථල තෙතිසක් වෙයි. සියල්ලට මධ්‍යයෙහි වූ **සුදශීන** නම් කුම්භය ශක්‍රයාගේ ප්‍රයොජනය පිණිස වෙයි. **බුත්සරණෙහි** 82 වන අංශය බලනු.

140 කෙලෙසුන් පසුන් කල තවසුන් මිස නොම ඳ[1]
දු මු ව න් විසි කරවන[2] රුසිරැති පබ ඳ
සු ව දි න් මලින් දිවබරණින් සුසැදි සො ඳ
ද කි මි න් දිවසරන් මනනෙත් දෙමින් න ඳ

අ:- කෙලෙසුන් පසුන් කල තවසුන් මිස දුටුවන් විසි කරවන පබ'ද නොමඳ රුසිරැති සොඳ සුවදින් මලින් දිවබරණින් සුසැදි දිවසරන් දකිමින් මන නෙත් නඳ දෙමින්-

ප-: 1. **'කෙලෙසුන් පසුන් කල තවසුන්'**- මෙහි 'කෙලෙසුන්' යනුවෙන් ප්‍රධානවශයෙන් කාමරාගය ගැණේ. කාමරාගය ප්‍රච්ඡින්න කළාහු නම් අනාගාමීන් හා රහත්හුයි. උන්වහන්සේලා ද කෙලෙස් තවන ශීලාදි තපස් ඇතිහෙයින් 'තාපස' නම් වෙති. එතුමෝ කවර තරම් සත්‍රීරූපයක් වුව ද ඇලුම් නො කරති. ධ්‍යාන බලයෙන් කෙලෙස් මැඩ පවත්වා සිටින තාපසයෝ වූ කලී ඇතැම් විට දෙවඟනන්ගේ වසඟයට යති.

2. **'පබ'ද'**-පබින් අද-පබඳ. ප්‍රභායෙන් ආර්ද්‍ර (තෙත්)වූ යනු අර්ථයි

1. පබඳ. 2. වන තුදු. 3. නොමඳ.

3. 'මනනෙත්'-(=මන ද නෙත් ද);'දෙමින්' යන්නෙහි සම්ප්‍ර දානයයි. විභක්තිප්‍රත්‍යය ලුප්තයි.

141. ම න් පිණවන උරුවිසි සමග නලඟ න
දු න් රඟ නරඹමින් මනනුවන පිණව න
ප න් සිළු අ෴ වරසුරගඳඹුන් වය න
සා න් කලු මියුරු වෙණනද සවණ සදමි න

අ:- නලඟන සමඟ මන් පිණවන උරුවිසි දුන් මනනුවන පිණවන රඟ නරඹමින් පන්සිළු අෑ වරසුරගඳඹුන් වයන සාන්කලු මියුරු වෙණනද සවණ සදමින-

ප:- 1. 'උරුවිසි'-මෝතොමෝ එක් ගන්ධර්වාඞ්ගනාවකි. ගන්ධර්වයෝ නම් නැටුම්වැයුම් ආදියෙන් දෙවියන්ට සෙවනය කරන්නෝයි. උර්ශීතොමෝ අතිශය රූපශ්‍රී ශොභාසම්පන්න ලලනාවකි. එහෙයින් ම ගුත්තිලයෙහි "දුටුවන් විසීයා-කරවන උරුවිසීයා"යි කීහ. 'සර්වේශ්‍යා, දිව්‍යගණිකා' නාමිනුදු මෝ ප්‍රසිද්ධ ය.

2. 'නරඹමින්'-'නරඹ' ධාතුයි.

3. 'පන්සිළු'-පන්සිඛා දෙව්පිත් මිනිස්පියෙහි සිට පින්කම් කරණකල කෙහෙකලු ළඳුරි ය. හේ ගොපල්ලනට දෙට ව සෙසු දරුවන් ගෙණ ගමින් පිටත සතරමඟ එක්වූ තැන ගල් කරවමින් පොකුණු බිඳුවමින් ගෙවල් කරවමින් මඟ පහයවමින් කණුමුල් උපුරවමින් වළ ගොඩ සම කෙරෙමින් ඇවිදුනේ නවයොවුනෙහි ම මෙළේ. හේ සව්මහරජ දෙව්ලොව ගඳැව්දෙවියන් කෙරෙහි අනුලක්‍ෂයකට ආයුෂය ගෙණ උපන. ඒ නන්අබරණ පැලඳ පස්සුලක් කොට කෙහෙ බැඳ බහාලයි. එයින් පන්සිළුදෙව් නම් ව ඇවිද්දී. ඒ හැම දෙවියනට ම ප්‍රිය ය. ඔහුගේ වීණාව 'බෙලුවපණ්ඩු' නමි. බෙරය 'සුසවර' නමි. (අමාවතුරෙහි 17 වන පරිච්ඡෙදය බලනු.)

4. 'වෙණනද සවණ සදමින' යනු "වෙණනද අසමින්" යි කී තියා යි.

142. දි න ක ර සඳ සහස් එකවිට පහල යු රූ
ග න ඳු ර පැහැර දවරැ දිලෙන නිරතු රූ
පැහැ සර නවරුවන් කොත් පැලඳි විසිතු රූ
තු ඟු න ර සුරවිමන් සැදි දෙපසෙහි සොඳු රූ

අන්වය සුගමයි.

ප:- 1. 'පැහැර'-'පහර-පැහැරුම්හි' ධාතුයි.

2. **'නවරුවන්'**-

"මුක්තා-මාණික්‍ය-වෛදූර්‍ය- ගොමෙදන් වජ්‍ර-විද්‍රැමෞ,
පද්මරාගං මරකතං නීලඤ්චෙති යථාක්‍රමාත්"

යනුවෙන් නවරුවන් දක්වේ 'මාණික්‍ය' නම් රතුකැටයි. 'වෛදූර්‍ය' යනු වයිරෝඩියි. 'වජ්‍ර' යනු දියමන්තියි. විද්‍රැම' යනු පබළු (කොරල්) ය. 'මරකත' නම් පච්ච ය.

සං:- දෙව්ලොවට සූර්‍ය්‍යාලොකයෙන් අර්ථයෙක් නැති. එහි ප්‍රාසාදයන්ගේ ශෘඞ්ගාග්‍රයෙහි වූ රත්නාලොකය සඳහිරු දහස්ගණනක් එකවිට නැගී කලෙක්හි සේ මුළු දෙව්ලොව ශොභාවත් කෙරේ.

**143.** **මු නි ඳු න් විසින් වදහළ අනාගතවෙන පබ ඳ**
**සූ ප ස න් සුර ඉසුරු නරඹා සිතු පැහැ ද**
**සු ද සු න් වේ මැදින් ගොස් සමග සුර ර ද**
**සහො සින් සුදම්සබ අබතුරට වන් ස ඳ**

**අන්වය** සුගමයි.

**ප:-1. 'සුදසුන් වේ'**-මේ වනාගී තව්තිසාදෙව්ලොව ප්‍රධාන වීපියයි. දෙවියන්ගේ උත්සව දිනයන්හි මේ වීපිය විශෙෂ ශොභා සම්පන්න වෙයි.

2. **'සුදම්සබ'**-යට දක්වනලදී.

3. **'අබතුර'**-'අබ්‍යන්තර' යන්නෙන් භින්නයි.

4. **'වන්සඳ'**-මෙහි 'වන්'යන්නට හා මින් ප්‍රථම පද්‍යයන්හි වූ පූර්‍වක්‍රියාවන්ට ද 138 වන කවෙහි වූ "මෙ අප බෝසත" යන්න අනුකත්‍ත කර්තෘයි.

**144.** **එහි නෙක සුර න් හා**
**මනහර සුරසර න් හා**
**දෙතිසක් සුර න් හා**
**දෙදෙව් ලොව හිමි සුරනිඳු න් හා**

**අන්වය** සුගමයි.

**ප:- 1. 'නෙකසුරන්'**-මෙයින් දෙතිස් දෙවියන්ගෙන් අවශෙෂයෝ ගැණෙත්. (හා සබඳෙහි කතුවිබත් රුයි.)

2. **'දෙතිසක්සුරන්'**- මඝමාණවකකාලයෙහි බෝසතුන්ට සහළු ව දෙතිස් දෙනෙක් පින්කම් කළහ. ඔහු මිය ගොස් බෝසතුන් සහ දෙව්ලොව උපන්හ. එහි දී ඔහු කෘතපුණ්‍යහෙයින් උසස් තනතුරු ලත්හ ඔවුන්ගෙන් පසු අන්‍යයෝ ඒ තනතුරු ලැබූහ. මෙහි කීවෝ ඔහු ය.

3. **දෙදෙව්ලොවහිමි'**-'දෙදෙව්ලොව' නම් චාතුර්මහාරාජික, ත්‍රයත්‍රිංශත් යන දිව්‍යලොකයි. ශක්‍රයා ඒ දෙකට හිමි වේ.

4. **'සුරනිඳු'**-සුරන් (හට) ඉඳු=සුරනිඳු, අලුප්ත සමාසපදයෙකි. 'නරනිඳු' යනු මෙනි.

**145.** **සතුටින් සුතු ව හ ද**
**මහබෝසතුන් මනන ද**
**දිවපහස් දෙන සො ද**
**විසල් පඬුපුල් සලස්නේ සෙ ද**

**අන්වය** සුගමයි.

**පෘ:- 1. 'හද'**-ආධාරවිභක්ත්‍යන්තයි. 'හෘදයෙහි'යනු අර්‍ථයි. මෙහි 'හද' සදින් සිත ගැණේ.

2. **'පඬුපුල් සලස්නේ'**-'සලසුනේ'යි තුබූ තන්හි සකාරසථ උකාරලොපයෙන් "සලස්නේ"යි සිද්‍ධයි. 'සලසුන්' යනු ප්‍රකෘතියි. 95-5 බලනු. මඝමාණවක කාලයෙහි ශාලාවට නුදුරු කොට කොබ ලීල පැලයක් හිඳුවාලා ඒ පැලයමුල ගල්ලෑල්ලක් ලවාලූ අනුහසින් අද දක්වා සාරසියක් ගවු උස ඇති වටින් එක්දහස් දෙසිය ගව්වක් ඇති පරසතුගස හා ඒ රුකාමුල පඬුපුල් සලස්හා ද පහළ වි ය.

**146.** **ඉඳුවා සාර අද ර**
**ගඳදුම්මලින් පුද සා ර**
**මහසතුගෙන් පව ර**
**දහම් අසනුව දෑන්වූ සුරව ර**

**අන්වය** සුගමයි.

**පෘ:- 1. 'ගඳදුම්මලින්'**-'ගඳ' සද ආඝ්‍රාණය කට හැකි සියල්ල කෙරෙහි ම යෙදෙතත් මෙහි සුගන්‍ධාර්‍ථයෙහි යෙදින. වර්‍තමාන ව්‍යවහාරයෙහි දුර්ගන්‍ධවාචි වේ. දුම් ද මල් ද=දුම්මල්. ගඳින් යුත් දුම් මල්=ගඳදුමමල්. එයින්. කර්‍මාර්‍ථයෙහි කරණවිභක්තියි.

2. **'දෑන්වූ'**-'දන්' දයින් නිපන් හෙත්‍වර්‍ථ අතීතකාලික බහුවචනාන්තාඛ්‍යාත පදයි. අන්ත්‍ය ඌකාරය ඡන්‍දොහෙතුවින් හ්‍රස්වයි. මෙහි එකවචනය "දෑන්වි" යනුයි.

3. **'සුරවර'**-මෙයින් 144 පද්‍යයෙහි දැක්වූ දෙවියෝ ගැණෙත්. මෙහි ප්‍රථමා බහුවචනප්‍රත්‍යය ලොප් කරණලදී.

**147.** **ගුණරුවන සාග ර**
**දනමනකොඳ නිසාක ර**
**සඳහම් අමා ක ර**
**පවර මුළුතුන්ලොවෙක සේක ර**

**අන්වය** සුගමයි.

**පෘ:- 1. 'ගුණරුවන සාගර'**-සාගරය රත්නයනට ආකරයයි කියති. යම් සේ සාගරය රත්නයනට ආකාර වේ ද, එසේ ම අප මහ බෝසත්හු ද ගුණයන්ට ආකාර වෙති.

2. **'දනමනකොඳ නිසාකර'**-චන්‍ද්‍රයා කුන්‍දයන් පුබුදුවයි යනු කවිසමයාගතයි. යම් සේ චන්‍ද්‍රතෙමේ කුන්‍දයන් පුබුදුවා ද, එසේ ම අප මහබෝසත්හු ජනමානසයන් පුබුදුවති. දනන්ගේ මන=දනමන. දනමන ම කොඳ=දනමනකොඳ.

3. **'සදහම් අමාකර'**–'ආකර' යනු උත්පත්තිස්ථානයි. අප බෝසත්හු සද්ධර්ම නමැති අමෘතයට ආකරයකි.

4. **'ශේඛර'**–'ශෙඛර' ශබ්දයෙන් නිපන්නයි. ශෙඛර නම් ඔටුන්නයි. අප බෝසත්හු තුන්ලොවට අසහාය(=එක ම)ඔටුන්නකි. එතුමන්ට මුළුතුන්ලෝවැසියෝ ම හිස නමා වඳිති.

**148.** **මෙ අප බෝසත් ස ද**
**සපැමිණ අසුන් නුබමැ ද**
**සුරසබ කිරිමුහු ද**
**වැඩි සදහම් අමාරැසිනො ද**[1]

අ:– මෙ අප බෝසත්සඳ අසුන්නුබමැද සපැමිණ සදහම් අමරැසින් සුරසබ කිරිමුහුද ඔද වැඩී.

ප:– 1. **'සුරසබ කිරිමුහුද'** වන පරිදි **ගුත්තිලයෙහි**

"431. වරකාත රඟින් ස ර-සුරසිරිසඳට ආකා ර
සුරසබ කිරිසයු ර-පිවිටූ සඳරස් ලෙසින් මනහර"

යන කාවෙහි පැණේ.

2. **'වැඩි'**–'වඩ' දයින් නිපන් අතීතකාලාඛ්‍යාතයි.

3. **සදහම් අමාරැසින්**– ආසනය ආකාශයෙකි. බෝසත් එහි සඳ ය. ඔහුගේ අමාරැස් නම් සදහම් ය. අමාරැස ලැබ ඔද වැඩෙන කිරිමුහුද නම් සුරසබයයි. චන්ද්‍රරශ්මිය අමෘතරශ්මියයි කියනු ලැබේ. (11 කාව බලනු) බෝසත් තෙමේ දහම් දෙසා සුරසබය ඉතා සතුටු කොළේ යයි මෙයින් කිහ.

**149.** **සුරගඟ තරඟ ලෙ සි**
**වසිත විලසින් අමවැ සි**
**තෙපලින් නිසි සුබැ සි**
**මෙ අප බෝසත් දහම් පැව සි**

**අන්වය** සුගමයි.

ප:–1. **'සුරගඟ තරඟ ලෙසි'**–සුරගඟ නම් මන්දාකිනී නදියයි. ඒ විෂ්ණුහුගේ මහපටැඟිල්ලෙන් නැඟ කෛලාසවාසි ඊශ්වරයාගේ දළමඩුල්ලට පැමිණ එය තුන්වටක් පැදකුණු කොට පොළොවට බසී ල. අධික වාතවෙගය නිසා එහි තරඟයෝ අතුරු නැති ව නඟිති. බෝසතුන්ගේ වචනයෝ ද එබඳු වෙතැයි කීමෙන් බෝසතුන් කථායෙහි ඉතා බුහුටිබව හා වචනයන්ගේ නිරන්තර බවත් දැක්වූහ.

2. **'වසින විලසින් අමවැසි'**–අමෘතය නම් අති මධුරවූ ජීවනීය ද්‍රව්‍යයෙකි. එයින් බිඳකුදු සපශී කොළේ අතිශය ද්‍රතියට පැමිණේ. බෝසතුන්ගේ වචන ද, වචනයන්හි අක්ෂර ද අමාබිදු මෙන් ප්‍රමොද දායක ය. මෙයින් වචනයන්ගේ අතිශය මධුරත්වය කිහ.

1. කොළේය ඔද දම්අමරැසින් නද,

3. **'නෙපලින් නිසි සුබැසි'**– බෝසතුන්ගේ වදන් හුදක් නිරන්තර ද, මධුර ද මතු නො වේ. නිශ්‍රිත ද, සුභාෂිත ද වේ. නිරන්තර වුව ද, මධුර වුව ද, වචනයෝ සුභාෂිත නො වෙති. අඞ්ග සතරකින් යුත් වචනය සුභාෂිත වෙයි. යහපත් කොට කියන ලද්දක් වීම ය, අධර්මයක් ප්‍රකාශ නොවන්නක් වීම ය, අප්‍රිය නො වන්නක් වීම ය, සත්‍යයක් ම වීම ය යන මේ සතරයි. වදුරණ ලද මැයි:–

"සුභාසිතං උත්තමමාහු සන්තො
ධම්මං භණෙ නා'ධම්මං තං දුතියං,
පියං භණෙ නා'පියං තං තතියං
සච්චං භණෙ නා'ලිකං තං චතුත්ථං" යි.

සං:–'බෝසත් දහම් පැවැසී'යනු අනන්තර පද්‍යයෙන් ද ප්‍රකාශ වන හෙයින් මේ සාව මෙහි අනවශ්‍ය ය. පුනරුක්තදෝෂයට ඉඩ ලැබෙන හෙයිනි. මේ කාවෙහි ප්‍රථමාර්ධය **කාව්‍යශෙඛරයෙහි** 10 සර්ගයෙහි 133 වන,

"සුරගඟ හරන රඟ–අමාවැසි වසිනා රඟ"

යන පද්‍යාර්ධයෙන් ගැණුනකි.

**150. සදහම් අමාර ස**
**සවන් රන්ගොටුයෙන්[1] තො ස**
**බී ඉතිර[2] ගිය ලෙ ස**
**මහසතුට සක් කොළේ තුතිගො ස**

**අන්වය සරලයි.**

පඃ–1. **'ගොටුයෙන්'**– 'ගොටු' සද වඤ්ක (කෝප්ප) වාචී ය. **රුවන්මල්හි** ද "විත් ගොටු ද පැන්මල් වේ"යි කීහ. බත්වලඳන බඳුන "තැටි" නම්. කීහු මැයි:–"තළි තටු බොඳුන්පා තැටි"යි.

2. **'තොස'**– සන්තොෂයෙන් යන අර්ථ ඇත්තේ ය.

3. **'බී'**–'පා–පීමෙහි' දයින් සිද්ධ පූර්වක්‍රියාපදයි. තත්සම වශයෙන් මෙසේ ගණිතත් පදසිද්ධියෙහි දී පාධාතුවට 'පෙං(බො)' ආදෙශ වේ.

4. **'ඉතිර'**– 'උතුර' දයින් නිපන් පෙරකිරියපදයි.

5. **'මහසතුට'**–සම්ප්‍රදානයි.

සඃ– ශක්‍රතෙමේ සද්ධර්මාමෘතය කර්ණවඤ්කයෙන් ඉතිර යන පමණට බී හෙවත් බණ අසා බෝසතුන්ට සතුති කොළේ ය. ඒ සතුතිය කෙබඳු ද? යත්:– පානය කළ ධර්මාමෘතයෙන් ඉතිරී ගිය ශෙෂයක් වැන්න.

**151. මේ ලෙසට නොවින ර**
**තුතිගොස ද පෙරදැරි කා ර**
**මහසතුට පුරඳ ර**
**අවවාද කොළෙ බසින් පියකා ර**

1, බී සවන් තැටියෙන් 2, පිරිහිරී.

**අන්වය** සරලයි.

පා:- **'පෙරදූයි'** - 'පුරෙචාරි' යන්නෙන් ආයේ ය. චකාරයට ජකාර ව, ජකාරයට දකාර ව සිද්ධ යි. 'චීන' සදින් 'දීන' යනු සිද්ධ වූවාක් මෙනි. මෙයින් තුතිය පළමු කොටත් අවවාදය පසු කොටත් කළ බව හඟවයි.

අවවාද දක්වන්නාහු "සිවු සඟරු වතින" යනාදිය කියති.

| | | |
|---|---|---|
| **152.** | **සිවුසඟරු වති** | **න** |
| | **මඟරු දසරජදහම්** | **න** |
| | **සව්සතුන් සිත් ගෙ** | **න** |
| | **පවතු පෙරනරනිදුන් විලසි** | **න** |

**අන්වය** සරලයි.

පා:- **'සිවු සඟරුවත්, දසරජ දහම්'**- යට දැක්වූම්හ.

2. **'පවතු'**- 'පවත්' දයින් නිපන් විධි ක්‍රියාපදයි.

3. **'පෙර නරනිඳුන්'**- මනු ආදීහුයි.

| | | |
|---|---|---|
| **153.** | **පුරා බුදුකුරු ද** | **ම්** |
| | **සව් සතුන් වෙත නො ව හි** | **ම්** |
| | **වඩවමිනි සුත පෙ** | **ම්** |
| | **පවතු විලසින් පොරණ රජද** | **ම්** |

**අන්වය** පහසුයි,

පා:- **'බුදුකුරුදම්'**- බුඩකාරකධර්මයි. ඔහු නම් පාරමිතා වෝයි.

2. **'නො ව හිම්'**- කොටසක් වෙන් කර ගත හොත් සීමාව කට පැමිණියේ වේ. එසේ නො ව හැමසතුන් කෙරෙහි එක සේ පුත්‍ර ප්‍රේම වඩනුයේ සීමාවට නො පැමිණේ.

3. **'සුතපෙම්'**- ධාර්මික රජකෙනෙකුට වූ කලී යටත් වැසි යෝ දරුවන් වැන්නහ. කාලිදාසයෝ ද,

"ප්‍රජානාං විනයාධානා-ද්‍රක්ෂණාද් භරණාදපි,
ස පිතා පිතරස්තාසාං-කෙවලං ජන්මහෙතවඃ"

(ප්‍රජාවන් හික්මවීමෙන් ද, රැකීමෙන් ද, පොෂණයෙන් ද, ඒ දිලීප රජතෙමේ වැසියන්ගේ පියෙක් වී ය. ඔවුන්ගේ පියවරු හුදක් ඔවුන් ඉපිදවීමට ම හෙතු වූහ—යනු භාවයි.) යනුවෙන් එය කීහ. එහෙයින් යටත් වැස්සන් කෙරෙහි පුත්‍ර ප්‍රේම වැඩිය යුතු ම ය.

151. සව්කොලෙස් මුල් සි ඳ
මනු බුදුබව ලබන ලෙ ඳ
දසපෙරුමන් පබ ඳ
සපුරමින් නිති පවතු මහර ඳ

අන්වය සුගමයි.

පඃ–**'සපුරමින්'**–'ස' පූර්‍ව 'පුර' ධාතුවෙන් නිපන් මිශ්‍රක්‍රියාපද යි.

155. අනත් දුක් අන නා
යන තිලකුණු නිති ප නා
මෙනෙහි කර පැව නා
සසරසයුරෙන් මිදෙව මහ නා

අන්වය සුගමයි.

පඃ–1. **"අනත් දුක් අනනා යන තිලකුණු"** **'අනත්'**–සියලු සංස්කාර ධර්‍ම හෙවත් හෙතුන්ගෙන් උපදනා ඵලධර්‍ම වූ ලොක යෙහි ඇතිනාක් සියල්ල ඉපිද නැති වීම අනිත්‍යලක්‍ෂණ යි. **'දුක්'**–ඇති ව නැති වන හෙයින් සියලු සංස්කාර දුක් සහිත වීම දුඃඛ ලක්‍ෂණයි. **'අනත්'**–ආත්මයයි පෙන්විය හැක්කක් නැති වීම හා තමන්ට කැමැති සේ සංස්කාරයන් පවත්වා ගත නො හැකි වීම ද අනාත්ම ලක්‍ෂණ යි. මේ තුණ සියලු සංස්කාරධර්‍මයන්හි ම පවත්නා සාමාන්‍ය ලක්‍ෂණයි. මොවුන් මෙනෙහි කිරීම විදර්‍ශනාභාවනා නම් වේ. මහත් වූ සසර සයුරෙන් මිදෙන්නේ විදර්‍ශනාභාවනා කිරී මෙනි.

2. **'නිතිපනා'**-මේ එක ම නිපාතපදයෙකැයි කිය යුතු වේ. 'නිති, පනා' යන නිපාත දෙදෙනාගේ යොගයෙන් නිෂ්පන්නයෙකි. මෙසින් අන්තන්හි 'පනා' යන්න වීප්සායෙහි වැටේ. දිනපනා, මාස්පනා' යනාදියෙහි මෙනි. නිත්‍යය නම් එකෙකි. වීප්සාව වනු යේ එකින් වැඩිගණන් පිළිබඳ ව ය. එහෙයින් 'නිතිපනා' යනු දුෂ්ට ය යි ද කියති. ආරම්භයෙහි දී මෙය අව්‍යක්තයන් අතර ම ව්‍යවහෘත බව නම් නිසැක ය. දැන් මෙය අව්‍යක්තප්‍රයොග යයි නො හළ යුතු තැනට පැමිණ තිබේ. 'සෙනඟ' යන තන්හි 'අඟ' සද මෙන් මෙහි 'පනා' යන්න ද විශෙෂාර්‍ථයක් නො දෙන ස්වාර්‍ථ මාත්‍රයෙහි යෙදුනු ශබ්දයෙකැයි ගැණීම යොග්‍යයි. 'පනා' යන්න 'ම' නිපාතයාගේ අර්‍ථයෙහි යොදා 'නිත්‍යයෙන් ම'යි කියන්නෝ ද, 'නිතිපනා' යන්න 'දිනපනා'යි වෙනස් කරන්නෝ ද ඇත්තාහ.

3. **'පැවැනා'**– 'පවත්' ධාතුයි. අනන්‍ය ඇකාරයට එලිසමය සඳහා ආකාරාදෙශයි.

4. **'මිදෙව'**– 'මුද' දයින් නිපන් ස්වයංකතෘ ස්වයංකාමී විධි ක්‍රියාපදයි. 'මුද' ධාතුව අකර්මක ද වේ. එවිට 'මිදේ, මිදෙත්, මිදිති' යනාදි වශයෙන් ඒ වරනැඟේ. එයින් 'මිදෙව' යන්න සිද්ධ යයි ගතොත් නිරුත්සාහික විධික්‍රියාපදයෙක් වේ.

**156.** **සක්රද මහ සතු ව**
**මෙලෙසින් අවවාද සො ව**
**එන ලෙස නරලොව ව**
**දිනි ය සමු[1] නොවිතර අදර සො ව**

**අන්වය** සුගමයි.

ප:– 1. **'දිනි'**–'දා (=දෙ)' දයින් නිපන් අතීතකාල කතෘකාරකාඛ්‍යාතයි. 'සක්රද' යනු එහි උක්තයයි.

**157.** **බසිමින් නරලොව ව**
**පැමිණ තම රජ සැපත ව**
**මතු බුදු වන ලෙස ව**
**දෙසි සදහම් සතන් තුමු සො ව[2]**

**අන්වය** සුගමයි.

ප:– 1. **'බසිමින්'**–දහම්සොඬ රජු ස්වශක්තියෙන් ම නර ලොවට නො බැස්සේ ය. අභිඥබලයක් නැතිහෙයින් එතුමෝ අහසින් යාමෙහි අසමර්ථයහ. සක්දෙව්රජ එතුමන් මිනිස් ලොවට ඇරලී ය.

2. **'දෙසි'**–දෙස් ධාතුවෙන් නිපන් අතීතාඛ්‍යාතයි. මෙහි උක්තය 'හේ' යි අධ්‍යාහාර කටයුත්තේ ය.

**158.** **විඳ රජසිරි නොම ඳ**
**පසක් සක්රජ මෙන් සො ඳ**
**රජදහම නො වැරැ ඳ[3]**
**විසි බෝසත් තුමා මනන ඳ**

**අ:**– පසක් සක්රජ මෙන් නොමඳ රජසිරි විඳ සොඳ රජදහම නො වැරැද මනනඳ බෝසත් තුමා විසී.

ප:–1. **'වැරැද'**– 'වරද– වැරැදුම්හි' දයින් නිපන් පෙරකිරි යයි.

2. **'විසි'**–'වස්' ධාතුවෙන් සිද්ධ අතීතාඛ්‍යාතයි.

**159.** **කළ කම් වූ විල ස**
**උපනුපන් හැන නො ව'ල ස**
**පුරා පෙරුමන් ද ස**
**ගෙවා සිවු අංසඛි කප් සුවහ ස**

---

1. සමු දැනිය. 2. පුරා පෙරුම් තිසිකොට 3. නො වහද.

**අන්වය** සුගමයි.

**ප:**-1. **'කල කම් වූ විලස උපනුපන් නැන'**-බෝසතුන් ගෙන් ද කුසල් අකුසල් දෙක ම සිදු වේ. කුශලවිපාකයන් ගෙන් සුගතීන්හි ද, අකුශලවිපාකයන්ගෙන් තිරිසන් ආදි දුගී තීන්හි ද බෝසත්හු උපදිති. බෝසත් තෙමේ තිරිසන් ව උපන් නමුදු හැකි තාක් පෙරුමන් අලස නො ව සපුරයි.

2. **'සිවු අසෙකි කප් සුවහස'**-මොවුන්ගේ විස්තර යට දක් වන ලදී. අසංඛ්‍ය නම් එකක් ළිස සතරක් කොසේ වේ දැයි ප්‍රශ්න යෙක් වේ. ස්ථාන සතරෙක්හි වූ අසඞ්ඛ්‍යය ගෙණ සතර ගැණේ ය යනු පිළිතුරයි. ඒ එසේ මැයි:-දීපඞ්කර, කොණ්ඩඤ්ඤ යන බුදුවරුන් දෙනම අතර මහාකල්පයෝ අසඞ්ඛ්‍යයහ. ඒ අතර බුදු කෙනෙක් පහළ නො වූහ. මෙ එක් අසඞ්ඛ්‍යයෙකි. කොණ්ඩඤ්ඤ, මඞ්ගල යන බුදුවරුන් දෙනම අතර බුදු කෙනෙකුන් පහළ නොවූ මහාකල්පයෝ අසඞ්ඛ්‍යයහ. මේ දෙවැන්නයි. සොභිත, අනෝමදස්සී දෙනම අතර ද මහාකල්පයෝ අසඞ්ඛ්‍යයහ. මේ තෙ වැන්නයි. නාරද, පදුමුත්තර දෙනම අතර ද මහාකල්පයෝ අසඞ්ඛ්‍ය යහ. මේ සිවු වැන්නයි.

**160.** **මේ බදුරු කපතු ර**
**පැසුළු ව කසුප් මුනිව ර**
**ගෝතම නම් පව ර**
**බුදු වී දම්සොඬ නිරිඳු පුවත ර**

**අ:**-මේ බදුරුකපතුර කසුප්මුනිවර පැසුළු ව පුවතර දම්සොඬ නිරිඳු පවර ගෝතම නම් බුදු වී.

**ප:**-1. **'බදුරු කප'**-මේ කල්පය බුදුවරුන් පස්නමක් පහළ වන හෙයින් භද්‍ර (යහපත්) කල්ප නම් වෙයි. කකුසන්ධ, කොණාගමන, කස්සප, ගෞතම, මෙත්තෙය්‍ය යනු උන්වහන්සේලාගේ නාමයි. මෙතේ බුදුහු මතු පහළ වෙති.

2. **'කසුප් මුනිවර'**-අවධි අර්ථයි.

**ස:**-අපගේ ගෞතම නම් වූ බුදුරජාණන්වහන්සේ දහම් සොඬ රජතුමන් බව මෙයින් දැක්වූහ.

මෙතෙකින් දහම්සොඬසිරිත නිමවී ය. මේ බෝසත් සිරිත ඇසූවන්ට ශුභප්‍රාර්ථනා කරණුවෝ අනන්තර පද්‍යය කියති.

**161.** **මහබෝසත් සිරි ත**
**අදර ව ඇසූ සවි ස ත**
**දූ ජරා මර මු ත**
**වෙසෙත්වා ලැබ නිවන්සම්ප ත**

**අන්වය** සුගමයි.

ප:-1. **'මහබෝසත්'** -බොධිසත්ත්වයෝ තුන්වැදෑරුම් වෙති: මහා බොධිසත්ත්වය, ප්‍රත්‍යෙකබොධිසත්ත්වය, ශ්‍රාවක බොධිසත්ත්වයයි. මහා බොධිසත්ත්ව තෙමේ සර්ඥතාඥාන ය සඳහා පෙරුම් පුරයි.

2. **'සව්සත'**-සමූහාර්ථයෙහි එක වචනයි. නොහොත් බහු වචන ප්‍රත්‍යය ලුප්තයි. ''වෙසෙත්වා'' යන බහුවචනාන්තක්‍රියාවෙහි උක්තකාර්‍ය පදයි.

3. **'වෙසෙත්වා'**-'වස්' ධාතුයි.

දැන් කාර්‍යපිත්‍ෘනාමසඳග්‍රීහය කරන්නාහු "සව්සතර" යනාදීන් කියත්.

**162.** **සව් සතර සමුදු** ර
**නැණ නැවින් දුටු පරතෙ** ර
**දහම් දජ පඬව** ර
**නදන වූ පරසිදු මෙදියතු** ර

අ:-සව්සතරසමුදුර පරතෙර නැණනැවින් දුටු දහම්දජ පඬිවර නදන වූ මෙදියදුර පරසිදු—

ප:-1. **'නදන'**-'නන්දන' ශබ්දයෙන් නිපන්නයි. ඒ පුත්‍ර වාචී ද වෙයි. මේ කාව **කුසදා** කාවෙහි පැණෙනුයේ මෙසේ යි:—

"නෙවලා දම් සයු ර-නැණ නැවිනි දුටු පර තෙ ර
**තිස්වැලි** ගඹ පව ර-**දහම්දජ** පඬි නදන ගරුත ර"

**163.** **අලගිය වන්න** නම්
**මූකවෙටි තුමා ගුණ** තුම්[1]
**දකිනුව[2] සසර** හිම්
**මෙකාව කොළෙ හෙළුබසින් මන** රම්

**අන්වය** සරලයි.

ප:-1. **'සසරහිම්'**-සංසාරයෙහි සීමාව නම් නිර්වාණයයි. හෙ ද පින් ඇතියන්ට ය. පින්නැත්තන්ට සසරහිමකුත් නැත් තේ ය. මෙහි 'හිම්' සද 'අන්ත' වාචී සේ ගැණිම යුතු ය.

ස:-අලගියවන්න මූකවෙටි තුමන් විසින් නිවන් දකිනු සඳහා මේ කාව්‍යය කළ බව මෙයින් සූචිතයි.

**පරිකථාසහිත දහම්සොඬකාව නිමි.**

---

1 මූකවෙටි ගුණැති නැණතුම්　　2 දකිනව-කුසද

# උපග්‍රන්ථය.

## දහම්සොඬකවිසන්නය.

### "නමො බුද්ධාය."

(පරිකථාවෙහි අන්වය දක්වූ පද්‍යයන්ගේ පදගතාර්ථ ද, තදන්‍ය පද්‍යයන්ගේ පද්‍යාර්ථය සමග අර්ථ ද මෙහි දක්වනු ලැබේ.)

1. ශ්‍රාවක නමැති දෙව්දුන්නෙන් විරාජිතවූ තීක්ෂ්ණ නමැති මකරන්දය ප්‍රවර්ෂිත කළාවූ ක්ලේශ නමැති රජස මර්දනය කොට හැරියාවූ සුගත නමැති මේඝරාජයාට ආදරයෙන් නමස්කාර කරමි.

2. මොක්ෂසඞ්ඛ්‍යාත වෙලායෙන් දීප්තිමත්වූ මාර්ගඵල නමැති මධුරජලයෙන් යුක්තවූ මහාශ්‍රාවක නමැති පක්ෂීන් විසින් සේවනය කරණලද සද්ධර්මමහාගඞ්ගාව මස්තකයෙහි සජ්ජිත කරමි.

3. නිර්මල මුනිචන්ද්‍රයා සේවනය කළ සඞ්ඝ නමැති නභස්තලයෙහි විජෘම්භිතවූ ශීලකාන්තියෙන් උජ්ජ්වලිතවූ මහාසඞ්ඝයා නමැති තාරකාවලිය නිත්‍යයෙන් නමදිම්.

4. පඤ්චාක්ෂිය, සහස්‍රාක්ෂිය, අෂ්ටාක්ෂිය, ත්‍රිනේත්‍රය, ද්වාදශනේත්‍රය, ජගන්නේත්‍රය, කමලනේත්‍රය යන මොහු දිව්‍යනේත්‍රය මෙහෙයා ජනසමූහයා රක්ෂා කොට දෙත්වා.

5. බඹඋපතින්- බ්‍රහ්මොත්පත්තියෙන්, සැපත්- සම්ප්‍රාප්තවූ, මහාසම්මතරජගොත්- මහසම්මතරාජවංශ නමැති, නුබතලමැද- නභස්තලයාගේ මධ්‍යයෙහි, දිමුත්- දීප්තිමත්වූ, සරාපුන්සඳමඬල් සිරි- ශරච්චන්ද්‍රමණ්ඩලශොභාව, ගත්- ග්‍රහණය කළ;

6. භුවනෙකබාහු නාමයෙන් යුක්තවූ ප්‍රවර නරෙන්ද්‍රයාගේ චිත්තග්‍රහණය කොට බොහෝ ස්ථානාන්තර ලැබුවාවූ සකලස්ථානයන්හි ප්‍රසිද්ධ වෙමින් විජෘම්භිතවූ;

7. බොහෝ ක්ෂෙත්‍රවස්තු යුක්තවූ මනොනන්දනීය සකල ශ්‍රීයෙන් සජ්ජිතවූ සජ්ජනයන් නිරන්තරයෙන් රඤ්ජිතවූ සුන්දරවූ පාණබුනු කෝරළය සම්බන්ධවූ;

8. 'මාම්පා' නමැති සාර පවිත්‍ර ප්‍රදෙශයට ස්වාමි වන්නාවූ ශ්‍රෙෂ්ඨවූ විජයධ්වජ නම්වූ පලිහවඩන මන්ත්‍රීන්‍ද්‍රයාගේ නප්තෲවූ;

9. කෙසර සිංහයෙකු සේ ශත්‍රුරාජනමැති හස්තීන්ගේ දළිය භග්න කළාවූ සූර්‍ය්‍යවංශ නමැති ප්‍රාසාදයාගේ මස්තකයෙහි කොතු වක් වැනිවූ රාජසිංහරාජයාගේ පාදච්ඡදනයෙහි වැඩුනාවූ;

10. අමෘතාකාරයා සමාන කීර්තියෙන් යුක්තවූ සද්ගුණ රත්නයන්ට ආකරයක්වූ කාරුණිකවූ මේ සමරදිවාකර නම් අධි කරණනායක මන්ත්‍රීන්ද්‍රතෙමේ;

11. ගුණ නමැති අමෘත රශ්මියෙන් ජනමානස කුමුදයන් ප්‍රබුද්ධ කොට ස්වවංශසංඛ්‍යාත ගගනමධ්‍යයෙහි සකලකාලයෙහි පූර්ණචන්ද්‍රශ්‍රියෙන් බබලයි.

12. මොක්ෂසම්පත්තිය ම ප්‍රාර්ථනා කොට චිත්තය පුණ්‍යයට ම නම්න කොට (=නමා) බුද්ධරූප චිත්‍රිතවස්ත්‍ර හා ප්‍රතිමාවන් ද කරවා සිත්කලුවූ ත්‍රිපිටක ධර්මය ලෙඛනය කරවී.

13. මෘෂාවාදය ද සුරාමෙරය ද ඝොරවිෂ මෙන් මුඛයෙහි මුක්ෂණය නො කර යි. (=නො තවරයි). අන්‍යසන්තක ධන සමූහය ශර්කරා ලොෂ්ටයන් මෙන් සකලකාලයෙහි චින්තනය කෙරේ.

14. ලොව- ලොකයෙහි, හැමතැන-සකලස්ථානයෙහි, විතත- විසතිණිවූ, පුන්සිසිකැලුම් එකයුත- පූර්ණචන්ද්‍රකාන්තියක් මෙන්, හිතාහිත සත වෙත- විරුද්ධා විරුද්ධ (සකල) සත්ත්වයන් කෙරෙහි, එකරහට- එකාකාරයෙන්, මෙත්සිත- මෛත්‍රීචිත්තය, පතුරුවයි- ඵරණය කෙරෙයි.

15. ව්‍යවහාරවචනය හෙවත් අධිකරණ වචන හෝ පුරාතන අධිකරණවිනිශ්චයයන් ශ්‍රවණය කොට චතුර්විධ අගතිදොෂයන් අවබොධ කොට හංසයා ක්ෂීරයෙන් ජලය පෘථග්භූත කළාක් මෙන් විනිශ්චය කොට සත්‍ය ඝොෂාව පැවැත්වී ය.

16. මහාබ්‍රහ්මයා විසින් රූපශ්‍රිය, ගුණධර්මය, ඥානය, කීර්තිය, වික්‍රමය, ප්‍රදානය දැයි යන මේ සකලගුණයන් එකීභූත කොට මේ මන්ත්‍රීශ්‍රෙෂ්ඨයා මවනලද්දක් මෙනි.

17. මේ මන්ත්‍රීන්ද්‍රචන්ද්‍රයා ප්‍රවරවූ සර්වඥ රාජයාගේ පූර්ව චරිතයක් ශ්‍රවණය කරණු පිණිස ආදර කොට ආරාධනය කරණ ලද හෙයින්-

18. චිත්තය අනන්‍යවිහිත කෙරෙමින් ශ්‍රවණය කළ සත්ත්වයන්ට මනොඥවූ ස්වර්ගී අපවර්ගී සම්පත්තිය දානය කරණ ධර්මශෞණ්ඩ ප්‍රවෘත්තිය පද්‍යබන්ධනය කොට කථනය කෙරෙමි.

19. ඥනප්‍රබන්ධඇති ව්‍යක්තයෙහි, මේ කෘතියෙහි දෝෂයක් දර්ශනය කළත්, (එය) වර්ජනය කොට සර්වඥයන්ගේ ගුණයට ප්‍රසන්නව භක්තියෙන් ශ්‍රවණද්වයය අවනත කොට එතද්දිනයෙහි ශ්‍රවණය කරව්.

20. ප්‍රසිද්ධ වූ මේ මහා භද්‍රකල්පයෙහි තෘතීය අන්තඃකල්පයෙහි ලොකයෙහි ප්‍රාදුර්භූතවූ පුණ්‍යයෙන් සාරවූ මනොහරවූ කාශ්‍යප සර්වඥයන්වහන්සේ;

21. දෙතිසක් ලකුණෙන් ද- ද්වාත්‍රිංශන්මහාපුරුෂලක්ෂණයන්ගෙන් ද, සවන්ගනබුදුරැසින් ද- ෂඩ්වර්ණඝනබුද්ධරශ්මියෙන් ද, කොත්මල්ලකරින් ද- කෙතුමාලාලඞ්කාරයෙන් ද, විසිරියන් බඳින් ද- විංශතිරත්නනමිත ශරීරයෙන් ද, බබලමින්- භ්‍රාජමාන වෙමින්;

22. විපුලවූ සංසාරසාගරයෙහි ප්‍රවිෂ්ට ව පරතීරය අඥාත වූ චතුර්විංශතිඅසඞ්ඛ්‍යයක් සත්ත්වයන් ශ්‍රීමත්වූ මොක්ෂපුරයට ප්‍රාපණය කර;

23. සත්ත්වයා කෙරෙහි ප්‍රසන්නතවූ ඍජුවූ චතුර්විධබ්‍රහ්මවිහාරයෙන් මෘදුවූ ප්‍රසිද්ධවූ ඒ මුනීන්ද්‍රචන්ද්‍රයා වර්ෂවිංශතිසහස්‍රයක් ම වාසය කෙළේ.

24. මෙරුශිඛියෙහි භ්‍රාජිත ව නිර්වෘත ව ගියාවූ ප්‍රදීපයක් මෙන් ඒ සර්වඥයන්වහන්සේ පිරිනිවන් පෑකල්හි මනොඥසර්වඥශාසනය පරිහීන වී ය.

25. අතිවිශිෂ්ටවූ සකලෛශ්වර්‍ය්‍යී හෙතුවින් ත්‍රයත්‍රිංශද්දිව්‍යපුර ශොභාවෙන් දෘෂ්ට (දක්නාලද්ද)වූ සාධුජනයන්ට වාසස්ථානවූ බාරාණසී නාමයෙන් නගරයෙක් වූයේය.

26. තුඟුගෝපුර පෙණ කර- උස්වූ ගොපුර නමැති එණය කොට, නන- අනන්තයා විසින්, ලූ- ප්‍රක්ෂිප්තවූ, දරණවැලයුර- භොගාවලියක් වැනිවූ, එපුර- ඒ නගරයෙහි, පිළිමිණිවුර-ස්ඵටික මණිප්‍රාකාරය තෙම, හැමවර- සර්වාරයෙහි, සුරපුරහිමි ව- දිව්‍ය ලොකය සීමා කොට ඇත්තක් ව, දිලෙයි-ශොභමාන වේ.

27. සහගුම්බිගු- ඝොෂසහිත භෘඞ්ගයන් විසින්, වතළ- විස්තෘතවූ, තඹර- තාමරසයන්ගෙන්, පිරි- පූර්ණවූ, පිරි- පරිඛා තොමෝ, සුලසාළ- සඩලඞ්කෘතවූ (මොනවට සැරහුනු), පුරඹ- පුරාඞ්ගනාවන්ගේ, මහවුරුකුළ- මහාප්‍රාකාර නමැති ජඝනයෙහි, අනුබඳ- නිරන්තරයෙන්, බඳ-බද්ධවූ, රසන්වැල- රසනාදමය, රුපැයි- ගෙණඇර දක්වී.

28. පහසොතග රුස්- ප්‍රාසාදශෘඞ්ගාග්‍රරශ්මිය, වැද- ස්පෘෂ්ටව, පුරඹර-නගරාම්බරයෙහි, දිසි- පෙණුනු, සුපුන්සඳ- සම්පූර්ණ චන්ද්‍රයා, රන්මිණියට- සවර්ණමණිමයයෂ්ටියෙක්හි, වොරද- විරාජිතවූ, සේසත එව්- ශ්වෙතච්ඡත්‍රයක් මෙන්, දනමනනුවන්- ජනයන්ගේ චිත්තනෙත්‍රයන්, බඳ- බද්ධ කෙළේයි.

29. ජ්වලිතවූ ඉන්ද්‍රනීලමණිභූමියෙහි ප්‍රතිබිම්බිත ව පෙණුනු ධ්වජවලිය කාලින්දීගඞ්ගාවෙහි ක්‍රීඩා කළාවූ අප්‍රමාණවූ මත්ස්‍යසමූහයාගේ විලාසය ප්‍රකට කෙළේය.

30. පහග- ප්‍රාසාදාග්‍රයෙහි, රත්මිණිරුස- රක්තමාණික්‍ය රශ්මිය, වැද- ආහත ව, රත්- රක්තවර්ණවූ, තරිඳු- තාරෙන්ද්‍රයාගේ, මැද-මධ්‍යයෙහි, සස- ශශතෙමේ, බෝසත්- බොධිසත්වයන්, සස දවස- ශශක ව උපන්කාලයෙහි, ගිනිරුස්මැදට- අග්නිරශ්මිමධ්‍යයට, පැනිලෙස- පතනය කළ ආකාරය, රුපැයි-ප්‍රකාශ කෙළේ.

31. ඒ නගරයෙහි මණිභිත්තීන්හි දක්නාලද නෘත්‍යග්‍රහණය කළ නාටිකාවගේ ප්‍රතිබිම්බයෝ ප්‍රතිමල්ල වෙමින් ආගමනය කොට නෘත්‍ය කරණ කාන්තිමත් දිව්‍යාප්සරාවන් වැනි වෙති.

32. ඒ නගරයෙහි සඤ්චාරය කරණ කාන්තාවෝ හසන අධර යන්ගෙන් අනඞ්ගයාගේ තෙජස ද, දන්තනබරශ්මීන් කීර්තිය ද, අපහාස්‍යනිරීක්ෂණයෙන් බාණයන් ද, ප්‍රකාශ කළාහුය.

33. සලෙලු මුවසැළ- රසිකජන නමැති මෘගසමූහයා, එපුර නතන්ගේ- තත්පුරාඞ්ගනාවන්ගේ, දුල- ජ්වලිතවූ, නෙත්කැලුම්- නෙත්‍රකාන්ති නැමැති, දැල- ජාලයෙහි, දැවටී-වෙෂ්ඨිත ව, මඳහස පණින්- මන්දහාස්‍ය නමැති පණියෙන්, ඇකිල- ආස්ඛලිත ව, යා නො හී-ගමන් කළ නො හැකි ව, සිටිති-ස්ථානය කෙරෙති.

34. රතදරිනි නාලිය- රක්තාධරයන් කරණකොට නාගපල්ලවයන්වූ, ගමනින් නාලිය සදිසි- ගමනයෙන් හස්තිනීන් වැනිවූ, එපුරසරණා ලිය-ඒ නගරයෙහි හැසිරෙණ කාන්තාවන්, වණාලිය- වර්ණනා කරන්නට, කවුරු නම්- කතරකෙනෙක් නම්, හැකිවෙති- සමර්ථවෙත් ද?

35. (තම්හ නො ව) තිකුළුපෙයොධර යුග්ම ඇති මූර්තියෙන් ග්‍රහණය කටහැකි කෘශමධ්‍යභාග ඇති මේ සමස්ත ලොකය අසීශවූ කාන්තාවන් අවස්ථානය කරණ වනිතාශාලාවෝ සුසජ්ජිත වූහ.

36 මල්පලුපල දරූ- පුෂ්පඵලපල්ලවයන් ධාරණය කළ, නදදෙනකොවුල්බමර- නාදකරණ කොකිලයන් හා භෘඞගයන් ඇති, රිවිකිරණ ඇවුරූ- සූයයීරශ්මි ආවරණ කළ, එපුර ගෙවු යන්- ඒ පුරයෙහි ගෘහොද්‍යානයන්, කවුරු- කවරයෝ, වණනි- වණිනා කෙරෙත් ද?

37. ඒ පුරයෙහි මහාස්කාන්තවූ කාන්තාවන් ක්‍රීඩා කරණ මරාලයන් හා මධුලොලයන් කූජනය කරණ නිම්ල ශීතජලයෙන් පූණිවූ ගෘහදීර්ඝිකාවෝ ප්‍රමාණ කිරීමට නො හැක්කහ.

38. එහි- ඒ පුරයෙහි, උස් කුඹුදළදළිත- උන්නතවූ කුම්භස්ථලය දෑස් (දසණ) දන්තය යන මෙයින් ද, දෙරණ- ධරණියෙහි, සුපිහිටි- සුප්‍රතිෂ්ඨිතවූ, සතඟින- සප්තාඞ්ගයෙන් දිසි යන, සොබනලකුණෙන්- ශොභනලක්ෂණයෙන්, යුතු- යුක්තවූ, මහගසෙන්- හස්තිසෙනාවෝ, හැමදින සරති- සකලකාලයෙහි හැසිරෙති.

39. පස්කලණයුතු වන- පඤ්චකල්‍යාණයකින් යුක්ත වන් නාවූ, මහරුලකුණින් බබලන- මහාර්ඝලක්ෂණයෙන් භ්‍රාජමාන වන, කෙසරුන් මෙන් පනින- සිංහයන් මෙන් උල්ලඞ්ඝනය කරණ, තුරඟසෙන්,- තුරඞ්ගසෙනාවෝ, නිතියෙන- නිත්‍යයෙන්, එහි- ඒ නගරයෙහි, සරති-සඤ්චාරය කෙරෙති.

40. එපුර- ඒ නගරයෙහි, ලෙලරන්රිදිදද- ලීලොපෙත සවණිරජතධ්වජඇති, මනනද සුදු සිදු යෙදූ- මනොඥශ්වෙත සෛන්ධවයන් යොජිතවූ, රිය- රථයන්ගේ, සක්නද- චක්‍රනාදය, දිගත විනිවිද දිශාන්තයන් විනිවේධනය කොට, පැතිර පවතී- ව්‍යාප්ත ව ප්‍රවෘත්ත වේ.

41. වික්‍රම හෙතුවෙන් ගගනයෙන් භූමියට අවතීණිවූ මහාසෙන දෙවියා සදෘශවූ මහත් භටසෙනාංහාමෝ ශත්‍රුසෙනාවන් ජයග්‍රහණය කොට (පරදවා) ඒ නගරයෙහි සඤ්චාරය කෙරෙති.

42. සුදනන්ගෙන්- සජ්ජනයන්ගෙන්, දිමුත්- දීප්තිමත්වූ, එපුරෙහි- ඒ නගරයෙහි, සියලුසම්පත්-සකල සම්පත්තින්, වණන- වණිනය කරත් හොත්, අනන- අනන්තයා ද, නරඹන හොත්- නිරීක්ෂණය කරත්හොත්, සක- ශක්‍රයා ද, මූත්- හැර, කවුරු- කතර නම් කෙනෙක්, පොහොසත්- සමර්ථ වෙත් ද?

43. ඒ නගරවරයෙහි කිසියම් දුර්ගුණයක් ජානනය නො කළාවූ සඞ්ඝයා කෙරෙහි පැතුරුණු මෛත්‍රියෙන් යුක්තවූ බුහම දත්ත යන නාමයෙන් ප්‍රසිද්ධ වූ මහිපාලයෙක් උපන්නේ ය.

44. ඒ රාජයාගේ යශඃප්‍රබන්ධය (සමූහය), දිගන්තයන්හි එකාකාරයෙන් ව්‍යාප්ත වන කල්හි ප්‍රසිද්ධ ඒ විෂ්ණු තෙමේ ක්ෂීරසාගරයාගේ ද නීලවර්ණ සාගරයාගේ ද වෙනස පරිච්ඡේද කොට අවබොධ නො කෙළේසි.

45. නවමෙඝකුළ එව්- අභිනව මෙඝකූටයක් මෙන්, දුල- ජ්වලිතවූ, තුඟු- උස්වූ, අතුල් මහත්වූ, අඳුන්ගිරිකුළ- අඤ්ජනකූට පර්වතය තෙමේ, ඔහු- ඒ රාජයාගේ, පළ- ව්‍යක්තවූ, හෙල- ධවලවූ, යසිනි- කීර්තියෙන්, කෙලෙස්ගිරිරදවිලස්- කෛලාස පර්වතරාජයාගේ විලාසය, පළ කළ- ප්‍රකට කෙළේ ය.

46. ඒ වීරයාගේ ව්‍යප්තවූ ව්‍යක්තවූ ධවලවූ යශස ආකාශ ගඞ්ගා නමැති යෂ්ටියෙහි ජ්වලිතවූ ජගත්පර්‍ය්‍යන්ත කොට ඡායාව කළාවූ බ්‍රහ්මමස්තකයෙහි ශ්වෙතච්ඡත්‍රයක්හුගේ විලාසය කෙළේසි.

47. ඒ රාජයාගේ තෙජොලක්ෂණ දවාග්නිය දශදිශාවන්හි එකාකාරයෙන් ධාවනය කරණ කල්හි ඊශ්වර තෙමේ සන්ධ්‍යා වලාහක සන්දෙහයෙන් නෘත්‍ය කොට වඤ්චිත වී ලු, ඛෙදයෙකි !

48. ඒ රාජයාගේ සන්බන්ධතෙජො ලක්ෂණ ග්‍රීෂ්මයෙන් ශත්‍රු වනිතාවන්ගේ පයොධරලක්ෂණ ස්වර්ණහංසයෝ චූචුක නමැති වඤ්චූන් ඌර්ධ්වමුඛ කොට ස්ථාපනය කෙරෙමින් ඒ ශත්‍රුවනිතාවන්ගේ වක්ෂස්ස්ථල නමැති තඩාගයෙහි නිමග්න වූවන් මෙනි.

49. එරජුගේ තෙජස් නැමැති වහ්නිමණ්ඩලයෙන් රෞද්‍රවූ රිපුකානනය භස්ම කරණකල්හි ශත්‍රුවනිතාවන්ගේ (රොදන යෙන්) රක්තවර්ණ වූ නෙත්‍රය ඒ වහ්නියෙන් උද්ගතවූ විස්ඵුලිඞ්ගාකාරයෙන් වූයේය.

50. ඔහුගේ තෙජොග්නිය ප්‍රජ්වලිත නො වී දිශාන්තයන්හි ව්‍යප්ත ව දිශාඞ්ගනාවන්ගේ පයොධරමණ්ඩලයෙහි ප්‍රභායෙන් උජ්ජ්වලිතවූ කුඞ්කුමාඞ්ගරාගශොභාව ප්‍රකාශ කෙළේය.

51. ඔහු- ඒ රාජයා, කගමේ-ඛඩ්ගනමැති මෙඝය, නඟන- උද්ගත කරණකල්හි, රුපඹුබැමසිකි- ශත්‍රුවනිතාවන්ගේ භ්‍රූ නමැති මයූරයා, නලළත- ලලාට නමැති, රන්ගිරිඅතලමත- ස්වර්ණපර්වත ස්ථලමස්තකයෙහි, කියඹු- අලක නැමැති, සඳපිල්කැල- චන්ද්‍රාක්ෂි පුච්ඡ සමූහය, විදගත-විසතීර්ණ කර ගත්තේය.

52. එතිරිඳු- ඒ නරේන්ද්‍රතෙම, ගැමදවස- සියලු දිනයන්හි, විතරණ විකුම් සබවස- ත්‍යාග වික්‍රම සත්‍යවචනයන්, එනමන් දිවි විලස- ස්වකීය ජීවනය සේ, නුවණින් යෙදී- ඥානයෙන් යුක්ත ව, නිසිලෙස- යොග්‍යාකාරයෙන්, රකි- රක්ෂා කෙරේ.

53. එනරවර සුරතුරු- ඒ නරේන්ද්‍ර නමැති කල්පවෘක්ෂය, වැලඳි- ආශ්ලෙෂ කළාවූ, කප්ලිය එකයුරු- කල්පලතාවක් බඳුවූ, සුරූ- මනාරූප ඇති, කැත්කුලඟනක්- ක්ෂත්‍රිය කුලාඞ්ගනාවක්, අගබිසෝනතුරු- අග්‍රමහිෂිස්ථානාන්තරයට, සැපත්වූ- සම්ප්‍රාප්ත වූවා ය.

54. නෙත්අට- මහාබ්‍රහමයා, සිරිරති- ශ්‍රී දෙවිය හා රතිය, පළමු කොට- ප්‍රථමයෙන්; මවා- නිර්මාණය කොට, බලමින්- නිරීක්ෂණය කොට, රුසිරුගුණ- රුචිරගුණයන් නොහොත් රූපශ්‍රීගුණයන්, කැටි කොට- එක රාශි කොට, යළි- නැවත, මෙලඳ- මේ කාන්තාව, මනතුට- චිත්තප්‍රීතියෙන්, මැවූ වැනි- නිර්මාපණයකරණ ලද්දියක වැනිය.

55. වක්ත්‍රයෙන් චන්ද්‍රයා වැනිවූ පාපයෙන් නිවෘත්ත ව පවත්නාවූ උජ්ජ්වලිත දෙහයෙන් යුක්ත ඒ කාන්තාව අනෙක රාජාඞ්ගනාවන්ගේ ලලාටයෙහි තිලකාභරණයෙකි.

56. විශිෂ්ටවූ ශරීර සෞන්දය්‍යශ්‍රීයෙන් ප්‍රත්‍යක්ෂ ශ්‍රී කාන්තාව මෙන් දෘශ්‍යමානවූ නිර්දෙෂ කුලධර්මයන් රක්ෂා කළාවූ ප්‍රවරගුණ යුක්තවූ ඒ රාජ්ඤියගේ කුක්ෂියෙහි,

57. දානශීලාදි විශෙෂ ඇත්තා වූ සමත්‍රිංශත්පාරමිතාවන් පූරණය කරණ තුන්ලොවට එක ම චක්ෂුසක් වැනි පුණ්‍යරාශි ඇති බොධිසත්වොත්තමයා පිළිසිඳගත්තේ ය.

58. මෙඝකූටයකින් නිෂ්ක්‍රාන්තවූ දෙෂරහිතවූ චන්ද්‍රමණ්ඩලයක්මෙන් සමවූ දශමාසය පූර්ණ ව ඒ කුමාරොත්තමයා මනොඥකාරයෙන් වහිර්භූත වී හෙවත් උපන්නේය.

59. ඒ බුද්ධාඞ්කුරයා වහිර්භූත වන කල්හි සකල ලෝකවාසි ජනයෝ හෘදයාභ්‍යන්තරයෙහි සද්ධර්මලක්ෂණ හෙවත් සද්ධර්මසංඥ උද්වහනය කළහ. ඒ හෙතුවින් ඒ කුමාරතෙමේ ධම්මසොණ්ඩ යන නම ඇත්තේ වීය.

60. සාරවූ රූපශ්‍රියෙන් යුක්ත ව මාතෘපිතෘන්ගේ ප්‍රෙමසාගරය නිරන්තරයෙන් ඔජොභූයිෂ්ඨ කෙරෙමින් අභිනව චන්ද්‍රශොභායෙන් ඒ කුමාරතෙමේ වෘද්ධ වීය.

61. සිප්සැටකලාව ද- සූසැටකලාශිල්ප ද, මනනඳ- මනොඥ වූ, දසටක් පොරණ- අටළොස් පුරාණග්‍රන්ථ ද, නෙක අවිසිල්පය ද- අනෙකවිධආයුධශිල්පය ද, එකුමරු- ඒ කුමාරයා, නැණින්- ඥාණයෙන්, පිරිසිඳ-පරිච්ඡෙද කොට, ඉගෙණ- උද්ග්‍රහණය කොට,

62. සුගුණමිණිමුහුදු ව- සද්ගුණනාමැති මණීන්ට සාගරය ව, සතසතන්කොඳ- සත්වචිත්තසන්තානනාමැති කුඳයන්ට, නරිඳු ව- චන්ද්‍රයා ව, සිරිසඳට- ශ්‍රීකාන්තාවට, උවිඳු ව- උපෙන්ද්‍රයා ව, මුළුදඹදිවිහි- සකල ජම්බුද්වීපයෙහි, පසිඳු ව- ප්‍රසිද්ධ ව, විසී- වාසය කොළේය.

63. පෙරඬමස- පූර්ණිමාසයෙහි, සඳලෙස- චන්ද්‍රයා සේ, දින දින- දවස් පතා, තිසිලෙස-යොග්‍ය සේ, වැඩී-වෘද්ධ ව, සොළොස් වස- ෂොඩශනමවර්ෂයට, පැමිණෙන- ප්‍රාප්තවන කල්හි, කුමරු- ඒ කුමාරයා, දක- දර්ශනය කොට, රජ- පිතෘරාජතෙමේ, සහතොස වෙමින්- සන්තුෂ්ට වෙමින්,

64. කිඹකර අමාත්‍යවරයන් සමග සාරවූ චතුරඞ්ගිණීසෙනාව ද සකලෛශ්වර්‍ය්‍යයෙන් සමග යුවරාජස්ථානාන්තරය ද සමර්පණය කොළේය.

65. ඒ කාලයෙහි පටන් සකලාවස්ථාවෙහි සතිසවපජකඳයෙන් යුක්ත ව සපිත ව සකලලොකවාසිසත්වයන් තුෂ්ට කොට සව නෙත්‍රයුග්මය සේ රක්ෂා කොරේ.

66. පියරදඇවෑමෙන්- පිතෘරාජයාගේ අත්‍යයෙන්, පෙර රජදහම්- පූර්වරාජධර්මය, පිළිපැද- ප්‍රතිපාදනය කොට, මිණිකිරුළ- මණිමයකිරීටය, ඉස පැලඳ- ශීර්ෂයෙහි ප්‍රසාධනය කොට, දඹදිව් තලට- ජම්බුද්වීපතලයට, අගරද වී ය- අග්‍රරාජ වූයේය.

67. දසවූ චතුරුපාය නමැති පාදයන් ඇති අවකාශරහිත ව වචන නමැති මදජලය වහනය වන ධර්මනමැති ශුණ්ඩාදණ්ඩයකින් යුක්තවූ වාරණයෙකුගේ ශ්‍රිය ධර්මශෞණ්ඩරාජතෙමෙ උද්වහනය කොළේය.

68. ජම්බුද්වීප නමැති ක්ෂෙත්‍රයෙහි යශොලක්ෂණ බීජයන් වික්ෂෙපණය කොට සම්බද්ධවූ තෙජසින් යුත් ආඥනැමැති වෘෂ්ටිය සපිර කොට කරුණාලක්ෂණජලයෙන් ආර්ද්‍ර කොට සන්තුෂ්ටව රක්ෂණය කොරේ.

69. සතරක් උපායෙන- චතුර්විධ උපායයන්ගෙන් ද, තුන් සත්- ත්‍රිවිධශක්තියෙන් ද, සතගින- සප්තාඞ්ගයෙන් ද, සිවුසඟරු වතින- චතුර්විධසඞ්ග්‍රහවස්තූන්ගෙන් ද, වෙසෙසින- විශෙෂයෙන්, යුතු ව- යුක්ත ව, ලොව- ලොකය, රැක- රක්‍ෂණය කොට, වෙසේ- වාසය කෙරේ.

70. අපගේ මේ මහාසත්‍වතෙමේ තමන්වහන්සේ රාජ්‍යශ්‍රියට පැමිණි සමලපදිනයක් අභ්‍යන්තරයෙහි ශ්‍රිශයනමස්තකයෙහි නිෂණ්ණ ව ඉදම්ප්‍රකාරයෙන් චින්තනය කලේය.

71. සංසාරයෙහි චාරිකා (හැසිරීම) කරන්නාවූ සත්‍වයන් කෙරෙහි මෛත්‍රියෙන් හා කරුණාවෙන් මේ අපගේ සර්‍වඥයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දාවූ අමෘතය වැනිවූ නිර්‍වාණ නගරයට ප්‍රාපණය කරන්නාවූ;

72. මුනි- සර්‍වඥයන්වහන්සේ, නැණදර- ඥාන නැමැති පෘථිවියෙහි, පිහිටි- ප්‍රතිෂ්ඨිතවූ, මගපලඅමා- මාර්ගී ඵල නිර්‍වාණ නැමැති, පලබර- ඵලභාර ඇති, බවගිමිත- සංසාරග්‍රිෂ්මය, දුරහළ- දූරීභූත කළාවූ, පුවතර- පෞඪවූ, සුරතුරෙක- දිව්‍යවෘක්‍ෂයක්හුගේ, සිරි- ශොභාව, රැගත්- ග්‍රහණය කළාවූ,

73. මෙබඳුගුණ- උක්තප්‍රකාරගුණ ඇති, සදහම්- සද්ධර්‍මය, නො ම දැන- අවබොධ නො කොට, සැලකුම් නො කර-ප්‍රත්‍යවෙක්‍ෂා නො කොට, කරණ- ක්‍රියමාණ වූ, මේ රජකම්- මේ රාජකර්‍මය, අහෝ- අනේ, අපහට- අසමතුන්ට; තරම් නො වේ- යොග්‍ය නො වෙයි.

74. වෙලනැති- වෙලාරහිතවූ, සයුර මෙන-සාගරය මෙන් ද, රිවිසඳු නැත්- සූර්‍ය්‍ය චන්ද්‍රයන් රහිතවූ, අහස මෙන ආකාශය මෙන් ද, පහන නිවි- ප්‍රදීපයක් නිර්‍වෘතවූ, ගෙය මෙන- ගෘහයක් මෙන් ද, යුවල දළ නැති- දංෂ්ට්‍රායුග්මහීනවූ, මතගිජිඳු මෙන- මත්ත හස්තිරාජයක්හු මෙන් ද;

75. කමල නැති- පද්මරහිත වූ, විල මෙන- තඩාගය මෙන් ද, තරලමිණ නැති- තරලමණිහීනවූ, හර මෙන්- හාරය මෙන් ද, ගඟණ සුන්-ජිහ්වාඝ්‍රාණය ඇති, වත මෙන- වක්ත්‍රය මෙන් ද, දහම් නැති- ධර්‍මයෙන් හීනවූ, ලොව- ලොකය, සසොබන නො ඉවි- නො ශොභනේ ය.

76. සූර්‍ය්‍ය චන්ද්‍රයන් අප්‍රාප්ත අවස්ථාවෙහි භ්‍රාජමාන නොවන්නාවූ ශ්වෙත නීල වර්ණවත් වස්තූන් මෙන් සද්ධර්ම්ය අවිද්‍යමාන අවස්ථාවෙහි පුණ්‍යපාප දෙදෙනාගේ විපාකය අවබොධ නො වේ ම ය.

77. මේ ලෙස- යථොක්තාකාරයෙන්, සලකමින- චින්තනය කරමින්, එරැදින- ඒ රාත්‍රිදිනය, පසු කරමින- යාපනය කොට, පනද- දෙවෙනි දවසෙහි, උදුසන- උදයකාලයෙහි, සුවඳසිලිලෙන- සුගන්ධසලිලයෙන්, සිරුර- ශරීරය, සනහා- ස්නාන කරවා,

78. රසමසවුලෙන්- සූපය ව්‍යඤ්ජනය ඛාද්‍යය යන මෙයින්, යුත්- යුක්තවූ, රසවත්- (මධුර) රස ඇති, බොජුන්- භොජන, බුදිමින්- අනුභව කොට, සිනිඳුවත්- ස්නිග්ධවස්ත්‍රයන්, වඩමින්-ආච්ඡාදනය කොට, සිරිමත්- කාන්තිමත්වූ, සිවුසැටබරණ- චතුෂ්ෂෂ්ට්‍යාභරණයන්, පැලඳ- පිලන්ධනය කොට,

79. විජයොත්පහවුලෙන-වෛජයන්තප්‍රාසාදාභ්‍යන්තරයෙන්, නික්ම- නිෂ්ක්‍රාන්ත ව, සුරසබයට- දෙවසභාවට, යන- ගමනය කරන්නාවූ, පසක්- ප්‍රත්‍යක්ෂවූ, සක්විලසින- ශක්‍රයාගේ විලාසයෙන්, සෙනඟ සමගින- සෙනාව සමග, සබයට- රාජ සභාවට, පිවිස- ප්‍රවිෂ්ට ව.

80. පූර්ණචන්ද්‍රාකාරයෙන් පෙණුනු දන්තපිණ්ඩමය ශ්වෙතච්ඡත්‍රයාගේ අධොභාගයෙහි සජ්ජිතවූ සිංහාසනමස්තකයෙහි ස්වකීය ස්තබ්ධ තෙජ ආඥුව ප්‍රකාශ කොට ආරූඪ ව,

81. මැතින්- මන්ත්‍රීන්ගේ, වත්තඹරට- වක්ත්‍රතාමරසයට, නෙත්කැන් බිඟුන්- නෙත්‍රකාන්ති නැමැති භෘඞ්ගයන්, හැර- ප්‍රෙරණය කොට, තුට-තුෂ්ටිය හා, මඳහස- මන්දහාස්‍යය, පෙරටු කොට- පූර්වඞ්ගම කර, රසබසින්- මධුර වචනයෙන්, මෙලෙසට-මේ ආකාරයෙන්, වදුරයි- ප්‍රකාශ කෙරෙයි.

82. ත්‍රිභුවනයට ආචාර්‍ය්‍යවූ මුනීන්ද්‍රයන් විසින් බ්‍රහ්මාමර මනුෂ්‍යයන් තුෂ්ට කර මොක්ෂඵලය සාක්ෂාත් කර දෙසනලද සද්ධර්ම්ය අසමතුන්ට කථනය කරව්.

83. මහට- අසමතුන්ට, බණ- ධර්ම්ය, කිවහොත්- කථනය කලොත්, මුළුදෙරණසමගින්- සමස්තධරණීය සමග, අපමණ රජසිරිසර ද- අප්‍රමාණරාජ්‍යශ්‍රීසාරය ද, පුදමි- පූජා කරමි. මෙකරුණ- මේ කාරණයෙහි, සැක- සංශය, නො ම කරව්- නො උපදවව්.

84. ඊදෘශාකාරයෙන් ඒ රජයන් වාරයෙන් වාරය සවිරවූ වච නය කියන කල්හි ද පූර්වයෙහි අද්භූත භාවයෙන් මහාත්‍රීවරයෝ අශක්‍යභාවය ප්‍රකාශ කළහ.

85. ඒ ඇමතියන් ධර්මය අද්භූත භාවය ප්‍රකාශ කළ කල්හි ප්‍රසිද්ධ වූ මඞ්ගල හස්තියා සජ්ජිත කොට ආභරණය කරවා සහස්‍ර යෙන් බද්ධ වූ සාර වූ වස්ත්‍ර ඛණ්ඩයක් නොහොත් භස්ත්‍රාවක් ද ස්ථාපනය කොට පුරාභ්‍යන්තරයෙහි වක්ෂ්‍යමාණාකාරයෙන් ආඥ හෙරිය ප්‍රයුක්ත කොළේය.

86. මුනිඳුන්- සර්වඥයන් වහන්සේ විසින්, වදහළ- දෙශනා කරණලද, අමයුත්- අමෘතයෙන් යුක්ත වූ, දහමින්- ධර්මය අතු රෙන්, ගයකින් වත්- ගාථාවකින් හෝ, ඉන් අඩින් අඩකින්වත්- ඒ ගාථාවකින් අර්ධයකින් හෝ තදර්ධයකින් හෝ, මට- අස්මතුන් හට, දූන්- මේ කාලයෙහි කිසිවෙකු- කිසියම් කෙනෙකුන් විසින්, බණ- ධර්මය, කිව- කථනය කළොත්, ඕහට- ඒ ධර්මදෙශනායාට, තුටුසිත්- සන්තුෂ්ටචිත්තය, වඩමින්-වර්ධනය කරමින්, නෙක සම්පත්- නානාවිධසම්පත්තීන්, දෙමි- දානයකරමි.

87. දහස් පටන්- සහස්‍රයෙහි සිට, කොළසුවහස්- කොටිශත සහස්‍රය, හිමි කොට- සීමා කොට, වෙසෙස්- විශිෂ්ටවූ, අනගි- අනර්ඝවූ, මුතුමිණි සග- මණිමුක්තාවන් හා, රටතොට- රාජ්‍යප්‍රතිෂ්ඨ යන් ද, සතොස් වඩන- සන්තොෂවර්ධනය කරන්නාවූ, රජසිරි- රාජශ්‍රිය ද, හිමි කොට- ස්වාමි කොට, දී- දානය කර, ඕහට- ඒ ධර්ම දෙශනායාට, මම- අසමත්තෙමේ, දහස්බවට- දාසභාවයට, පැමි ණෙමි- ප්‍රාප්ත වෙමි.

88. මෙලෙසින්- ඊදෘශාකාරයෙන්, කියමින්- කථනය කර මින්, හැමතැන- සකලස්ථානයෙහි, විමසා- විමංශනය කොට, බණ දන්නෙකු- ධර්මඥයෙකු, නො ලදින්- අලබ්ධ ව, කලකිරෙමින්- උත්කණ්ඨාවට පැමිණ, රජසිරි- රාජ්‍යශ්‍රිය, හරිමින්- ත්‍යක්ත කොට, වෙතින්- අන්‍යවූ, එක්වෙසකින- එකවෙශයකින්, වනයට- අරණ්‍ය යට, යන මෙන-ගමනය කරණ ලෙස, නොලසින්-ශීඝ්‍ර ව, නික්මිනි- නිෂ්ක්‍රාන්ත වී.

89. දෘඪ වූ දෘඨා ප්‍රහාරයෙන් අග්නි කණිකාවන් විකිරණය කර මින් ජලයෙහි ලොභය වර්ධනය කරමින් නිර්ඣරයක් පාසා අවතර ණය කරමින් කරෙණුකාවන් හා පොතකයන් ද හා සමග්‍ර ව ක්‍රීඩා කරමින් ඒ ඒ ස්ථානයෙහි ස්ථිතිය කළාවූ මත්තගජේන්ද්‍රයන් දර්ශ නය කරමින්,

90. දිලෙමින්- බබලමින්, ලඹ දෙන- ලම්බමාන වන්නාවූ, නවතඹපල්ලන්- අභිනව තාම්‍රවර්ණපල්ලවයන්හි, ලොලයෙන්- ආශාවෙන්, තොලු- ඔෂ්ඨයන්, දී- දානය කොට, සිටි-ස්ථිතවූ, මුව පොල්ලන්- මෘගපොතකයන් ද, විලසින්- විලාසයෙන්, ඉඳුනිල් පැහැති- ඉන්ද්‍රනීලප්‍රභාන්විතවූ, සුනිල්ලන්- අතිනීලවර්ණවූ, රඟ දෙන- නෘත්‍ය කරන්නාවූ, පිල්වල්ලන්- පිච්ඡභාරයන් ඇති, සිකි- මයූරයන් ද, දකිමින්- දර්ශනය කරමින්,

91. ඒ මහාසත්ත්වතෙමේ විකසිත කුසුම මකරන්දයෙන් හා ඵල රසයෙන් ද මත්තවූ මධුලොලය පරපුෂ්ටය ශුකය ශාරිකාය යන පක්ෂීන් විසින් නාදග්‍රහණය කළ මෙඝකූටයක ආකාරයෙන් යුක්තවූ උත්තුංග (උස්)වූ මහත්වූ වෘක්ෂයන්ගේ ඝනවූ නීලවර්ණවූ ඡායාවන් ගෙන් යුක්තවූ වනයට පැමිණියේ ය.

92. මයූරසමූහයා විසින් නෘත්‍ය කරණු ලබන්නා වූ මෘග ගණයා විසින් ක්‍රීඩා කරණු ලබන්නා වූ මනඃකල්‍යවූ දිව්‍යාඞ්ගනාවන් රඤ්ජිත වූ ශොභන වූ ඒ වනයෙහි ආකාශගඞ්ගායෙහි උද්ගත වන්නා වූ තරඞ්ගපඞ්ක්ති සේ උජ්ජවලිත වූ මනොඥවූ අතිනිර්මල වූ වාලුකාස්ථලයන්හි සන්තර්පිත ව-

93. ලමඟ- කරාබුය නොහොත් කුරුඳු ය, සබර- ලොධ්‍රය, සිඳුවර- සින්දුවාර (නික) ය, කර- තාපස වෘක්ෂය, කලුහර- කාල සාර ය, පෙතඟ- කාඤ්චනාර (පෙතං) ය, ඬෙබර- බදර (මසන්) ය, සොර- සරල ය, මොර- පීලු ය, පර- එනම් රුක් ය, සහකර- සහකාර (මීඅඹ) ය, වෙලඟ- වෙලංගස්ය, වරණ- ලුණුවරණ ය, රැරඟ- ඖෂධිය, බෙලි- බිල්වය, බිජුපුර- බීජපූර (නත්නාරං) ය, සිතඟ- සිතාඞ්ගය යන, තුඟුතුරු- උත්තුඞ්ගතරුන්ගෙන්, සැදි- සජ්ජිත වූ, වනතුර- වනාභ්‍යන්තරයට, (සිතඟ-චිත්තාභිප්‍රාය සේ) පිවිස- ප්‍රවිෂ්ට ව,

94. විසදර- විෂධරවූ, නා- නාගය, තෙලිසප්- එනම් පොළොං වෙසෙසය, පොලඟුන්ගෙන්- ගොනස ය යන සර්පයන් ගෙන් ද, බියකර- භයඞ්කර වූ, සීගජ වග වලසුන්ගෙන- සිංහ, හස්ති, ව්‍යාඝ්‍ර, ඍක්ෂ යන මොවුන්ගෙන් ද, ගොරතර- ඝොරතර වූ, යක් බූ පිසස් සොරුන්ගෙන- යක්ෂ භූත පිශාච චෞරයන්ගෙන් ද, උවදුරකට- උපද්‍රවයකට, පින්මහිමෙන- පුණ්‍යමහිමයෙන්, නො පැමිණ- අප්‍රාප්ත ව.

95. මහාසත්ත්වතෙමේ ඒ අරණ්‍යයෙහි චින්තනයෙන් තප්ත ව නිෂණ්ණකාලයෙහි ඒ මහත්වූ තෙජො ගුණ බලයෙන් ශක්‍රයාගේ ශෛලාසනය සන්තප්ත ව ශීතස්පර්ශය නැත්තක් ව දීප්ත වූ රත් වූ අයඃපිණ්ඩයක් සේ උෂ්ණ වී ය.

96. සතොස්පහස්- සන්තුෂ්ටිදායක ස්පර්ශය, දෙන- දානය කරණ, එ අසුන්- ඒ ශෛලාසනය, මෙලෙසින්- උක්තප්‍රකාරයෙන්, රත් යවටක් මෙන්- තප්ත අයඃපිණ්ඩයක් මෙන්, හුණුවත- උෂ්ණ වනකල්හි, දහස් දිවැස්- සහස්‍රමිත දිව්‍යාක්ෂීන්, ලා- ප්‍රේරණය කොට, මුළුලොව- සමස්තලොකය, බලමින- අවලොකනය කොට, කුකුස් වෙමින්- සන්තාපයට පැමිණෙමින්; උන්- නිසීදනය කළ, මහසතු- මහාසත්ත්වයන් වහන්සේ, දකිමින- දර්ශනය කොට,

97. වර්තමානකාලයෙහි ගුණයෙන් අතිමහත්වූ ධර්මශෞණ්ඩ මහාබොධිසත්ත්වතෙමේ ධර්ම වියොගයෙන් රාජ්‍යශ්‍රිය ත්‍යජනය කොට වනයට ප්‍රවිෂ්ට ව යම්කිසි වෙහෙසකට පැමිණියේ නම්, අසමතුන් සමාන වූ සුරෙන්ද්‍රයෙකු විද්‍යමාන වීමෙන් වන්නාවූ ඵලය කවරේ ද?

98. උක්තප්‍රකාරයෙන් යහපත් කොට චින්තනය කොට ඒ ක්ෂණයෙහි සන්තොෂවර්ධනය කරණ විශිෂ්ටවූ දිව්‍යාඞ්ගනාවන් හා දිව්‍යසම්පත්තිරාශිය සහිතවූ දෙවලොකය වර්ජනය කොට ශීඝ්‍ර ව හෘෂ්ටසහන ව මනුෂ්‍යලොකයට අවතීර්ණ ව,

99. සහස්‍රාක්ෂ තෙමේ අඤ්ජනකූටයක් මෙන් විශෙෂයෙන් උච්චතරවූ ශරීරයකින් ද අයොමයබලිසයන් සේ ශීර්ෂයෙහි තීක්ෂ්ණවූ කෙශයන්ගෙන් ද කල්පාන්තයෙහි සූර්යයා වැනි වූ රොෂ සහිත වූ රක්තාක්ෂියුග්මයකින් ද (යුක්තවූ) රාක්ෂස විලාසය මේ ආකාරයෙන් ග්‍රහණය කෙළේයි.

100. දියවක්සඳ මෙන්- (ශුක්ලපක්ෂය සම්බන්ධ) ද්විතීය දින යෙහි චන්ද්‍රයා සේ, නැමි- නැමුනාවූ, දළසුවලැති- දංෂ්ට්‍රායුග්මයක් ඇත්තාවූ, රියසක් ලෙස- රථචක්‍ර වැනිවූ, කන්හෝඩු දෙකක් ඇති- කර්ණතාඩඞ්කද්වයයක් ඇති, මටි- උස් නුවූ, දික්- දීර්ඝවූ, පුන්-පූර්ණවූ, මැදබුන්- මධ්‍යයෙන් භග්නවූ, නාසක් ඇති- ඝ්‍රාණයක් ඇත්තාවූ, කොටසක් පමණට- කොරග නම් භාජනවිශෙෂය පමණින්, ලොකු- මහත්වූ, මුහුණක්- වක්ත්‍රයක්, ඇති- ඇත්තාවූ, (රකුස් විලස් ගති).

101. ඝනවූ සූකරස්කන්ධයක් මෙන් එකාබද්ධ වූ ස්කන්ධයෙන් ද ශිලාතලයක් මෙන් පුළුවූ වක්‍ෂසින් ද චාටියක් වැනිවූ පිටතට නික්මුනු මහෝදරභාරයෙන් ද පූර්වභාගයට නැමුවූ ජානුයුගලයෙන් ද යුක්තවූ (රකුස් විලස්ගති.)

102. එක් අතකින්- එක් හස්තයකින්, නැබුළු- මහත්වූ, යගදා- අයෝමයගදායුධය, ගෙණ- ග්‍රහණය කොට, එක්අතකින්- එක් හස්තයකින්, දළිරැවුළු- දැඝීකාසමශ්‍රූන්, ඇදඇද- ආකර්ෂණය කරමින්, සියලඟෙහි ම- සකලශරීරයෙහි ම, විසුළු-විකාරයන්, දක් (ක) වමින්- දර්ශනය කරවමින්, රළුපරළු- කර්කශාතිකර්කශවූ, බස්- වචනයන්, බැණ- භණනය කොට, වික්ම- වික්‍රමය, පමින්- ප්‍රකාශ කරමින්,

103. රෞද්‍රභාවයෙන් යුක්තවූ අග්නිජ්වාලාවන් ශරීරයෙන් විසර්ජනය කොට මුඛයෙන් අමන්දවූ අග්නිකණිකායන් විකිරණය කරමින් ක්‍රෑරවූ ශබ්දය සඞ්ඝාත කොට දිශාවන් බධිර කොට පාදයෙන් පාදයට ජ්වලිතාඞ්ගාරයන් මර්දනය කරමින්,

104. දර්ශනය කළවුන් භීතියට ප්‍රවිෂ්ට ව මූර්ච්ඡාවට පැමිණෙන සේ තෙජසින් රෞද්‍රවූ රාක්‍ෂස වෙශය ග්‍රහණය කරමින් සහස්‍රාක්‍ෂයා ඒ වනයෙහි නිෂණ්ණවූ මනොනන්දනීය මහාබොධිසත්වයාට දෘශ්‍යමාන වෙමින් ආසන්න ව ස්ථිත වූ කල්හි,

105. කලෙකින්- චිරකාලයකින්, දුටු- දර්ශනය කළ, ඉටු මිතුරකු වෙත- ඉෂ්ට මිත්‍රයෙකුගේ සමීපයට, යන- ගමනය කරණ, අදරින් යුතු- ආදරයෙන් යුක්ත වූ, මිතුරකු ලෙස- මිත්‍රයෙකු මෙන්, සතොසින- සන්තොෂයෙන්, දම්ලොලයෙන- ධර්මලෞල්‍ය (ආශා) යෙන්, කිසි සැකයක්- කිසි ශඞ්කාවකට, නො වමින්- නො පැමිණෙමින්, නොලසින්- වහා, ගොස්- ප්‍රයාණය කොට, රකුසා වෙත- රාක්‍ෂසයාගේ සමීපයෙහි, සිටගෙණ- ස්ථිත ව,

106. අවිරෙධී ව උභය ලොකයෙන් වෘද්ධිය සිද්ධ කරන්නාවූ මුනීන්ද්‍රයානන්වහන්සේ විසින් භවදුඃඛය පරිච්ඡෙද කොට දෙශනා කළ ධර්ම පදයක් යුෂ්මතුන් විසින් මෙ අවස්ථාවෙහි කථනය කළොත් රාජ්‍යශ්‍රිය සමග මාගේ ජීවිතය පූජා කෙරෙම්.

107. මෙලෙසා- උක්තප්‍රකාරයෙන්, අප බෝසතු- අපගේ බොධිසත්වයන් විසින්, පැවසූ- ප්‍රකාශ කළ, බස- වචනය, අසමින්- ශ්‍රවණය කරමින්, රකුසා- රාක්‍ෂසතෙමේ, මෙලෙස- වක්‍ෂ්‍යමාණ

කාරයෙන්, පැවසි- ප්‍රකාශ කෙළේය. බඩ- උදරයෙහි, සා- ක්‍ෂුධාව, ඉවසිය- සහනය කරන්නට, නො හෙමි- හැකි නො වෙමි. එසින්- ඒ ක්‍ෂුධාග්නියෙන්, මිස- මිදී, මුනිබණ- සර්වඥ ධර්මය, තොප- යුෂ්මතුන්ගේ, තොස- සන්තොෂය, කර කොට, පවසාලමි- ප්‍රකාශ කරමි.

108. මනොනන්දනීය වූ ධම්මසොණ්ඩ රජතුමානෙනි! ඒ භාවයෙන් යුෂ්මතුන්ගේ ශරීර මාංස හා රුධිරය ද පරිභොග කොට උදරයෙහි ක්‍ෂුධාග්නිය නිර්වාපණය කොට සන්තර්පිත ව නිසිදනය කොට සන්තොෂයෙන් ධර්ම පදයන් ප්‍රකාශ කරමි යි කථනය කෙළේ ය.

109. මහාසත්ව තෙමේ සිත් සේ ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණය කරමින් පූර්වයෙහි දෑනවතුන් විසින් ප්‍රකාශ කළ, 'ආඥව විද්‍යමාන වනුයේ ජීවිතය විද්‍යමාන විනොත් නො වේද?,' යන වචනය මෙන් අසමත් තෙමේ අවිද්‍යමාන වෙම් නම්, යුෂ්මතාගේ භණිතය ශ්‍රවණය කරණ කවරනු ද? (යනු කී ය.)

110. තෙදසා යුතු- තෙජසින් යුක්ත වූ, ඉදුමත්- ඍද්ධිමත්, රකුසානෙනි- රාක්‍ෂසයානෙනි, තොප- යුෂ්මතුන්ගේ, සාගිනි සහ- ක්‍ෂුධාග්නිය ද, මගෙ- අසමතුන්ගේ, දම්දෙලයත්- ධර්මාශාවත්, නොලසා- වහා, එකවිට- එකක්‍ෂණයෙහි, පසිඳෙන විලසත්- සමාප්ත වන හෝ විනිශ්චය වන ආකාරයත්, විමසා- විමර්ශනය කොට, කියවයි කථනය කරවසි, අප බෝසත්- අපගේ බොධිසත්ව තෙමේ, කී- කථනය කෙළේ.

111. ඒ වචනයට තෙජොයුක්ත වූ ඒ රාක්‍ෂස තෙම 'ස්වාමීන්ද්‍රය! මේ යුෂ්මතුන්ට වන්නා වූ සද්ධර්මලාභ ද අසමතුන්ට මාංසලාභය ද එකක්‍ෂණයෙහි විනිශ්චය කෙරෙමි'යි.

112. කථනය කොට වජ්‍රායුධයක් ඇත්තාවූ ඒ රාක්‍ෂස තෙමේ දඬ වූ කූටශතයෙන් යුක්තාවූ ආකාශයෙහි සට්ටිත ව භ්‍රාජමාන වන්නා වූ අඤ්ජනකූටපර්වතය වැනි වූ ගව්‍යූති තුණක් උස්වූ පර්වතයක් මාපනය කෙළේ ය.

113. සමත්‍රිංශත්පාරමීන් සම්පූර්ණ කොට බ්‍රහ්මාමරමනුෂ්‍යයන් සන්තොෂ කරමින් අනාගතයෙහි දෛෂරහිත වූ බුද්ධත්වප්‍රතිලාභය කරණ විශිෂ්ට වූ බුද්ධාඞ්කුර ස්වාමීන්ද්‍රයානෙනි,

114. මෙගිරට- මේ පර්වතයට, නැඟෙමින්- ආරූඪ ව, සහතුට- සන්තුෂ්ට සේ, මකටට- මාගේ මුඛයට, පනිනා අතරට- පතනය කරණ අතරයෙහි, තොපහට- යුෂ්මතුන්ට, දම්- ධර්මය, දෙසම්- දෙශනා කරමි. ඇසුමට- (එය) ශ්‍රවණයට, විගසට- වහා, නැඟෙවසි- ආරූඪ වවසි, කිව්ට- කථනය කළ කල්හි,

115. අතිශයඝොරවූ සංසාරදුඃඛය වාරණය කළාවූ මොක්‍ෂ සුඛය නිශ්ශඞ්කිත සේ ලබනු පිණිස මොක්‍ෂාචාර්‍ය්‍යවූ සර්‍වඥයන් වහන්සේ විසින් වදාරණලද උපදෙශයන් බොධිසත්‍වතෙමේ සංලක්‍ෂණය කෙළේ ය.

116. ඇතැම් ජනයෝ සත්පුරුෂයන් විසින් කථනය කළ වචනයන්ට පහර දී මූර්ඛජනයාගේ වචනයන් වර්ජනය නො කොට ග්‍රහණය කොට කාමමිථ්‍යාචාරය කොට ඝොර වධයන් විඳනය කොට විනාශයට පැමිණෙත්.

117. ඇතැම් කෙනෙක් සාඩම්බරකථා ප්‍රකාශ කරමින් ක්‍රෑරවූ යුඩමධ්‍යයට ප්‍රවිෂ්ට ව ශූර නො වී රෞද්‍රවූ ආයුධප්‍රහාරය ප්‍රතිලාභය කොට අමනූ ව විනෂ්ට වෙත්.

118. ඇතැම්හු සජ්ජනයන් විසින් කථනය කළ වචනයන් චිත්තයට ග්‍රහණය නො කොට ස්ථාන ස්ථානයෙහි ගමනය කොට වෛරකම් කර රෞද්‍ර පීඩාවන් විඳනය කොට විනෂ්ට ව නරකයට ප්‍රාප්ත වෙත්.

119 සමහරු- ඇතැම්හු, මෙකල- මේ කාලයෙහි, ගංහෝ සිලිල- ගඞ්ගාශ්‍රොතස්සලිලයෙහි, වැටෙමින්- පතිත වෙමින් ද, බිය කරු- භයඞ්කරවූ, වලාදල- වලාහකාගනිය ගෙවත් ගෙන, වැද- ඝට්ටනයෙන් ද, තුහුතුල්ගිරගින්- උස් මහත් පර්‍වත මුදුනෙන්, පැනලා- පතිත ව ද, වැනසෙත්- විනෂ්ට වෙත්.

120. ඇතැම්හු හලාහලභක්‍ෂණයෙන් ද අන්‍යයෝ ග්‍රීවායෙහි රජ්ජූන් ප්‍රක්‍ෂෙප කොට ගෙණ ද ඇතැම්හු තමන්ගේ ජිහ්වාව ආකර්‍ෂණය කොට භක්‍ෂණය කොට ද අන්‍යයෝ ස්වහස්තයෙන් හනනය කොට ගෙණ ද (වැනසෙත්.)

121. උභයලොකයෙන් ආත්මයාහට වන්නාවූ අශාන්තිය ජානනය නො කොට යථොක්තාකාරයෙන් නෂ්ට ව නරකයට ප්‍රාප්ත වූ අඥලොකවාසි සත්‍වයන් විමර්ශනය කළහොත් මෙපමණ යයි සීමාවක් අවිද්‍යමාන ය.

122. සසරෙහි- සංසාරයෙහි, සැරිසරණ- සඤ්චාරණය කරණ, මා ද- අෂමතා ද, තද- ඝනබඩ වූ, සිහ දිවි වලසුන්ගෙන්- සිංහ ව්‍යාඝ්‍ර තරක්‍ෂූන්ගෙන් ද, නොමඳ- අමන්‍ද වූ, අතිකුත් උවදුරින්- සෙසු උපද්‍රවයන්ගෙන් ද, නැසුනු- නෂ්ට වූ, ජාති- ජාතිහු, මෙතෙකැයි- මෙපමණ යයි, කො ද?- (ප්‍රමාණයක්) කොයින් ද?

123. අදරසිතින්- ආදරචිත්තයෙන්, ඇසූ- ශ්‍රවණය කළ, සතන- සත්ත්වයන්ට, අජර-ජරාරහිත වූ, අමර- මරණරහිතවූ; මොක් සිරි- මොක්ෂසම්පත්තිය, දෙන- දානය කරන්නා වූ, මුනිඳුන- සර්වඥයන් වහන්සේගේ, පවර- ප්‍රවර වූ, සදහමට- සද්ධර්මයට, මේවර- මේ අවස්ථාවෙහි, මදිවි- මාගේ ජීවිතය, බැතින-භක්තියෙන්, පුදමි- පූජා කෙරෙමි.

124. අතිනිර්මල වූ මේ ප්‍රවෘත්තිය චින්තනය කරමින් මහත් වූ පර්වතමස්තකයට ආරූඪ ව උජ්ජ්වලිත වූ අභිමානසම්පන්න කේසර සිංහයකු මෙන් සන්තොෂයෙන් පර්වතාග්‍රයෙහි සිටිතවූ කල්හි,

125. අතික්‍රෑරවූ ශක්‍රරාක්ෂසයා ප්‍රෙෂ්‍ය වූ අග්න්‍යාවාටයක්හුගේ උභයපාර්ශ්වයෙහි ස්ථාපනය කළ අයශ්ශඞ්කුවයයක්හුගේ ශොභාව ප්‍රකාශ කළ දංෂ්ට්‍රායුග්මය ඌර්ධ්වමුඛ කරමින්,

126. අතිරක්ත වූ අයොවට්ටයන්ගේ විලාසයෙන් දෘශ්‍යමාන වූ නෙත්‍ර භ්‍රමණය කරවා හාත්පස අවලොකනය කරමින් පර්වත ගුහාවක් සේ ශොභමාන වූ වෘහද්මුඛය විවෘත කොට සිටිත ව,

127. මහත්වූ සංසාරයට පැමිණියාවූ සත්ත්වයන් නිර්වාණ නගරයට ප්‍රාපණය කරන් හොත් සමර්ථ වූ ත්‍රිලොකනෙත්‍ර වූ සර්වඥයන් වහන්සේ විසින් දෙශනා කළ අමෘතයෙන් යුක්තවූ "අනිච්චා වත සංඛාරා" යනාදි වූ ගාථාව ජ්වලිතවූ ඝනබද්ධ වූ තෙජසින් යුක්ත වූ ශක්‍රරාක්ෂසයා කථනය කරණ කල්හි-

128. අභිමානයෙන් යුක්ත වූ එකචාරිකෙසරසිංහයක්හුගේ ශොභායෙන් සද්ධර්ම ලෞල්‍යයෙන් සවල්පයක්වත් හීන නො වී ශොභමාන ගුණයන්ට නිධාන වූ මේ අපගේ මහා බොධිසත්ත්වතෙමේ සත්ත්වයා කෙරෙහි මෛත්‍රියෙන් වක්ෂ්‍යමාණාකාරයෙන් බුද්ධශ්‍රිය ප්‍රාර්ථනා කෙරේ.

129. ස්වකීය වූ පුත්‍රදාරාවන් හා චක්ෂුස් ශීර්ෂ මාංස රුධිරය ද යාචකයන්ගේ සිත් සන්තුෂ්ට කර චිත්තයෙන් ප්‍රසන්න ව දානය කොට මාරසෙනාව භග්න කොට විදර්ශනාඥානයෙන් ක්ලෙශයන් ප්‍රච්ඡින්න කරමින් සකලඥෙයයන් පිළිබඳ ප්‍රබන්ධය හෙවත් සමූහය සමාප්ත කර,

130. තිලබීජ ප්‍රමාණ වූ ශරීරයෙන් නිර්ගත ව ප්‍රමාණරහිත වූ සකලචක්‍රවාටගර්භයෙහි ව්‍යාප්ත ව භවාග්‍රය දර්ශනය කරණ නෙක් විසතීර්ණ ව ප්‍රයාණය කරණ ප්‍රභාසාර වූ මහත් වූ මනොහර ෂඩ්වර්ණ ඝන බුද්ධරශ්මියෙන් භ්‍රාජමාන වෙමින්,

131. සසරසයුර-සංසාර සාගරයෙහි, සරණ-සඤ්චාරය කරණ; සව්සතායා-සකලසත්ත්වයන්, අජරඅමරමොක්පුර- අජරාමරනිර්වාණ නගරයට, ලම්- දම්මියි, සිතායා- චින්තනය කොට, ගැඹුරගුණැති- ගම්භීරගුණසම්පන්න වූ, අප මහබෝසතායා-අස්මන්මහාබොධිසත්ත්ව තෙමේ, පවර-ප්‍රවර වූ, අයිරිමත්- ආශ්චර්‍ය්‍යවත් වූ, බුදුබව-බුද්ධත්වය, පතායා-ප්‍රාර්ථනා කර,

132. සහස්රැස්බරින්- සහස්‍රරශ්මිභාරයෙන්, හුනු-පතිත වූ, දිනකරලෙස ද- දිවාකරයා මෙන් ද, තමස්මුවෙන්- රාහුමුඛයෙන්, ගිලිහුනු ගලිත වූ, පුන්සඳ ලෙස ද-පූර්ණචන්ද්‍රයා මෙන් ද, වෙසෙස්- විශිෂ්ට වූ, දහම්- ධර්මය, අසමින්- ශ්‍රවණය කරමින්, දිවි පුදනලෙද- ජීවිතය පූජා කරණ විලාසයෙන්, රකුස් මුවට- රාක්ෂස මුඛයට, සෙද-ශිෂ්‍ය ව, ගිරිහිසින්-ගිරිශීර්ෂයෙන්, පිනුවේ-පතනය කොළේ ය.

133. මේ අසමතුන්ගේ සුන්දර වූ බොධිසත්ත්වයන් මේ ආකාර යෙන් පතනය කරණකල්හි ග්‍රහණය කළ රාක්ෂසවේශය අන්තර්ධාන කරමින් දිශානුදිශාවන් ශරීරාලොකයෙන් ආලොක කරමින් වහා මහාර්ඝ වූ ඒ ශක්‍රරාජවේශය ග්‍රහණය කරමින්,

134. ස්වකීය වූ ප්‍රියඞ්කර ස්වාමියෙකු භක්තිමත් චිත්තයෙන් ග්‍රහණය කළ වෘද්ධිකර වූ දාසයකු මෙන් චිත්තයෙහි පූර්ණ වූ තොෂ යෙන් බොධිසත්ත්වයන් ආලිඞ්ගනය කොට ගෙණ දිව්‍යලොකයට ගෙණ යන චිත්තයෙන් දිවාකර මාර්ගයට ආරූඪ ව වහා නිෂ්ක්‍රාන්ත වි ය.

135. රළපෙළ- තරඞ්ගපඞ්ක්තීන්, පතළ- ප්‍රසෘත වූ, නිල- නීලවර්ණයෙන්, ලෙල- ලීලොපෙත වූ, මහසමුදුර ද- මහාසමුද්‍රය ද, පැහැදුල-ප්‍රභායෙන් උජ්ජ්වලිත වූ, හිමව්පවු-හිමාලය පර්වතකූටයන්, රැඳි- රඤ්ජිත වූ, හිමවතපෙත ද- හිමවතපඞ්ක්තිය ද, සිරිදුල- ශ්‍රියෙන් උජ්ජ්වලිත වූ, කොදෙව් සහ- ක්ෂුද්‍රද්වීපයන් හා, මහදිවයින් ද- මහා ද්වීපයන් ද, සිතු-චිත්තයෙන්, පැහැද- ප්‍රසන්න ව, මනදෙළ- චිත්තාසාව, වඩා- වර්ධනය කොට, දක දක- දර්ශනය කරමින්, ගොස්- ගමනය කොට,

136. මෙරගිරසර- මෙරුපර්වත නමැති පද්මය, ලකළ කළ- අලඞ්කෘත කළා වූ, දලවිලස්- පත්‍රයන්ගේ විලාසය, ලද- ලබ්ධ වූ, යුගඳුරපටන්- යුගන්ධරයෙහි සිට, දිසි- දෘශ්‍යමාන වූ, සත්කුළගිරි පෙළ ද- සප්තකූට පර්වතපඞ්ක්තිය ද, එහි- ඒ පර්වතපඞ්ක්තියෙහි, අතර අතර- අන්තරන්තරයෙහි, සුසැදි- සුසජ්ජිත වූ, සිදන්සමූ

දුර ද- සිදන්තසාගර ද, එතම- ඒ තමන්ගේ, සිතුලෙද- අභිප්‍රායානු කූල ව, දැක-දර්ශනය කොට, පුරඳර සමග-පුරන්දරයා සමග, ගොස්- ගමනය කොට,

137. දුටුවන්- දර්ශනය කළවුන්ගේ; මනනුවන්- චිත්තයට හා නෙත්‍රයන්ට, නඳ දෙන-ආනන්දදායකවූ, රුසිරි- රූපශ්‍රියෙන්, සර- සාර වූ, සුරඟුන්-දිව්‍යාඞ්ගනාවන්, කෙළින- ක්‍රීඩා කරන්නා වූ, ගෙවු යන්- ගෘහොද්‍යානයන්ගේ, සිරිනි- ශොභාවෙන්, මනහර- මනො හර වූ, නිතියෙන්- නිත්‍යයෙන්, සිවුවරම් දෙවියන්- ධෘතරාෂ්ට්‍රාදි සතරවරම්දෙවිමහරජවරුන්ගෙන්, සැදි සජ්ජිත වූ, පවර- ප්‍රවර වූ, සිවුමහරදදෙව්නුවර- චාතුර්මහාරාජිකාදිව්‍යනගරය, දකිමින්-දර්ශනය කරමින්, ගොසින්- ගමනය කොට,

138. හරගිරසිර- කෛලාසපර්වතමස්තකය, වෙළපා- විඩම්බ නය කොට, බබලන- භ්‍රාජමාන වූ, දිමුත- දීප්තිමත් වූ, තරසර- ස්ථිරසාර වූ, විසල් වාසල්- විශාලගොපුරවාර ඇති, මිණිපවුරුයුත- මණිප්‍රාකාරයන්ගෙන් යුක්ත වූ, මෙරසිර-මෙරුමස්තකයෙහි, සුසැදි- සුසජ්ජිත වූ, දසදහසක් යොදුන් යුත- දශසහස්‍රයොජනයෙන් යුක්ත වූ, වරසුරපුරට- උතුම් වූ (තව්තිසා) දිව්‍යලොකයට, මෙඅප බෝසත- මේ අපගේ බොධිසත්ත්වයන්, වදිමින්- ප්‍රවිෂ්ට ව,

139. දෙව්රුක්පසින්- දිව්‍යවෘක්ෂපංක්තිකයෙන්, හෙබි- ශොභි ත වූ, පබඳ- ප්‍රබන්ධ වූ, නඳුනුයන ද- නන්දනොද්‍යානය ද, සියයක් යොදුන්- ශතයොජනප්‍රමාණ වූ, නඳනමැති පොකුණ ද-නන්ද යන නාමයෙන් යුක්ත වූ පුෂ්කරිණිය ද, තෙතිසක් කුඹින්-කුම්භත්‍රිස්ත්‍රිංශ කින්, උදුල-උජ්වලිත වූ, එරවණවරණිඳු ද-ඓරාවණහස්තිරාජයා ද, සිතු- චිත්තයෙන්, පැහැද- ප්‍රසන්න ව සියසක් පුරා- ස්වචක්ෂුෂ පූර ණය කර, දැක දැක- දර්ශනය කර කර, ගොස්- ප්‍රයාණය කොට,

140. කෙලශයන් ප්‍රව්‍රජ්‍යාකළා වූ තාපසයන් හැර දර්ශනය කළවුන් වසහ කරවන්නාවූ ප්‍රභායෙන් ආර්ද්‍ර වූ අමන්ද වූ රූපශ්‍රී ඇත්තා වූ සුන්දරවූ සුගන්ධයෙන් ද මාලායෙන් ද දිව්‍යාභරණයෙන් ද සුසජ්ජිත වූ දිව්‍යාප්සරාවන් දර්ශනය කරමින් මනොනෙත්‍රයන්ට සන්තොෂදානය කරමින්,

141. නාටිකාඞ්ගනාවන් හා චිත්තප්‍රීණනය කරණ උර්ශිය විසින් දානය කළ මනොනයනයන් ප්‍රීණනය කරණ නෘත්‍යය නිරීක්ෂ ණය කරමින් පඤ්චශිඛාදි උතුම් දිව්‍යගන්ධර්වයන් විසින් වාදනය කරණුලබන කාණ්යට කාන්ත වූ මධුර වූ වීණානාදයෙන් ශ්‍රවණය සජ්ජිත කෙරෙමින්,

142. දිනකරසඳදහස්-සූර්‍ය්‍යචන්‍ද්‍රසහස්‍රයන්, එකවිට-එකක්‍ෂණයෙහි, පහළ යුර- ප්‍රාදුර්භූතවූවාක් මෙන්, නිරතුරු- නිරන්තරයෙන්, ගනඳුරු- ඝනාන්‍ධකාරය, පැහැර- පහ කොට, දවරැ-දිවා රාත්‍රීන්හි, දිලෙන- බබලන්නා වූ, පැහැසර- ප්‍රභාසාර වූ, නවරුවන් කොත්- නවරත්නඛචිත ශෘඞ්ගයන්, පැලැඳි- පිනද්ධ වූ, විසිතුරු- විචිත්‍ර වූ, තුඟුතර-අතිඋත්තුඞ්ග වූ, සුරවිමන්- දිව්‍යවිමානයන්ගෙන්, දෙපසෙහි-උභයපාර්ශ්වයෙහි, සැදි-සජ්ජිත වූ, සොඳුරු-සුන්‍දර වූ,

143. මුනිඳුන් විසින්- සර්‍වඥයන් විසින්, වදහළ- වදාරණ ලද නමුත්, නොගෙවන- අවසාන නොවන්නා වූ, පබඳ- ප්‍රබන්‍ධ ඇති, සුපසන්- අතිප්‍රසන්න වූ, සුරඉසුරු-දිව්‍යසම්පත්තිය, නරඹා- නිරීක්‍ෂණය කොට, සිතු- චිත්තයෙන්, පැහැද- ප්‍රසන්න ව, සුරරදසමග- දෙවරාජයා හා, සුදසුන් වේ මැදින්- සුදර්ශනවීථිමධ්‍යයෙන්, ගොස්- ගමනය කොට, සතොසින්- සන්තොෂයෙන්, සුදම්සබඅබතුරට- සුධර්‍මාසභාභ්‍යන්තරයට, වන්සඳ- ප්‍රවිෂ්ට වූ කල්හි,

144. එහි- ඒ දිව්‍යසභාවෙහි, නෙකසුරන් හා-නොයෙක් දෙවියන් සමග, මනහර- මනොහර වූ, සුරසරන් හා-සුරප්සරාව (=දෙවඟන) න් ද, දෙතිසක් සුරන් හා- ද්වාත්‍රිංශද්දෙවයන් ද, දෙදෙව් ලොවහිමි- උභයදිව්‍යලොකයට ස්වාමි වූ, සුරනිඳුන් හා- ශක්‍රයා දූසි යන, (සුරවර-දෙවියෝ)

145. හද-හෘදයෙහි, සතුටින් යුතු ව-සන්තුෂ්ටියෙන් යුක්ත ව, මහබෝසතුන්- මහබොධිසත්ත්වයන්, මනනඳ- මනොඥ වූ, දිවපහස් දෙන- දිව්‍යස්පර්ශය දෙන්නා වූ, සොඳ- සුන්‍දර වූ, විසල්පඬුපුල්සලස්නේ- විශාල පාණ්ඩුකම්බලශෛලාසනයෙහි, සෙද-ශීඝ්‍ර ව,

146. අදර කර-ආදර කොට, ඉඳුවා-නිෂීදනය කරවා, ගඳදුම් මලින්- සුගන්‍ධධූපපුෂ්පයෙන්, පුද කර-පූජා කොට, මහසතුගෙන්- මහා සත්ත්වයාගෙන්, පවර-ප්‍රවර වූ, දහම් අසනුව-ධර්‍මශ්‍රවණය පිණිස, සුරවර- දෙවොත්තමයෝ, දන්වූ- විඥාපනය කළහ.

147. ගුණරුවන- ගුණරත්නයන්ට, සාගර- සමුද්‍ර වූ, දනමන කොඳ- ජනමනස්කුන්‍දයන්ට, නිසාකර- චන්‍ද්‍රයා වූ, සදහම් අමා- සද්ධර්‍මාමෘතයට, ආකර- උත්පත්තිස්ථාන වූ, මුළුතුන්ලොවට-සමස්ත ත්‍රිභුවනයට, සේකර- ශෙඛරයක් වූ, පවර- ප්‍රවර වූ,

148. මේ අසමතුන්ගේ බොධිසත්ත්ව චන්‍ද්‍රතෙම ආසන නමැති නභොමධ්‍යයට සම්ප්‍රාප්ත ව දෙවසභා නමැති ක්‍ෂීරසාගරයාගේ ඔජස සද්ධර්‍මාමෘතරශ්මියෙන් වර්‍ධනය කොළේ ය.

149. සුරඟන- මනුකිනියගේ, තරඟ ලෙසී- තරඞ්ගයන් වැනි වූ ද, අමවැසි- අමෘතවෘෂ්ටින්, වයිනවිලසින්- වර්ණනය කරන්නාක් මෙන් ද, නිසි- යොග්‍ය වූ, සුබැසි තෙපලින්- සුභාෂිතවචනයෙන්, මෙ අපබෝසත්-මේ අපගේ බොධිසත්වතෙමේ, දහම්-ධර්මය, පැවසී- ප්‍රකාශ කෙළේ ය.

150. සදහම්අමාරස-සද්ධර්මාමෘතරසය, සවන් රන්ගොටුයෙන්- ශ්‍රවණනමැති ස්වර්ණචෂකයෙන්, තොස- සන්තොෂයෙන්, බී-පානය කොට, ඉතිරිගියලෙස-අතිරික්ත ව ගියාක් මෙන්, සක්- ශක්‍රතෙමේ, මහසතුට-මහා බොධිසත්වයන්ට, තුතිගොස-ස්තුතිඝොෂය, කෙළේ- පැවැත්වී ය.

151. මේ ලෙසට- මේ ආකාරයෙන්, නොවිතර- අප්‍රමාණ වූ, තුතිගොස ද- ස්තුතිඝොෂය ද, පෙරදූරි කර- පූර්වඞ්ගම කොට, පුර දර- පුරන්දර තෙමේ, මහසතුට- මහාසත්වයාට, පියකරබසින්- ප්‍රියඞ්කර වචනයෙන්, අවවාද කෙළේ- අවවාද දානය කෙළේ ය.

152. සිවුසඟරාවතින- චතුස්සඞ්ග්‍රහ වස්තුයෙන් ද, මහරුදස රජදහමින- මහාභීදශරාජධර්මයෙන් ද, සව්සතුන් සිත් ගෙණ- සකලසත්වයන්ගේ චිත්තග්‍රහණය කොට, පෙරනරනිඳුන් විලසින පවතු- පූර්වරාජයන් සේ ප්‍රවෘත්ත වව.

153. බුදුකුරදම් පුරා-බුද්ධාඞ්කුරධර්මයන් පූරණය කොට, සව් සතුන් වෙත- සකලසත්වයන් කෙරෙහි, හිම් නො ව-සීමාවකට නො පැමිණ, සුතපෙම් වඩවමිනි- පුත්‍රප්‍රෙමය වර්ධනය කරමින්, පොරණ රජදම් විලසින්- පුරාණරාජධර්මය සේ, පවතු- ජීවත් වව.

154. මහරද- මහාරාජයානෙනි, සව්කොලෙස්- සකලකෙලශ යන්, මුල්සිඳ- මූලොච්ඡෙද කොට, මතු බුදුබවලබනලෙද- අනාග තයෙහි බුද්ධත්වය ලබන සේ, දසපෙරුමන්පබඳ- දශපාරමිතා සමූහය, නිති- නිත්‍යයෙන්, සපුරමින්- සම්පූර්ණ කරමින්, පවතු- ප්‍රවෘත්ත වව.

155. අනත්දුක්අනතා යන- අනිත්‍යදුඃඛ අනාත්ම යන, තිල කුණු- ත්‍රිලක්ෂණයන්, නිති පතා- නිරන්තරයෙන්, මෙනෙහි කර- චිත්තයෙහි කොට (සිතා), පැවත- ප්‍රවෘත්ත ව, මහතා- මහත් වූ, සසර සයුරෙන්- සංසාරසාගරයෙන්, මිදෙව- මුක්ත වව.

156. සක්රද- ශක්‍රරාජතෙමේ, මහසතුට- මහාසත්වයාට, මෙ ලෙසින්- උක්තප්‍රකාරයෙන්, අවවාද කොට- උපදෙශ දී, නර ලොවට- මනුෂ්‍යලොකයට, එන ලෙසට- ආගමනය කරණුවස්, නොවිතර අදර කොට- අප්‍රමාණ ආදරය පවත්වා, සමු දිනිය- සම්මතිදානය කෙළේ ය.

157. නරලොවට-මනුෂ්‍යලොකයට, බසිමින්-අවතීර්ණ ව, තම රජසැපතට- ආත්මීයරාජසම්පත්තියට, පැමිණ- ප්‍රාප්ත ව, මතු-අනාගතයෙහි, බුදු වන ලෙසට-සම්බුද්ධ වන පරිද්දෙන්, සතන් තුටු කොට- සත්වයන් සන්තුෂ්ට කොට, සදහම්- සද්ධර්මය, දෙසී-දෙශනා කොළේ ය.

158. පසක් සක්රජ මෙන්- ප්‍රත්‍යක්ෂශක්‍රදෙවෙන්ද්‍රයා සේ, නොමඳරජසිරි විඳ- අමන්ද වූ රාජ්‍යශ්‍රිය වලඳ, සොඳ රජදහම-සුන්දර රාජධර්මය, නො වැරද- විරුද්ධ නො කොට, මනනඳ-මනොනන්දනීය වූ, බෝසත්තුමා-බොධිසත්වොත්තම තෙමේ, විසී-වාසය කොළේ ය.

159. කළකම්වූ විලස-කරණලද කර්මයන් වූ පරිද්දෙන්, උපනු පන්තැන- උත්පන්නොත්පන්නස්ථානයෙහි, නොවලස- අනලස ව, දසපෙරුමන් පුරා- දශපාරමිතාවන් පූරණය කොට; සිවුඅසෙකි කප්සුවහස-චතුරසඞ්ඛ්‍යකල්පලක්ෂයක්, ගෙවා- අවසන් කොට,

163. මේ භද්‍රකල්පාභ්‍යන්තරයෙහි කාශ්‍යපසර්‍වඥයන් වහන්සේට අනන්තර ව ප්‍රසිද්ධ වූ ධර්මශෞණ්ඩරාජතෙමේ ප්‍රවර වූ ගෞතම නම් සම්බුද්ධ වී ය.

161. මහබෝසත් සිරිත- මහාබොධිසත්වචරිතය, අදර ව- ආදර සහිත ව, ඇසූ- ශ්‍රවණය කළ, සව්සත-සකලසත්වයෝ, දූජරු මරමුත- ජාතිජරාමරණයන්ගෙන් මුක්ත වූ, නිවන්සම්පත- නිර්‍වාණ සම්පත්තිය, ලැබ-ලබ්ධ ව, වෙසෙත්වා- වාසය කෙරෙත්වා.

162. සකලශාස්ත්‍රසාගරයාගේ පරතීරය දුටු නැමැති නෞකාවෙන් දර්‍ශනය කළ ධර්මධ්වජපණ්ඩිතොත්තමයාගේ පුත්‍ර වූ මේ ජගදභ්‍යන්තරයෙහි ප්‍රසිඬ වූ,

163. ගුණතුම්- ගුණයෙන් උතුම් වූ, අලගියවන්න නම්- අලගියවන්න නමැත්තාවූ, මුකවෙටිතුමා- මොහොට්ටි උත්තම තෙමේ, සසරහිම්- සංසාරයාගේ අන්තය, දකිනුව- දර්‍ශනය කරණු පිණිස, මනරම් හෙලුබසින්- මනොරම සිංහලභාෂාවෙන්, මෙකව්- මේ කාව්‍යය, කොළෙ- නිපිදවී.

**දහම්සොඬකව්සන්නය**

— නිමි. —



